පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# ඛුද්දක නිකාය

# 7

10. අපදාන පාළිය
11. බුද්ධ වංශය
15. චරියා පිටකය

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලොක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාය්‍ය ආයය්‍රත්න රේරුකාන මහතා

# ඛුද්දක නිකාය

# 7

10. අපදාන පාළිය
11. බුද්ධ වංශය
15. චරියා පිටකය

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1957
දෙවැනි මුද්‍රණය - 2014

**ත්‍රිපිටකය**

**ඛුද්දක නිකාය 7**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනයː
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනයː
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණයː
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත් යොමු

කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ

මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2014 මාර්තු

# සංඥාපනය

සූත්‍ර පිටකයේ පස්වෙනි නිකායවූ ඛුද්දක නිකාය කාණ්ඩ පසළොසකින් යුක්තයි. මේ නිකායේ ජාතක කථා ආදී ධර්ම රස ඇතිකරන කථා රාශියක් අන්තර්ගත කර තිබේ. කාව්‍ය රසය දක්වන පද්‍ය රචනා බොහෝ වෙත්. මේ පොතට ඛුද්දක නිකායේ අපදාන පාළියේ හත්ථි වග්ගයේ සිට අවසානයටද, බුද්ධ වංශයද, චරියා පිටකය ද ඇතුළත් කිරීමෙන් සූත්‍ර පිටකය අවසන් විය.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඹිරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඹිරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රත්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, තලල්ලේ පණ්ඩිත ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේද, පණ්ඩිත බලපිටියේ විසුද්ධාලෝක ස්ථවිරයන් වහන්සේද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

10 - 12 - 56.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.		http://pitaka.lk

පටුන

*x*

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | පිට |
|---|---|
| 13. අපදාන පාළිය | |
| 22. හත්ථි වග්ග | 2899 |
| 23. ආලම්බනදායක වග්ග | 2903 |
| 24. උදකාසන වග්ග | 2907 |
| 25. තුවරදායක වග්ග | 2910 |
| 26. ථොමික වග්ග | 2913 |
| 27. පදුමුක්ඛෙප වග්ග | 2916 |
| 28. සුවණ්ණ බිම්බොහන වග්ග | 2919 |
| 29. පණ්ණදායක වග්ග | 2922 |
| 30. චිතන පූජක වග්ග | 2926 |
| 31. පදුම කේසර වග්ග | 2930 |
| 32. ආරක්ඛදායක වග්ග | 2934 |
| 33. උම්මාපුප්ඵිය වග්ග | 2938 |
| 34. ගන්ධධූපිය වග්ග | 2947 |
| 35. එක පදුමය වග්ග | 2959 |
| 36. සද්දසඤ්ඤක වග්ග | 2964 |
| 37. මන්දාරව පුප්ඵිය වග්ග | 2967 |
| 38. බොධිවන්දක වග්ග | 2070 |
| 39. අවණ්ට ඵලදායක වග්ග | 2974 |
| 40. පිළින්දවච්ඡ වග්ග | 2981 |
| 41. මෙත්තෙය්‍ය වග්ග | 3025 |
| 42. භද්දාලි වග්ග | 3057 |
| 43. සකිංසම්මජ්ජක වග්ග | 3071 |
| 44. එක විහාරිය වග්ග | 3084 |
| 45. විභීටක වග්ග | 3090 |
| 46. ජගති දායක වග්ග | 3095 |

| | | |
|---|---|---|
| 47. | සාලකුසුමිය වග්ග | 3098 |
| 48. | නළමාලිය වග්ග | 3103 |
| 49. | පාසුකුල වග්ග | 3109 |
| 50. | කිංකණි පුප්ඵිය වග්ග | 3126 |
| 51. | කිනිකාර වග්ග | 3133 |
| 52. | කුරඤ්ජය වග්ග | 3140 |
| 53. | තිණදායක වග්ග | 3145 |
| 54. | කච්චාන වග්ග | 3155 |
| 55. | භද්දිය වග්ග | 3187 |
| | **ථෙරීඅපදාන පාළිය** | |
| 1. | සුමෙධා වග්ග | 3214 |
| 2. | එකූපොසථිකා වග්ග | 3224 |
| 3. | කුණ්ඩල කේසි වග්ග | 3267 |
| 4. | ඛත්තියා වග්ග | 3302 |
| 14. | **බුද්ධ වංස පාළි** | |
| 1. | රතනචංකමන කාණ්ඩය | 3320 |
| 2. | සුමෙධ පත්ථනා කාණ්ඩය | 3329 |
| 1. | දීපංකර බුද්ධ වංශ | 3344 |
| 2. | කොණ්ඩඤ්ඤ බුද්ධ වංශ | 3347 |
| 3. | මංගල බුද්ධ වංශ | 3350 |
| 4. | සුමන බුද්ධ වංශ | 3353 |
| 5. | රේවත බුද්ධ වංශ | 3356 |
| 6. | සොභිත බුද්ධ වංශ | 3358 |
| 7. | අනොමදස්සි බුද්ධ වංශ | 3361 |
| 8. | පදුම බුද්ධ වංශ | 3363 |
| 9. | නාරද බුද්ධ වංශ | 3366 |
| 10. | පදුමුත්තර බුද්ධ වංශ | 3369 |
| 11. | සුමේධ බුද්ධ වංශ | 3371 |
| 12. | සුජාත බුද්ධ වංශ | 3374 |
| 13. | පියදස්සි බුද්ධ වංශ | 3377 |
| 14. | අත්ථදස්සි බුද්ධ වංශ | 3379 |
| 15. | ධම්මදස්සි බුද්ධ වංශ | 3382 |

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

16. සිද්ධත්ත බුද්ධ වංශ 3384
17. තිස්ස බුද්ධ වංශ 3386
18. ඵුස්ස බුද්ධ වංශ 3388
19. විපස්සි බුද්ධ වංශ 3390
20. සිඛී බුද්ධ වංශ 3393
21. වෙස්සභු බුද්ධ වංශ 3395
22. කකුසන්ධ බුද්ධ වංශ 3398
23. කොණාගමන බුද්ධ වංශ 3400
24. කස්සප බුද්ධ වංශ 3402
25. ගොතම බුද්ධ වංශ 3406
26. බුද්ධ පකිණ්ණක කථා 3408
27. ධාතු භාජන කථා 3410

15. චරියා පිටකය

1 අකිත්ති වග්ගය

1.අකිත්ති චරියා 3411
2. සංඛ චරියා 3412
3. කුරු රාජ චරියා 3413
4. මහා සුදස්සන චරියා 3413
5. මහා ගොවින්ද චරියා 3414
6. නිමිරාජ චරියා 3415
7. චන්ද කුමාර චරියා 3415
8. සිවිරාජ චරියා 3416
9. වෙස්සන්තර චරියා 3417
10. සසපණ්ඩිත චරියා 3422

2. හත්ථිනාග වර්ගය

11. සීලව නාගමාතුපොසක චරියා 3424
12. භූරිදත්ත 3425
13. චම්පෙය්‍ය නාග චරියා 3425
14. චූලබොධි චරියා 3426
15. මහිස රාජ චරියා 3427
16. රුරු රාජ චරියා 3428
17. මාතංග චරියා 3429

18. ධම්ම දේව පුත්ත 3429
19. ජගද්දිය - අලීනසත්ත චරියා 3430
20. සංඛපාල චරියා 3431
3. යුධඤ්ජය වර්ගය
21. යුධඤ්ජය චරියා 3432
22. සොමනස්ස චරියා 3433
23. අයෝඝර චරියා 3434
24. මහාකඤ්චන චරියා 3435
25. සොණපණ්ඩිත චරියා 3436
26. මූගපක්ඛ-තෙමිය චරියා 3436
27. කපිරාජ චරියා 3438
28. සච්ච තාපස චරියා 3438
29. වට්ටක පොතක චරියා 3438
30. මච්ඡරාජ චරියා 3439
31. කණ්හ දීපායන චරියා 3440
32. සුතසෝම චරියා 3442
33. සුවණ්ණසාම චරියා 3442
34. එකරාජ චරියා 3443
35. මහා ලොමහංස චරියා 3443

# ඛුද්දක නිකාය

## 13 අපදාන පාළිය.

## 22 හත්ථි වග්ග.

### 211 හත්ථිදායක ථෙරාපදානය

2319 "තාදී ගුණ ඇති ද්විපදොත්තම වූ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේට රාජවාහන යොග්‍යවූ උඩට නැගුනාවූ මහත් දළ ඇති ඇත් රජෙක් ම විසින් පුදන ලදී.

2320 "(ඒ හේතුවෙන්) නිරුත්තර උත්තමාර්ථය වූ ශාන්ති පදය අනුභව කරමි. සර්වලොක හිතෛෂීන්වහන්සේට මා විසින් අනුග්‍රහයක් දෙනලදී.

2321 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි මා විසින් යම් දනක් දෙන ලදද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. හස්ති රාජයා දන්දීමෙහි මේ විපාකයයි.

2322 "අව සැත්තෑවන කපෙහි මහත් බලඇති සමන්ත පාසාදික නම් සොළොස් සක්විති රජ කෙනෙක්වූහ.

2323 සිව් පිළිසිඹියාවෝද අෂ්ට විමොක්ෂයෝද ෂඩභිඥාවෝද සාක්ෂාත් කරනලදි. බුදුරජාණන් වහන්සේගේ සසුන ද කරන ලදී. මෙහි මේ අයුරින් ආයුෂ්මත් හත්ථිදායක තෙරුන් වහන්සේ මෙම ගාථාවන් වදාළසේක. (මින් පසු අපදාන අගට 2323 ගාථාව යොදා ගැනීමේදී ඒ ඒ අපදාන වදාළ තෙරුන් වහන්සේලාගේ නම්ද යොදා ගත යුතුයි)

### 212 පානධිදායක ථෙරාපදානය

2324 "මම බොහෝ කලක් තපස්කම් කළ වෘද්ධවූ වඩන ලද සිත් ඇති අරණ්‍යෙහි වසන ඍෂිවරයෙකුහට පාවහනක් (සෙරෙප්පුවක්) දුනිමි.

2325 "ද්විපදොත්තමයන් වහන්ස ලොකජ්‍යෙෂ්ඨයන් වහන්ස එම (පුණ්‍ය) කර්ම හේතුවෙන් සියලු යානයන් (ලබා) පරිභොග කරමි.

2326 "මින් සිව් අනූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පාවහන් දනෙහි මේ විපාකයයි.

2327 "මින් සත් සැත්තෑවන කපෙහි මහත් බල ඇති සුයාන නම් වූ අට සක්විති රජ කෙනෙක් වූහ.-2328

## 213 සච්චසඤ්ඤක ථෙරාපදානය

2329 "එසමයෙහි භික්ෂු සංඝයා විසින් පිරිවරන ලද වෙස්සභූ බුදුරජතෙම කෙලෙස් ගිනි නිවමින් මහාජනයාට ආර්‍ය්‍ය සත්‍යයන් දෙශනා කරනසේක.

2330 "එකල්හි මම අතිශය දුකට පත්වූයේ වෙමි. (ඒ බුදුරජුන් දහම් දෙසන) සමූහය වෙතට ගියෙමි. එහි (පසෙක) හුන් මම බුදුරජුන්ගේ ධර්මය ඇසීමි.

2331 "මම උන්වහන්සේගේ ධර්මය අසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි. මම පෙර එම දෙව්ලොවෙහි තිස් කපක් විසීමි

2332 "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් (ධර්ම) සංඥාවක් ලැබුයෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චතුරාර්යසත්‍ය සංඥාවෙහි මේ විපාකයයි.

2333 "මින් සවිසිවැනි කපෙහි ජනාධිපතිවූ මහත් බල ඇති 'එකපුසිත' නම් වූ එක් සක්විති රජෙක්වීමී.-2334

## 214 එකසඤ්ඤක ථෙරාපදානය

2335 "ගසක් මුදුනෙහි එල්ලෙන්නාවූ තථාගතයන් වහන්සේගේ පසුල් සිවුර දැක මම ඇඳිලි බැඳ පසුල් සිවුර වැන්දෙමි.

2336 "මින් එක් තිස්වන කපෙහි වූ එකල්හි යම් පාංශුකූල චීවර සංඥාවක් ලැබූයෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2337 "මින් පස්විසිවෙනි කපෙහි ජනාධිපතිවූ මහත් බල ඇති 'අසිතාභ' නම් සක්විති රජෙක්වීමි.-2338

## 215 රංසි සඤ්ඤක ථෙරාපදානය

2339 "උදාවන්නාවූ හිරු මෙන්ද, එසේම (උදාවී) පැතිරී ගිය රැස් ඇති හිරුමෙන්ද යහපත් ජන්ම ඇති උතුම් ව්‍යාඝ්‍ර රාජයෙකු වැනිවූද, කඳු අතරෙහි (වැඩහුන් බුදුරජුන් දිටිමි)

2340 "කඳු අතුරෙහි ඒ බුද්ධානුභාවය බබලයි. මම බුද්ධ රශ්මියෙහි සිත පහදවා කල්පයක් ස්වර්ගයෙහි සතුටුවීමි.

2341 "සෙසු කල්පයන්හි මා විසින් කුසල් කරන ලදී. එම චිත්ත ප්‍රසාදයෙන් හා බුද්ධානුස්සති භාවනාවෙන් ද,

2342 "මින් තිස් දහස්වන කපෙහිවූ එකල්හි යම් (බුද්ධාලොක) සංඥාවක් ලැබූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි.

2343 "සත් පණසස්වන කපෙහි මහත් බල ඇති ජනාධිපතිවූ සුජාත නම් එක් සක්විති රජකෙනෙක් වීමි. 2344

## 216 සණ්ඨිත ථෙරාපදානය

2345 "මනාව වැඩුනු ඇසතු බෝරුක්හි හරිද්වර්ණ (කොළ පාට) රශ්මියෙහි සිහියෙන් යුතුව හුන්නේ එක් බුදුවරයන් වහන්සේ කෙනෙකුන් කෙරෙහි ගිය සිහිය (බුද්ධානුස්සතිය) ලැබීමි.

2346 "මින් එක්තිස් වන කපෙහිවූ එකල්හි යම් (බුද්ධානුස්සති) සංඥාවක් ලැබූයෙම්ද, එම බුද්ධානුස්සති සංඥා බලයෙන් මාගේ ආශ්‍රව ක්ෂය විය. (රහත් වීම)

2347 "මින් තෙළෙස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ධනිට්ඨ නම් ක්ෂත්‍රියයෙක් වීමි. 2348

## 217 තාලවණ්ටදායක ථෙරාපදානය

2349 "මවිසින් තිස්ස නම් සූයඞී බන්ධුවූ බුදුන් වහන්සේට පරිඩාහය සංසිඳවීම පිණිස ද ග්‍රීෂ්මය නිවීම පිණිසද විජිනි පතක් දෙන ලදී.

2350 "රාග ගින්න නිවීමි. ඉන් අධිකවූ ද්වෙෂාග්නියද නිවමි. එසේම මොහාග්නියද නිවමි. විජිනිපත් (වටාපත්) දානයාගේ මේ විපාකයයි.

2351 "මාගේ කෙලෙස් දවනලදී. සියළු භවයෝ නසන ලදහ. (දැන්) සම්බුදු සසුනෙහි අන්තිම ශරීරය දරමි.

2352 "මින් දෙයානූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2353 'මින් තෙසැටවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'මහානාම' නම්වූ සක්විති රජෙක් වීමි. 2354

## 218 අක්කන්ත සඤ්ඤක ථෙරාපදානය

2355 "මම පෙර උපාධ්‍යායයන්හට ගොරෝසු කඩක් ගෙන (ගියෙමි) එකල මම හී පහර බිඳින්ට හැකිවූ මන්ත්‍රයකුදු ඉගෙනගතිමි.

2356 "ලොකයාගේ පූජාවන් පිළිගැනීමට සුදුසුවූ කෙලෙස් රජස් විරහිත ශ්‍රෙෂ්ඨවූ "තිස්ස" බුදුරජුන් දිටිමි.

2357 "ලොව පහළ වූ ලොක ජ්‍යෙෂ්ඨවූ නර ශ්‍රෙෂ්ඨවූ පද ද්වීතිහාරය කරන්නාවූ බුදුරජාණන් වහන්සේට එම වස්ත්‍රය (පාවාඩයක් ලෙස) අතුරන ලදී.

2358 "(එසේ එය පාගන්නාවූ) ලොකයට ආලොකයක් වූ නිර්මලවූ චන්ද්‍රයා හා සමානවූ ඒ බුදුරජුන් දැක පැහැදි සිතින් ශාස්තෲන් වහන්සේගේ පා වැන්දෙමි.

2359 "මින් සිව් අනූවන කපෙහි යම් දුඹුල් කඩක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. දුඹුල් කඩ දීමෙහි මේ විපාකයයි.

2360 "මින් සත්තිස්වන කපෙහි ජනාධිපතිවූ මහත් බල ඇති සුනන්ද නම් සක්විති රජෙක් වීමි. 2361

## 219 සප්පිදායක ථෙරාපදානය

2362-2363 "මම ස්ත්‍රී සමූහයා විසින් පිරිවරන ලදුව උතුම් පහයෙහි හුන්නේ ස්වකීය ගෘහයට පැමිණියාවූ මහා වීරවූ දෙවියනට දෙව්වූ නරශ්‍රෙෂ්ඨවූ රොගීවූ ශ්‍රමණයන් වහන්සේ

නමක් දැක බුහුමන් කෙළෙමි. මා විසින් (එම) සිද්ධාර්ථ බුදුරජුන් හට ගිතෙල් දෙනලදී.

2364 "පැහැදි මුහුණු හා ඉඳුරන් ඇති සන්සිඳුනු කාය චිත්ත දරථ ඇති උන්වහන්සේ දැක එම ශාස්තෘන්වහන්සේගේ පා වැඳ (ඒ) අතීතයෙහි ධර්මයද ඇසීමි.

2365 "අතිශයින් පහන් බැව් ඇති ඍද්ධියෙහි කෙළ පැමිණි ප්‍රාඥවූ ඒ සර්වඥතෙම අහසෙහි යන හස් රජෙකු මෙන් අහසට නැංගේය.

2366 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් ගිතෙල් දනක් දුනිම්ද, එකල්හි (ඒ හේතුවෙන්) දුගතියක් නොදුටිමි. ගිතෙල් දනෙහි මේ විපාකයයි.

2367 "මින් සතළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ජුතිදෙව නම් සක්විති රජෙක් වීමි. 2368

## 220 පාපනිවාරිය ථෙරාපදානය

2369 "අව් සුළං වලක්වන බට ගස්වලින් වැඩීගිය සක්මනක් මා විසින් සිදුහත් බුදුරජුන්හට පිරිසිදු කරනලදී.

2370 "පව් වැළැක්ම පිණිසද කුසල් ඇතිවීම පිණිසද කෙලෙස් දුරුකිරීම පිණිසද බුදුසසුනෙහි වීර්‍ය්‍යය වැඩීමි.

2371 "මින් එකොළොස්වෙනි කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'අග්ගිදෙව' යයි ප්‍රසිද්ධ සක්විති රජෙක් වීමි. 2372

# 23 ආලම්බනදායක වග්ග.

## 221 ආලම්බනදායක ථෙරාපදානය

2373 "අටලෝ දහම්හි කම්පා නොවන බැවින් තාදි ගුණ ඇති ලොකජෙ‍්‍යාෂ්ඨවූ ද්වීපදොත්තමවූ අර්ථ දස්සී බුදු රජුන්හට මා විසින් එල්බෙන පුවරුවක් දෙන ලදී.

2374 "මහත්වූ සයුර කෙළවරකොට ඇති පෘථිවිය රජ කරමි. (පෘථිවියෙහිවූ) ධනයට ද ප්‍රාණීන්ට ද ආධිපත්‍යය පවත් විමි.

2375 "මාගේ කෙලෙස් දවනලදී. සියළු භවයෝ නසන ලදහ. පැමිණෙන ලද ත්‍රිවිද්‍යාවෝ ඇත්තාහ බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

2376 "මින් දෙසැට වන කපෙහි මහත්බල ඇති 'ඒකා පස්සිත' නම් ඒ තුන් සක්විති රජ කෙනෙක් වූහ-2377

## 222 අජිනදායක ථෙරාපදානය

2378 "මින් එක් තිස්වන කපෙහි මම ශාස්තෘන් ගරු කළ පිරිසෙහි කෙනෙක් වීමි. කෙලෙස් රජස් විරහිත ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ සිඛී බුදුරජුන් දිටිමි.

2379 "ලොක බන්ධුවූ සිඛී බුදුරජුන්හට මාවිසින් සම් කඩක් දෙන ලදී. ද්වීපදොත්තමයන් වහන්ස, ලොක ජ්‍යෙෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, එම කර්මය කරණ කොටගෙන,

2380 "මම සම්පත් අනුභවකොට කෙලෙස්ද දැවීමි. සම්බුදු සසුනෙහි (මේ) අන්තිම ශරීරයද දරමි.

2381 "මම මින් එක්තිස්වන කපෙහි යම් අඳුන්දිවි සමක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අඳුන් දිවිසම් දනෙහි මේ විපාකයයි.

2382 "මින් පස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සුදායක නම් සක්විති රජෙක් වීමි.-2383

## 223 ද්වීරතනීය ථෙරාපදානය

2384 "මම පෙර මහවනයෙහි මුවවැද්දෙක්වීමි. ලොකයාගේ පූජාවන් පිළිගත්තාවූ කෙලෙස්මල නැති බුදුරජුන් දිටිමි.

2385 "විපස්සී බුදුරජුන්හට මා විසින් මස් කැබැල්ලක් දෙන ලදී. මම (ඒ හේතුවෙන්) දෙවියන් සහිත ලොකයෙහි ආධිපත්‍යය කරමි.

2386 "මෙම මස්දන කරණකොට ගෙන මට රුවන් උපදී. මේ රුවන් දෙක ලෙව්හි නිවන් ලැබීමට උපකාරවේ.

2387 "මස් දනෙහි ශක්තිය කරණකොටගෙන මම ඒ සියල්ල අනුභව කරමි. මාගේ ශරීරයද මෘදුය. සියුම් දෙය අවබොධ කරගත හැකි ප්‍රඥාවද වේ.

2388 "මින් එක් අනූවන කපෙහි මම යම් මස් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මස් දනෙහි මේ විපාකයයි.

2389 'මින් සිව්වන කපෙහි ජනාධිපතිවූ මහත් බල ඇති මහා රොහිත නම් සක්විති රජෙක් වීමි-2390

## 224 ආරක්ඛදායක ථෙරාපදානය

2391 "මා විසින් සිදුහත් බුදුරජුන් හට වේදිකාවක් කරන ලදී. මා විසින් මහර්ෂිවූ බුදුරජුන්හට ආරක්ෂාවක්ද දෙන ලදී

2392 "එම කර්ම විශෙෂය කරණකොටගෙන භයජනක අරමුණක් නොදනිමි. කොහි උපන්නේ නමුදු මට ත්‍රාසයක් විද්‍යමාන නැත.

2393 "මම සිව් අනුවන කපෙහි යම් වේදිකාවක් කරවූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වේදිකා දනෙහි මේ විපාකයි

2394 "මින් සවනු කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අපස්සෙන නම් සක්විති රජෙක් වීමි. 2395

## 225 ආරක්ඛදායක ථෙරාපදානය

2396 "මම විපස්සි බුදුරජුන්හට ගිනිහල්ගෙයක් දුනිමි. රොගීන් හට නිවාස ස්ථානද, උනුදියද කෙල ගසන (පඩික්කම්ද) දුනිමි.

2397 "එම කර්මය හෙතුකොටගෙන මට මේ ආත්ම භාවය මවන ලදී. මම ලෙඩ කුමක් දැයි නොදනිමි. පුණ්‍ය කර්මයාගේ මේ විපාකයයි.

2398 "මින් එක් අනූවන කපෙහි එකල්හි යම් ශාලාවක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ගිනිහල් ගෙය දීමෙහි මේ විපාකයයි.

2399 "මින් සත්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අපරාජිත නම් එක් සක්විති රජෙක් වීමි. 2400

## 226 අද්ධොකල පුප්ඵීය ථෙරාපදානය

2401 2402 'නාරද යනු මගේ නමයි. මට කාශ්‍යපයයිද කියති. ශ්‍රමණයනට අග්‍රවූ දෙවියන් විසින් සත්කාර කරන

අනුව්‍යඤ්ජනයන් දරන්නාවූ ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ විපස්සී බුදුරජුන් දිටිමි. මම රුක්ගුණ මල් ගෙන (එම) බුදුරජුන්හට පිදීමි.

**2403-2404** 'මින් සුසැත්තෑවන කපෙහි ස්වර්ණ සිවිකා ආදී යානයන්ද මහාමාත්‍ය සෙවකාදි බලයන්ද හස්ති අශ්ව රථ සංඛ්‍යාත වාහනයන්ද යන මොවුන්ගෙන් යුක්තවූයේ පැළඳි මාලාභරණ ඇත්තේ 'රොමස' නම් රජෙක් වීමි-2405

## 227 වටංසකිය ථෙරාපදානය

**2406** "උද්‍යාන භූමියට නික්ම යන්නේ ලොකනායකවූ සිඛී බුදුරජුන් දිටිමි. මැනවින් කොට නිමවන ලද ස්වර්ණ වර්ණවූ හිසේ පළඳන මාලාවක් ගෙන.

**2407** "ඇතුපිට සිටි මම වහා ඉන් බැස ලොක බන්ධුවූ සිඛී බුදුරජුන්හට එම මාලාව පිදීමි.

**2408** "මින් එක් තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (බුද්ධ පූජාවෙහි මේ විපාකයයි

**2409** "මින් සත්විසි වන කපෙහි ජනාධිපතිවූ මහත් බල ඇති මහාපතාප නම් සක්විති රජෙක් වීමි. 2410

## 228 මිඤ්ජ වටංසකිය ථෙරාපදානය

**2411** "කථාකරන්නවුන් අතුරෙන් උතුම්වූ සිඛී බුදු රජුන් පිරිනිවී කල්හි හිසෙහි පළඳින මාලාවන් ගෙන් ගැවසීගත් බොධි පූජාවක් කෙළෙමි.

**2412** 'මින් එක්තිස් වන කපෙහිවූ එකල්හි යම් පුෂ්ප දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2413** "මින් සවිසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'මෙඝබ්භ' නම් සක්විති රජෙක් වීමි.-2414

## 229 සුකතාවලිය ථෙරාපදානය

**2415** 'එකල්හි මම අසිත නම් මල්කරුවෙක් වීමි. හිසෙහි පලඳින මාලාවක් රජුට දීම සඳහා ගෙන යමි.

2416 "රජුවෙත පැමිණීමට පෙර සිබී බුදුරජාණන් වහන්සේ දුටිමි. සතුටුවූයේ සතුටු සිතින් (එය) බුදුරජුන් හට පිදීමි.

2417 "මින් එක්තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

2418 "මින් පස් විසිවන කපෙහි මහත් බල ඇති, 'වෙභාර' නම් සක්විති රජෙක් වීමි.-2419

### 230 එක වන්දිය ථෙරාපදානය

2420 "ශ්‍රෙෂ්ඨවූ උතුම්වූ පස්මරුන් ජයගත් වෙස්සභූ බුදුන්හට මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ වැන්දෙමි.

2421 "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වන්දනා වෙහි මේ විපාකයයි.

2422 "සුවිසිවන කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති විගතානන්ද නම් සක්විති රජෙක් වීමි.-2423

## 24 උදකාසන වග්ග.

### 231 උදකාසනදායක ථෙරාපදානය

2424 "මම අරම් දොරින් නික්ම උත්තමාර්ථයවූ නිවණට පැමිණීම පිණිස (වැඩහිඳීමට) පුවරුවක් ඇතිරීමි. පැන්ද එලවා තැබීමි.

2425 "මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අසුන හා දිය එලවා තැබීමෙහි මේ විපාකයයි

2426 "මින් පසළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'අභිසාම' නම් සක්විති රජෙක් වීමි. 2427

### 232 භාජනදායක ථෙරාපදානය.

2428 මම එකල්හි බන්ධුමතී නගරයෙහි කුම්භකාරයෙක් (කුඹලෙක්) වීමි. එකෙණෙහි භික්ෂු සංඝයාට බඳුන් දුනිමි.

2429 "මින් එක් අනූවන කපෙහි යම් භාජන දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. භාජන දානයාගේ මේ විපාකයයි.

2430 "මින් තෙපණස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති (අනන්තජාලී) නම් සක්විති රජෙක්වීමි. 2431

## 233 සාලපුප්ඵිය ථෙරාපදානය

2432 "මම අරුණවතී නගරයෙහි පූප (කැවිලි වර්ග) සාදන්නෙක් විමි. (එකල්හි) මාගේ ගෙදොරින් වඩිනා සිඛී බුදුරජුන් දුටිමි.

2433 "මම බුදුරජුන්ගේ පාත්‍රය ගෙන මනාසේ වඩින එම බුදුරජාණන් වහන්සේට පැහැදී සිතින් හල්පූ දුනිමි.

2434 "මින් එක්තිස්වන කපෙහි මම යම් ඛාද්‍යයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. හල්පූ දානයෙහි මේ විපාකයයි.

2435 "මින් තුදුස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'අමිතඤ්ජල' නම් සක්විති රජෙක්වීමි. 2436

## 234 කිලඤ්ජදායක ථෙරාපදානය

2437 "(ප්‍රාකාරත්‍රයකින් වටකළ බැවින්) තිවරා නම්වූ රම්‍ය නගරයෙහි මම එකල්හි නළකරුවෙක් (කුළුපොත්තෙක්) වීමි. සිද්ධාර්ථ බුදුරජුන් කෙරෙහි පැහැදුනු ජනසමූහයෝ එහිවූහ.

2438 "ලොකනාථයන් වහන්සේට පිදීම සඳහා කළාලයක් සොයයි. මම ඒ බුද්ධපූජාව කරනවූනට කළාලයක් දුනිමි.

2439 'මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. කළාල දානයාගේ මේ විපාකයයි.

2440 'සත් සැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'ජුතින්ධර' නම් සක්විති රජෙක් වීමි. 2441

## 235 වෙදිකාරක ථෙරාපදානය

2442 'විපස්සී බුදුරජුන්ගේ උතුම් බෝරුකට මම පහන් සිත් ඇත්තේ සොම්නසවූයේ වේදිකාවක් කෙළෙමි.

2443 "මම මින් එක් අනූවන කපෙහි වේදිකාවක් කරවූයෙම්ද (ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. වේදිකා දානයාගේ මේ විපාකයයි.

2444 'මින් එකළොස්වන කපෙහි සත්රුවනින්යුත් මහත්බල ඇති 'සුරියස්සම' නම් සක්විති රජෙක් වීමි. -2445

## 236 වණ්ණකාර ථෙරාපදානය

2446 'මම එකල්හි අරුණවතී නගරයෙහි වර්ණකාරයෙක් (රෙදි සායම් කරන්නෙක්) වෙමි. මම චෛත්‍යයෙහි වස්ත්‍ර නා නා වර්ණකොට පෙවීමි.

2447 "මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි යම් වර්ණයක් (පින් පිණිස) පෙවූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි.

2448 "මින් තෙවිසිවන කපෙහි සත්වරුනින් යුත් මහත් බල ඇති චන්ද්‍රපම නම් සක්විති රජෙක් වීමි. - 2449

## 237 පියාල පුප්ඵිය ථෙරාපදානය

2450 "මම පෙර මහ වෙනෙහි මුව වැද්දෙක් වීමි. මම පිපුණු පියාල ගසක් දැක බුදුරජුන් වැඩිය මගෙහි (එම මල් ගෙන) දැමීමි.

2451 "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.-2452

## 238 අම්බයාගදායක ථෙරාපදානය

2453 "ස්වකීය (තර්කව්‍යාකරණාදි) ශිල්පයෙහි දක්ෂ වූයේ මම වනයට ගියෙමි. මම (මග) වඩින්නාවූ බුදුරජුන් දැක අඹ දනක් දුනිමි.

2454 "මින් එක් අනුවන කපෙහි එකල්හිවූ යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අඹ දනෙහි මේ විපාකයයි.-2455

## 239 ජගතිකාරක ථෙරාපදානය

2456 "මා විසින් අත්ථදස්සී බුදුරජුන් පිරිනිවි කල්හි එම බුදු රජුන්ගේ උතුම් සෑයෙහි පිළිදැකුම් කරන ලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**2457** "එක් දහස් අටසියවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කරන ලදද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චෛත්‍ය ප්‍රතිජග්ගනයෙහි මේ විපාකයයි.-2458

## 240 වාසිදායක ථෙරාපදානය

**2459** "මම පෙර උතුම් තිවරා පුරයෙහි කඹුරෙක් විමි. මා විසින් සියල්ල දත් පස්මරුන් දිනූ බුදුරජුන්හට එක් දැලිපිහියක් දුනිමි.

**2460** "මින් සිව්අනූවන කපෙහිවූ එකල්හි යම් දැලි පිහියා දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. දැලිපිහියා දනෙහි මේ විපාකයයි-2461

# 25 තුවරදායක වග්ග.

## 241 තුවරදායක ථෙරාපදානය

**2462** "මම පෙර මහවනයෙහි මුව වැද්දෙක් වීමි. මම බරකොට ගෙනවුත් තුවර ඇට (බැද) සංඝයාට දුනිමි.

**2463** 'මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. තුවර දනෙහි මේ විපාකයයි.-2464

## 242 නාගකෙසරිය ථෙරාපදානය

**2465** "මම (මුවන් මැරීම සඳහා) දුන්න සරසාගෙන වනයට ඇතුළු වීමි. උඩට නැගුනු මල් පෙති පිපුණු කුඩා විලක් දැක

**2466** "(එම මල්) දෝතින් ගෙන හිසෙහි ඇඳිලි බැඳ ගෙන ලොක බන්ධුවූ තිස්ස බුදුරජුන්හට පිදීමි.

**2467** "මින් දෙඅනූවන කපෙහි සම් බුද්ධ පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි

**2468** "තෙසැත්තෑවන කපෙහි සත් රුවනින් යුත්මහත් බල ඇති 'කෙසර' නම් සත් සක්විති රජකෙනෙක් වීමි. 2469

## 243 නළිනකෙසරිය ථෙරාපදානය

**2470** "මම ස්වයංජාත විලක් මැද ජල කුක්කුටයෙක්ව වසමි. ඉක්බිති (එහිදී) අහසෙහි වඩින්නාවූ බුදුරජුන් දුටුවෙමි.

2471 "තුඩින් මල්ගෙන පැහැදි සිතින් ලොක බන්ධුවූ තිස්ස බුදුරජුන්හට පිදිමි.

2472 "මින් දෙයානුවන කපෙහි යම් නෙළුම්මල් පිදීමක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2473 "තෙසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සතපත්ත නම් සක්විති රජෙක් වීමි.-2474

## 244 විරවි පුප්ඵිය ථෙරාපදානය

2475 "ලොකනායකවූ (සිද්ධාර්ථ) බුදුරජාණන් වහන්සේ මග වඩින සේක. එකල්හි (මම) ශබ්ද පවත්වන කුසුම් වර්ගයක්වූ විරවි පුෂ්පයන්ගෙන් (එම) බුදුරජුන්හට පිදීමි.

2476 "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.-2477

## 245 කුටිධූපක ථෙරාපදානය

2478 "මම සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේගේ ගඳකිළියෙහි වතාවත් කරන්නෙක් වීමි. කලින්කල පහන් සිතැත්තේ සියතින් දුමගැස්වීමි.

2479 "මින් සිව්අනූවන කපෙහි එකල්හිවූ යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි-480

## 246 පත්තදායක ථෙරාපදානය

2481 "(කාය-වචී-මනො මක්ඛකාවන්ගෙන් තොර බැවින්) ඍජු ගුණ ඇති (අටලෝ දහම්හි නොසැලෙන බැවින්) තාදී ගුණයුත් උතුම් වූ දමථ (සන්සිඳීම්)යෙන් යුත් සිද්ධාර්ථ බුදුරජුන්හට මා විසින් පාත්‍ර දානයක් (පාත්‍රයක්) දෙන ලදී

2482 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් (පාත්‍ර) දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පාත්‍ර දනයාගේ මේ විපාකයයි.-2483

## 247 ධාතු පූජක ථෙරාපදානය

2484 "ලොකනාථවූ සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ පිරිනිවී කල්හි තාදී ගුණ ඇති ද්විපදොත්තමවූ බුදුරජුන්ගේ එක් ධාතුන් වහන්සේ නමක් මා විසින් ලබන ලදී.

2485 සූයඝී බන්ධුවූ බුදුන්ගේ ඒ ධාතුන් වහන්සේ රැගෙන නරොත්තමයන් වහන්සේ වැඩ සිටින්නාක් මෙන් පස්වසක් පූජාවිධි පැවැත්වීමි

2486 "මින් සිවු අනුවන කපෙහිවූ එකල්හි යම් ධාතු පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ධාතුන්ට උවටැන් කිරීමෙහි පිදීමෙහි විපාකයයි.-2487

## 248 සත්තලි පුප්ඵිය ථෙරාපදානය

2488 "වෙස්සභූ බුදුරජුන් ලොව පහළවූ කල්හි මම සත්තලි නම් මල් සතක් හිසෙහි කොට එම බුදුරජුන් හට පිදීමි.

2489 "මින් එක් තිස්වන කල්පයෙහි යම්පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.-2490

## 249 බිම්බි ජාලිය ථෙරාපදානය

2491 "සියල්ල තෙමේම අවබොධ කළාවූ අග්‍ර පුද්ගලවූ පදුමුත්තර බුදුරජතෙම චතුස්සත්‍යය දෙශනා කරයි. අමෘත පදය (නිවණ) දක්වයි.

249 'එකල්හි මම රත්කරවි මල් කඩා තාදී ගුණ ඇති ද්විපදොත්තමවූ පදුමුත්තර බුදුරජුන්හට පිදීමි.

2493 "මින් අටසැටවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති කිඤ්ජකෙසර නම් සිව් සක්විති රජ කෙනෙක් වූහ.-2494

## 250 උද්දායක ථෙරාපදානය

2495 "සියල්ල තෙමේම අවබොධ කළාවූ පස්මරුන් ජයගත් කකුධ නම් බුදුරජතෙමේ වැඩවෙසෙන විහාරයෙන් නික්ම මහා නදියට වැඩියේය.

2496 "මම එකල්හි ඇසල (මල්) ගෙන සන්සුන්වූ ඍජු ගුණ ඇති බුදුරජුන්හට පහන් සිත් ඇත්තේ පිදීමි.

2497 'මින් එක් තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්පදානයෙහි මේ විපාකයයි. 2498

## 26 ථොමක වග්ග.

### 251 එකාසනදායක ථෙරාපදානය

2499 "දෙව්ලොව සිටියේ විපස්සී බුදුරජුන්ගේ ධර්මය අසා සතුටුවූයේ මම මේ වචනය කීමි.

2500 "පුරුෂ ශ්‍රේෂ්ඨයන් වහන්ස ඔබවහන්සේට නමස්කාරවේවා, පුරුෂොත්තමයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාරවේවා, ඔබ අමා පදය (ධර්මය) දෙසමින් බොහෝ දෙන (සසර සයුරින්) එතර කරහිය කියායි.

2501 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් (බුදු රජුන්හට ස්තුති) වචනයක් කීවෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ ස්තුති කරණයෙහි මේ විපාකයයි. 2502

### 252 එකාසනදායක ථෙරාපදානය

2503 "බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේගේ සසුනෙහි කුසල් කරනු කැමතිව දෙව්වෙස හැර බිරිය සමග මෙහි පැමිණියෙමි.

2504 "(එකල්හි) දෙවල නම් පදුමුත්තර බුදුරජුන්ගේ ශ්‍රාවකයෙක් විය. මා විසින් උන්වහන්සේට පහන් සිතින් භික්ෂාවක් දෙනලදී.

2505 "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කරණ ලදද ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. පිණ්ඩපාත දානයාගේ මේ විපාකයයි. 2506

### 253 චිතකපූජක ථෙරාපදානය

2507 "සියල්ල තෙමේම අවබොධ කළාවූ පස්මරුන් දිනූ ආනන්ද නම් සම්බුදු රජතෙමේ අමනුෂ්‍ය පරිගෘහිත වනයෙහි පිරිනිවන් පා වදාළේය.

2508 "මම එකල්හි දෙව් ලොවින් මෙහි පැමිණ චිතකයක් කොට (එම බුද්ධශරීරය) දැවීමි. සත්කාරයද කෙළෙමි.

2509 "මින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 2510

## 254 තිචම්පක පුප්ඵිය ථෙරාපදානය

2511 "හිමවතට නුදුරෙහි චිතක නම් පර්වතයක් විය එම පර්වතය මධ්‍යයෙහි වඩනලද ඉඳුරන් ඇති ශ්‍රමණයෙක් තෙම වෙසෙයි.

2512 "උන්වහන්සේගේ සන්සුන් බව දැක පැහැදි සිතින් සපුමල් තුනක් ගෙන විසිරවීමි. (පිදීමි)

2513 "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 2514

## 255 සත්ත පාටලිය ථෙරාපදානය

2515 "පර්වතාන්තරයෙහි වැඩහුන්නාවූ පිපුණු කිණිහිරි රුකක් මෙන් බබලන බුදුරජුන්හට පළොල් මල් සතක් පිදීමි.

2516 "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 2517

## 256 උපාහනදායක ථෙරාපදානය

2518 "එකල්හි චන්දක නම් බුද්ධ පුත්‍රයෙක් විය. මා විසින් උන්වහන්සේට එක් පාවහන් සඟලක් දුනිමි. (දීමෙන් පැතීමි) එම්බා පාවහන් සඟල. "ඔබ මා (ශ්‍රාවක) බොධියට පමුණුවන්නෙහිය" කියායි.

2519 "මින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් පාවහන් දෙකක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පාවහන් දනෙහි මේ විපාකයයි. 2520

## 257 මඤ්ජරී පූජක ථෙරාපදානය

2521 "මම මදටි මල් ගොටුවක් කොට විදියට පිවිසියෙමි. (එහිදී) භික්ෂු සංඝයා විසින් පිරිවරන ලද ශ්‍රමණයනට අග්‍රවූ බුදුරජාණන් වහන්සේ දුටිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2522 උතුම් ප්‍රීතියෙන් පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ දෝතින් ගෙන බුදුරජුන් හට පිදීමි.

2523 "මින් දෙයානූවන කපෙහි යම් මල්පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.

2524 "මින් තෙසැත්තෑවන කපෙහි පෘථිවිශ්වරවූ මහත් බල ඇති ජොතිය නම් සක්විති රජෙක් වීමි. 2525

## 258 පණ්ණදායක ථෙරාපදානය

2526 "මම හිමවතෙහි වැහැරි සිවුරු දරණ ලුණු නො මැතිව කොළ අනුභව කරන්නාවූ නියම නම්වූ පඤ්ච සීලයෙහි හික්මුනාවූ තවුසෙක් වෙමි.

2527 "පෙරවරුව පැමිණි කල්හි සිද්ධාර්ථ බුදුරජතෙම මාවෙත වැඩියේය. මම පහන්වූයේ සියතින් බුදුන්හට පිදීමි.

2528 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් කොළ දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි) කොළ දානයාගේ මේ විපාකයයි.

2529 "සත්විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති "යදත්ථිය" නම් සක්විති රජෙක් වීමි. 2530

## 259 කුටිදායක ථෙරාපදානය

2531 "වනයෙහි හැසිරෙන්නාවූ සර්වඥ තෙමේ එකල්හි රුක්මුලක විසීය. මම පස්වරුන් දිනූ උන්වහන්සේට පන්සලක් කරවා දුනිමි.

2532 "මින් එක් අනූවන කපෙහි යම් පර්ණ කුටියක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. කුටිදානයාගේ මේ විපාකයයි

2533 "මින් අටවිසිවන කපෙහි සබ්බත්ථ අභිවස්සි නම් සොළොස් සක්විති රජ කෙනෙක් වූහ. 2534

## 260 අග්ගජ පුප්ඵිය ථෙරාපදානය

2535 "පර්වතාන්තරයෙහි වැඩහුන්නාවූ ස්වර්ණ වර්ණවූ රශ්මිය කරණකොටගෙන ගිනි කඳක්මෙන් බබලන සිඛී බුදු රජුන් (දුටිමි)

2536 "(මම) අග්ගජ නම් වූ මල් ගෙන බුදුරජුන්වෙත එළඹියෙමි. පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ (එය) බුදු රජුන්හට පිදීමි.

2537 "මින් එක් තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2538 "පස්විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අමිත නම් සක්විති රජෙක් විමි. 2539

## 27 පදුමුක්ඛෙප වග්ග

### 261 ආකාසුක්ඛිපිය ථෙරාපදානය

2540 "ඇතුළු විථියෙහි වඩින්නාවූ ස්වර්ණ වර්ණවූ නර ශ්‍රෙෂ්ඨවූ සිර්ධාර්ථ බුදුරජුන් (දිටිමි) (දැක) ජලයෙහි හටගන්නාවූ පියුම් උපුල් වැනි උතුම් මල් දෙකක් ගෙන උන්වහන්සේ වෙත එළඹියෙමි.

2541 "ඉන් එක මලක් බුදු රජුන්ගේ ශ්‍රීපාදයට බිම දැමිමි. එකක් අහසට උඩ දැමීමි.

2542 "මින් සිව් අනූවනු කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්පදානයාගේ මේ විපාකයයි.

2543 "මින් දෙතිස්වන කපෙහි පෘථිවීශ්වරවූ මහත් බල ඇති අන්තලික්ඛචර නම් සක්විති රජෙක් වීමි.-2544

### 262 තෙලමක්ඛිය ථෙරාපදානය

2545 "නරශ්‍රෙෂ්ඨවූ සිදුහත් බුදුරජුන් පිරිනිවි කල්හි මම (උන් වහන්සේගේ) බොධි වේදිකාවෙහි තෙල් ගැල්වීමි

2546 "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්පදානයාගේ මේ විපාකයයි.

2547 "මින් සූවිසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සූච්ඡවි නම් සක්විති රජෙක් වීමි. 2548

## 263 අඩ්ඪචන්දිය ථෙරාපදානය

2549 "තිස්ස බුදුරජුන්ගේ උතුම් බෝරුක මුල මවිසින් අර්ධ චන්ද්‍රාකාරයෙන් නොයෙක් වර්ගයෙන් මල් පුදනලදී.

2550 "මින් දෙයානූ වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කරන ලදද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2551 "මින් පස්විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති දෙවල නම් සක්විති රජෙක් වීමි.-2552

## 264 අපණ්ණදීපිය ථෙරාපදානය

2553 "එකල්හි දෙවියෙකුවූ මම පොළවට බැස (මිනිස් ලොවට අවුත්) පහන්වූයේ සියතින්ම පහන් පසක් පිදීමි.

2554 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් ප්‍රදීප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ප්‍රදීප දානයාගේ මේ විපාකයයි.

2555 "පස්පණස්වන කපෙහි පෘථිවීශ්වරවූ සමන්ත චක්ඛු නම් මහත්බල ඇති සක්විති රජෙක් වීමි-2556

## 265 බිලාලිදායක ථෙරාපදානය

2557 හිම වතට නුදුරෙහි 'රොමස' නම් පර්වතයෙක් විය. එම පර්වතපාදයෙහි පර්වතය කෙළවර සංවර කරන ලද ඉඳුරන් ඇති භික්ෂුවක් විය

2558 "මම බිළාලි නම්වූ අල ගෙන ගොස් එම ශ්‍රමණයන් වහන්සේට දුනිමි. සියල්ල තෙමේම දත් මහා වීරවූ පස් මරුන් දිනූ එම බුදුරජතෙම අනුමෝදනාව කෙළේය. (කෙසේ ද යත්)

2559 "තා විසින් මට පැහැදී සිතින් බිළාලි අල දෙන ලදද (ඒ හේතුවෙන්) භවයෙහි උපදනා කල්හි තොපටද ඵල නිපදේවා කියායි.

2560 "මම මින් සිව් අනූවන කපෙහි යම් බිළාලි දනක් දෙන ලදද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බිළාලි දනයාගේ මේ විපාකයයි.-2561

## 266 මච්ඡදායක ථෙරාපදානය

2562 "මම එකල්හි චන්ද්‍රභාග නදී තීරයෙහි කබරුස්සෙක් (පක්ෂි විශෙෂයක්) වීමි. මම මත්ස්‍යයෙකු ගෙන සිද්ධාර්ථ බුදුරජුන්ට දුනිමි.

2563 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් මත්ස්‍ය දානයක් දෙන ලදද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මත්ස්‍ය දානයාගේ මේ විපාකයයි.-2564

## 267 ජවහංසක ථෙරාපදානය

2565 "එකල්හි මම චන්ද්‍රභාග නදී තීරයෙහි වැද්දෙක් වීමි. අහස් මගෙහි වඩින්නාවූ සිදුහත් බුදුරජුන් දිටිමි.

2566 "මම මහාමුනිවූ එම බුදුරජුන් බලමින් ඇඳිලි බැඳ සිය සිත පහදවා ලෝකනායකවූ උන්වහන්සේට වැන්දෙමි.

2567 'මින් සිව් අනූවන කපෙහි යම් බුදුවරයෙකු වැන්දෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වන්දනාවෙහි මේ විපාකයයි-2568

## 268 සලලපුප්ඵිය ථෙරාපදානය

2569 "මම එකල්හි චන්ද්‍රභාගා නදී තීරයෙහි කිඳුරෙක් වීමි. (එහිදී) රශ්මි ජාලාවන්ගෙන් ගැවසීගත් විපස්සී බුදු රජුන් දුටුවෙමි

2570 "මම පහන් සිතැත්තේ සොම්නස්වූයේ මහත්වූ ප්‍රීතියෙන් සලල මල්ගෙන (එම) විපස්සී බුදුරජුන් හට විසිරවීමි. (පිදීමි.)

2571 "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙලෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 2572

## 269 උපාගතාසය ථෙරාපදානය

2573 "හිමවත මැද මැනවින් නිමා කළ විලක් විය. මම එහි අනුන් වෙහෙසන සුළු භයානක රකුසෙක් වීමි.

2574 "අනුකම්පාව ඇති කරුණාවත්වූ ඒ විපස්සී බුදු රජතෙම මා (එම දරුණු ජීවිතයෙන්) ගොඩලනු කැමැත්තේ මාගේ සමීපයට පැමිණියේය.

**2575** "මම එසේ පැමිණියාවූ මහාවීරවූ දෙවියනට දෙව්වූ නරශ්‍රෙෂ්ඨවූ (උන් වහන්සේ දුටිමි) (දැක) සිටින තැනින් නික්ම ශාස්තෲන් වහන්සේට වැන්දෙමි.

**2576** 'මින් එක් අනූවන කපෙහි පුරුෂොත්තමවූ බුදු රජුන්හට යම් වැඳීමක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වැඳීමෙහි මේ ප්‍රතිඵලයයි.-2577

### 270 තරණීය ථෙරාපදානය

**2578** "දක්ෂිණාර්හවූ ස්වර්ණ වර්ණවූ භික්ෂුසංඝයා විසින් පිරිවරණලද ශාස්තෲවූ විපස්සී බුදුරජතෙම ගංතෙරෙහි සිටියේය.

**2579** "මහ මුහුදු තරණය කරන නැවක් එහි නොවීය. මම ගඟින් නික්ම අවුත් ලොකනායකවූ එම බුදු රජුන් එතෙර කරවීමි.

**2580** "මින් එක් අනූවනු කපෙහි බුදුරජුන් ගඟින් එතෙර කිරීම් නම්වූ යම් පින් කමක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුදුරජුන්ගේ එතෙර කිරීමෙහි මේ විපාකයයි. 2581

## 28 සුවණ්ණ බිම්බොහන වග්ග.

### 271 සුවණ්ණ බිම්බොහනිය ථෙරාපදානය

**2582** "උත්තමාර්ථයවූ නිවන් ලබනු පිණිස මම සියතින් එක් අසුනක් දුනිමි. බිම්බොහන (මෙට්ට) යක්ද දුනිමි.

**2583** 'මින් එක් අනූවන කපෙහි මම යම් බිම්බොහන දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බිම්බොහන දානයාගේ මේ විපාකයයි

**2584** "මින් තෙසැට වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අසම නම් සක්විති රජෙක් වීමි. 2585

### 272 තිලමුට්ඨිදායක ථෙරාපදානය

**2586** "ලොකනායකවූ ශාස්තෲ තෙමේ මාගේ අදහස් දැන මනෝමයවූ කයින් හෙවත් චිත්ත ගතියට හැරවූ සිරුරින් යුතුව ඍද්ධියෙන් (මා වෙත) එළඹියේය.

**2587** 'මම එසේ එළඹියාවූ පුරුෂොත්තමවූ ශාස්තෲන් වහන්සේට වැඳ පහන් සිත් ඇත්තේ සොම්නසවූයේ තල මිටක් දුනිමි.

**2588** "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් තිල දානයක් (තල දනක්) දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. තලමිටක් දීමෙහි මේ විපාකයයි.

**2589** "මින් සොළොස් වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති නන්දිය නම් සක්විති රජෙක් වීමි. 2590

## 273 චංගොටකිය ථෙරාපදානය

**2591** "සිද්ධාර්ථ (බුදුරජතෙම) මහ සයුර ඇසුරුකොට ඇති කඳු අතරක වැඩ වෙසේ. මම (මල්) ගොටුවක් සාදා ගෙන උන්වහන්සේට පෙර ගමන් කොට එය පිළිගැන්වීමි.

**2592** "මම සියලු සත්වයනට හිතානුකම්පා ඇති සිදුහත් බුදුරජුන් හට මල්ගොටුව පිළිගන්වා (ඒ හේතුවෙන්) කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටු වීමි.

**2593** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි (එසේ) මල් ගොටුවලින් පිදූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. මල් ගොටුවක් පිදීමෙහි මේ විපාකයයි. 2594

## 274 අබ්භඤ්ජනදායක ථෙරාපදානය

**2595 2596** "විත රාගීවූ තාදී ගුණ ඇති ආකාශය සමවූ (මෙත්) සිත ඇති ප්‍රමාද විහරණ (කෙලෙස් ගති වලින් යුතුව නොසැළකිලිමත්ව විසීමක්) නැති ධ්‍යාන කරන්නාවූ සියලු මුළාවීම් ඉක්මවූ සකල ලොකහිතෛෂි භාවයෙන් යුත් ද්විපදොත්තමවූ භාග්‍යවත් කොණ්ඩඤ්ඤ බුදුරදුන්හට මා විසින් ආලේපන තෛලයක් දෙන ලදී.

**2 97** "මින් අසංඛ්‍ය කල්පයකට පෙරවූ එකල්හි යම් ආලෙපන තෛලයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ආලෙපන තෛල දානයාගේ මේ විපාකයයි

**2598** "මින් පසළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති චිරප්ප නම් සක්විති රජෙක් වීමි. 2599

## 275 එකඤ්ජලිය ථෙරාපදානය

2600 "දිඹුල් ගස්සෙවනෙහි නියමිත කොළ ඇතිරියක වසන්නාවූ මහර්ෂි ශ්‍රමණයන් වහන්සේට මා විසින් විසුමට තැනක් දෙන ලදී.

2601 "ලොකනාථවූ තාදී ගුණ ඇති තිස්ස බුදු රජාණන් වහන්සේට ඇඳිලි බැඳ මල් ඇතිරියක් අතුළෙමි.

2602 "මින් දෙයානූවන කපෙහි යම් මල් ඇතිරියක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මල් ඇතිරිය දීමෙහි මේ විපාකයයි

2603 "මින් තුදුස්වන කපෙහි මනුජාධිපතිවූ මහත්බල ඇති එක අඤ්ජලික නම් සක්විති රජෙක් වීමි. 2604

## 276 පොත්ථකදායක ථෙරාපදානය

2605 "අසමාන පුණ්‍යක්ෂෙත්‍රවූ බුදුරජුන්ද ධර්මය හා සංඝයාද අරබයා මහර්ෂීවූ බුදුරජුන්හට මා විසින් නියඳ වස්ත්‍ර දානයක් දෙන ලදී.

2606 "මින් එක්අනූවන කපෙහි එකල්හිවූ (එම වස්ත්‍ර දානය කිරීම් වශයෙන්) යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (බුමුතුරුණු සඳහා දුන්) එම නියඳ වස්ත්‍ර දානයෙහි මේ විපාකයයි. 2607

## 277 චිතකපූජක ථෙරාපදානය

2608 'මම චන්ද්‍රභාගා ගං ඉවුරෙහි යටිගංබලා යමි. (එහිදී) මාලුව මල් සතක් ගෙන (වැලිවලින් සෑයක් කොට එම්) චිතකයට පිදීමි.

2609 'මින් සිව් අනූවන කපෙහි යම් චිතක පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චිතක පූජාවෙහි මේ විපාකයයි)

2610 "මින් සත් සැට වන කපෙහි සත්රුවනින් යුත් පටිජග්ග නම් ඇති සක්විති රජකෙනෙක් වූහ. 2611

## 278 ආලුවදායක ථෙරාපදානය

2612-2613 හිමවත් පව්වෙහි සුදර්ශනීයවූ මහාසින්ධු නම් නදියකි. පැහැපත් ඉතා සන්සුන් බැව්හි යෙදුනු සුදස්සන නම්

රහතුන්වහන්සේ දැක විෂ්මිතවූ සිත් ඇත්තේ පහන් සිත් ඇත්තේ සියතින්ම උන්වහන්සේට අල (කැබෙල්ලක්) දුනිමි.

**2614** "මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි යම් ආලුව දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ආලුම් (අල) දනෙහි මේ විපාකය. 2615

## 279 එකපුණ්ඩරීක ථෙරාපදානය

**2616** "(මම) එකල්හි නමින් රෝමස නම් විමි. මනා ව්‍රත ඇති බුදුරජ තෙමේද විය. මා විසින් පහන් සිතින් (උන්වහන්සේට) පියුමක් දෙන ලදී.

**2617** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් පියුමක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුණ්ඩරීක දානයාගේ මේ විපාකයයි 2618

## 280 තරණීය ථෙරාපදානය

**2619** පහසුවෙන් යා නොහැකි මාර්ගයක මවිසින් ලෝකයාගේ එතරවීම පිණිස සියතින්ම ඒදණ්ඩක් (හෙයක්) කරවන ලදී.

**2620** මින් අනූඑක්වන කපෙහි මවිසින් ඒදණ්ඩ කර වන ලදී. දුගතියක් නොදනිමි. ඒදඬු දානයාගේ මේ ඵලයයි.

**2621** මින් පණස්වන කපෙහි සත්රුවනින් යුතු මහත් බල ඇති සමාගධ නම් සක්විති රජෙක්වීමි. 2622

# 29 පණ්ණදායක වග්ග.

## 281 පණ්ණදායක ථෙරාපදානය

**2623-2624** "මම පාණීභෝජන අනුභවයෙහි (කොළ බුදීමෙහි) යෙදුනේ පන්සලක හුන්නේ වෙමි. මුළු ලොවටම වෙදෙකු වැනිවූ ලොව බබළවන්නාවූ සිද්ධාර්ථ සර්වඥයන් වහන්සේ (එසේ) හුන් මා වෙත එළඹිසේක. එළඹ කොළ ඇතිරියෙහි වැඩහුන් උන්වහන්සේට (කෑම සඳහා) නිමවන ලද කොළයක් මා විසින් දෙන ලදී.

**2625** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් (කෑමට පිළියෙල කළ) කොළයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පණි දානයාගේ මේ විපාකයි. 2626

## 282 ඵලදායක ථෙරාපදානය

**2627** "සිනේරු පර්වතය මෙන් ශාන්තවූ මහමෙර මෙන් ස්ථිරවූ ඒ සිද්ධාර්ථ භාග්‍යවත් තෙමේ සමාධියෙන් නැගිට පිඬු පිණිස මා වෙත එළඹියේය.

**2628-2629** "අරළු නෙල්ලි අඹ දඹ බුළු ඩෙබර බදුළු බෙලි බොරළු දමනු යන ඒ සියල්ල මුළු ලොවට අනුකම්පා කරන්නාවූ සිදුහත් බුදු රජුන්හට පැහැදී සිතින් මා විසින් දෙන ලදී.

**2630** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් පලතුරු දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පලතුරු දනෙහි මේ විපාකයයි.

**2631** "මින් සත් පණස්වන කපෙහි සත් රුවනින් යුත් මහත් බල ඇති එකජ්ඣ නම් සක්විති රජෙක් වීමි 2632

## 283 පච්චුග්ගමනිය ථෙරාපදානය

**2633-2634** "වනයෙහි (එකලාව) හැසිරෙන්නාවූ සිංහයෙකු මෙන් ශ්‍රෙෂ්ඨ ආජානියයෙකු මෙන්ද බබලන්නාවූ කුඹුක් ගසක් මෙන්ද (ක්ලේශ රොගයෙන් පෙළෙන) එකල ලොකයාට වෛද්‍යවරයෙකු මෙන්ද ලොව බබුළුවන්නාවූ නරශ්‍රෙෂ්ඨවූ (ඉදිරියට) වඩින සිදුහත් බුදුරජුන් (දැක) පැහැදි සිතින් පෙර ගමන් කෙළෙමි.

**2635** "මින් එක් අනූවන කපෙහි බුදුරජුන්හට පෙර ගමන් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පෙරගමන් කිරීමෙහි මේ විපාකයයි.

**2636** "මින් සත් විසිවෙනි කපෙහි ජනාධිපතිවූ මහත් බල ඇති සපරිවාර නම් සක්විති රජෙක් වීමි. 2637

## 284 එකපුප්ඵිය ථෙරාපදානය

**2638** "මම එකල්හි දකුණු දොරටුවෙහි පිසාචයෙක් වීමි. (එහිදී) පීත වර්ණ රැස් ඇති (උදාවන) හිරු වැනිවූ කෙලෙස් රජස් නැති බුදු රජුන් දුටිමි.

**2639** "සර්වලොක හිතෛෂීවූ නරශ්‍රෙෂ්ඨවූ ද්වීපදොත්තමවූ තාදී ගුණ ඇති විපස්සී බුදුරජුන්හට මා විසින් එක් මලක් පුදන ලදී.

**2640** "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් පුෂ්ප දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 2641

## 285 මසව පුප්ඵිය ථෙරාපදානය

**2642** "නර්මදානදී තීරයෙහි සියල්ල තෙමේම අවබොධ කළාවූ පස්මරුන් දිනූ යහපත්වූ නොකැළඹුණු ඒ (සුමන) සර්වඥයන් සමාධියට සම වැදුනේ විය.

**2643** "පහන්වූ සොම්නස්වූ මම අපරාජිතවූ එම සර්වඥයන් වහන්සේ දැක එකල්හි එම බුදුරජුන්හට මසව නම්වූ මල්වලින් පිදීමි

**2644** "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 2645

## 286 උපට්ඨායකදායක ථෙරාපදානය

**2646** "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ ද්විපදොත්තමවූ නරශ්‍රෙෂ්ඨවූ වීථියට පිවිසෙන බුදුරජුන් (දිටිමි.)

**2647** "(දැක) මා විසින් සර්වලොක හිතෛෂිවූ ඒ සිදුහත් බුදුරදුන්හට උපස්ථායකයෙක් දෙන ලදී.

**2648** "මහා මුනිවූ සර්වඥතෙමේ (උපස්ථායකයා) පිළිගෙන (ආපසු මට පාවාදුනි) ඉක්බිති එම අසුනෙන් නැගිට ප්‍රාචීන දිශාභිමුඛව (නැගෙනහිරට මුහුණලා) වැඩියේය.

**2649** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි උපස්ථායකයෙක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (උපස්ථායක දානයෙහි) උවැටනෙහි මේ විපාකයයි.

**2650** "මින් සත් පණස්වන කපෙහි සත්රුවනින් යුත් මහත්බල ඇති බලසේන නම් සක්විතිරජෙක් වීමි. 2651

## 287 අපදානීය ථෙරාපදානය

**2652** "මම මහර්ෂීවූ බුදුරජුන්හට තථාගතයන් වහන්සේලාගේ අපදාන පැවසීමි. පහන්වූයේ සියතින් ශ්‍රීපාදයන්ද හිස නමා වැන්දෙමි.

**2653** "මින් දෙයානුවන කපෙහි (යම්) සුගතාභිදානයක් පැවසුවෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අපදාන කීර්තනයෙහි (තථාගත චරිතයනට පැසසීමෙහි) මේ විපාක යයි. 2654

## 288 සත්තාහ පබ්බජිත ථෙරාපදානය

**2655** "මා විසින් විපස්සී බුදුරජුන්ගේ ශ්‍රාවක සංඝ තෙමේ සත්කාර හා බුහුමන් කරන ලදුයේ විය. මට ආපදාවක් පැමිණියේය. පෙර ඤාතීන් අතර භෙදයක් ඇතිවිය.

**2656** "එම උවදුරින් සන්සිදීම පිණිස බුදුසසුනෙන් කැමැත්තෙන් පැවිදිව සතියක් එහි ඇළුනේව විසීමි.

**2657** 'මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් හෙයකින් මම පැවිදිවූයෙම්ද (ඒ පැවිදිවීම කරණකොටගෙන) දුගතියක් නොදනිමි. පැවිද්දෙහි මේ විපාකයයි.

**2658** "මින් සත්සැටවන කපෙහි පෘථිවීශ්වරවූ මහත් බල ඇති සුනික්ඛම නම්වූ සක්විති රජ කෙනෙක් වූහ. 2659

## 289 බුද්ධුපට්ඨාක ථෙරාපදානය

**2660-2661** "මාගේ නම වෙටම්බරිය විය. එකල්හි මාගේ පිය තෙම මේ ලොකාග්‍රනායකවූ බුදුවරු මට දහම් දෙසන්නාහුයයි කියා මාගේ අතගෙන බුදුරජුන් වෙතට පැමිණ වීය. මම පහන්වූයේ සියතින් උන්වහන්සේට මැනවින් උපස්ථාන කෙළෙමි.

**2662** "මින් එක්තිස් වන කපෙහි එකල්හි බුදුරජුන් හට පිරිවරණය (වතාවත්) කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. උවැටැන් කිරීමෙහි මේ විපාකයයි.

**2663** "මින් තෙවිසිවන කපෙහි මහත් බල ඇති සමණුපට්ඨාන නම් සිව් සක්විති රජ කෙනෙක් වූහ. 2664

## 290 පුබ්බංගමිය ථෙරාපදානය

**2665** "උත්තමාර්ථයවූ නිවන් ලැබීම පිණිස අසූහාර දහසක් දෙනා (කිසිදු වස්තුවක් නොමැති බැවින්) අකිඤ්චනවූ පැවිද්දෝ වූහ. මම ඔවුනතුරෙන් පුරෝගාමියා වීමි.

**2666** "පැහැදුනාවූ නොකැළඹුනාවූ මොව්හු රාගසහිතයෝය. භවෝත්පත්තිය නැති නොකොළෝය. පහන්වූ ඔව්හු (රහතුන්හට) සියතින්ම මැනවින් උවැටැන් කළාහුය.

**2667** "ක්ෂය කළ ආශ්‍රව ඇති වමාරා දැමූ (නැතිකළ කෙළෙස්) දොස් ඇති රහත් බවට පත් සියල්ල තෙමේම අවබොධකළාවූ පස්මරුන් දිනූ (උන්වහන්සේලා) (අප කෙරෙහි) මෙත් සිත පැතිරවූහ.

**2668** "එම සම්බුදුවරයන් වහන්සේලාට උවැටැන් කොට සිහියෙන් යුක්තවූයේ මරණයටද පැමිණියාහු දෙවත්වයටද ගියෙමු.

**669** සිව් අනූවන කපෙහි යම් සීලයක් රැකියෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සංයමයෙහි මේ විපාකයයි. 2670

## 291 චිතකපූජක ථෙරාපදානය

**2671** "එකල්හි මම අජිත නම් බමුණෙක් වීමි. පූජාවක් කරනු කැමැත්තේ නොයෙක් මල් රැස් කෙළෙමි.

**2672** "සිඛී බුදුරජාණන් වහන්සේගේ ඇවිලෙන්නාවූ සෑය දැක මම එම මල් ගෙන චුත් සෑයෙහි විසිර වීමි.

**2673** "මින් එක්තිස් වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**2674** 'මින් සත්විසි වෙනි කපෙහි මනුජාධිපතිවූ මහත් බල ඇති සුපජ්ජලිත නම් සත්සක්විති රජ කෙනෙක් වූහ 2675

## 292 පුප්ඵධාරක ථෙරාපදානය

**2676** "මම වැහැරි සිවුරු දරන්නාවූ එකස්කොට හිඳිනා ලද අඳුන් දිවිසම් ඇති උපදවූ පංචාභිඥා ඇති සඳ පිරිමැදුමෙහි සමත් (ඍද්ධිමත්) තවුසෙක් වීමි.

**2677** "ලොකයාට ආලොකයක්වූ මා සමීපයට වැඩියාවූ විපස්සී බුදුරජුන් දැක මම එම ශාස්තෘන් වහන්සේට පරසතු මල් (ගෙනවුත් කුඩයක් මෙන් කොට) දැරීමි.

**2678** "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප (ඡත්‍රයක්) දැරුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (මල් කුඩය) දැරීමෙහි මේ විපාකයයි.

**2679** "මින් සත් අසූවන කපෙහි පෘථිවීශ්වරවූ මහත් බල ඇති සමන්තධාරණ නම් එක් සක්විති රජෙක් වීමි. 2680

## 293 ඡත්තදායක ථෙරාපදානය

**2681** 'එකල්හි මාගේ පුත්‍රතෙමේ කසාවත් හැඳියේ පැවිදිවිය. හෙතෙම ශ්‍රාවක බොධිය (රහත් බවට) පැමිණියේ ලොකයා විසින් පුදනු ලැබූවෙක්ව පිරිනිවන් පෑය.

**2682** "මම සිය පුතා සොයමින් පස්සෙන් ගියෙමි. මම පිරිනිවන් පෑ රහතන් වහන්සේගේ සෑය වෙත ගියෙමි.

**2683** "මම එහි ඇඳිලි බැඳගෙන සෑය වැඳ එකල්හි සුදු කුඩයක් ද ගෙන (සෑයට) නගා තැබීමි

**2684** මින් සිව් අනූවන කපෙහි යම් කුඩ (ඡත්‍ර) පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මේ ඡත්‍ර දානයාගේ විපාකයයි

**2685** මින් පස් විසිවෙනි කපෙහි ජනාධිපතිවූ මහත් බල ඇති මහාරහ නම් තුන් සක්විති රජකෙනෙක් වූහ. 2686

## 294 සද්දසඤ්ඤක ථෙරාපදානය

**2687** හිරු උදාවන්නටත් පෙර ආලොකය මහත්විය. (මෙය) මහර්ෂිවූ බුදුරජාණන් වහන්සේගේ ලොව පහළ වීමයි.

**2688** (ගිලන් ඇඳෙහි වැතිර සිටි) මම එහි ශබ්ද ඇසීමි. ඒ බුදුරජුන් නොදීටිමි. මරණාසන්න අවස්ථාව පැමිණි කල්හිද බුද්ධ යන නාමය සිහි කෙළෙමි.

**2689** මින් සිව් අනූවන කපෙහි වූ එකල්හි යම් බුද්ධ යන හැඟීමක් ලැබුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ සංඥාවෙහි මේ විපාකයයි. 2690

## 295 ගොසීය නික්ඛෙපක ථෙරාපදානය

**2691** මා විසින් (භික්ෂු සංඝයා) අරම් දොරින් නික්මෙන (මඩ සහිත) මගෙහි ගව හිස් කබලක් අතුරන ලදී (ආජානීය අශ්ව වාහනාදිය ලැබීමෙන්) එකල තමා කළ ස්වකීය කර්මයේ විපාකය විඳිමි. පූර්ව කර්මයාගේ මේ විපාකයයි.

**2692** ආජානීය අශ්වයෝද වාතවේගයෙන් දිවියහැකි වාත ජව අශ්වයෝද සෛන්ධව අශ්වයෝද යන සීඝ්‍ර වාහන (සම්පත්) අනුභව කරමි. මේ සියල්ල ගව හිස් කබල (සංඝයාගේ ගමන් පහසුව සඳහා) දැමීමේ විපාකයයි.

**2693** පුණ්‍යකර්මය ආශ්චර්‍ය්‍යයයි මා විසින් සරුකෙතෙහි කරන ලද (මෙය) උතුම් පුණ්‍යකර්මයකි. සංඝයා විෂයෙහි කරන ලද උපකාරය හා සසඳනවිට අනික් සත්කාරයක් (ඉන්) කලාවකටද නොඅගී.

**2694** "මම මින් සිව් අනූවන කපෙහි යම් ගව හිස් කබලක් අතුළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ගමන් පහසුව ඇතිවනසේ සංඝයා සඳහා ගෙරි හිස්කබල ඇතිරීමේ මේ විපාකයයි.

**2695** "පන් සැත්තෑවන කපෙහි මහත් බල ඇති අතිශය තදවත් සුප්පතිට්ඨිත නම් එක් සක්විති රජෙක් වීමි. 2696

## 296 පාදපූජක ථෙරාපදානය

**2697** "එකල්හි (මම) හිමවත් පව්වෙහි කිඳුරෙක් වීමි. (එහිදී) පීත වර්ණ රැස් ඇති (උදා) හිරුමෙන් බබළන බුදු රජුන් දීටිමි

**2698** "(තමා සිටින තැනට) වැඩියාවූ ලොක නායකවූ ඒ විපස්සී බුදුරජුන් (දැක) මම ශ්‍රී පාදයෙහි සඳුන් ද තුවරලාද ඉස්සෙමි.

**2699** "මින් එක් අනූවන කපෙහි යම් ශ්‍රීපාද පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ශ්‍රීපාද පූජාවෙහි මේ විපාකයයි. 2700

## 297 දෙසකිත්තක ථෙරාපදානය

**2701-2** 'එකල්හි මම 'උපසාළ්හක' නම් බමුණෙක් වීමි. මහවනයට පිවිසි ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ ලොකයාගේ

පූජාවන් පිළිගන්නාවූ බුදුරජුන් දැක ශ්‍රීපාදයන් වැන්දෙමි. පහන් සිත් ඇති මා ගැන දැන බුදුරජතෙම අතුරුදන් විය.

**2703** "වනයෙන් නික්ම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහි කෙළෙමි. (බුදුරජුන් වැඩමවූ) එම දෙසට පසසා මම කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටුවීමි

**2704** "මින් දෙයානූවක කපෙහි බුදුරජුන් වැඩමවූ යම් දෙසකට පැසසුයෙම්ද. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පැසසීමෙහි මේ විපාකයයි. 7705

## 298 සරණගමණීය ථෙරාපදානය

**2706** "මම හිමවත් පව්වෙහි වැද්දෙක් වීමි. ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ විපස්සී බුදුරජුන් දිටිමි.

**2707** "මම සම්බුදුරජුන් වෙත එළඹ වතාවත් කෙළෙමි. ද්විපදොත්තමවූ තාදී ගුණ ඇති බුදුරජුන්ගේ සරණ ද ගියෙමි.

**2708** "මම මින් එක්අනූවන කපෙහි බුදුරජුන් සරණ කොට ගියෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මේ සරණාගමනයෙහි විපාකයයි. 2709

## 299 අම්බපිණ්ඩිය ථෙරාපදානය

**2710** 'මම (එකල්හි) නමින් රොමස නම් වීමි 'දානමං' යයිද ප්‍රසිද්ධවූයේ වෙමි. ඒ මා විසින් විපස්සී බුදුරජුන්හට අඹගෙඩියක් දෙනලදී.

**2711** "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම් අඹ දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අඹ දනෙහි මේ විපාකයයි. 2712

## 300 අනුසංසාවක ථෙරාපදානය

**2713** "මම පිඬු පිණිස හැසිරෙන්නාවූ විපස්සි බුදු රජුන් දුටිමි. ද්වීපදොත්තමවූ තාදී ගුණ ඇති (එම බුදුරජුන්හට සැන්දක් පමණවූ භික්ෂාව දුනිමි.

**2714** "මම එකල්හි පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ වැන්දෙමි. උත්තමාර්ථයවූ නිවනට පැමිණීම පිණිස බුදුරජුන්හට පැසසීමි.

2715 "මින් එක්අනූවන කපෙහි (මම බුදුරජුන්හට) පැසසීමි. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පැසසීමෙහි මේ විපාකයයි. 2716

# 31 පදුම කෙසර වග්ග.

## 301 පදුම කෙසරිය ථෙරාපදානය.

2717 "මම පෙර (ප්‍රත්‍යෙක බුද්ධ) ඍෂි සමූහයා අතුරෙහි මාතංග හස්ති කුලයෙහි උපන් චණ්ඩ නම් හස්තියෙක් වීමි. පසේ බුදුවරුන්වහන්සේලාට පැහැදී පියුම්කෙසරු විසිරවීමි.

2718 "කම්පා කරනලද කෙලෙස් ඇති තාදි ගුණ ඇති ඒ පසේ බුදුවරුන් වහන්සේලා කෙරෙහි සිත පහදවා මම කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටුවීමි.

2719 "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි පියුම් කෙසුරු විසිරවීම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි. 2720.

## 302 සබ්බගන්ධිය ථෙරාපදානය

2721 "විපස්සි බුදුරජුන්හට මා විසින් සුවඳ මල් දෙන ලදී. එසේම කාය වංකාදියෙන් තොර බැවින් ඍජුවූ උන්වහන්සේට උතුම් කොසෙය්‍ය වස්ත්‍රයක් ද දුනිමි.

2722 "මින් එක්අනූවන කපෙහිවූ ඒ අතීතයෙහි යම් වස්ත්‍ර දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ගන්ධ දානයෙහි මේ විපාකයයි.

2723 "මින් පසළොස්වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'සුචල' නම් සක්විති රජෙක් වීමි. 2724.

## 30 පරමන්නදායක ථෙරාපදානය

2725 "කිණිහිරි රුකක් මෙන්ද, උදාවන හිරු මෙන්ද, බබලන ලොකජෙ‍්‍යෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ විපස්සී බුදුරජුන් දිටිමි.

2726 "මම ඇඳිලි බැඳ (එම බුදුරජුන්) සිය ගෙදොරට වැඩමවීමි. වැඩමවා සම්බුදු රජුන්හට උතුම් ආහාර දුනිමි.

2727 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි උතුම් ආහාර දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. උතුම් ආහාර දානයාගේ මේ විපාකයයි. 2728.

## 304 ධම්මසඤ්ඤක ථෙරාපදානය

2729 "ලොක ජ්‍යෙෂ්ඨවූ නර ශ්‍රෙෂ්ඨවූ බුදුරජුන් බෝ රුක් මුල සිටියදීම නොහොත් බුදුරජුන් බෝරුක මුල සිටිනා කල්හි මෙන් සිතා (කරන) විපස්සි බුදුරජුන්ගේ මහා බොධි පූජාවක් විය.

2730 "එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා විසින් පිරිවරන ලදුයේ අභීත වචනයෙන් චතුස්සත්‍යය වදාරණසේක

2731 "විවට කළ කෙලෙස් සෙවෙනි ඇති එම බුදුරජ තෙම සංක්ෂිප්තවද විස්තරවද (දහම්) දෙසමින් මහජනයා නිවනට පැමිණවිය.

2732 "මම ලොක ජ්‍යෙෂ්ඨවූ නර ශ්‍රෙෂ්ඨවූ උන්වහන්සේගේ ධර්මය අසා (එම) ශාස්තෲන්වහන්සේගේ පා වැඳ උතුරු දිගට මුහුණ ලා ගියෙමි.

2733 "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම් ධර්මයක් ඇසූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ධර්ම ශ්‍රවනයෙහි මේ විපාකයයි.

2734 "මින් තෙතිස්වන කපෙහි මහත් බල ඇති පෘථිවීශ්වරවූ 'සුතවා' නම් සක්විති රජෙක් වීමි. 2735

## 305 ඵලදායක ථෙරාපදානය

2736 "එකල්හි භාගීරථී නදී තීරයෙහි අසපුවක් විය. මම පලතුරු ගත් අත් ඇත්තේ බලාපොරොත්තු සහිත වූයේ එම අසපුවට ගියෙමි.

2737 "එහිදී පීතවර්ණ රැස් ඇති (උදාවන) හිරු මෙන් (බබලන්නාවූ) විපස්සි බුදුරජුන් දිටිමි. මා ලඟ යම් ඵල වර්ගයක් වීද, ඒ සියළු ඵල මම බුදුරජුන්හට දුනිමි.

2738 "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 2739

## 306 සම්පසාදක ථෙරාපදානය

2740 "බුද්ධ වීරයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා (ඔබ) සියලු ස්කන්ධ ධාතු ආයතනයන්ගෙන් මිදුනේ වෙහිය. මම දුකට පැමිණියේ වෙමි. ඒ මට පිහිටවනු මැනවි.

2741 "ලොකයෙහි අනුපම පුද්ගලවූ සිද්ධාර්ථ බුදුරජ තෙමේ ඕහට මෙසේ වදාළේය. සංඝතෙමේ මහසයුර මෙන් ගැඹුරු ගුණ ඇත්තේය. අපමණ ගුණ ඇත්තේය අනුත්තරවූ ගුණ ඇත්තේය.

2742 "අනන්ත විපාක දෙන්නාවූ (කෙළෙස්) රජස් සහිත (පුණ්‍ය) ක්ෂෙත්‍රවූ සංඝයා කෙරෙහි සිත පහදවනු මැනව. එහි කුසල් නමැති මහබිජුවටද රොපණය කරනු මැනව" කියායි

2743 "ලොක ජ්‍යෙෂ්ඨවූ නර ශ්‍රෙෂ්ඨවූ සර්වඥතෙමේ මෙය වදාරා මට මෙසේ අනුශාසනා කොට අහසට නැංගේය.

2744 "නරශ්‍රෙෂ්ඨ වූ බුදුරජුන් වැඩම වූ නොබෝ වේලාවකින් මම මරණයට පැමිණියේ තුසිතයෙහි ඉපදුනිමි.

2745 එකල්හි මම (කෙලෙස්) රජස් විරහිත අනන්ත ඵලදායකවූ සංඝයා කෙරෙහි සිත පහදවා කල්පයක් ස්වර්ගයෙහි සතුටු වීමි.

2746 මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි (සංඝයා කෙරෙහි) යම් ප්‍රසාදයක් ලැබුයෙම්ද (ඒ හෙතුවෙන්) දුගතියක් නොදනිමි. (සංඝයා කෙරෙහි) පැහැදීමෙහි මේ විපාකයයි. 2747

## 307 ආරාමදායක ථෙරාපදානය

2748 'මා විසින් සිදුහත් බුදුරජුන්හට ආරාමයක් රෝපනය කරනලදී. රුක් සෙවන වැඩෙන කල්හි පක්ෂීන් (කැදලිවලට වී) සන්සුන් වන කල්හි (සවස් කල්හි)

2749 "ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ (කෙලෙස්) රජස් විරහිත බුදු රජුන් දිටිමි. (දැක) ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ බුදුරජුන්හට අරම පිළිගන්වීමි.

2750 "මම සතුටුවූයේ සතුටු සිතින්ම ගෙඩිද මල්ද (උන්වහන්සේට) පිදීමි. ඉක්බිති හටගත් ප්‍රසාදයද එම වන (ආරාම)යද වර්ධනය කෙළෙමි.

2751 "පැහැදි සිතින් බුදුරජුන්හට යම් මේ ආරාම දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) භවයෙහි උපදින කල්හි මට ඵලවර්ග නොහොත් එම කුශල ඵලය උපදී.

2752 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් ආරාම දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ආරාමදානයාගේ මේ විපාකයයි.

**2753** මෙයින් තිස්පස්වන කපෙහි සත්රුවනින් යුත් මුදුසීතල නම් සත් සක්විති රජවූහ. 2754

## 308 අනුලෙපදායක ථෛරාපදානය

**2755** "මම අත්ථදස්සී බුදුරජුන්ගේ ශ්‍රාවකයෙක් දුටිමි. සීමාවක තවකම් කරද්දී මම එතනට එළඹියෙමි.

**2756** "පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ නිරුත්තරවූ පුණ්‍යක්ෂෙත්‍ර සංඛ්‍යාත සංඝයා කෙරෙහි පැහැදි සිතින් නව කර්ම නිමි කල්හි මම එහි සුණු ආලේප කෙළෙමි.

**2757** "මින් එක්දහස් අටසිය කපෙහිවූ එකල්හි යම් (සුධාලේපන) කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. අනුලේප දානයාගේ මේ විපාකයයි.) 2758

## 309 බුද්ධ සඤ්ඤක ථෛරාපදානය

**2759 2760** "සියක් රැස් ඇති පීතවර්ණ රශ්මියෙන් යුත් උදාවන හිරු වැනි වනයට පිවිසි ලොක "ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ සිද්ධාර්ථ බුදුරජුන් සිහිනෙන් දුටිමි. මම එහි (බුද්ධාළම්බනයෙහි) සිත පහදවා සුගතියෙහි උපනිමි.

**2761** "මින් සිව් අනූවන කපෙහිවූ කල්හි බුද්ධාරම්මණයක් ලැබුයෙම්ද, ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ සංඥාවෙහි (බුද්ධාළම්බන ප්‍රිතියෙහි) මේ විපාකයයි-2762

## 310 පබ්භාරදායක ථෛරාපදානය

**2763** "මා විසින් සිදුහත් බුදුරජුන්හට ගිරි ගුහාවක් පිරිසිදු කරන ලදී. තාදී ගුණ ඇති බුදුරජුන්ගේ පරිභොගය පිණිස (පැන්) කළයක්ද එලවා තැබීමි.

**2764 2765** 'මහාමුනිවූ පියදස්සී බුදුරජ තෙමේ "මට ඒ කරුණ මෙසේ ප්‍රකාශ කළේය. (කෙසේද යත්?) දහසක් කොටස් බෙදුම් ඇති සියයක් ගොලාකාර මුදුන් ඇති ධජයන්ගෙන් යුත් කොළවන්වූ ඒ මහාප්‍රාසාදයද අපමණවූ රුවන් ද නිපදින්නේය කියායි. (මෙසේ) ගිරිගුහා දානය දී කල්පයක් ස්වර්ගයෙහි සතුටු වීමි.

**2766** "මින් දෙතිස්වන කපෙහි මහත් බල ඇති සත් රුවනින් යුත් "සුසුද්ධ" නම් සක්විති රජෙක් වීමි. 2767

# 32 ආරක්ඛදායක වග්ග.

## 311 ආරක්ඛදායක ථෙරාපදානය

2768 "ධම්මදස්සී බුදුරජුන්හට මා විසින් වැටක් කරවන ලදී. තාදීගුණ ඇති (එම) ද්විපදොත්තමයන් වහන්සේට මා විසින් ආරක්ෂාවද දෙන ලදී.

2769 "එක් දහස් අටසියවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද එම කර්ම විශෙෂය කරණ කොට ගෙන මාගේ (කාමාදී) ආශ්‍රවක්ෂයට පැමිණියේය. 2770

## 312 භොජනදායක ථෙරාපදානය

2771 "මැනවින් වැඩුනු තරුණ සල්ගසක් මෙන්ද, උස්ව නැගුණාවූ මුරුංගා ගසක් මෙන්ද, අහසෙහි දේ දුන්නක් මෙන්ද බුදුරජතෙම හැමකල්හිම බබළයි.

2772 "මහර්ෂිවූ දෙවාති දේවවූ ඒ වෙස්සභූ බුදුරජුන් හට මම පැහැදි සිතින් බොජුනක් දුනිමි.

2773 "එය පිළිගත් සියල්ල තෙමේම අවබොධ කළාවූ පස්මරුන් ජයගත් බුදුරජ තෙම මට අනුමෝදනා දහම් දෙශනා කෙළේය. (කෙසේද යත්?) 'භවයෙහි උපදනා කල්හි ඔබහට (මෙහි) පුණ්‍ය ඵලය ලැබේවායි කියායි.

2774 "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිමි. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. භොජන දානයාගේ මේ විපාකයයි.

2775 "මින් පස්විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති 'අමත්තාභ' නම් සක්විති රජෙක් වීමි. 2776

## 313 ගතසඤ්ඤක ථෙරාපදානය

2777 "අති ලඤ්ජස නම්වූද අම්බර නම්වූද අහසෙහි පියවර නැත. එම අහසෙහි වඩින්නාවූ සිදුහත් බුදුරජුන් දුටිමි.

2778 "සුළඟින් සෙලවෙන්නාවූ සම්බුදුරජුන්ගේ සිවුර දැක (එසේම) උන්වහන්සේගේ ගමනද දැක බුදුරජුන් කෙරෙහි එකෙනෙහි මාගේ ප්‍රීතිය හටගත්තේය.

2779 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් (බුදු රජුන්ගේ ගමන පිළිබඳ) සංඥාවක් ලැබුයෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධසංඥාවෙහි මේ විපාකයයි. 2780

## 314 සත්තපදුමිය ථෙරාපදානය

2781 "මම ගංවුරෙහි 'නෙසාද' නම් බමුණෙක්ව පියුම් මලින් අසපුව හැමද වෙසෙමි.

2782 "අහසින් වඩින ලොකනායකවූ ස්වර්ණ වර්ණවූ සිද්ධාර්ථ බුදුරජුන් දැක මට ප්‍රීතිය පහළ විය.

2783 "ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ සම්බුදුරජුන් වෙත පෙර ගමන් කොට අසපුවද පිළිගන්වා උතුම් නෙළුම් වලින් පිදීමි.

2784 "මින් සිව්අනූවන කපෙහිවූ යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි

2785 "මින් එක් විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති "පාදපාචර" නම් සිව් සක්විති රජ කෙනෙක් වූහ. 2786

## 315 පුප්ඵාසනදායක ථෙරාපදානය

2787 "නුදුරෙන් වඩින්නාවූ ස්වර්ණ වර්ණවූ සියක් රැස් ඇති හිරුමෙන් (බබලන්නාවූ) පස් මරුන් දිනූ සිද්ධාර්ථ බුදු රජුන් දිටිමි.

2788 "(දැක උන්වහන්සේට පෙර ගමන් කොට (මාගේ) අසපුවට පමුනුවා) පැහැදි සිතින් මා විසින් පුෂ්පා සනයක් දෙන ලදී.

2789 "එකල්හි මම හටගත් ප්‍රීති ඇත්තේ ඇඳිලි බැඳ බුදුරජුන් කෙරෙහි සිත පහදවා එම පුණ්‍ය කර්මය දියුණු කෙළෙමි.

2790 "පස් මරුන් දිනූ බුදුරජුන් කෙරෙහි මා විසින් කරන ලද යම් පින්කමක් ඇද්ද, එම සියළුම කුශලය කරණ කොටගෙන ශාසනය කෙරෙහි පිරිසිදුවූ (රහත්) කෙනෙක් වෙමි.

2791 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි (යම්) පුෂ්පාසන දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්පාසන දානයාගේ මේ විපාකයයි. 2792

## 316 ආසනත්ථවික ථෙරාපදානය

2793 "ලොක බන්ධුවූ සිඛි බුදු රජුන්ගේ "උත්තම" නම් චෛත්‍යයක් විය එකල්හි මම ජන සඤ්චාර විරහිත මහ වෙනෙහි මංමුලාවූයේ (ඒ මේ අත) හැසිරෙමි

2794 "වනයෙහි නික්ම (යන) මා විසින් (එම බුදු රජුන්ගේ) ශ්‍රෙෂ්ඨ (බුද්ධ) ආසනය දක්නා ලදී. (උතුරු සළුව) එකස්කොට ඇඳිලි බැඳ ලොක නායකවූ බුදුරජුන්හට ස්තුති කෙළෙමි.

2795 "ලොකයෙහි අසහාය නායකවූ බුදුරජුන්හට දිවා (දවල් කාලය මුළුල්ලෙහි ස්තුතිකොට සොම්නස්වූයේ සොම්නස්වූ සිතින්ම මෙම වචන කීමි. (එනම්)

2796 "පුරුෂ ශ්‍රෙෂ්ඨයන් වහන්ස ඔබ වහන්සේට නමස්කාරවේවා, පුරුෂොත්තමයාණන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාරවේවා. ලොකජ්‍යෙෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, මහාවීරයන් වහන්ස, (ඔබ) සර්වඥවෙහිද කියායි.

2797 "මම බුද්ධාසනය නිමිති කිරීමෙන් සිඛී බුදු රජුන්ට ස්තුතිකොට (එම) බුද්ධාසනයට වැඳ උතුරුදිගට මුහුණ ලා ගියෙමි.

2798 "මින් එක්තිස් වන කපෙහි බුදු රජුන් හට ස්තුති කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ස්තුති කිරීමෙහි මේ විපාකයයි.

2799 "මින් සත්විසිවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති අතුල්‍ය නම් සක්විති රජකෙනෙක් වූහ 2800

## 317 සද්දසඤ්ඤක ථෙරාපදානය

2801 "දෙතිස් මහා පුරිස් ලකුණෙන් මනා දර්ශනය ඇති මහා වීරවූ සිඛී බුදුරජතෙම අමා දහම දෙසමින් ශ්‍රාවක සංඝයා විසින් පිරිවරන ලදුව උත්තම විහාරයෙහි වැඩ වෙසෙයි

2802 "එසේ ඒ මිහිරිවූ වචනයෙන් මහාජනයාට සංග්‍රහ කරන කල්හි දෙව්මිනිසුන් අතුරෙහි පැතිරීගිය දෙසුම් හඬද මහත් විය.

**2803** "(මෙසේ සිදුහත් බුදුරජුන්ගේ (දහම් දෙසන්නාවූ) මහත් ශබ්ද අසා එම් ශබ්දයෙහි සිත පහදවා ලොක නායකවූ බුදුරජුන්හට වැන්දෙමි.

**2804** "මින් සිව් අනූවන කපෙහි එකල්හි බුදුරජුන්ගේ මිහිරි හඬෙහි යම් ශබ්ද සංඥාවක් ලැබුවෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ සංඥාවෙහි මේ විපාකයයි. 2805

## 318 නිරාසිය ථෙරාපදානය

**2806** "ශ්‍රෙෂ්ඨ ජන්ම ඇති කෙශර සිංහයෙකු වැනිවූද පර්වතයෙහි (දිලිසෙන) ගිනිකඳක් වැනිවූද සියලු දිගින් බැබුළුනාවූ කඳු අතුරෙහි (වැඩහුන්) සිදුහත් බුදුරජුන් (දුටිමි.)

**2807** "(එම බුදුරජුන්ගේ) බුද්ධාලොකයද සූර්‍ය්‍යාලොකයද චන්ද්‍රා ලොකයද දැක මට ප්‍රීතිය පහළවිය.

**2808** "(මේ) ත්‍රිවිධ ආලොකයන් දැක අඳුන් දිවිසම එකස්කොට (හැඳ) ශ්‍රාවකොත්තමවූ ලොකනායකවූ බුදු රජුන්හට ස්තුති කෙළෙමි. (කෙසේදයත්?)

**2809** "ලෙව්හි ලොවතුළ පැතිරි අඳුරු දුරුකරන්නාවූ එළිපතුරුවන්නෝ තිදෙනෙක් වෙති. (එනම්) චන්ද්‍රයාද සූර්‍ය්‍යයාද ලොකනායකවූ බුදුරජද යන මේ තිදෙනායි.

**2810** "මා විසින් මෙසේ උපමා දක්වා මහා මුනිවූ බුදු රජ පසසන ලදී. බුදුරජුන්ගේ ගුණ ප්‍රකාශකොට කල්පයක් මුළුල්ලෙහි ස්වර්ගයෙහි සතුටුවීමි.

**2811** "මින් සිව් අනූවන කපෙහි යම් බුදුරජාණන් වහන්සේගේ ගුණ පැවසීමක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුදුගුණ පැවසීමෙහි මේ විපාකයයි.

**2812** "මින් එක් සැටවන කපෙහි සත් රුවනින් යුත් මහත් බල ඇති 'ඤාණධර' නම් සක්විති රජෙක් වීමි. 2813

## 319 කාන්දලී පුප්ඵිය ථෙරාපදානය

**2814-2815** "එකල්හි මම සින්ධු නදී තීරයෙහි අනුන්ගේ මෙහෙ කිරීමෙහි යෙදුනු ගොවියෙක් වීමි. අනුන්ගෙන් ලැබෙන වැටුපක් නොදක්නේ සින්ධු ගංඉවුරු දිගේ ගමන් කරන්නාවූ

මම පිපුණු නෙළුම් මලක් මෙන් සමාධියෙන් යුතුව හුන් සිදුහත් බුදුරජුන් දිටිමි.

2816 "මම එකල්හි කඳල මල් සතක් නටුවෙන් කඩා ආදිත්‍ය බන්ධු (සූර්‍ය්‍ය වංශයෙහි) වූ බුදුරජුන්ගේ සිරසෙහි (උඩට) දැමීමි.

2817 "සුදුසු තන්හි හෙවත් සුදුසු අරමුණෙහි එකඟවූ සිත් ඇති ස්වර්ණවර්ණවූ ත්‍රිමදගලින හස්තිරාජයෙකු වැනිවූ (ගුණයෙන් කිසිවෙකු විසින්) ලංවිය නොහැක්කාවූ,

2818 "ප්‍රඥාවත්වූ වඩන ලද ඉඳුරන් ඇති ඒ බුදුරජුන් වෙත එළඹ මම ශාස්තෘන් වහන්සේට ඇඳිලි බැඳ වැන්දෙමි.

2819 "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි විපාකයයි. 2820

### 320 කුමුදුමාලිය ථෙරාපදානය

2821-2822 "ශ්‍රෙෂ්ඨවූ, උතුම්වූ, වීරවූ, මහර්ෂිවූ පස් මරුන් දිනූ ශ්‍රෙෂ්ඨ ජන්ම ඇති කෙශර සිංහයෙකු වැනිවූ ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ මහමඟට පිළිපන් විපස්සී බුදුරජුන් (දිටීමි.) දැක කුමුදු මල් ගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට පිදීමි.

2823 "මින් එක්අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 2824

## 33 උම්මා පුප්ඵිය වග්ග

### 321 උම්මා පුප්ඵිය ථෙරාපදානය

2825 "සත්හුන් සමවත් පස්මරුන් පැරදවූ සමාධි බලයෙන් සමීපයට වැඩමවූ මනුෂ්‍යොත්තමවූ සිදුහත් බුදු රජුන් දිටිමි

2826 'දැක දිය බෙරලිය මල් ගෙන බුදුරජුන්හට පිදීමි. සියළු මල් එක එක සමව ලං ලංව හැපුනාහු නටු උඩුකුරු වූවාහු පෙති යටිකුරු වූවාහු

2827 "ඉතා පිවිතුරු වූවාහු අහසෙහි මල් ඇතිරියක් මෙන් සිටිකල්හි (ඒ පිළිබඳව ඇතිවූ) එම චිත්ත ප්‍රසාදය කරණකොට ගෙන මම තුසිත දෙව්ලොවට ගියෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2828 "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2829 "මින් පස්පණස්වන කපෙහි පෘථිවීශ්වරවූ මහත් බල ඇති සමන්තඡදන නම් සක්විති රජෙක් වීමි. 2830

## 322 පුලින පූජක ථෙරාපදානය

2831 "බබලන්නාවූ කුඹුක් ගසක් වැනිවූද ශ්‍රෙෂ්ඨ ආජානීයයෙකු මෙන්වූද ඔසධිතාරකාව මෙන් දිලිසෙන බබලන්නාවූ නරශ්‍රෙෂ්ඨ බුදුරජුන් දිටිමි.

2832-2833 (දැක) මම ශාස්තෲන්වහන්සේට ඇඳිලි බැඳ වැන්දෙමි. බුදුරජුන්ට පැසසීමි. ස්වකීය පුණ්‍ය කර්මයෙන් සතුටුවූයේ පිරිසිදු වැලිගෙන ඔඩොක්කුවෙහි ලාගෙන ගොස් විපස්සී බුදුරජුන් වැඩිය මගෙහි දැමීමි.

2834 "ඉක්බිති පැහැදි සිතින් ඉන් අඩක් වැලි බුදු රජුන් දවල් කල වෙසෙන) දිවා විහාරස්ථානයෙහි තාදී ගුණ ඇති තථාගතයන්හට පූජාවක් ලෙස) ඉසීමි.

2835 "මින් එක් අනූවන කපෙහි මම යම් වැලිඉසීමක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වැලි ඉසීමෙහි මේ විපාකයයි 2836

## 323 හාසජනක ථෙරාපදානය

2837 "ශාස්තෲන් වහන්සේගේ පවුල් සිවුර ගස් මුදුනක එල්බෙනු දැක මා විසින් ඇඳිලිබැඳ (එය) වඩාත් ඔසවන ලදී.

2838 "දුරදීම දැක මට සතුට පහළවිය. (ඉක්බිති) ඇඳිලිබැඳ වඩාත් සිත පැහැදවීමි.

2839 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් (බුදු රජුන්ගේ පවුල් සිවුර පිළිබඳ) පැහැදි හැඟීමක් ලැබුයෙම්ද (ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. බුදුරජුන් පිළිබඳ පැහැදි හැඟීමෙහි මේ විපාකයයි. 2840

## 324 යඤ්ඤසාමික ථෙරාපදානය

2841 "උපතින් සත් ඇවිරිදිවූ මම මන්ත්‍ර ශාස්ත්‍රයෙහි තෙරපතුයේ කුල පරපුර දැරීමි. මා විසින් යාගයක්ද මෙහෙය වන ලදී.

2842 "එකල්හි මගේ (යාගය උදෙසා) අසූසාර දහසක් සිවුපාවන් මරත්. (එම සිව්පාවෝ) යාගය පිණිස යූපස්තම්භය වෙත පමුණුවන ලද්දාහු පසෙක සිටියාහුස.

2843-2844 "උදාවන හිරු වැනිවූද, පසළොස්වක් දිනයෙහි සඳු වැනිවූද කිහිරඟුරු මෙන් බබලන පැහැපත් මුහුණු ඇත්තේ සතුටුවූ තුන්ලොකවාසීන් විසින් පුදන ලද (තිලොවට) හිතවත්වූ සර්වසම්පූර්ණ අදහස් ඇති සිදුහත් බුදුරජතෙම එතැනට එළඹ මෙම වචන වදාළේය. (කෙසේද යත්?)

2845 2846 'කුමරුවෙනි, සව්සත්නට හිංසා නොකිරීම මටරුචි කෙරේ, එසේම සොරකමින්ද. දුරාචාරයෙන්ද මත්පැන් බීමෙන්ද වැලැක්වත්, සමචරියාවෙහි ඇල්මත් බහු ශ්‍රැත බව හා කෘතඥ බවත් (මට රුචි කෙරේ) මේ ධර්මයෝ මෙලෙව්හිද පරලෙව්හිද ප්‍රශංසා කටයුත්තේ වෙත්.

2847 'මේ ධර්මයන් වඩා සව්සත්හට හිත වැඩෙහි ඇළුනේ බුදුරජුන් කෙරෙහි සිත පහදවා උතුම් මග (ප්‍රතිපදාව) වඩනු මැනව."

2848 "ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ සර්වඥතෙම මෙය වදාරා මටම අනුශාසනාකොට අහසට නැග වැඩම විය.

2849 "පෙර සිත පිරිසිදුකොට පසුව සිත පැහැදවීමි. මම එම චිත්ත ප්‍රසාදය කරණකොටගෙන තුසිත දෙව්ලොව උපනීමි

2850 මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් (බුදු රජුන් කෙරෙහි) සිත පැහැදවීමක් කෙළෙම්ද, ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. බුදුන් සිහිකොට සිත පැහැදවීමෙහි මේ විපාකයයි. 2851

## 325 නිමිත්ත සඤ්ඤක ථෙරාපදානය

2852 "මම චන්ද්‍රභාග නදීතීරයෙහි අසපුවක වෙසෙමි. මම වනයෙහි හැසිරෙන්නාවූ ස්වර්ණමෘගයෙක් දිටිමි.

2853 "එම ස්වර්ණ මෘගයා කෙරෙහි සිත පහදවා බුදු රජුන් සිහි කෙළෙමි එම චිත්ත ප්‍රසාදය කරණකොටගෙන අනක් බුදුවරයන්ද සිහිකෙළෙමි

2854 "අතීතයෙහි යම් බුදු කෙනෙක් වූවාහුද, වර්තමානයෙහි හා අනාගතයෙහි යම් බුදු කෙනෙක් වෙත්ද, ඒ

තෙකල්හිවූ බුදුවරුම මේ ස්වර්ණ මෘග රාජයා යම්සේද එසේම බබලත්.

**2855** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් බුදුවරයන් වහන්සේ කෙනෙක් සිතින් සිහිපත් කෙළෙම්ද, ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. ඒ බුදුවරුන් සිහිපත් කිරීමෙහි මේ විපාකයයි

**2856** 'මින් සත්විසිවන කපෙහි පෘථිවීශ්වරවූ මහත් බල ඇති අරඤ්ඤසත්ත නම් සක්විති රජෙක් වීමි. 2857

## 326 අන්නසංසාවක ථෙරාපදානය

**2858** "අතුරු අවුණෙහි (විථිය මැද) වඩින්නාවූ කසුන් ඇගෑවක් මෙන් බබලන දෙතිස් මහාපුරිස් ලකුණු යුත් රන්වන් බුදුරජුන් දිටිමි.

**2859** "සර්වාර්ථයෙන් සිදුකළ (කෙළෙස්වලින් වන) කම්පාවක් නොමැති පස්මරුන් පරදවා ජයගත් සිදුහත් බුදුරජුන් වැඩමවා එම මහාමුනිවූ සර්වඥයන් වහන්සේ වැළඳ වීමි.

**2860** "එකල්හි ලෙව්හි කාරුණිකවූ බුදුරජතෙම මා වෙත ආලොකය පැතිර විය. මම බුදුරජුන් කෙරෙහි සිත පහදවා කල්පයක් ස්වර්ගයෙහි සතුටු වීමි.

**2861** "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. භික්ෂූ දානයාගේ මේ විපාකයයි. 2862

## 327 නිග්ගුණ්ඩි පුප්ඵිය ථෙරාපදානය

**2863** "යම් කලෙක්හි ආයු පිරිහීයෑමෙන් දෙවියෙක් දෙව්ලොවින් චුතවයේද (එකල්හි) අනුමෝදනය කරන්නාවූ දෙවියන්ගේ ත්‍රිවිධශබ්ද කෙනෙක් පිටවී යෙත් (කෙසේද යත්?)

**2864** "පින්වත, මින් චුතව මනුෂ්‍යයන්ගේ සහභාවය වූ සුගතියට යනු මැනව. මිනිස්වූයේ සසුනෙහි උතුම්වූ ශ්‍රද්ධාව ලබව

**2865 2866 2667** ඒ ශ්‍රද්ධා තොමෝ බැසගන්නා ලදී. එහි හටගත් මුල් ඇත්තී මැනවින් පිහිටන ලද්දී විය යුතු වන්නීය. මනාකොට අවබොධ කරන ලද ධර්මයෙහි දිවි ඇති තාක්

නොපසු බටවූ කයින්ද වචනයෙන් සිතින්ද බොහෝ කුසල් කොට නිදුක්වූ (ක්ලේශොපධි රහිත බැවින් පිරිසිදුවූ (අත්බැව් සම්පත් හා භවභොග සම්‍යක් උපදනා) ඖපධිකවූ ඒ බොහෝ කුසල්ද කොට පරිත්‍යාගයෙන් යුතුව අනික් මිනිසුන්ද බ්‍රහ්මචරිය නම්වූ සද්ධර්මයෙහි පිහිටවනු මැනව, කියායි.

**2868** "නුවණැති දෙව්වරු (එසේ) චුතවන්නාවූ දෙවියනට දෙව්පුරයට නැවත එනු මැනවයි කියා මෙම අනුකම්පා වෙනුදු අනුමෝදනය (අනුව සතුටු කිරීම) කෙරෙත්.

**2869** "දිව්‍ය සමූහයා රැස්වූ කල්හි මට සංවෙගයක් ඇතිවිය. (කෙසේද යත්?) මම මින් චුතව කිනම් යොනියකට උත්පත්ති වශයෙන් යන්නෙම්ද කියායි.

**2870-2871** "වඩනලද ඉඳුරන් ඇති ශ්‍රමණයෙක් තෙම මාගේ දුක දැන මා ඒ දුකින් ගොඩනගනු කැමැත්තේ මාගේ සමීපයට පැමිණියේය. එකල්හි 'සුමන' නම්වූ ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක තෙම අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනකොට මා සංවේගයට පත් කෙළේය.

(දොළොස්වෙනි බණවරයි.)

**2872** "මම උන්වහන්සේගේ වචනය අසා බුදුරජුන් කෙරෙහි සිත පැහැද වීමි. ඒ ප්‍රාඥයන් වහන්සේට අභිවාදනය කොට මම එහි කළුරිය කෙළේ වෙමි.

**2873** "(එකී) කුශල මුලයෙන් මෙහෙයනලද මම එම දෙව්ලොවෙහි උපදින්නෙම් (ඉක්බිති) මව් කුසෙහි වසන්නේ නැවතත් මව්කුසින් දරයි.

**2874** "මම එම අත් බැවින් චුතව තව්තිසා දෙව්ලොව උපනිමි මම එකල්හි මේ අතරතුර කාලයෙහි දොම්නසක් නොදනිමි.

**2875** "තව්තිසා දෙව්ලොවින් චුතව මව්කුසක උපනිමි. මම මව්කුසින් බිහිව (ලදරු බැවින්) කළු සුදු (හෙවත් හොඳ නරක කුමක්දැයි) නොදනී.

**2876-2877** "මම උපතින් සත් ඇවිරිදි වයස් ඇත්තේ ආරාමයට පිවිසියෙමි. තාදිගුණ ඇති භාග්‍යවත්වූ ගෞතම කාශ්‍යප පුත්‍රයන් වහන්සේගේ බොහෝදෙනා විසින් මැනවයි

පිළිගත් සසුනයයි කියන ලද එම විසිතුරු ත්‍රිපිටක ධර්මයෙහි (දක්ෂව) බුදුරජුන්ගේ සසුන කරන්නාවූ භික්ෂූන් දුටිමි.

2878 "සැවැත් නම් නුවරෙක් විය. කොසොල් රජ තෙමේ එහිවී (එම කොසොල් රජතෙම) ඇතුන් යෙදූ රියකින් උතුම් බොධිය වෙත එළඹියේය.

2879 "මම එම රජුගේ ඇතා දැක පූර්වකර්මය සිහිකෙළෙමි මමද ඇඳිලි බැඳ එම සභාවට ගියෙමි.

2880 "උපතින් සත් ඇවිරිදිවූයේම අනාගායයී නම්වූ සසුනෙහි පැවිදිවීමි (එකල) සම්‍යක් බුදුරජුන්හට උවටැන් කෙළේද හේ (මේ) ආනන්ද නම් ශ්‍රාවක තෙමෙයි.

2881 "සිටි පියවරෙහිම සිට පද සැටදහසක් වුවද බුදු රජුන් වදාළ නියාවෙන්ම දැන ගැනීමෙහි සමත් බැවින් ගතිමත්වූද (බුද්ධ වචනය ඉගෙන ගන්නා වීයයීයද සජ්ඣායනය කිරීමෙහි වීයයීයද සිත්හි ලා දැරීමෙන් වීයයීයද ශාස්තෲන් වහන්සේට ද උවටැන් කිරීමෙහි වීයයීයද අන්හැම දෙනටම වඩා අධිකව ඇති බැවින් ධෘතිමත්වූද එසේම අන් හැමදෙනාටම වඩා බුදුවදන් සිත්හි ලා දැරීමෙහි සිහි ඇතිබැවින් ගතිමත්වූද (මෙම සසුනෙහි භාණ්ඩාගාරික පයයීාප්තියෙහිම සිට බුදුවදන් උගත් බැවින් බහුශ්‍රුතවූද (එම ආනන්ද ස්ථවිරතෙම) රජුගේ සිත පහදවමින් මහත් ආලොකයක් නික්මවිය.

2882 "මම උන්වහන්සේගේ ධර්මය අසා පූර්වකර්මය සිහිපත් කෙළෙමි. එහි හුන්නේම රහත් බවටද පැමිණියෙමි.

2883 "ඉක්බිති සිවුර එකස් කොට හිසෙහි ඇඳිලි බැඳ සම්බුදු රජුන් වැඳ මෙම වචනය කීමි. (කෙසේදයත්)

2884 "මම ශාස්තෘවූ ද්විපදොත්තමවූ පදුමුත්තර බුදු රජුන්ගේ සිහසුනෙහි (බුද්ධාසනයෙහි) නික මල්ගෙන තැබීමි.

2885 "ද්විපදොත්තමයන් වහන්ස, ලොකජෙ‍්‍යෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, එම (කුශල) කර්මය කරණ කොටගෙන ජය පරාජය දෙක හැර නිශ්චල ස්ථානයවූ නිවණට (රහත් බවට) පැමිණියේ වෙමි.

2886 "පස්විසි දහස්වන කපෙහි මනුජාධිපතිවූ අබ්බූද නිරබ්බූද නම්වූ අටසක්විති රජ කෙනෙක් වූහ. 2887

## 328 සුමනා වෙලිය ථෙරාපදානය

2888 "තාදී ගුණ ඇති ලොකජ්‍යෙෂ්ඨවූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට ඒ සියලු ජනයෝ එක්ව මහාපූජාවක් කෙරෙත්.

2889 "මම එකල්හි දෑසමන් මල්වලින් මල් දමක්ද සුණු පිඩක්ද කොට බුද්ධාසනය ඉදිරියෙහි නගා තැබීමි.

2890 "සියළුදෙන එක්ව උතුම් මල් දෙස බලත්. තාදී ගුණ ඇති බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට කවරෙකු විසින් මේ මල්පුදන ලදදැයි (අසත්)

2891 "මම එම චිත්ත ප්‍රසාදය කරණකොට ගෙන නිර්මාණරතී දිව්‍ය ලොකයෙහි උපනිමි. පෙර තමා විසින් කරන ලද පුණ්‍ය කර්මය (පිළිබඳ විපාකය) අනුභව කෙළෙමි.

2892 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදිම් ද, (ඒ හැම තැන්හිම) සියළු දෙනාම ප්‍රිය වෙමි. පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි.

2893 "සන්හුන් ඉඳුරන් ඇති තවුසනට කයින් හෝ වචනයෙන් හෝ යලි සිතින් හෝ මා විසින් කරණ ලද නින්දාවක් ගැන නොදනිමි

2894 "මම එම සුචරිතය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධීන් (ප්‍රාර්ථනා) කරණකොට ගෙනද සියළුදෙනා විසින් පුදන ලද්දෙක් වෙමි. (තවුසනට) ආක්‍රොෂ නොකිරීමෙහි මේ විපාකයයි

2895 "මින් එක් තිස්වනු කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2896 "මින් එකොළොස් වන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති සහස්සාර නම් සක්විති රජෙක් වීමි. 2897

## 329 පුප්ඵ ඡත්තිය ථෙරාපදානය

2898-2899 "තාදී ගුණ ඇති ලොක ජ්‍යෙෂ්ඨවූ සත්වයන් නිවනට පමුණුවන්නාවූ සත්‍යය දෙශනා කරන්නාවූ භාග්‍යවත්වූ සිද්ධාර්ථ බුදුරජුන්හට දියෙහි හටගත් මනරම් නෙළුම්මල් ගෙනවුත් පුෂ්ප ඡත්‍රයක් (මල් කුඩයක්) කොට පිදීමි.

**2900** "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ ත්‍රිවිධ ලොකයට අවබොධ කළ ශාස්තෘවූ සිද්ධාර්ථ බුදුරජ තෙමේ භික්ෂු සංඝයා මැද වැඩ සිටියේ මෙම ගාථාවෙන් වදාළේය (කෙසේද යත්)

**2901** "යමෙක් මාගේ සිත පහදවා මල්සැතක් (කුඩයක්) කරවිද, හෙතෙම එම සිත පැහැදවීම කරණකොට ගෙන දුගතියක නොයයි (කියායි).

**2902** "ලොකනායකවූ සිද්ධාර්ථ බුදුරජ තෙමේ මෙය වදාරා පිරිස මෙහෙයවා අහසට නැංගේය.

**2903** "නරදෙවවූ බුදුරජුන් නැගී ගිය කල්හි සේසතද නැගී ගියේය. බුදුරජුනගේ ඉදිරියෙහි උතුම් ඡත්‍රයද යෙයි.

**2904** "මින් සිව් අනූවන කපෙහිවූ යම් ඡත්‍රයක් පිදුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුෂ්ප ඡත්‍ර (මල් කුඩ) පූජාවෙහි මේ විපාකයයි.

**2905** 'සූසැත්තෑවන කපෙහි සත්රුවනින් යුත් මහත් බල ඇති ජලසිඛ නම් අටසක්විති රජ කෙනෙක් වූහ. 2906

## 330 සපිරිවාර ඡත්තදායක ථෙරාපදානය

**2907** "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජතෙමේ අහසෙහි දියවැස්සක් මෙන් දහම් වැසි වස්වයි.

**2908** "අමා පිය (නිර්වාණ ධර්මය) දෙසන්නාවූ එම සම්බුදුරජුන් දුටිමි. (දැක) සිය සිත පහදවා තම ගෙට ගියෙමි.

**2909** "අලංකාර කරන ලද ඡත්‍රයක් (කුඩයක්) ගෙන නරොත්තමවූ බුදුරජුන් වෙත එළඹියෙමි. සතුටුවූයේ සතුටු සිතින් මම (එය) අශයෙහි දැමීමි

**2910** "මැනවින් සකස්කළ යානයක් මෙන්ද දැමුණු උතුම් ශ්‍රාවකයෙකු මෙන්ද, සම්බුදුන් වෙත එළඹ හිස මතුයෙහි (උඩ) පිහිටියේය.

**2911** "ලොවට අනුකම්පා කරන්නාවූ කාරුණිකවූ ලොකාග්‍රනායක බුදුරජතෙමේ භික්ෂු සංඝයා මැද හිඳ මෙම ගාථාවන් වදාළේය. (කෙසේද යත්)

**2912** "යමෙකු විසින් අලංකාර කරන ලද මනරම්වූ මේ ඡත්‍රය (කුඩය) දෙන ලදද, එම සිත පැහැදවීම කරණ කොට ගෙන හෙතෙම දුගතියට නොයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2913 "දෙවියන් අතුරෙහි සත්වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. දෙතිස්වරක් සක්විති රජ වන්නේය.

2914 'කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ ගෞතම නම්වූ ශාස්තෘතෙමේ ලොව පහළ වන්නේය.

2915 "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදවූ ධර්මයෙන්ම කොට නිමකළාක් වැනි ඖරස බුද්ධ පුත්‍රයෙක්ව සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥා වශයෙන් දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය කියායි.

2916 "මම වදාරණ ලද එම අභීත වචන බුදුරජුන්ගේ හඬයයි දැන පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ වැඩියක්ම සතුටු ඉපදවීමි.

2917 'මිනිස් අත්බව අත්හැර දෙව් අත්බවට පැමිණියෙමි මට මනරම්වූ උතුම් විමානයක් පැනනැගුනේය.

2918 "විමානයෙන් (පිටතට) නික්මෙන්නාවූ මට සේසතක් දරයි. එකල්හි සිහි ලැබීමි. පූර්වකර්මයාගේ මේ විපාකයයි.

2919 දෙව්ලොවින් චුතව මිනිසත් බවටද පැමිණියෙමි. මින් සත් සියවන කපෙහි සවරක් සක්විති රජෙක් වීමි.

2920 "එම (මිනිස්) කයින් චුතව තිදස්පුරයට පැමිණියෙමි. පිළිවෙලින් (එහි) හැසිර නැවත මිනිසත් බවට පැමිණියෙමි.

2921 "මව්කුසෙහි පිළිසිඳ ගත් මට සේසත් දරුවාහුය උපතින් සත් ඇවිරිදි කල්හි මම අනගාර්‍ය්‍ය නම්වූ සසුනෙහි පැවදිවීමි.

2922 "මන්ත්‍ර ශාස්ත්‍රයෙහි පරතෙරට ගියාවූ ඒ සුනන්ද නම් බමුණු තෙමේ පළිඟු සතක් (කුඩයක්) ගෙන අග්‍ර ශ්‍රාවකයන් වහන්සේට දුන්නේය.

2923 "මහාවීරවූද මහා කථිකවූද ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ අනුමොදනාව කෙළේය උන්වහන්සේගේ අනුමොදනාව අසා පූර්ව (කුශල) කර්මය සිහිකෙළෙමි.

2924 "ඇඳිලි බැඳගෙන සිය සිත පැහැදවීමි. පූර්ව (කුශල) කර්මය සිහිකොට රහත් බවට පැමිණියෙමි.

2925 "(මම) එම අසුනෙන් නැගිට හිසෙහි ඇඳිලි බැඳගෙන සම්බුදුරජුන් හට වැඳ මෙම වචන කීමි (කෙසේදයත්)

**2926** 'මින් සියක් දහස් (ලක්ෂයක්) වන කපෙහි ලෙව්හි (උත්තරීතර කෙනෙක් නැති බැවින්) අනුත්තරවූ චතුරාය්‍ය‍ී සත්‍යය අවබොධ කළාවූ (ත්‍රිවිධ) ලොකය මැනවින් දත් ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජ තෙම (ලොව පහළවිය.)

**2927** "මා විසින් විසිතුරුවූ මනාව අලංකාර කරන ලද ඡත්‍රයක් උන්වහන්සේට දෙන ලදී. සියල්ල තෙමේම අවබෝධ කළාවූ අග්‍රපුද්ගලවූ සර්වඥතෙම දොහොතින් (එම) පිළිගත්තේය.

**2928** 'බුදුරජතෙම ආශ්චය්‍ය‍ීයෙකි. ධර්මය ආශ්චය්‍ය‍ීයකි. අපගේ ශාස්තෘ සම්පත්තියද ආශ්චය්‍ය‍ීයකි. මම එක ඡත්‍රයක් (කුඩයක්) දීම කරණකොට ගෙන දුගතියක නොඉපදුනිමි.

**2929** මාගේ ක්ලේශයෝ දවන ලදහ. සියළු භවයෝ නසන ලදහ. සියළු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥා වශයෙන් දැන ආශ්‍රව රහිතව (රහත්ව) වෙසෙමි. 2930

# 34 ගන්ධධූපිය වග්ග.

## 331 ගන්ධධූපිය ථෙරාපදානය

**2931** "මම සිදුහත් බුදුරජුන්හට සුවඳ දුමක් දුනිමි. සමන් මල්වලින් වසනලද එය බුදුරජුන්හට සුදුසුවූවක් වෙයි.

**2932** "(මෙසේ) කසුන් ඇගෑවක් මෙන් බබලන්නාවූ නිළුපුල් මලක් මෙන් දිලිසෙන්නාවූ ඇවිලෙන ගින්නක් වැනිවූ

**2933** "උතුම්වූ ශ්‍රෙෂ්ඨ ව්‍යාඝ්‍රයෙකු වැනි, විශිෂ්ට ජන්ම ඇති (ජාතිමත්) කෙශරසිංහයෙකු මෙන්වූ ශ්‍රමණයන්ට අග්‍රවූ භික්ෂු සංඝයා පිරිවරාගෙන හුන්නාවූ (එම සිදුහත් බුදුරජුන්)

**2934** "දැක සිත පහදවා ඇඳිලි බැඳ ශාස්තෘන් වහන්සේගේ සිරිපා වැඳ උත්තරදිශාභිමුඛව (උතුරු දෙසට හැරී) ගියෙමි.

**2935** "සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් සුවඳ දුමක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සුවඳ දුම් පිදීමෙහි මේ විපාකයයි. 2936

## 332 උදක පූජක ථෙරාපදානය

**2937** "දිලිසෙන ගින්න මෙන්වූ ඇවිලගත් අග්නිය වැනි අහසෙහි වඩින්නාවූ රන්වන්වූ සම්බුදුරජුන් දුටිමි.

2938 (දැක) මම අතින් දිය ගෙන අහසෙහි දැමීමි. මහා වීරවූ කාරුණිකවූ සර්වඥ ඍෂිතෙමේ (එය) පිළිගත්තේය.

2939 "අහසෙහි වැඩ සිටියාවූ පදුමුත්තර නම් ශාස්තෘ තෙමේ මාගේ අදහස් දැන මෙම ගාථාව වදාළේය.

2940 "මේ ජලදානය කරණකොට ගෙනද (බුදුරජුන් කෙරෙහි) ප්‍රීතිය ඉපදවීම. කරණකොට ගෙනද කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නූපදින්නෙහිය කියායි.

2941 "ද්විපදොත්තමයන් වහන්ස, ලොක ජ්‍යෙෂ්ඨයන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයන් වහන්ස, එම කර්මය කරණකොට ගෙන ජය පරාජය දෙකම හැර අචලස්ථානයවූ (නිවනට) පැමිණියේ වෙමි.

2942 "හදාස් පන්සියවනු කපෙහි (සිව් සයුර හා සිව් මහ දිවයින් කෙළවරකොට ඇති පෘථිවියෙහි අධිපතිවූ ජනාධිපතිවූ සහස්සරාජ නම්වූ සිව් සක්විති රජකෙනෙක් වූහ. 2943

## 333 පුන්නාග පුප්ඵිය ථෙරාපදානය

2944 "වැද්දෙකුවූ මම මහවනයට පිවිස වෙසෙමි. පිපුණු දොඹගසක් දැක බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත් කෙළෙමි.

2945 "සුවදැති මිහිරි සුවඳ කැවුනු එම මල් නෙලා වැල්ලෙහි සෑයක් කොට බුදුරජුන්හට පිදීමි.

2946 "මින් දෙ අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

2947 "එක් අනූවන කපෙහි අඳුරු දුරුකරන්නාවූ සත් රුවනින් යුත් මහත් බල ඇති එක් සක්විතිරජෙක් වීමි 2948

## 334 එකදුස්සදායක ථෙරාපදානය

2949 "(එකල්හි මම) හංසවතී නගරයෙහි තෘණහාරකයෙක් (තණ කපා එකතුකොට විකුණන්නෙක්) වීමි තණ එක්කොට විකිණීමෙන් කරන තෘණහාරක කර්මයෙන් ජීවත් වෙමි එයින්ම (අඹු) දරුවන්ද පොෂණය කරමි.

2950 "සියළු ධර්මයන්ගේ පරතෙරට ගියාවූ ලොක නායකවූ පදුමුත්තර බුදුරජතෙම (මොහ නමැති) ගණඳුර නසා (ලොව) පහළවිය.

**2951** "මම එකල්හි ස්වකීය ගෘහයෙහි හිඳ මෙසේ සිතීමි. (කෙසේද යත්?) බුදුරජතෙම ලොව පහළවිය. මට උන්වහන්සේහට දියයුතු දෙයක්ද නැත.

**2952** 'මේ මාගේ එකම සළුවයි. මට කිසි දායකයෙක් (දෙන කෙනෙක්) නැත. නිරයෙහි ස්පර්ශය දුකය. දක්ෂිණාවක් දානමය චෙතනාව නමැති කුසල් බිජුවක් රොපනය කරන්නෙමි. (හිඳුවන්නෙමි) කියායි.

**2953** "මම මෙසේ සිතා සිය සිත පැහැදවීම. මම (ඒ) එකම වස්ත්‍රය ගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට පිදීමි.

**2954** "එම එකම වස්ත්‍රය දී අත්පොලසන්හඬ පැවැත් වීමි. ඉදින් වීරයන් වහන්ස, ඔබවහන්සේ බුදුවරයෙක් වන සේක්නම් මහා මුනීන් වහන්ස, මා සසර සයුරින් එතර කරනු මැනවයි කීමි

**2955** "ලොකයාගේ පූජාවන් පිළිගත්තාවූ පදුමුත්තර බුදුරජ තෙමේ මාගේ දානය පසසමින් මට අනුමොදනාවක් කෙළේය (කෙසේදයත්)

**2956** "මෙම එකම වස්ත්‍ර දානය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධීන් කරණකොට ගෙනද කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නොයයි.

**2957** "ශක්‍රදෙවෙන්ද්‍රව සතිස්වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. දෙතිස් වරක සක්විති රජ වන්නේය.

**2958-2959** "(කරන ලද) ප්‍රදෙශ රාජ්‍යය මෙතෙකැයි ගණන් වශයෙන් ගිණිය නොහැකිය. මිනිස් ලොව හෝ දෙව්ලොව හෝ සැරිසරන්නේ රූමත් ගුණවත් නොමඩනා ලද සිරුරු ඇති නොකැළඹියහැකි අපමණවූ වස්ත්‍ර සම්පත් සිත්වූ පරිදි ලබන්නෙමියි කියායි.

**2960** "ප්‍රඥාවූ පදුමුත්තර නම් බුදුරජතෙම මෙම වචන වදාරා ආකාශයෙහි යන හංසරාජයෙකු මෙන් අහසට නැගුනේය.

**2961** "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදිම්ද (එකල්හි) මාගේ භොග සම්පත්තියෙහි අඩු බවක් නැත. එක වස්ත්‍ර දානයක මේ විපාකයයි.

**2962** "පියවරක් පියවරක් පාසා මට වස්ත්‍ර පහළවේ. වස්ත්‍රයට (වියන්යට) සිටිමි. මාගේ හිස මතුයෙහි (නිරතුරුවම) වියනක්වේ.

**2963** "වන සහිත පර්වත සහිතවූද චක්‍රවාට පර්වතය පටන්කොට ඇති ඒ සියල්ල මම කැමතිවන්නේ නම් වස්ත්‍රයන්ගෙන් වසන්නෙමි.

**2964** "එම එක වස්ත්‍රයක් පිදීමෙහි විපාකය වශයෙන් කුදු මහත් භවයෙහි සැරිසරන්නේ එම සැරිසරන කුදු මහත් භවයෙහි ස්වර්ණවර්ණවම සැරිසරමි.

**2965** "එක වස්ත්‍රයක් දීමෙන් ලද ඒ විපාකය කිසි තැනෙක්හි අවසන් බවට නොයයි. මාගේ මේ අන්තිම ජාතියයි එහිදු එම කුශලය විපාක දෙයි.

**2666** "මින් කල්ප ලක්ෂයකට පෙර වූ කල්හි යම් වස්ත්‍ර දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. එක වස්ත්‍රයක් දීමෙහි විපාක මෙයයි.

**2967** "මාගේ ක්ලේශයෝ දවන ලදහ. සියළු භවයෝ නසන ලදහ. බැමි සිඳගත් හස්ති රාජයෙකු මෙන් ආශ්‍රව රහිතව වෙසෙමි 2968.

## 335 වුසිතකම්පිය ථෙරාපදානය

**2969** "එකල්හි ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ විපස්සී බුදු රජතෙම රහතුන් විසින් පිරිවරනලදුයේ සංඝාරාමයෙහි විසීය.

**2970** "ලොක නායකවූ විපස්සී බුදු රජතෙමේ අටලක්ෂයක් රහතුන් සමග අරම් දොරින් නික්ම (වඩිනු දුටිමි.)

**2971** "(එකල) අඳුම් දිවිසම් පෙරවි වැහැරී සිවුරු දරන්නාවූ මම කුසුමහමල් (තම්බාගත් වර්ණවත්) දිය ගෙන සම්බුදු රජුන් වෙත එළඹියෙමි.

**2972** "මම සිය සිත පහදවා සතුටුවූයේ කරනලද ඇඳිලි ඇත්තේ කුසුම්භපුෂ්ප තම්බාගත් වර්ණවත් ජලය බුදුරජුන් උදෙසා උඩට ඉසීමි.

**2973** "එම කර්මය කරණකොටගෙන (පැහැදුනු) පදුමුත්තර නම් සර්වඥතෙමේ මාගේ ඒ කුශල කර්මයට පසසා කැමති පරිදි වැඩමවීය.

**2974-2975** "මම එකල්හි යම් හෙයකින් (එම වර්ණොදකයෙහි බිඳු පන්දහසක් පිදුයෙම්ද (ඒ හේතුවෙන්) දෙසිය පණස් වරක් දිව්‍යරාජ්‍යය කරවීමි (එසේම) මම දෙසියපණස් වරක් සක්විති රජ වීමි. (ඉක්බිතිවද) විපාක නොදී ඉතිරිවූ කම්බලයෙන් රහත් බවට පැමිණියෙමි.

**2976** "යම් කලෙක්හි ශක්‍රදෙවෙන්ද්‍රයා වෙම්ද, එසේම යම්කලෙක්හි මනුජාධිපතිවූ රජවෙම්ද මට එම නමම විය. (එනම්) 'වුසිත' නම් වෙමි.

**2977** 'දෙවිවූද මනුෂ්‍යවූද මාගේ හාත්පස බඹයක් පමණ තැන වැසිබිඳු වස්නේයි.

**2978** "මාගේ භවයෝ නසන ලදහ. එසේම මාගේ ක්ලෙශයෝ දවන ලදහ. සියලු ආශ්‍රවයන් ප්‍රහීණ කෙළේ (වෙමි.) (වර්ණොදක) බිඳු ඉසීමෙහි මේ විපාකයයි.

**2979** "මාගේ සිරුරින් සඳුන් සුවඳට බඳු සුවඳ පැතිරෙයි. මාගේ සිරුරින් විහිදෙන සුවඳ (අර්ධකොෂයක්) බඹ පන්සියයක් තන්හි පැතිරේ.

**2980** "පුණ්‍යකර්මයට අනුකූලවූ දිවසුවඳ හමයි. එම (දිව) සුවඳ ආඝ්‍රාණයකොට (සියල්ලෝ) 'වුසිත' තෙම මෙහි පැමිණියේයයි දැනගනිති.

**2981** "අතු, කොළ, දර, තණ යන මේ දෑ හැමලෙසින්ම මාගේ අදහස දැනගෙන (මෙන්) (මාගත්) කෙණෙහි සුවඳ විහිදුවයි

**2982** "මින් කල්ප ලක්ෂයකට පෙර (එම වර්ණ ජලයෙහි සඳුන් යොදාගත්) සඳුන්දිය පිදූයෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (වර්ණොදක) බිඳු ඉසීමෙහි මේ විපාකයයි 2983.

## 336 පභංකර ථෙරාපදානය

**2984** "තාදී ගුණ ඇති ලොක ජ්‍යෙෂ්ඨවූ පදුමුත්තර බුදුරජුන්ගේ ස්තූපයක් චණ්ඩ මෘගයන්ගෙන් ගැවසිගත් මහ වනයෙහි වීය.

**2985** "චෛත්‍යය වඳිනු සඳහා යාමට කිසිවෙක් සමත් නොවීය එම චෛත්‍යය තණ, දර, ලිය වෙලුනු බිඳීගිය එකක් විය.

**2986** එකල්හි මම පිය මුතුන් පරපුරෙහි (සිටම උරුමව ආ සිරිතට අනුව) වූ වන කාර්මිකයෙක (වනයෙහි කටයුතු කරන්නෙක් වීමි. වනයෙහිවූ තෘණ ලතාවන්ගෙන් ගැවසී ගත් බිඳ වැටුණු එම සෑයද දුටිමි.

**2987** "මම එම බුදුරජුන්ගේ (දා නිදන් කළ) සෑය දැක ඒ කෙරෙහි ගෞරව චිත්තයක් ඉපදවීමි. බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ මෙම සෑය බිඳවැටුනේ වනයෙහි තිබෙන්නේවේ.

**2988** "බුද්ධ ස්තූපය පිරිසිදු නොකරවා අන් කටයුතු වල යෙදෙන්නේ නම් (එය) හොඳ-නොහොඳ දන්නවුනට නොහොඳය. නුසුදුසු" යයි සිතීමි.

**2989** "මම චෛත්‍යයෙහිවූ තණ (කොළ)ද, දරද, වැල්ද පිරිසිදුකොට (ගලවා දමා) අට වරක් නැවුනේ (උක්කුටිකයෙන් හිඳ වැඳ ගියෙමි.

**2990** "මැනවින් කරණලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධීන් (සිතින් කළ පැතුම්) කරණකොට ගෙනද, මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්තියෙන්) ගියෙමි.

**2991** 'එහි මට මැනවින් කරනලද විමානය රුවන්මුවාය. පැහැ විහිදෙන්නේය සැටයොදුන් උසය. තිස්යොදුන් පුලුලය

**2992** 'මම තෙසිය වරක් දෙව්රජය කරවීමි. පස්විසි වරක් සක්විති රජවීමි.

**2993** "මම කුදුමහත් භවයන්හි සැරිසරමින් මහත් භොග ලැබීමි. මාගේ භොග සම්පත්තීයෙහි අඩු බවෙක් නම් නැත. (චෛත්‍ය) පිරිසිදු කිරීමෙහි මේ විපාකයයි.

**2994** "සිවිකාව (දෝලාව) කින් හෝ ඇත පිටින් හෝ වනයෙහි ගමන් කරන්නාවූ මට (එහි) මම යම් යම් දිශාවකට යෙම්ද වනයම මට පිහිට ඇති කරයි.

**2995** (එසේ යන කල්හි) කණුවක් හෝ කටුවක් හෝ මම ඇසින් නොදකිමි. පුණ්‍යකර්මයාගේ විපාකය හා යෙදුනේ (එම කණු-කටු) තෙමේම ඉවත්වෙයි.

**2996** "කුෂ්ටද (සිරුරෙහි හැදෙන) ගඩගෙඩිද, කිලාස නම් කුෂ්ට විශෙෂයද, අපස්මාරයද (මීමැස්මොර) ද විතච්ඡිකා නම් කුෂ්ඨද, දදද, කැසිලිද මට නැත. (චෛත්‍යය) පිරිසිදු කිරීමෙහි මේ විපාකයයි.

**2997** "(i) බුදුරදුන් (ධාතු නිදන්කළ) සෑය පිරිසිදු කිරීමෙහි මට (ලැබුණු) අනික් ආශ්චය්‍ය්‍යීයකුදු වෙයි. (එනම්) (ii) මාගේ සිරුරෙහි හටගත්තා වූ ස්වල්පමාත්‍ර වූද බිබිලක් ගැන නොදනිමි.

**2998** (මෙහි 2997 (i) යොදන්න.) දිව්‍යවූද මනුෂ්‍යවූද භව දෙකෙහි පමණක් සැරිසරමි.

**2999** (මෙහි 2997 (i) ) මම හැමතන්හි රුවන් වන් වූයේද පැහැවන් වූයේද වෙමි.

**3000** (මෙහි 2997 (i) ) මා නොකැමැති දෑ බැහැරවේ. කැමැති දෑ එළඹසිටී.

**3001** (මෙහි 2997 (i) ) මාගේ සිත එකගවූ මැනවින් සමාධියට පත්වූ පිරිසිදු එකක් වේ.

**3002** (මෙහි 2997 (i)) එක අසුනෙහිම හිඳ රහත් බවට පැමිණියෙමි.

**3003** මින් සියක්දහස් (ලක්ෂයක්) වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සෑය පිරිසිදු කිරීමෙහි මේ විපාකයයි 3004

## 337 තිණකුටිදායක ථෙරාපදානය

**3005** 'මම බන්ධුමතී නගරයෙහි අනුන්ගේ බැලමෙහෙ කිරීමෙහි යෙදුනේ අනුන්ගේ බත් වැටුප් බලාපොරොත්තු වන්නේ පරකාර්මිකයෙක් හෙවත් අනුන්ගේ බැලමෙහෙවර කරන්නෙක් වීමි.

**3006** "මම එකල්හි රහසිගතව (විවේකයෙන්) හිඳ මෙසේ සිතීමි, (ඒ කෙසේදයත්?) බුදුරජතෙම ලොව පහළ විය. මට පිණක්ද නැත

**3007** "මාගේ පැවැත්ම පිරිසිදු කරගන්නට මේ කාලයයි. මා විසින් (අෂ්ට දුෂ්ටක්ෂන විනිර්මුක්ත) සුදුසු මොහොත පිළියෙලකොට (ලැබ) ගන්නාලදී පින් නොකළ සතුනට (ලැබෙන) නිරයෙහි පහස දුකය කියායි.

**3008** "මම මෙසේ සිතා මට වැඩදෙන ස්වාමියා වෙත එළඹියෙමි. මම එකදිනක වැඩ ඉල්වාගෙන වනයට පිවිසියෙමි.

3009 "මම එකල්හි තණ (කොළ) ද, ලීද, වැල්ද ගෙනවුත් ත්‍රිදණ්ඩකයෙහිද (කතිර සිටින සේ එකට බැඳි දඬු තුණෙහි) තබා මම (එහි) තෘණ කුටියක් කෙළෙමි.

3010 "මම සංඝයා පිණිස කළ එම කුටිය පිළිගන්වා එදවස්හිම අවුත් වැඩදෙන ස්වාමියා (කර්ම ස්වාමියා) වෙත එළඹියෙමි.

3011 "මම මැනවින් කරනලද එම කර්මය කරණකොට ගෙන තව්තිසා දෙව්ලොවට ගියෙමි. එහි මට (සංඝයාට පිළිගැන්වූ) තෘණකුටිය වෙනුවට මැනවින් කරණලද මැවූ (දිව්‍ය) විමානයක් විය.

3012 "දහසක් කොටස් (බෙදුම්) ඇති සියයක් ගොලාකාර මුදුන් ඇති ධජයන්ගෙන් යුත් කොළවන්වූ ඒ මාගේ මහා ප්‍රාසාදයෙහි (විමානයෙහි) සියක් දහසක් දොරටු පහළවූහ.

3013 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදිම්ද (ඒ සියලු තන්හි) මාගේ අදහසට අනුව ප්‍රාසාදයක් තිබේ.

3014 'භයක් හෝ තැතිගැනීමක් හෝ ලොමු දැහැගැන්මක් හෝ නොවේ එම භය ආදිය මම නොදනිමි මෙය තෘණකුටි දානයෙහි විපාකයයි.

3015 "සිංහයෝද, ව්‍යාඝ්‍රයෝද, දිවියෝද, වලස්සුද, වෘකයෝද, කළු හිස් ඇති වලස්සුද යන මේ සියලු (වනමෘගයෝ) මා බැහැර කෙරෙත් තෘණකුටි දානයෙහි මේ විපාකයයි

3016 "බඩගා යන සත්තුද, භූතයෝද, සර්පයෝද, කුම්භාණ්ඩයෝද, රකුසෝද යන ඔව්හු මා බැහැර කෙරෙත්. තෘණකුටි දානයෙහි මේ විපාකයයි.

3017 "මට පව්ටු සිහින පෙනුමක් ගැන මම නොදනිමි. මාගේ සතිය (සිහිය) එළඹසිටියාය. තෘණකුටි දානයෙහි මේ විපාකයයි.

3018 "එම තෘණකුටි දානය හේතුකොටගෙනම සම්පත් අනුභවකොට මම ගෞතම බුදුරජාණන් වහන්සේගේ ධර්මයද ප්‍රත්‍යක්ෂ (අවබොධ) කෙළෙමි.

3019 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. තෘණකුටි දානයෙහි මේ විපාකයයි. 3020

## 338 උත්තරෙය්‍යදායක ථෙරාපදානය

3021 "එකල්හි (මම) හංසවතී නගරයෙහි වෙද හදාරන්නාවූ මන්ත්‍ර දරන්නාවූ වෙදත්‍රයෙහි පරතෙරට ගිය බමුණෙක් වීමි.

3022 "මැනවින් හික්මුණු ජාතිමත් (කුලවත්) වූ මම ස්වකීය ශිෂ්‍යයන් විසින් පෙරටුකරන ලදුයේ දිය ඉසීම පිණිස නුවරින් නික්මුනෙමි.

3023 "සියළු (දතයුතු) ධර්මයන්ගේ පරතෙරට ගියාවූ පස්මරුන් දිනූ පදුමුත්තර බුදුරජතෙමේ රහතුන් දහසක් සමග නගරයට පිවිසියේය.

3024 "නොඇලීමෙන් (තෘෂ්ණා රහිත බැවින්) කරන ලද්දාක් වැනිවූ අති මනොඥ රූපය ඇති රහතුන් විසින් පිරිවරනලද (එම බුදුරදුන්) දැක සිත පැහැදවීමි.

3025 "හිසෙහි ඇඳිලිබැඳ මනා ව්‍රත ඇති (බුදුරදුන්හට) වැඳ පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ මම උතුරුසළුව පිදීමි. (කෙසේද යත්)

3026 "සළුව දොහොතින් ගෙන උඩට දැමීමි. (එම) සළුව යම්තාක් බුදුපිරිසද ඒතාක් (වියනකින් මෙන්) වැසීය.

3027 "එකල්හි පිඩු පිණිස හැසිරෙන්නාවූ ගෘහයෙන් නික්මෙන්නාවූ මහා භික්ෂු සංඝයාගේ ආදිමවූ බුදුරජුන්හට

3028 "සෙවෙතියක් (වියනක) කරමින් මා සතුටු කරවමින් (එම සළුව) අහසෙහි සිටියේය. සියල්ල තෙමේම අවබොධ කළාවූ, අග්‍ර පුද්ගලවූ ශාස්තෘ තෙමේ වීථියෙහි සිටියේම මට අනුමොදනාව කෙළේය."

3029 "පහන් සිත් ඇත්තේ සොම්නසක්වූයේ යමෙක් මට සළුවක් පිළිගැන්වූයේද, මම හේ කවරෙක්දැයි කියන්නෙමි. එසේ කියන්නාවූ මාගේ වචනය අසව්.

3030 "(මෙතෙම) කප්තිස් දහසක් මුළුල්ලෙහි දෙව් ලොව සිත් අලවා වසන්නේය. ශක්‍ර දෙවෙන්ද්‍රව පණස් වරක් දිව්‍යරාජ්‍යය කරන්නේය.

3031 "(කරන ලද) පුණ්‍යකර්මයාගේ විපාකයෙන් යුතු වූයේ දෙව්ලොව වසන්නාවූ මොහුට හාත්පස යොදුන් සියයක් වස්ත්‍ර සෙවෙනියක් (වියනක්) වන්නේය.

3032 "සත්තිස් වරක් සක්විති රජවන්නේය. (කරවන්නාවූ) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් ගිනිය නොහැකිය.

3033 "(කරන ලද) පුණ්‍යකර්මයාගේ විපාකයෙන් යුක්තව භවයෙහි සැරිසරන්නාවූ මොහුට සිතින් පතන ලද සියල්ල එකෙණෙහි නිපදවන්නේය.

3034 "කොසෙය්‍යද, කම්බිලිද, කොමුපිළිද, කපුපිළිද යන අනගිවන් (වස්ත්‍ර) මේ මිනිස් තෙම (භවයෙහිදී) ලබන්නේය.

3035 "මේ මිනිස්තෙම සිතින් පතන ලද සියල්ල ලබන්නේය. එක වස්ත්‍රයක් පිදීමේ විපාකය හැමකල්හි අනුභව කරන්නේය.

3036 "කුශල මූලයෙන් මෙහෙයන ලද හෙතෙම පසුව පැවිදිව ගෞතම බුදුරජාණන් වහන්සේගේ ධර්මය ප්‍රත්‍යක්ෂ කරන්නේය" කියායි.

3037 "මහර්ෂිවූ බුදුරජුන් සඳහා මාවිසින් මැනවින් කරන ලද කර්මය ආශ්චර්‍ය්‍යයකි මම එක සළුවක් පුදා ඒ හේතුවෙන් නිවනට පැමිණියේ වෙමි.

3038 "මඩුවක හෝ රුක්මුලක හෝ හිස් ගෙයක හෝ වසන්නාවූ මට හාත්පසින් බඹයක් තන්හි රෙදි සෙවෙනියක් (වියනක්) දරයි.

3039 "මම නොවිනවන (වචනයෙන් කියා පිළියෙල නොකරවන ලද සිවුරු හඳිමි. ප්‍රත්‍යද (ලබමි.) ආහාරපානයන්ගේ ලාභියෙක් වෙමි. උතුරුසළු දනෙහි මේ විපාකයයි.

3040 "මින් සියක් දහස් (ලක්ෂයක්) වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් (වස්ත්‍ර පූජාවක්) කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වස්ත්‍ර දානයාගේ මේ විපාකයයි. 3041

## 339 ධම්මසවනිය ථෙරාපදානය

3042 "සියළු ධර්මයන්ගේ පරතෙරට ගිය පදුමුත්තර බුදුරජතෙම චතුස්සත්‍යය දෙශනා කරමින් බොහෝ දෙන (සසර සයුරින්) එතර කළේය.

3043 "මම එකල්හි උග්‍ර තපස් ඇති ජටිලයෙක් (ජටාධර තවුසෙක්) වූයේ වැහැරි සිවුරු කම්පනය කරමින් අහසෙහි යෙමි.

3044 "මම බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ (හිස) මතුයෙහි (ඉහළ අහසෙහි) යන්ට නොහැකිවීමි. පර්වතයක හැපුනු පක්ෂියකු මෙන් ගමන නොලැබීමි. (යනු නොහැකි විය)

3045 "මාගේ ගමනට මෙබඳු අවහිරවීමක් පෙර නොවූ විරූය. (පෙර) පොළොවෙන් මතුවීගන මෙන් මෙසේ අහසෙහි යමි.

3046 "උදාරවූ මනුෂ්‍යයෙක් යට (පොළොවෙහි) හුන්නේ වන්නේය. ඒකාන්තයෙන් හේ කවරෙක් දැයි සොයන්නෙමි. මම ඉන් අභිවෘද්ධියක් ලබන්නේ නම් මැනවි. (යයි සිතීය)

3047 "අහසින් බසිමින් අනිත්‍ය දෙශනා කරන්නාවූ බුදුරජුන්ගේ ශබ්දය ඇසීමි. (අසා) එකල්හි මම එය උගතිමි.

3048 "අනිත්‍ය සංඥාව ඉගෙන මාගේ අසපුවට ගියෙමි. එහි ආයුෂ ඇතිතාක් වැස මම කළුරිය කළේ වෙමි.

3049 "චුතිය වන්නාවූ අවස්ථාවෙහි එම ධර්ම ශ්‍රවනය සිහි කෙළෙමි. මැනවින් කරන ලද එම කර්මය කරන කොට ගෙන මම තව්තිසා දෙව්ලොවට ගියෙමි.

3050 "මම කල්ප තිස් දහසක් දෙව්ලොව සිත් අලවා විසීමි. එක් පණස් වරක් දිව්‍යරාජ්‍යයද කෙළෙමි.

3051 මම එක්සත්තෑ වරක් සක්විති රජ වීමි (කරවන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය.

3052 '(පියාගේ ගෘහයෙහි වැඩහිඳ වඩන ලද ඉඳුරන් ඇති බුදුරජතෙම ගාථාවෙන් (කරුණු) දක්වමින් අනිසබව (අනිත්‍ය බව) වදාළේය.

3053 "කුදු මහත් භවයෙහි සැරිසරමින් එම අනිත්‍ය සංඥාව සිහි කරමි. (එහෙත්) (සසර) කෙළවරවූ අමෘත පදයවූ නිවන අවබොධ නොකරමි.

3054 "ඒකාන්තයෙන් (සියළු) සංස්කාරයෝ අනිත්‍යයහ. ඇතිවීම හා නැතිවීම ස්වභාවය කොට ඇත්තාහ ඇතිව නැතිවෙත්. එම සංස්කාරයෝ සංසිඳීම සැපයකි."

3055 "එම ගාථාව අසා ඒ සමගම පූර්ව කර්මය සිහිපත් කෙළෙමි. එම අසුනෙහිම හිඳ රහත් බවට පැමිණියෙමි.

**3056** "මම උත්පත්තියෙන් සත්හැවිරිදි වූයේ රහත් බවට පැමිණියෙමි. පසැස් ඇති සර්වඥතෙමේ මාගේ ගුණය දැන (මා) උපසම්පදා කරවීය.

**3057** "ළදරු වියෙහිවූ මම රහත් බවට පැමිණියෙමි. ශාක්‍ය පුත්‍රවූ බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි (අද) කටයුතු දෙය කිම?

**3058** "මින් සියක්දහස් (ලක්ෂයක්) වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සද්ධර්ම ශ්‍රවණයෙහි (බණ ඇසීමෙහි) විපාකයවේ. 3059

## 340 උක්ඛිත්තපදුමිය ථෙරාපදානය

**3060** "මම හංසවතී නගරයෙහි මල් කරුවෙක් වීමි. එකල්හි පියුම් විලකට බැස පියුම් නෙලමි.

**3061 3062** "සියළු ධර්මයන්ගේ පරතෙරට ගිය පදුමුත්තර නම් සර්වඥතෙමේ තාදී ගුණ ඇති සන්හුන් සිත් ඇති ශුද්ධවූ ෂඩභිඥා ඇති සියක් දහසක් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ සමග මාගේ අභිවෘද්ධිය ගැනම සිතා මා සමීපයට පැමිණියේය

**3063 3064** "මම දෙවියනට දෙවිවූ සියල්ල තෙමේම අවබොධ කළාවූ ලොකනායකවූ බුදුරජුන් දැක එකල්හි පියුම නටුයෙන් කඩා අහසෙහි දැමීමි (කෙසේ සිතාදයත්?) 'වීරයන් වහන්ස' ඉදින් ඔබ ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ සර්වඥ වෙහි පියුම් තෙමේම ගොස් ඔබ වහන්සේගේ මස්තකයෙහි දරත්වායි (කියායි)

**3065** "ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ මහාවීරවූ බුදු රජතෙමේ (එසේ වීමට) ඉටීය. බුද්ධානුභාවයෙන් එම පද්මයෝ උන්වහන්සේගේ මුදුනෙහි දැරූහ.

**3066** "මම මැනවින් කරන ලද එම කර්මය හා චිත්ත ප්‍රණීධින් කරණකොටගෙන මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට ගියෙමි.

**3067** "එම දෙව්ලොවෙහි මට කරන ලද විමානය, 'සතපත්ත' යයි කියනු ලැබේ (එය) සැටයොදුන් උසය. තිස් යොදුන් පුළුලය.

3068 "ශක්‍ර දෙවෙන්ද්‍රව දහස් වරක් දිව්‍යරාජ්‍ය කෙළෙමි. මම පන්සැත්තෑවරක් සක්විති රජ වීමි.

3069 "කරවන ලද මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණින් වශයෙන් ගිනිය නොහැකිය. පෙර තමා විසින් මැනවින් කරන ලද ස්වකීය කර්මයෙහි (විපාකය) අනුභව කරමි.

3070 "එම එක පියුම පිදීමෙන් එහි ආනිසංසය ලෙස සම්පත් අනුභව කොට මම ගෞතම බුදුරජාණන් වහන්සේගේ ධර්මය අවබොධ කෙළෙමි.

3071 "මාගේ ක්ලේශයෝ දවන ලදහ. සියලු භවයෝ නසනලදහ. බැඳුම් සිදී ඇතෙකුමෙන් ආශ්‍රව රහිතව වෙසෙමි.

3072 "මින් ලක්ෂයක් වන කපෙහි යම් පුෂ්ප පද්ම පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. එක පියුමක් පිදීමෙහි මේ විපාකයයි. 3073

## 35 එකපදුමය වග්ග

### 341 එකපදුමය ථෙරාපදානය

3074 "සියළු ධර්මයන්ගේ පරතෙරට ගිය පදුමුත්තර සර්වඥතෙමේ භවයාගේ අභාව නම්වූ නිවන පවසමින් බොහෝ ජනයා සසර සයුරින් එතර කළේය.

3075 "එකල්හි මම පක්ෂීන්හට උත්තමවූ හංසරාජයෙක් වෙමි, ස්වයංජාත විලකට බැස හංස ක්‍රීඩා කරමි.

3076 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පස්මරුන් දිනූ පදුමුත්තර බුදුරජතෙම එකෙණෙහි එම ස්වයංජාත විල මතුයෙහි (අහසින් එතැනට) වැඩියේය.

3077 "මම දෙවියනට දෙව්වූ සියල්ල තෙමේම අවබොධ කරගත් (එම) බුදුරජුන් දැක මනරම්වූ සියපත් පියුමක් නටුවෙන කඩා

3078 "බුදුරජුන් කෙරෙහි පහන්වූයේ හොටින් ගෙන ඔසවා අහසෙහි වැඩසිටි එම බුද්ධ ශ්‍රෙෂ්ඨයන්වහන්සේට පිදීමි.

3079 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ ශාස්තෲවූ පදුමුත්තර බුදුරජතෙම අහසෙහි වැඩ සිටියේ මා හට මේ අනුමොදනාව කළේය.

3080 "මෙම එකම පියුම් පිදීමෙන්ද, චිත්ත ප්‍රණීධීන්ද කරණකොට ගෙන කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි විනිපාත නම්වූ දුගතියකට නොයන්නෙහිය.

3081 "පදුමුත්තර නම්වූ සර්වඥ තෙමේ මෙම අනුමෝදනා වචන) වදාරා මාගේ කර්මය (පිළිබඳ තොරතුරු) පවසා අභිමත පරිදි වැඩම විය.

3082 "මින් පෙර ලක්ෂයක් වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3083

## 342 තිළුප්පලමාලිය ථෙරාපදානය

3084 "මම එකල්හි චන්ද්‍රභාග නදීතීරයෙහි වඳුරෙක් වීමි. (එහිද්) කඳු අතුරෙහි වැඩහුන් කෙලෙස් රජස් නැති බුදුරජුන් දුටිමි.

3085 "දස දිගින් බබුළුවන්නාවූ පිපීගිය උතුම්වූ සල් රුකක් වැනි (දෙතිස්මහාපුරිස්) ලකුණින් හා (අසූවක්) අනු ව්‍යඤ්ජනයන්ගෙන් යුත් බුදුරජුන් දැක සතුටු වීමි.

3086 "ඔදවැඩි සිත්ඇත්තේ සොම්නස් වූයේ ප්‍රීතියෙන් පිනාගියේ උපුල් මල් තුනක් මතුයෙහි (අහසෙහි) දමා පිදීමි.

3087 "විපස්සී බුදුරජුන්හට (මෙම) මල් පුදා ගෞරව සහිතව ගොස් උතුරුදිගට මුහුණ ලා ගියෙමි.

3088 "පැහැදි සිතින් සීඝ්‍රව යන්නේ කඳු අතුරෙහි (පැකිලී) වැටී ජීවිතක්ෂයට පැමිණියෙමි.

3089 "මැනවින් කරණ ලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණීධීන් කරණකොට ගෙනද, මිනිස් සිරුර හැර මම තව්තිසා දෙව්ලොවට ගියෙමි.

3090 'මම තුන්සිය වරක් දිව්‍ය රාජ්‍යය කෙළෙමි. පන්සිය වරක් සක්විති රජ වීමී

3091 "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කරන ලදද. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3092

## 343 ධජදායක ථෙරාපදානය

3093 "ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ තිස්ස නම් ශාස්තෘ තෙමේ ලොව පහළ විය. උන්වහන්සේගේ උපධික්ෂය (ස්කන්ධොපධි නම්වූ පඤ්ච ස්කන්ධයාගේ අභාවයවූ නිරුපධි ශෙෂ නිර්වාණය) දැක මා විසින් ධජයක් නගන ලදී.

3094 "මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙන ද මම මිනිස් සිරුර හැර තව්තිසාවට ගියෙමි.

3095 "මම තුන් සියවරක් දිව්‍යරාජ්‍ය කරවීමි එසේම පන්සිය වරක් සක්විති රජ වීමි.

3096 "(කරවන ලද) ප්‍රදෙශ රාජ්‍ය ගණින් වශයෙන් (මෙපමණයයි) ගිණිය නොහැකිය. පෙර තමා විසින් මනා කොට කරන ලද ස්වකීය කර්මඵලය අනුභව කරමි.

3097 "මින් දෙයානුවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි ධජ දානයාගේ මේ විපාකයයි.

3098 "මම අද කැමතිවන්නේ නම් කඳු වන සහිතවූ ලොකය කොමුපිලියෙන් වසන්නෙමි. (මේ) එදා මා විසින් කරන ලද පුණ්‍ය කර්මයාගේ විපාකයයි. 3099

## 344 තිකිංකණි පූජක ථෙරාපදානය

3100 'හිමවතට නුදුරෙහි 'භූතගණ' නම් පර්වතයක් විය. එහිද ගස් මුදුනක එල්ලන ලද පවුල් සිවුරක් (පාංශු කූල චීවරයක්) දුටිමි.

3101 "මම එකල්හි කිකිණිමල් තුනක් කඩා සතුටු වූයේ සතුටු සිතින් පවුල් සිවුරට පිදිමි.

3102 "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. කිකිණි මල් තුනක් පිදීමෙහි මේ විපාකයයි. 3103

## 345 නළාගාරික ථෙරාපදානය

3104 "හිමවතට නුදුරෙහි හාරිත නම් පර්වතයක් විය. නාරද නම් බුදුරජතෙම රුක්මුලක විසීය.

3105 "මම බට කුටියක් කොට එහි තණ (බටකොළ) සෙවිලි කළෙමි. (එහි) මම සක්මනක්ද පිරිසිදුකොට තථාගතයන් වහන්සේට දුනිමි.

3106 "මම තුදුස්වන කපෙහි දෙව්ලොව සිත් අලවා විසීමි. සුසැත්තෑ වරක් දිව්‍ය රාජ්‍යය කරවීමි.

3107 "මම සත්සැත්තෑ වරක් සක්විති රජවීමි. (කර වන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නොහැකියි

3108 "පැන නැංගාවූ මාගේ භවනය උඩට නැගුනු දේදුන්නක් මෙනි දහසක් කණු ඇති අනූපමවූ (එම) විමානය පැහැ විහිදුවන්නේය.

3109 "කුශල මූලයන් මෙහෙයනලදුයේ (දිව්‍ය-මනුෂ්‍ය) විවිධ සම්පත් අනුභව කොට මම ගෞතම බුදුන්ගේ සසුනෙහි පැවිදිවීමි.

3110 "වීර්‍ය්‍යයෙහි මෙහෙයන ලද සිත් ඇත්තේ වෙමි එසේම උපශාන්තය උපධි රහිතය. බැඳුම් සිඳි ඇත් රජකු මෙන් ආශ්‍රව රහිතව වෙසෙමි. 3111

## 346 චම්පක පුප්ඵිය ථෙරාපදානය

3112 "හිමවතට නුදුරෙහි 'චාපල' නම් පර්වතයක් විය. සුදස්සන නම් බුදුරජතෙම එහි කඳු අතුරෙහි විසීය.

3113 "හිමවත් මල් ගෙන හෙසින් යන්නාවූ මම (චතුර්) සත්‍යයන් තරණය කළ ආශ්‍රව රහිත කෙලෙස් රජස් විරහිත බුදුරජුන් හට පිදීමි.

3114 "එකල්හි මම සපුමල් සතක් හිසෙහි තබා සියල්ල තෙමේම අවබොධ කළාවූ බුදුරජුන් හට පිදීමි.

3115 'මින් එක්වන කපෙහිවූ එකල්හි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන් දුගතියක්) නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3116

## 347 පදුම පූජක ථෙරාපදානය

3117 "හිමවතට නුදුරෙහි රොමස නම් පර්වතයක් විය. එකල්හි සම්භව නම් බුදුරජතෙම එළිමහනෙහි විසීය.

3118 "මම භවනයෙන් නික්ම අවුත් උන්වහන්සේට පියුමක් දැරීමි. එක් දිනක් එය දරමින් සිට නැවත භවනයෙන් එළඹියෙමි.

3119 "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3120

## 348 තිණමුඨ්ඨිදායක ථෙරාපදානය

3121 "හිමවතට නුදුරෙහි ලම්බක නම් පර්වතයක්විය (එහි) උපතිස්ස නම් බුදුරජතෙම එලිමහනෙහි සක්මන් කෙළේය

3122 "එකල්හි මම මහ වනයෙහි මුව වැද්දෙක් වීමි. (එහිදී) දෙවියනට දෙව්වූ සියල්ල තෙමේම අවබොධ කළාවූ පස්මරුන් දිනූ (එම) බුදුරදුන් දැක

3123 "එකල්හි මම පැහැදි සිතින් එම බුදුරදුන්හට වැඩහිඳීම පිණිස තණ මිටක් දුනිමි.

3124 "දෙවාති දෙවවූ බුදුරදුන්හට (එය) දී බෙහෙවින් සිත පැහැදවිමි (ඉක්බිති සම්බුදුරදුන් වැඳ උතුරු දිගට මුහුණලා ගියෙමි.

3125 "එසේ ගිය නොබෝ වේලාවකින් සිංහයෙක් මා පෙළීය. සිංහයා විසින් බිම පෙරළන ලද මම එහි කළුරිය කළේ වෙමි.

3126 ආශ්‍රව රහිතවූ බුද්ධ ශ්‍රෙෂ්ඨයන්වූ උන්වහන්සේ විෂයෙහි මරණාසන්නයෙහිම මා විසින් කරන ලද කර්මය (කරණකොට ගෙන) මම දුන්නෙන් මුදන ලද වේගවත් හීයක් මෙන් දෙව්ලොවට ගියෙමි.

3127 "එහි (මාගේ) පුණ්‍ය කර්මයාගෙන් නිර්මිතවූ ශොභන ප්‍රාසදයක් විය. එහි දහසක් කොටස් (බෙදුම්) ඇත්තේය. සියයක් ගොලාකාරවූ මුදුන් ඇත්තේය. (එම මුදුන් මල එල්ලන ලද) ධජද ඇත්තේය. කොළවන් පැහැයෙන් යුක්තය.

3128 "උදාවූ හිරුමෙන් එම ප්‍රාසාදයාගේ රශ්මයද පැතිරෙයි මම (එහි) දිව්‍ය කන්‍යාවන් විසින් පිරිවරණලදුයේ කැමති කැමතිපරිදි සතුටුවීමි.

3129 'එම කුශල කර්මයෙන් මෙහෙයන ලදුයේ දෙව් ලොවින් චුතව මිනිස් භවයට පැමිණ ආශ්‍රවක්ෂයට පැමිණියේ වෙමි.

3130 "මම මින් සිව් අනූවන කපෙහි හිඳීමට (තණ මිටක්) දුනිමි. ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි තණ මිටක් දීමෙහි මේ විපාකයයි 3131

## 349 තින්දුකඵලදායක ථෙරාපදානය

2132 'කඳු අතුරෙහි වැඩහුන්නාවූ කිණිහිරි රුකක් මෙන් බබලන (චතුර්විධ) ධර්මයන් තරණය කළාවූ ආශ්‍රව රහිතවූ (කෙලෙස් රජස් විරහිත (වෙස්සභූ) බුදුරජුන් දුටුවෙමි.

3133 "ගෙඩි සහිත තිඹිරි ගසක් දැක (එය) කිණිති සහිතව බිඳ සිත් ඇත්තේ සොම්නස් වූයේ මම වෙස්සභූ බුදුරජුන්හට දුනිමි.

3134 'මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් තිඹිරි ගෙඩි දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵලදානයාගේ මේ විපාකයයි. 3135

## 350 එකඤ්ජලිය ථෙරාපදානය

3136 "එකල්හි රෙවත නම් සර්වඥතෙම ගංගාතීරයෙහි (ගංඉවුරෙහි) විසීය. මම කෙලෙස් රජස් විරහිතවූ පීතවර්ණ රැස් ඇති (උදා) හිරු වැනිවූද එම බුදුරජුන් දිටිමි.

3137 "කෝවයෙහි ලා තබා පිරිසිදුකළ ස්වර්ණයක් වැනිවූද, ඇවිලෙන කිහිරඟුරු මෙන් දීප්තිමත්වූද. බබලන්නාවූද ඔසධි තාරකාවක් වැනිවූද (එම බුදුරජුන් දැක) මම එක අඤ්ජලියක් (එකවරක් පමණක් ඇඳිලි බැඳීම) කෙළෙමි.

3138 "මින් සිව් අනූවන කපෙහි මම යම් ඇඳිලි බැඳීමක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඇඳිලි බැඳීමෙහි මේ විපාකයයි. 3139

# 36 සද්ද සඤ්ඤක වග්ග.

## 351 සද්දසඤ්ඤක ථෙරාපදානය

3140-3141 "මම පෙර මහවනයෙහි මුව වැද්දෙක් වීමි. එහිදී දිව්‍ය සමූහයා විසින් පිරිවරනලද චතුස්සත්‍ය දෙශනා, "කරන්නාවූ මහාජනයා සසර සයුරින් ගොඩන ගන්නාවූ සම්බුදුරදුන් දිටිමි. (දැක කොවුල් හඬට හුරු මිහිරි වචන ඇසීමි)

3142 "බ්‍රහ්ම ස්වරය ඇති ලොක බන්ධුවූ සිඛී බුදු රජුන්ගේ හඬෙහි සිත පහදවා ආශ්‍රවක්ෂයට (රහත් බවට) පැමිණියේ වෙමි.

3143 "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (බුද්ධ ස්වරයෙහි) පැහැදීමෙහි මේ විපාකයයි. 3144

## 352 යවකලාපිය ථෙරාපදානය

3145 "එකල්හි (මම) අරුණවතී නගරයෙහි යව කෙත් රකින්නෙක් වීමි. මගදී බුදුරජුන් දැක (උන්වහන්සේට වැඩහිඳීම සඳහා) යව (කරල්) මිටියක් (බිම) ඇතිරීමි.

3146 "අනුකම්පාව ඇති කාරුණිකවූ සිඛී බුදුරජතෙම මාගේ අදහස දැන එම (යව) ඇතිරියෙහි වැඩහුන්නේය.

3147 "එසේ වැඩහුන්නාවූ නිර්මලවූ මහා ධ්‍යාන ඇති අසහාය නායකවූ (බුදු රජුන්) දැක සතුට උපදවා මම එහි කළුරිය කෙළෙමි.

3148 "මින් සත්තිස් වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. යව ඇතිරි දනෙහි මේ විපාකයයි 3149

## 353 කිංසුක පූජක ථෙරාපදානය

3150 "පිපුණු කැලගසක් දැක ඇඳිලි බැඳගෙන සිද්ධාර්ථ බුදුරජුන් සිහිපත්කොට (එම මල්) අහසෙහි (ගසේ තිබියදීම) (බුදුරජුන්හට) පිදීමි

3151 "මින් සිව් අනූවන කපෙහිවූ යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3152

## 354 සකොටක කොරණ්ඩ දායක ථෙරාපදානය

3153 "සිඛී බුදුරජුන්ගේ තබනලද පියවර දැක මම අඳුන්දිවි සම් එකස්කොට (එම) ශ්‍රෙෂ්ඨ ශ්‍රීපාදය වැන්දෙමි.

3154 "පිපුණු කටුකරඬු රුකක් දැක (එය) කිණිති සහිතව (කඩා) පියවරෙහි (ශ්‍රීපාදයෙහි) චක්‍රලක්ෂණය පිදීමි.

3155 "මින් තිස්එක්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ශ්‍රීපාදය පිදීමෙහි මේ විපාකයයි. 3156

## 355 දණ්ඩදායක ථෙරාපදානය

3157 "එකල්හි මම වනයට වැද හුණලීයක් කපා එල්බෙන දණ්ඩක් (සැරයටියක්) සංඝයාට දුනිමි.

3158 'එම චිත්තප්‍රසාදය කරණකොටගෙන මනා ව්‍රත ඇති සංඝයා මැද සැරයටියද උතුරුදිගට මුහුණලා ගියෙමි.

3159 "මින් සිව්අනූවන කපෙහිවූ එකල්හි යම් සැරයටි දනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සැරයටි දනෙහි මේ විපාකයයි. 3160

## 356 අම්බයාගු ථෙරාපදානය

3161 "සියල්ල තෙමේම අවබොධ කරගත් පස්මරුන් දිනූ සතරංසී නම් සර්වඥතෙමේ සමාධියෙන් නැගිට මා වෙත පිඬු පිණිස එළඹියේය.

3162 "එම පසේ බුදුරජුන් දැක මම පිරිසිදු සිතින් යුත් උන්වහන්සේට පැහැදි සිතින්ම අඹ කැඳක් දුනිමි.

3163 "මින් සිව්අනූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අඹ කැඳ පිදීමෙහි මේ විපාකයයි 3164.

## 357 සුපුටක පූජක ථෙරාපදානය

3165 "දිවා විහරණයෙන් නික්මුණු ඒ විපස්සී බුදු රජාණන් වහන්සේ පිඬුපිණිස හැසිරෙන්නේ මාගේ සමීපයට එළඹියේය.

3166 "ඉක්බිති (එයින්) සතුටුවූ සොම්නස්වූ මම තාදි ගුණ ඇති බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට ලුණුගොටුවක් දී කල්පයක් ස්වර්ගයෙහි සතුටුවීමි.

3167 'මින් එක්අනූවන කපෙහි මම (යම්) ලුණු ගොටු දනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (ලුණු) ගොටු දනෙහි මේ විපාකයයි. 3168

## 358 මඤ්චදායක ථෙරාපදානය

3169 "ලොවට දෙටුවූ තාදී ගුණ ඇති විපස්සී බුදු රජුන්හට පහන් සිතින් සියතින්ම මා විසින් ඇඳක් දෙනලදී.

3170 'එයින් හස්තියානයන්ද, අශ්වයානයන්ද, දිව්‍යමය යානයන්ද, ලැබීමි. එම මඤ්චදායනයෙන්ම (ඇඳ දන් දීමෙන්) ආශ්‍රවක්ෂය (රහත් බව) ටද පැමිණියේ වෙමි.

3171 "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම් මඤ්චක දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මඤ්චක දානයාගේ මේ විපාකයයි. 3172

## 359 සරණගමණීය ථෙරාපදානය

3173 "එකල්හි ආජීවකයෙක්වූ මමද භික්ෂුවක්ද නැවකට නැගුනෙමු. නැව බිඳෙන කල්හි ආජීවකයෙක්වූ මට භික්ෂුව සරණ දුන්නේය.

3174 'මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි ඒ භික්ෂු තෙම මට යම් සරණයක් දුන්නේද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මේ සරණ ගමනයෙහි විපාකයයි. 3175.

## 360 පිණ්ඩපාතික ථෙරාපදානය

3176 "තිස්ස නම් සම්බුදුවරයෙක් විය. එකල්හි උන් වහන්සේ වනයෙහි විසූසේක. මම තුසිතයෙන් මෙහි පැමිණ උන්වහන්සේට පිණ්ඩපාත දානයක් දුනිමි.

3177 "මහත්වූ ගුණ ඝොෂාවක් ඇති තිස්ස නම් බුදු රජුන්හට සිය සිත පහදවා වැඳ මම (ආපසු) තුෂිත දෙව් ලොවට ගියෙමි.

3178 "මින් දෙයානූවන කපෙහිවූ එකල්හි යම් (පිණ්ඩපාත) දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පිණ්ඩපාත දානයාගේ මේ විපාකයයි 3179

# 37 මන්දාරව පුප්ඵීය වග්ග.

## 361 මන්දාරව පුප්ඵීය ථෙරාපදානය

3180-3181 "මංගල නම් මානවකවූ මම මදාරා මල් ගෙන තව්තිසා දෙව්ලොව සිට මෙහි පැමිණ සමාධියෙන් වැඩහුන්

විපස්සී බුදුරජුන්ගේ මස්තකයෙහි දැරීම් (ඒ මල් කුඩයක් මෙන්) සතියක් (බුදුරජුන්හට) දරා සිට නැවත දෙව් ලොවට ගියෙමි.

3182 "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3183

## 362 කක්කාරු පුප්ඵිය ථෙරාපදානය

3184 "(මම) යාම දෙව්ලොව සිට මෙහි පැමිණි ශ්‍රීමත්වූ ගෞතමයන්වහන්සේ (දුටිමි) (දැක) කැකිරි මල් ගෙන (එම) බුදුරජුන්හට පිදීමි.

3185 "මින් දෙයානූවන කපෙහි යම් බුද්ධ පූජාවක් (කැකිරිමල් පිදීමක්) කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3186

## 363 භිසමුළාලදායක ථෙරාපදානය

3187 'සියළු ධර්මයන්ගේ තෙරපත් ඵුස්ස නම් සර්වඥවරයෙක් විය. සප්‍රාඥවූ විවේකය කැමති උන්වහන්සේ මාගේ සමීපයට පැමිණියේය.

3188 "පස්මරුන් ජයගත් මහාකාරුණිකවූ එම බුදු රජාණන් වහන්සේ කෙරෙහි සිත පහදවා මම නෙළුම්බල සහ දඬුගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

3189 "මින් දෙයානූවන කපෙහිවූ එකල්හි යම් නෙළුම්බල දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. නෙළුම්බල දනෙහි මේ විපාකයයි. 3190

## 364 කෙශරී පුප්ඵිය ථෙරාපදානය

3191 "එකල්හි මම හිමවත් පව්වෙහි විද්‍යාධරයෙක් වීමි. (එහිදී) මහත් යශස් ඇති කෙලෙස් රජස් නැති සක්මන් කරන්නාවූ බුදුරජුන් දුටිමි.

3192 කෙසුරුමල් (බක්මී) තුණක් හිසමත තබා වෙස්සභූ බුදුරජුන් වෙත එළඹ පිදීමි.

3193 "මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3194

## 365 අංකොල පුප්ඵිය ථෙරාපදානය

3195 "එකල්හි චිත්‍රකූට පර්වතයෙහි පදුම නම් බුදුරජ තෙමේ වැඩවෙසෙයි. තෙමේම අවබොධකළාවූ උන්වහන්සේ දැක (එහි) එළඹියෙමි.

3196 "එකල්හි පිපුණු රුකගුන ගසක් දැක මම එම මල් නෙලා පස්මරුන් දිනූ පදුම බුදුරජුන් වෙත එළඹ (එය) පිදීමි.

3197 "මින් එක් තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි 3198

## 366 කදම්බ පුප්ඵිය ථෙරාපදානය

3199 "ඇතුල් වීථියෙහි වඩින්නාවූ ස්වර්ණවර්ණවූ දෙතිස් ලකුණෙන් විසිතුරුවූ කසුන් ඇගෑවක් වැනි

3200 ලොකනායකවූ බුදුරජුන් උතුම් පහයෙහි හිඳ දුටිමි. (මම) ඒ විපස්සී බුදුරජුන්හට කොලොම් මල් ගෙන පිදීමි.

3201 "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3202

## 367 උද්දාල පුප්ඵිය ථෙරාපදානය

3203 "අනොම නම් සම්බුදු රජතෙමේ ගංඉවුරෙහි විසීය. මම එකල්හි ඇසළ මල් ගෙන පස්මරුන් දිනූ උන් වහන්සේට පිදීමි.

3204 "මින් එක් තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතු වෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3205

## 368 එකචම්පක පුප්ඵිය ථෙරාපදානය

3206 "උපසන්ත නම් සම්බුදු රජතෙමේ කඳු අතරෙහි මෙසේ (මම) එක් සපුමලක් ගෙන නරොත්තමවූ (එම) බුදු රජුන් වෙත එළඹියෙමි.

3207 "පහන්සිත් ඇත්තේ සොම්නස්වූයේ පස් මරුන් දිනූ පසේබුදුරජුන්හට (එමමල්) දොහොතින් ගෙන පිදීමි.

3208 "මින් එක් තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3209

## 369 තිමිර පුප්ඵිය ථෙරාපදානය

3210 "චන්ද්‍රභාගා නදීතීරයෙහි ගඟ පහළට මම යෙමි. (එකල්හි) පිපුනු සල්රුකක් වැනිව බබලන්නාවූ බුදුරජුන් මම දුටිමි.

3211 "පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ මම තිමිර මල් ගෙන එම මල් පසේ බුදුරජුන්ගේ මස්තකයෙහි (උඩට දමා) පිදීමි.

3212 "මින් එක් අනුවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3213

## 370 සළලපුප්ඵිය ථෙරාපදානය

3214 "එකල්හි මම චන්ද්‍රභාග නදිතීරයෙහි කිඳුරෙක් වීමි. එහිදී සක්මණෙහි යෙදෙන දෙවියනට දෙව්වූ බුදුරජුන් දිටිමි.

3215 "මම සළල මල් නෙලා එම බුදුරජුන්හට දුනිමි. බුදුරජතෙමේ දිව්‍යමය සුවඳ ඇති එම සළල මල් ආඝ්‍රාණය කළේය.

3216 මෙයින් එක් තිස්වන කපෙහි යම් කර්මයක් කෙළෙම්ද, ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. මේ බුද්ධ පූජාවෙහි විපාකයයි.

3217 (ඉක්බිති) පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ බුදුරජුන් වැඳ නැවතද ඇඳිලි බැඳ පර්වතයට නැංගෙමි.

3218 "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3219

# 38 බොධිවන්දක වග්ග.

## 371 බොධිවන්දක ථෙරාපදානය

3220 "මම පලාවන්වූ පළොල් ගසක් දැක එකස්කොට ඇඳිලි බැඳ එම පළොල් බොධියට වැන්දෙමි. (පළොල් ගස විපස්සී බුදුන්ගේ බොධියයි.)

**3221-3222** "ඇඳිලි බැඳගන සිතින්ද ගරුකොට ඇතුළත පිරිසිදුවූ පිටතද පිරිසිදුවූ මැනවින් (සියළු කෙලෙසුන්ගෙන්) මිදුනාවූ ආශ්‍රව රහිතවූ ලෝවැස්සන් විසින් පුදන ලද කරුණාවට හා ඥානයට සාගරයක් වැනිවූ විපස්සී බුදුරජුන් හමුයෙහි මෙන් එම පළොල් ගසට වැන්දෙමි.

**3223** "මින් එක්අනූවන කපෙහි යම් බොධියකට වැන්දෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වන්දනාවෙහි මේ විපාකයයි. 3224

## 372 පාටලීපුප්ඵිය ථෙරාපදානය

**3225** "සියල්ල තෙමේම අවබොධ කළාවූ අග්‍ර පුද්ගලවූ පස්මරුන් ජයගත් විපස්සී නම් භාග්‍යවතුන් වහන්සේ ස්වකීය ශිෂ්‍යයන් විසින් පිරිවරන ලදුයේ බන්ධුම නගරයට පිවිසිසේක.

**3226** "මා විසින් පළොල් මල් තුනක් ඔඩොක්කුවෙහි තබන ලද්දේය. (ඒ) මම හිස පටන් නගනු කැමැත්තේ ගංතෙරට ගියෙමි.

**3227-3228** 'බන්ධුමතී නගරයෙන් නික්ම වඩින්නාවූ මහනිල් මලක් මෙන් බබලන ඇවිලගත් ගින්නක් වැනිවූ ශ්‍රෙෂ්ඨ ව්‍යාඝ්‍රයෙකු මෙන්වූ උතුම්වූ විශිෂ්ඨ ජන්ම ඇති සිංහයෙකු වැනිවූ ශ්‍රමණයනට අග්‍රවූ භික්ෂු සංඝයා විසින් පිරිවරන ලද ලොක නායකවූ බුදුරජුන් දුටිමි.

**3229** "කෙලෙස් මල දෝනාවූ ඒ බුදුරජුන් කෙරෙහි පැහැදුනේ (එම පළොල්) මල් තුන ගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ පිදීමි.

**3230** "මින් එක් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 3231

## 373 තිළප්පලමාලිය ථෙරාපදානය

**3232** "මම චන්ද්‍රභාග නදී තිරයෙහි වඳුරෙක් වීමි. එකල්හි කඳු අතරෙහි වැඩහුන් කෙලෙස් රජස් නැති බුදුරජුන් දුටිමි.

**3233** "සියළු දිගුන් බබුළුවන්නාවූ පිපිණු සල් රුකක් වැනිවූ (දෙතිස් මහ පුරිස්) ලකුණින් හා (අසූ) අනුව්‍යඤ්ජනයන්ගෙන් යුත් (උන්වහන්සේ) දැක සතුටුවූ මම,

3234 "ඔද වැඩි සිත් ඇත්තේ සොම්නස් වූයේ ප්‍රීතියෙන් පිණා ගිය සිත් ඇත්තේ උපුල් මල් තුනක් හිස මත (අහසෙහි දමා) පිදීමි.

3235 "මම ඵුස්ස බුදුරජුන්හට (එම) මල් පුදා ගෞරව සහිතව උතුරු දෙසට මුහුණ ලා ගියෙමි.

3236 "පැහැදි සිතින් යුහුව යන්නේ කඳු අතරෙහි වැටී ජීවිතක්ෂයට පත්වීමි.

3237 'මැනවින් කරනලද එම පුණ්‍යකර්මය කරණකොට ගෙනද සිතෙහි ඇතිවූ ප්‍රාර්ථනාවන් කරණකොට ගෙනද මම පළමු ජාතිය හෙවත් එම ආත්මය හැර තව්තිසා දෙව් ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

3238 "තුන්සිය වරක් දිව්‍යරාජ්‍යය කරවීමි. (එසේම) මම පන්සිය වරක් සක්විති රජවීමි.

3239 "මින් දෙයානුවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි 3240

## 374 පට්ටිපුප්ඵිය ථෙරාපදානය

3241 "යම් කලෙක්හි මහර්ෂිවූ පදුමුත්තර බුදුරජතෙම පිරිනිවන් පෑ සේක්ද, එකල්හි සියළුම මහජනයා එකතුව උන්වහන්සේගේ ශ්‍රී දේහය ගෙනයත්.

3242 "(එසේ) බෙරවයද්දී ශ්‍රී ශරීරය ගෙනයන කල්හි පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ මම පට්ටි පුෂ්පයක් පිදීමි.

3243 "මින් සියක් දහස් (ලක්ෂයක්) වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ශ්‍රීදේහය පිදූකල්හි (ලැබෙන මේ) විපාකයයි

3244 බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සමීපයට එකාන්තයෙන්ම මාගේ යහපත් පැමිණීමක් විය. ත්‍රිවිද්‍යාවෝ පැමිණෙන ලද්දාහු වෙති. ත්‍රිවිද්‍යා (ලැබීම්) බුදුරජාණන් වහන්සේගේ සසුන කරන ලදී.

3245 "මා විසින් කෙලෙස් දවන ලදී. සියළු භවයෝ නසන ලදහ. හස්තියෙකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි. 3246

## 375 සත්තපණ්ණිය ථෙරාපදානය

**3247** "ලොකනායකවූ සුමන නම් සම්බුදු රජතෙමේ ලොව පහළ විය. (මම) පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ රුක් අත්තන (මල්) පිදීමි.

**3248** "මින් සියක් දහස් (ලක්ෂයක්) වන කපෙහි යම් රුක් අත්තන මල් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. රුක්අත්තන මල් පිදීමේ මේ විපාකයයි.

**3249-3250-3251** (මෙහි 3244, 3245, 3246 යොදන්න)

(මින් ඉදිරියට තිබෙන අපදාන අගට මෙසේම යොදන්න)

## 376 ගන්ධමුට්ඨිය ථෙරාපදානය

**3252** "නොයෙක් සුවඳ වර්ග රැස්කොට සෑයක් (චිතකයක්) කරනු ලබන කල්හි මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ සුවඳ මිටක් (මම සෑයට) පිදීමි.

**3253** "මින් ලක්ෂයක්වන කල්පයෙහි යම් චිතක පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චිතක පූජාවෙහි මේ විපාකයයි.

3254-3255-3256

## 377 චිතක පූජක ථෙරාපදානය

**3257** "පදුමුත්තර නම් බුදුරජුන් පිරිනිවි කල්හි (උන් වහන්සේගේ ශ්‍රී දෙහය) චිතකයට නැගූ කල්හි (මම) සල්මල් පිදිමි.

**3258** "මින් ලක්ෂයක් වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චිතක පූජාවෙහි මේ විපාකයයි.

3259, 3260, 3261

## 378 සුමන තාලවණ්ටිය ථෙරාපදානය

**3262** "මම සමන් මල්වලින් වසා කළ මාහැඟි විජිනි පතක් දරමි. මම එම විජිනිපත සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේට දුනිමි.

**3263** "මම මින් සිව්අනූ වන කපෙහි යම් විජිනි පතක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. විජිනිපත් දනෙහි මේ විපාකයයි.

3264, 3265, 3266,

## 379 සුමනදාසිය ථෙරාපදානය

**3267** "(චතුර් මාර්ග ඥාන ජලයෙන් කෙලෙස් කසට සේදී යන සේ) ස්නානය කළාවූ තපොගුණ ඇති සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේට ඉදිරියෙහි සිටියේ සමන්මල් දමක් කොට දැරීමි.

**3268** "මින් සිව්අනූ වන කපෙහි යම් (සමන් මල්) දමක් දැරූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සුමන මල්දම් දැරීමෙහි මේ විපාකයයි.

3269-3270-3271

## 380 කාසුමාරිඵලදායක ථෙරාපදානය

**3272** "කිණිහිරි රුකක් මෙන් බබලන්නාවූ කඳුඅතරෙහි වැඩහුන් කෙලෙස් රජස් විරහිත ලොවට දෙටුවූ නරශ්‍රෙෂ්ඨවූ බුදුරජුන් දුටිමි.

**3273** "(දැක) පහන් සිත් ඇති සොම්නස්වූ මම හිසෙහි ඇඳිලි බැඳ කාසුමාරි ඵල (ඇත්දෙමට ගෙඩි) ගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

**3274** "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි.

**3275-3276** "(මවිසින්) ක්ලේශයෝ දමන ලදහ. ආශ්‍රව රහිතව වෙසෙමි. 3277.

# 39 අවණ්ට ඵලදායක වග්ග.

## 381 අවණ්ට ඵලදායක ථෙරාපදානය

**3278** "සියල්ල තෙමේම අවබොධ කළාවූ පස්මරුන් දිනූ භාග්‍යමත්වූ සතරංසී නම් සම්බුදු රජතෙම විවේකය කැමැති වන්නේ ගොදුරු ගමින් නික්මුනේය.

**3279** "මම (එසේ නික්මුනාවූ) බුදුරජුන් දැක ඵලගත් අත් ඇත්තේ (උන්වහන්සේ වෙත) එළඹියෙමි. පහන්සිත් ඇත්තේ සොම්නස්වූයේ නැටි රහිත ගෙඩි වර්ගයක් දුනිමි.

**3280** "මින් සිව් අනූවන කපෙහි මම යම් ඵලදානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵලදානයාගේ මේ විපාකයයි.

3281-3282-3283

## 382 ලබුජදායක ථෙරාපදානය

3284 "එකල්හි මම බන්ධුමති නගරයෙහි ආරාමිකයෙක් (අරමෙහි වතාවත් කරන්නෙක්) වීමි. (එහිදී) අහසෙහි වඩින්නාවූ කෙලෙස් රජස් විරහිත බුදුරජුන් දුටිමි.

3285 "(දැක) මම දෙල්ගෙඩි ගෙන බුදුරජුන්හට දුනිමි. මහත් යශස් ඇති සර්වඥතෙම අහසෙහි වැඩ සිටියේම එය පිළිගත්තේය

3286 "(එය) මාගේ සතුටු උපදවන්නෙකි මෙලොවදීම සුව එලවන්නෙකි. පැහැදි සිතින් (එම) එල බුදුරජුන්හටදී

3287 "එකල්හි ප්‍රීතියද මහත්වූ උතුම් ප්‍රීතියද ලැබීමි. ඒ ඒ තන්හි උපන්නාවූ තමන්හට රුවන් නිපදේමය.

3288 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් එල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. එල දානයාගේ මේ විපාකයයි.

3289-3290 3291

## 383 උදුම්බර එලදායක ථෙරාපදානය

3292 "චින්තා නදී තීරයෙහි පුරුෂොත්තමවූ බුදුරජ තෙම වැඩවිසීය. (මම) සන්හුන් වූ කෙලෙස් රජස් විරහිත එකගවූ බුදුරජුන් දිටිමී.

3293 "කෙලෙස් මල දෝනාවූ උන්වහනසේ කෙරෙහි පහන් සිත් ඇත්තේ මම දිඹුල්ගෙඩියක් ගෙන බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

3294 'මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් එල දානයක් දුනිම්ද, ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. එලදානයාගේ මේ විපාකයයි.

3295-3296-3297

## 384 පිලක්ඛ එලදායක ථෙරාපදානය

3298 "වනයෙහිදී මහත් කීර්ති ඇති අර්ථ දස්සී බුදුන් දැක පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ පුලිල ගෙඩි දුනිමි

3299 "එක්දහස් අටසිය වන කපෙහිවූ එකල්හි යම් එලදානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. එල දානයාගේ මේ විපාකයයි.

3300-3301-3302

## 385 එාරුස ඵලදායක ථෙරාපදානය

3303 "ලෝකයේ පූජාවන් පිළිගන්නාවූ රන්වන්වූ මාර්ගයෙහි වඩින්නාවූ බුදුරජුන් දැක (මම) උන්වහන්සේට බොරළු දමන (උගුරැස්ස) නම් ගෙඩි වර්ගයක් දුනිමි.

3304 "මින් එක් අනූවන කපෙහි යම් ඵලදානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵලදානයාගේ මේ විපාකයයි.

3305-3306-3307

## 386 වල්ලි ඵලදායක ථෙරාපදානය

3308 "සියළු ජනයෝ එක්ව එකල්හි වනයට ගියාහුය. එකල්හි ඵල සොයන්නාවූ ඔවුහු ඵල වර්ග ලැබුවාහුය.

3309 'එහිදී (මම) සියල්ල තෙමේම අවබොධකර ගත්තාවූ පස්මරුන් දිනූ සම්බුදු රජුන් දිටිමි (දැක උන් වහන්සේට) මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ වැල්වල සෑදුනු ඵල වර්ගයක් දුනිමි.

3310 "මින් එක්තිස්වනු කපෙහිවූ එකල්හි යම් ඵලදානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵලදානයාගේ මේ විපාකයයි.

3311-3312-3313

## 387 කදලිඵල දායක ථෙරාපදානය

3314 "කිණිහිරි රුකක් මෙන්ද පසළොස්වක් පොහෝ දා සඳුමෙන්ද බබලන ඇවිලගත් ප්‍රදීප වෘක්ෂයක් වැනිවූ බුදු රජුන් දුටිමි.

3315 "මම කෙසෙල් ගෙඩියක් ගෙන පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ බුදුරජුන්හට පිදීම් (ඉක්බිති) වැඳ ඉවත්ව ගියෙමි.

3316 "මින් එක් තිස්වන කපෙහි යම් ඵලදානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි ඵලදානයාගේ මේ විපාකයයි

3317-3318-3319

## 388 පනසඵලදායක ථෙරාපදානය

3320 "එකල්හි අර්ජුණ නම් සම්බුද්ධතෙමේ හිමවතෙහි විසීය. එම සර්වඥතෙමේ පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්ත වූයේ සමාධියෙහි දක්ෂවූයේද වේ.

3321 "කළගෙඩි පමණවූ පනස (කොස්) හා ජීවජීවක නම් ඵලද ගෙනවුත් පර්ණච්ඡත්‍රයෙහි කුඩය වෙනුවට ඉසලන කොළයෙහි තමා මම ශාස්තෘන් වහන්සේට දුනිමි.

3322 'මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි.

3323-3324-3325

## 389 සොනකොටිවිස ථෙරාපදානය

3326 "විපස්සී බුදුරජුන්ගේ සසුන පවත්නා කල්හි සිව් දිගින් වඩින සංඝයාට බන්ධුම රාජධානියෙහි මා විසින් ලෙණක් කරවන ලදී.

3327 "(එම) ලෙණෙහි බිම් වස්ත්‍රවලින් අතුරා (සංඝයාට) පිදීමි. එකල්හි ඔදවැඩි සිත් ඇත්තේ සොම්නස් වූයේ මෙබඳු ප්‍රාර්ථනාවක්ද කෙළෙමි.

3328 "මම බුදුරජුන් සතුටු කරන්නෙමි පැවිද්දද ලබන්නෙමි. අනුත්තරවූ උතුම් ශාන්ති නම්වූ නිවණද ස්පර්ශකරන්නෙමි කියායි.

3329 "එම කුශලමූලයෙන්ම අනූකල්පයක් සැරිසැරීමි. කරනලද පින් ඇති මම දිව්‍යවූයේ මනුෂ්‍යවූයේ බැබලීමි.

3330 "ඉක්බිති අවශෙෂ කර්ම විපාකයෙන් අන්තිම භවයෙහි මේ චම්පා නගරයෙහි අගසිටුහුගේ එකම පුත්‍රයාට උපන්නේ වෙමි.

3331 "මා උපන් පමණින් (එය) අසා පියතුමාහට මෙබඳු අදහසක් විය. (එනම්) මම කුමරුවාහට නොඅඩුව විසිකෙළක් (ධනය) දෙවමි කියායි.

3332 "මාගේ පතුල් දෙකෙහි සියුම්වූ මොලොක් පහස් ඇති කපු පුලුන් වැනි යහපත් සිව් අඟුල් දිග ලෝමයෝ හටගත්තාහුය.

3333 "අනුකපක් ඉක්ම ගියාය. මේ ඉතිරි කල්පයයි. (මේ එකානුකප තුළ) ඇතිරිලි රහිත බිමෙහි පා තුබූ බවක් නොදනිමි.

3334 "මා විසින් සම්බුදු රජතෙම සතුටු කරන ලදී. (මම) අනගාරිය නම්වූ සසුනෙහි පැවිදිවීමි. මා විසින් පැමිණෙන ලද

රහත් බව ඇත්තේය. කෙලෙස් තැවුල් නිවන ලදුයේ සිසිල්වූයේ වෙමි.

3335 "පටන්ගන්නා ලද වීයර්‍ය ඇති භික්ෂූන් අතුරෙන් අග්‍රයයි බුදුරදුන් විසින් (මම) දක්වන ලදුයේ වෙමි. මහත් ඍද්ධි ඇති ෂඩ්භිඥා ඇති ක්ෂය කළ ආශ්‍රව ඇති රහත් කෙනෙක් ද වෙමි.

3336 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ලෙන් දනෙහි විපාකයයි.

3337-3338-3339

## 390 පුබ්බකම්ම පිලෝතිකා ථෙරාපදානය

3340 අනවතප්ත මහවිල් තෙරදි පැන විචාරන ලද සොණකොටිවිය ස්ථවිරතෙමේ බික්සඟන ඉදිරියෙහි (එය) විසඳීය.

3341 "නොයෙක් රත්නයන්ගෙන් බබලන නානාවිධ සුගන්ධ පුෂ්පයන්ගෙන් ගැවසීගත් (හිමාලය) වනයෙහි අනවතප්තවිල සමීපයෙහිවූ සිත්කළු ගල්තලාවක,

3342 "මහත්වූ භික්ෂුසමූහයා විසින් පිරිවරන ලද බුදු රජාණන් වහන්සේ වැඩහුන්සේක් එහිදී තමන් වහන්සේගේ පූර්වකර්මය ප්‍රකාශ කළසේක.

3343 "මහණෙනි, මා විසින් යම් කර්මයක් කරන ලදද (මාගේ ඒ කර්මය අසවා) විපාකාවශෙෂ කර්මය බුදු බැව් ලැබූ කල්හිද විපාකදේ,

3344 "පෙර මම අප්‍රකටවූ (ශුද්‍ර) ජාතියට අයත් මුනාළී නම් ධූතියෙක් වීමි (එකල්හි) ක්ලේශයන්ගෙන් දූෂ්‍ය නොවූ සරභූ නම් පසේ බුදුන්වහන්සේට නින්දා කොට බැන්නෙමි.

3345 "එම (අකුසල) කර්ම විපාකයෙන් නිරයෙහි බොහෝ කලක් හැසුරුනිමි. බොහෝ දහස් ගණන් අවුරුදු දුක් වේදනා වින්දෙමි.

3346 "එම කර්මයාගේ අවශෙෂ විපාක වශයෙන් මේ අන්තිම භවයෙහි සුන්දරිකා නම් පරිබ්‍රාජකාව නිමිතිකොට මා විසින් නින්දා අපහාස වචන ලබන ලදී.

3347 "සම්බාහිභූ නම් බුදුරජුන්ගේ නන්දන නම් ශ්‍රාවකයෙක් විය. උන්වහන්සේට නින්දාකොට මා විසින් බොහෝ කාලයක් නිරයෙහි සැරිසරන ලදී.

3348 "අවුරුදු දසදහසක් පමණවූ දීර්ඝ කාලයක් නිරයෙහි හැසුරුනෙමි. මිනිසත් බව ලැබූ මම බොහෝ නින්දා ලැබීමි.

3349 "එම කර්මයාගේ ශෙෂවූ විපාකයෙන් චිඤ්චමානවිකාතොමෝ ජනසමූහයා ඉදිරියෙහි මට අභූතයෙන් චෝදනා කළාය.

3350 "බොහෝදෙනා විසින් සත්කාර කරන ලද්දාවූද මම බහුශ්‍රැත බමුණෙක් වීමි. මහවෙනෙහි පන්සියයක් මානවකයන්ට මන්ත්‍ර හදාරවමි.

3351 "මහත් ඍද්ධි ඇති පඤ්චාභිඥාලාභීවූ භයජනක ඍෂීවරයෙක් තෙම එහි පැමිණියේය. මම (එසේ) පැමිණියාවූ දූෂ්‍යනොවූ ඔහු දැක නින්දා කෙළෙමි. (කෙසේදයත්)

3352 "ඉක්බිති මම ශිෂ්‍යයන්හට මේ ඍෂිතෙමේ කාම භොගියෙකැයි කීමි මානවකයෝද එසේ කියන්නාවූ මාගේ (කථාවට) අනුව සතුටු වූවාහුය.

3353 "ඉක්බිති සියළු මානවකයෝ ගෙයක් ගෙයක් පාසා පිඬු පිණිස යන්නාවූ මේ ඍෂිතෙම කාමභොගියෙකැයි මහජනයාට කීවාහුය.

3354 "ඒ සියළු මානවකයෝ මේ පන්සියක් භික්ෂූහුම වෙති එම කර්ම විපාකය කරණකොට ගෙන ඔවුහු සුන්දරිකා පරිබ්‍රාජිකාව නිමිතිකොට නින්දා ලැබුවාහුය

3355 "පෙර මම (එක පියෙකුට දාව අන් මව් කුසකින් උපන්) වෙමාතික (කණිටු) සොහොයුරා ධනය හේතුකොට ගෙන නැසීමි. ගිරිදුර්ගයකද හෙළීමි. (හෙළා) ගලකින්ද ගැසීමි.

3356 "එම කර්ම විපාකය කරණකොට ගෙන දෙව්දත් තෙමේ ගලක් පෙරලීය. (ඉන් නැගුනු) ගල්පතුරක් මාගේ පයෙහි මහපටැඟිල්ලට වැදුනේය.

3357 "පෙර මම (කුල) දරුවෙක්ව මහමගෙහි ක්‍රීඩා කරමින් (එම) මගෙහි (වඩින) පසේ බුදුවරයන් වහන්සේ කෙනෙකු දැක ගල් කැබෙල්ලක් (උන්වහන්සේ දෙසට) විසිකෙළෙමි.

3358 "එම කර්ම විපාකය කරණකොට ගෙන මෙම අන්තිම භවයෙහි දෙව්දත් තෙමේ මා මැරීම පිණිස දුනුවායන් යෙදවීය.

3359 "මම පෙර ඇතරුවෙක් වීමි. පිඩු පිණිස හැසිරෙන්නාවූ උතුම් පසේ බුදුවරයන් වහන්සේ කෙනෙක් දැක ඇතා ලවා උන්වහන්සේ ගැටවීමි.

3360 "එම කර්ම විපාකය කරණකොට ගෙන ගිරිබ්බජ (මගධරට පුරාණ රාජධානිය) නම් උතුම් නගරයෙහිදී (මත්වී) භ්‍රාන්තවූ නාලාගිරි ඇත්තෙමේ දරුණුවූයේ මා වෙත එළඹියේය.

3361 "මම පෙර පෘථිවීශ්වරවූ රජෙක්වීමි. (එකල්හි) ආයුධය (කඩුව) කින් (ගසා) පුරුෂයෙකු මැරීමි. එම කර්ම විපාකය කරණකොට ගෙන බොහෝ කලක් නිරයෙහි පැසුනෙමි.

3362 "එම කර්මයාගේ ශෙෂවූ විපාකයෙන් මෙකල මාගේ පාදයෙහි සියළු සිවිය (ඇතුළත ලේගැලීම නිසා) නරක්විය. කර්මය නැති නොවේ.

3363 "මම කෙවුල් ගමක කෙවුල් දරුවෙක් වීමි. (එකල්හි) නසන ලද මසුන් දැක සොම්නස ඉපදවීමි.

3364 "එම කර්ම විපාකයෙන් මාගේ හිසෙහි (දුක්) වේදනාවක් ඇතිවිය. යම් කලෙක්හි විඩූඩභ තෙමේ යුද කෙළේද, එකල්හි සියළු ශාක්‍යයෝද නැසුනාහුය.

3365 "ඵුස්ස බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි (එම) ශ්‍රාවකයන්හට 'යව කව්' හැල් අනුභව නොකරව් යයි නින්දා කෙළෙම්ද,

3366 "එම කර්ම විපාකයෙන් බමුණෙකු විසින් ආරාමනය කරන ලදුයේ වෙරඤ්ජාවෙහි වසමින් එකල්හි තෙමසක් මුළුල්ලෙහි යව අනුභව කරන ලදී.

3367 (පෙර) මල්ල යුද්ධයක් පවත්නා කල්හි (ප්‍රතිමල්ලව ආ) මල්ලපුත්‍රයෙක් පෙළීමි. එම කර්ම විපාකය කරණ කොට ගෙන මාගේ පිටෙහි (පවත්නා) දුක්ඛ වේදනාවක් වීය.

3368 "මම පෙර වෛද්‍යවරයෙක් වීමි. (ධනය ගනු කැමතිව) එක් සිටුපුත්‍රයෙක් විරේක කරවීමි. එම කර්මය කරණකොට ගෙන මට ලොහිත පක්ඛන්දිකා (ලේ අතීසාරය) වැළඳුනේ වේ.

3369 "(පෙර) ජොතිපාල මානවකවූ මම එකල්හි කාශ්‍යප බුදුරජාණන් වහන්සේට හිසමුඬුකළහුට (සම්බොධි) ඥානයක් කොයින්ද, (තොපට) (සම්බොධි) ඥානය ඉතා දුර්ලභ යයි කීමි.

3370 "එම කර්ම විපාකය කරණකොට ගෙන උරුවෙලායෙහි සාවුරුද්දක් බොහෝ දුෂ්කර ක්‍රියා කෙළෙමි. ඉක්බිති සම්‍යක් සම්බොධියට පැමිණියෙමි.

3371 පූර්ව කර්මයෙන් (සැප) වළක්වන ලදුයේ නොමගින් බුදුබව සොයන්නෙමි. මම (එම්) නොමගින් උතුම් සම්‍යක් සම්බොධියට නොපැමිණියෙමි.

3372 "කුසල් හා අකුසල් (රැස් කිරීමේ ශක්තිය) ක්ෂය කරන ලදුයේ සියළු (කෙලෙස්) තැවුල් බැහැර කරන ලදුයේ ශොක රහිතවූයේ වෙහෙසීම් රහිතවූයේ ආශ්‍රව රහිත වූයේ පරිනිර්වාණයට පවත්වන්නෙමි.

3373 "සියළු අභිඥා බලයනට පත් සර්වඥයන් වහන්සේ අනවතප්ත මහ විල් (තෙර) හිදි බික් සඟන ඉදිරියෙහි මෙසේ වදාළ සේක.

මෙහි මේ අයුරින් භාග්‍යවතුන්වහන්සේ තමන්වහන්සේගේ පූර්වචරිතය (දැක්වෙන) පුබ්බකම්මපිලොතික නම් වූ ධර්ම පරියාය වදාළ සේක.

## 40 පිළින්දවච්ඡ වග්ග

### 391 පිළින්දවච්ඡ ථෙරාපදානය

3374 "මම හංසවතී නගරයෙහි දොරටුපාලයෙක් වීමි. මාගේ ගෘහයෙහි රැස්කරන ලද නිරවුල් අපමණ භොග සම්පත්ද විය.

3375 "මම එකල්හි පහයෙහි වාඩිවී විවේකව හිඳ සිත පහදවා මෙසේ සිතිමි.

3376 "මා විසින් භොග සම්පත්තීහු ලබන ලදහ. මාගේ අන්තො නගරය සමෘද්ධය පෘථිවිශ්වරවූ ආනන්ද රජ තෙමේද (බුදුරජුන් ප්‍රධාන සංඝයාට දානය සඳහා) ආරාධනය කෙළේය.

3377 "සර්වඥතෙම ලෝවැඩ සඳහා පහළවන්නේවේ. මේ (ඒ) සර්වඥතෙම ලොව පහළ විය. මාගේ භොගයෝද විද්‍යාමාන වෙත්, ශාස්තෘන්වහන්සේට දනක් දෙන්නෙමි.

3378 "පදුම නම් රාජ පුත්‍රයා විසින් බුදුරජාණන් වහන්සේ කෙරෙහි උතුම්වූ දානයක් දෙන ලදී (එම දානයෙහි) හස්තිරාජයන්ද පයඞ්කයන්ද හේත්තුවන ඇඳිද යන බොහෝ දේ වෙයි.

3379 "මමද උතුම්වූ සංඝයා කෙරෙහි දනක් දෙන්නෙමි. අනුන් විසින් නොදුන් විරූ (දැදීමෙහි) ආදිකර්මිකයෙක් වන්නෙමි.

3380 "යමක් පිළිබඳවූ දීමෙහි සැපවත්වූ විපාකයක් ඇද්ද, මම (ඒ විපාකයන් නන්අයුරින් සිතා මාගේ අදහස් සපුරාලන පරිෂ්කාර දානය (මේ මෙයයි) දුටිමි.

3381 "උතුම් වූ සංඝයා කෙරෙහි පිරිකර දෙන්නෙමි. අනුන් විසින් නොදුන් විරූ (දැදීමෙහි) ආදිකර්මිකයෙක් වන්නෙමි.

3382 "එකෙණෙහි කුළු පොත්තන් (බට ලී කර්මාන්ත කරන්නන්) වෙත එළඹ ඡත්‍රයක් කරවීමි. (එබඳු) ඡත්‍ර ලක්ෂයක් එක් රැස් කෙළෙමි.

3383 "(එසේම) වස්ත්‍ර ලක්ෂයක්ද එක්රැස් කෙළෙමි. පාත්‍ර ලක්ෂයක්ද එක්රැස් කෙළෙමි.

3384 "වෑද, කුඩ, පිහියද, හිඳිකටුද නියපොතු කපනා පිහියද ඊට සුදුසු ලෙස කරවා කුඩය යට (පැත්තෙහි) එල්බ වීමි.

3385 'පවන් අතුද, වටාපත්ද, මොණරපියාපත්ද, සෙමර (වල්ගද පෙරහන්කඩද තෙල් බඳුන්ද එයට සුදුසු ලෙස කරවීමි

3386 "ඉදිකටු ගුලාද උරහිසේ එල්ලන (අංශ කඩ) පටිද එසේම හිණ බඳනා පටිද කුඩා මේස කනප්පු පාත්‍ර අඩි ආදි මැනවින් ආධාරකද එයට සුදුසුලෙස කරවීමි.

3387 "පරිභොගයට ගන්නා බඳුන්ද එසේම ලොහො තලිද බෙහෙත් (වර්ග) වලින් පුරවා මම ඡත්‍රය යට තැබීමි. (කිනම් බෙහෙත්ද යත්?)

3388 "වදකසාය, සැවැන්න (විෂ්ණුක්‍රාන්ති) මුල්ය දඹුවෙල්බෑ මීය, පිප්පිලි නොහොත් පුලිලය, මිරිස්ය, අරළුය, හිඟුරුය, යන මේ සියල්ල බඳුන්හි පිරවීමි.

3389 "සෙරෙප්පුද, මිරිවැඩියද එසේම නෑමෙන් පසු දිය පිසනා දිය පිස්නාවන්ද මැනවින් කළ සැරයටියද එයට සුදුසු ලෙස කරවීමි.

3390 "බෙහෙත් අඳුන් නාළිකා (භාජන) ද (බෙහෙත් ගෑම් ආදිය සඳහා ගන්නා) ලොහොකුරු හෝ උණපතුරුද දම් කොතුරු (පැන් කෙණ්ඩිය) ද කෙණෙසි (සතුරු) ද පස්වර්ණයකින් (පාට පසකින්) වසා කළ කෙසිගුලා හෙවත් යතුරු දමන කොපුද

3391 "යමක් එල්ලා ගැනීම සඳහා උරහිසේ යොදන පටිද දුම් (බොන) පයිප්පද දල්වන පහන්ද නොහොත් පහන් එල්ලන කොකුද ධාන්‍ය මැණීමට ගන්නා) තිඹනම් මිණුම්ද කරඬුද එයට සුදුසු ලෙස කර වීමි.

3392 "හඬුද කතුරුද (යලිදු) මලහරනා හඬුද බෙහෙත් දමන පසුම්බිද එයට සුදුසු ලෙස කරවීමි.

3393 'දික්හගලාපුටුද කුඩා පුටුද ඇඳි නැති (පා සතරකින් යුත්) අසුන්ද මම එයට සුදුසු ලෙස කරවා ඡත්‍රයට තැබීමි.

3394 "එළලොම් පිරවූ ගුදිරිද පුලුන් පිරවූ ගුදිරිද යලිදු පුටුවලට දමන ගුදිරිද මැනවින් කරන ලද මෙට්ටද එයට සුදුසු ලෙස කරවිය.

3395 "කුරුවින්දක පාෂාණද මීඉටිද (තල) තෙල්ද ඇඟ ඉලීමට ගන්නා පෙණද (ඇඟ ඉලීමට ගන්නා මටකළ) ගල්පතුරුද.

3396 "සෙනසුන්ද පාපිසිද සෙනසුන්හි පරිභොගයට ගන්නා (සැරයටි ආදි) දඬුද දැහැටිද ආටලී නම් ද්‍රව්‍යයද හිසෙහි ගල්වන ගන්ධ (තෛලාදිය) දඃ

3397 "ගිනිගානා දඬුද පිදුරුයොදා කළ පුටුද පාත්‍රයන් වහන පියන් හා තලිද දියගන්නා පිණිස යොදන කිණිසිද සුණු වර්ගද පඬුරුද,

3398 '(හමදනා) මුස්නුද දියබඳුන්ද එසේම වැසි සළුද හිඳිනා ඇතිරිද වණ බඳින රෙදි පටිද හඳනද

3399 "තනිපට සිවුරු හා දෙපට සිවුරුද නශ්‍ය කරන ද්‍රව්‍යද මුවදෝනා බඳුන්ද ඇඹුල්කාඩි (විනාකිරිද) ලුණුද බොහෝවූ මීද දිහියෙන් කළ පාන වර්ගද,

3400 "දුම් අල්ලන ද්‍රව්‍යයද ඉටිද රෙදි කැබලි (පාන්කඩ) ද මුව පිස්නා (ලේන්සු) හා නූල් දැයි (මෙසේ දියයුතු යමක් ඇද්ද, (ඒ) යමක් ශාස්තෘන්වහන්සේට කැපද,

3401 "මේ සියල්ල රැස්කරවා මහර්ෂිවූ බුදුරජුන්ගේ පියාවූ ආනන්ද රජුවෙත එළඹියෙමි. එළඹ හිසනමා වැඳ මෙම වචනය කීමි. (කෙසේද යත්?)

3402 "(අපදෙදෙන) එකට ඉපිද එකට වැඩුනෝ වෙමු. දෙදෙනාගේ සිතද එක්වම පවතී. දෙදෙනා පිළිබඳව සුව දුක් දෙදෙනාටම සාධාරණය (දෙදෙනාම ඔවුනොවුනට) අනුව පවත්නෝ වෙමු.

3403 "සතුරන් මඩනාවූ රජතුමනි, මාගේ සිතෙහි තොප අයත් හෙවත් තොපවිසින් මැඩලිය යුතු දුකක් නැත. ක්ෂත්‍රියයාණෙනි, ඉදින් හැකිවෙයි නම් එම දුක දුරුකරන්නෙහිය කියායි.

3404 "ඔබගේ දුක මගේ දුකය. දෙදෙනාගේම සිත එක් බඳුය. ඉදින් තාගේ දුක මා අයත් නම් හෙවත් මා විසින් මැඩලිය හැක්කක් නම් එය අවසන්වීයයි දැනගනුව.

3405 "මහරජතුමනි, මගේ දුරුකළ නොහැකි එක් උතුම් දෙයකැයි දැනගනුව' එය කිරීමෙහි පොහොසත් වන්නේ නම් (කරන බවට) ගර්ජනය කරනු මැනවි.

3406 "විජිතය (පිළිබඳ) යම්තාක් දේ ඇද්ද ඉදින් මෙකී දෙයකින් ඔබට ප්‍රයෝජන නම් කම්පා නොවූයේම (එය) දෙන්නෙමි.

3407 දෙවයන් වහන්ස, ඔබවිසින් (එසේකරන බවට) ගර්ජනය කරන ලදී. එබඳු බොහෝ ගර්ජිතයන් (ඇතැම් විට) බොරුවන්නේය. අද ඔබ සියළු ධර්මයන්හි පිහිටියෙක් දැයි දැන ගන්නෙමි"

3408 "(ඇති) යමක් දෙන්නාවූ මා (ඔබ) දැඩිලෙස පෙළනෙහිය. මා පෙළීමෙන් ඔබට ඇති ප්‍රයෝජනය කිම තාවිසින් පතන ලද්ද මට කියව."

3409 "මහරජ තුමනි, මම අනුත්තරවූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ කැමැත්තෙමි. සම්බුදුරජුන් වළඳවන්නෙමි. ජීවිතය (බඳු) මාගේ වචනය අන්ලෙසකින් නොවේවා,"

3410 "මම ඔබට අනික් වරයක් දෙමි. තථාගයන් වහන්සේ නොඉල්ලුව මැනව. ජොතිරස නම් මැණික වැනිවූ බුදුරජතෙම කිසිවෙකුට නොදිය යුත්තෙකි"

3411 "දෙවයන්වහන්ස, ඔබ විසින් තමාගේ ජීවිතය වුවද දෙමැයි ගර්ජනය කරන ලදුයේ නොවේද? ජීවිතය දෙන්නාහු විසින් බුදුරජුන් දීම සුදුසුය"

3412 "බුදුරජතෙම (වෙන්කොට) තැබිය යුතුය. සර්වඥ තෙම කිසිවෙකුට නොදිය යුතුවේ. මා විසින් බුදුරජතෙම දෙමැයි පිළිවදන් නොදෙන ලදී. (අනික් කැමතිතාක්) පෙමණවූ ධනය ඉල්ලනු මැනව.

3413 "අධිකරණයට පැමිණෙමු අධිකරණයෙහිදී (කරුණු) විචාරන්නෙමු"

3414 "රජුන් අත්ගෙන විනිශ්චය (උසාවියට) ගියෙමි. විනිස කරුවන් ඉදිරියෙහි මෙම වචනය කීමි."

3415 "විනිස කරුවෝ මාගේ (වචනය) අසත්වා, කිසිවක් නොතබා මට රජතෙම වරයක් දුන්නේය. ජීවිතය පවා පැවරිය හෙවත් කැමති වුවහොත් දෙන බව කීය."

3416 'මට (එසේ)' වරදුන් මම බුදුරජුන් ඉල්ලීම මම බුදුරජතෙම මැනවින් දෙන ලද්දේ වේද, එසේ නොදෙන ලද්දේ නම් (එය වරදකැයි) මාගේ සැකයකි.

3417 "තාගේ වචනයද පෘථිවිපාලකවූ රජුගේ වචනයද අසන්නෙමු. දෙදෙනාගේම වචන අසා මෙහි සැක දුරු කරන්නෙමු."

3418 "දෙවියන් වහන්ස, කිසිවක් තබා නොගෙන සියල්ලම ගතයුතුසේ කොට (ඒ) සියල්ල ඔබවහන්සේ විසින් මොහුට දෙන ලදද, ජීවිතය (දෙන බව කියා) පැවරීද?"

3419 "(හෙතෙම) කරදරයට පැමිණියෙක්ව උතුම්වරයක් ඉල්ලීය. අතිශයෙන් දුකටපත් මොහු දැන (කැමති සියල්ලක්ම දෙමැයි) සර්වග්‍රාහිකකොට වරයක් දුනිමි."

3420 "දෙවයන් වහන්ස, පරාජය ඔබවහන්සේටය. බුදුරජතෙම ඔහුට දියයුතුය. දෙදෙනාගේම සැක පසිඳින ලදී. සත්‍යයෙන් සිටිනු මැනව"

3421 "රජතෙම එහිම සිටගෙන විනිස කරුවනට මෙය කීය" මිත්‍රවරුනි, මටද තෙපි (වරයක්) දෙන්නහු නම් නැවත මේ බුදුරජුන් (ආපසු) ලබමි.

3422 "තාගේ අදහස් සම්පූර්ණකොටගෙන තථාගතයන් වළඳවා ආනන්ද රජුහට නැවත (ආපසු) බුදුරජුන් දෙන්නෙහිය."

3423 "මම විනිසකරුවනටද රජතුමාටද වැඳ සතුටු වූයේ ප්‍රමුදිතවූයේම බුදුරජුන්වෙත එළඹියෙමි.

3424 "චතුරොඝයන් තරණය කළාවූ ආශ්‍රව රහිතවූ සම්බුදුරජුන් වෙත එළඹ හිස නමා වැඳ මෙම වචනය කීමි.

3425 "පසැස් ඇත්තාණන්වහන්ස, රහතුන් ලක්ෂයක් දෙනා වහන්සේ සමග (මාගේ දානය) ඉවසා වදාළ මැනව. මාගේ සිත සතුටු කරමින් මාගේ නිවසට වඩිනු මැනව."

3426 "ලෝවැස්සන්ගේ පූජා සත්කාරයන් පිළිගන්නාවූ තුන්ලොවම මැනවින් දතුවාවූ පසැස් ඇත්තාවූ පදුමුත්තර බුදුරජතෙම මාගේ අදහස දැන (එම ආරාධනය) ඉවසීය.

3427 "(මම) ආරාධනය පිළිගත් බව දැන ශාස්තෲන් වහන්සේට වැඳ සතුටුව ඔද වැඩි සිත් ඇත්තේ (සිය) නිවසට එළඹියෙමි.

3428 "(මම) මිත්‍රාමාත්‍යයන් රැස්කරවා මෙම වචනය කීමි. "ජොතිරස" නම් මිණිරුවන වැනි අති දුර්ලභ වස්තුවක් මා විසින් ලබන ලදි.

3429 "බුදුරජාණන් වහන්සේ පමණ කළ නොහැකි ගුණ ඇතිසේක. උපමාවක් දැක්විය නොහැකිවූ ගුණ ඇති සේක. ලොකයෙහි සමාන කළ හැකි කිසිදු වස්තුවක් නැති සේක. පස්මරුන් ජයගත් සේක අප්‍රති පුද්ගල වනසේක. එම බුදුරජුන්හට කුමකින් පුදන්නෙමුද?

3430 "එසේම එම බුදුරජාණන් වහන්සේ අසමසමයහ. අදුකියහ නරශ්‍රෙෂ්ඨයහ. මා විසින් එම බුදුරජුන් හට සුදුසු වූ පූජාවක් (කරනු ලැබීම) දුෂ්කරය,

3431 "නොයෙක් මල් රැස්කොට පුෂ්ප මණ්ඩපයක් කරමු. මේ සියළු පූජා බුදුරජුන්හට සුදුසු වන්නීය.

3432 "මම උපුල්ද පියුම්ද ඉද්ද මල්ද කෝබුමල්ද සපුමල්ද නා මල්ද යොදා මණ්ඩය කරවීමි

3433 "ඡත්‍රයන්ගේ සෙවෙනෙහි ලක්ෂයක් අසුන් පැණවීමි. මාගේ අන්තිම ආසනය සියයකට වඩා අගනේය.

3434 "මම ඡත්‍රයන්ගේ සෙවෙනෙහි ලක්ෂයක් අසුන් පැණවීමි. ආහාරපානද පිළියෙළ කරවා (සුදුසු) කළැයි දැන්වීමි.

3435 "කාලය ආරොචනය කළ කල්හි පදුමුත්තර බුදු රජතෙම ලක්ෂයක් රහතුන් සමග මාගේ නිවසට එළඹියේය.

3436 "ඡත්‍රය මතුයෙහි දරණ මැනවින් පිපුණු මල් (එල්ලා) ඇති බැවින් පුෂ්ප මණ්ඩපයක්වූ එහි පුරුෂොත්තමවූ බුදුරජතෙම ලක්ෂයක් රහතුන් සමග වැඩහුන්නේය.

3437 "ඡත්‍රලක්ෂයකි (එහි පැණවූ) අසුන් ලක්ෂයකි. බුදු රජාණන් වහන්ස, (මේවා) කැපය, නිවරදය පිළිගනු මැනව."

3438 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ ඒ මහාමුනිවූ පදුමුත්තර බුදුරජතෙම මා (සසර සයුරින්) එතර කරනු කැමැත්තේ (එය) පිළිගත්තේය.

3439 "මම එක එක භික්ෂුවට වෙන-වෙනම පාත්‍ර දුනිමි. පළමුවෙන් තිබුනු පාත්‍ර ඉවත්කොට හැරියාහුය. (හැම දෙනා වහන්සේම) ලොහ පාත්‍ර දරුවාහුය

3440 "බුදුරජතෙම දිවා රෑ සතක් පුෂ්ප මණ්ඩපයෙහි වැඩහුන්නේය. බොහෝ සත්නට දහම් අවබොධ කරවමින් දම්සක් පැවැත්විය.

3441 "පුෂ්ප මණ්ඩපය යට දම්සක් පවත්වන කල්හි අසුහාරදහසක් ප්‍රාණීන්හට ධර්මාභි සමය විය.

3442 "සත්වැනි දින පැමිණි කල්හි පදුමුත්තර බුදු රජතෙම ඡත්‍රච්ඡායාවෙහි (කුඩය සෙවෙනෙහි) වැඩහුන්නේ මෙම ගාථාවන් වදාළේය. (කෙසේද යත්?)

3443 "යම් මානවකයෙක් තෙම (කිසිවකින්) නොඅඩුවූ උතුම් දානයක් දුන්නේද මම හේ (කවරෙක්දැයි) කියන්නෙමි. (එය) කියන්නාවූ මාගේ (වචනය) අසව්.

3444 "ඇත්තුද, අශ්වයෝද රියද, පාබල සෙනගද යන සිව්රඟ සෙනඟ මොහු නිතර පිරිවරන්නාහුය. සර්ව දානයාගේ (සියල්ලදීමෙහි) මේ විපාකයයි.

3445 "හස්තියානය, අශ්වයානය, පල්ලැක්කි (දෝලා) ය සන්දමානික නම් යානය යන මෙකී යානයෝ නිරතුරුව මොහු වෙත එළඹ සිටිත්. සර්වදානයාගේ මේ විපාකයයි.

3446 "සියළු ආභරණයන්ගෙන් සරසන ලද සැට දහසක් රථයෝ නිරතුරුව මොහු පිරිවරන්නාහුය. සර්වදානයාගේ මේ විපාකයයි.

3447 "සැට දහසක් තූර්යයෝද මැනවින් අලංකාර කරන ලද භෙරීහුද මොහුට නිරතුරු වාදනය කරන්නාහුය. සර්වදානයාගේ මේ විපාකයයි.

3448 3449 "මැනවින් අලංකාර කරන ලද සයාසු දහසක් ස්ත්‍රීහු විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාහු පළඳින ලද මිණි කොඩොල් ඇත්තාහු සිනා සහිතවූවාහු මැනවින් හැඳින්විය යුතු ශරීරාවයව ඇත්තාහු සිහින් කටී ප්‍රදෙශ ඇත්තාහු නිරතුරුවම මොහු පිරිවරන්නාහුය. සර්වදානයාගේ මේ විපාකයයි.

3450 "කප්තිස් දහසක්කල් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය. දහස් වරක් දෙවෙන්ද්‍ර දිව්‍යරාජ්‍යය කරන්නේය.

3451 "දහස් වරක් සක්විති රජ වන්නේය. (කරවනු ලබන) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙපමණයයි) ගිණිය නොහැකිය.

3452 "පුණ්‍යකර්මයාගේ (විපාකය හා) යෙදී දෙව්ලොව වසන්නාවූ මොහුට දෙව්ලොව කෙළවරකොට රුවන් සැතක් (ස්වර්ණමය කුඩයක්) දරන්නේය.

3453 "යම්කලෙක රෙදි මල්වලින් සෑදූ මහලක්ද (එයින් වැටෙන) සෙවනක්ද කැමති වන්නේ නම් (එකල්හි) මොහුගේ සිත දැන (මෙන්) නිරතුරුව සෙවන කරන්නේය

3454 "කුශල මූලයෙන් මෙහෙයන ලද්දේ දෙව්ලොවින් චුතව පුණ්‍යකර්ම විපාකය හා යෙදුනේ බ්‍රාහ්මණයෙක් වන්නේය.

3455 "මින් කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින ගොත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෘතෙමේ ලොව පහළ වන්නේය.

3456 "ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජතෙමේ සියල්ල දැන භික්ෂු සංඝයා මැද වැඩහිඳ (මොහු) එතදග්‍රස්ථානයෙහි තබන්නේය.

3457 "දෙවියන් විසින්ද අසුරයන් විසින්ද ගන්ධර්වයන් විසින්ද සත්කාර කරන ලද පිළින්දිවච්ඡ නම් බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය.

3458 "එසේම හෙතෙම භික්ෂූන් හටද භික්ෂුණීන් හටද (යන) සියල්ලනට ප්‍රියව ආශ්‍රව රහිතව වාසය කරන්නේය." කියායි.

3459 "මින් සියක් දහස්වන කපෙහි කරන ලද කර්මයා (ගේ) විපාකය මට මෙහිදී දැක්විය. දුනු දියෙන් මිදුනු හී වේගය මෙන් කෙලෙස් දවන්නේය.

3460 "නිරුත්තරවූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි මා විසින් මැනවින් කරනලද පුණ්‍යකර්මය ආශ්චර්‍ය්‍යයි. යම් පින් කෙතක පින්කම්කොට අචලවූ නිර්වාණ පදයට පැමිණියේ වෙම්ද, එහෙයිනි,

3461 "යම් මානවකයෙක් තෙම කිසිවකින් නොඅඩුවූ උතුම් දනක් දුන්නේද, පළමුකොටම (එහි) ප්‍රමුඛයාවූයේද, එම දානයාගේ මේ විපාකයයි.

3462 (i) බුදුරජුන් කෙරෙහිද ගණ ප්‍රධානවූ සංඝයා කෙරෙහිද (ii) ඡත්‍රයන් පුදා මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් අටක් අනුභව කරමි.

3463 "ශීත හෝ උෂ්ණය නොදනිමි. දැළිකුණු නොතැවරේ. උවදුරු විපත් නැතිවේ. හැමකල්හි පුදන ලද්දෙක් වෙමි.

3464 3465 "සියුම් සිවි ඇත්තේ වෙමි. සිත පිරිසිදුවේ. භවයෙහි සැරිසරන්නාවූ මට මෙම ජාතිය හැර අනික් හැම ජාතියකදීම) එම කර්මයාගේ බලයෙන් සියළු අලංකාරයන්ගෙන් යුක්තවූ විසිදහස් ගණන් කුඩ මාගේ හිසට දරත්.

3466 "මේ ජාතියේ මාගේ ඡත්‍රධාරණයක් (කුඩ දැරීමක්) නැත්තේ මන්ද? මා විසින් කරණලද සියළු කර්මය විමුක්ති ඡත්‍ර ලාභයට (නිවන් ලැබීමට) හේතුවූ බැවිනි

3467 "(මෙහි 3462 (i) වස්ත්‍රදී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් අනුභව කරමි.

3468 "ස්වර්ණ වර්ණවූයේ, රජස් රහිතවූයේ, ප්‍රභාසහිත වූයේ, ප්‍රතාපවත්වූයේ භවයෙහි සැරිසරන්නාවූ මාගේ සිරුර සිනිඳු වේ.

3469 "සුදුවන්වූද, කහවන්වූද, ලෙහෙවන්වූද සිය දහස් වස්ත්‍රයෝ මාගේ මස්තකයෙහි (හිසට) දරත්. වස්ත්‍ර දානයාගේ මේ විපාකයයි.

3470 "කොසෙයාා වස්ත්‍රය කම්බල නම් වස්ත්‍රය කොමු පිලිය කපු පිලිය යන මේ වස්ත්‍ර එම කර්මයන්ගේ ඵලයෙන් මම සියළු තන්හිදී ලබමි.

3471 "(මෙහි 3462 (i) පාත්‍රදී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් දසයක් අනුභව කරමි.

3472 රන්තලිද, මිණිතලිද, රිදීතලිද, පියුමරාමණි මුවාතලිද හැම කල්හි පරිභොග කරමි.

3473 "උවදුරු රහිතවූයේ විපත් රහිතවූයේ හැමකල්හි (සියල්ලන් විසින්) පුදන ලදුයේ වෙමි. ආහාරපාන වස්ත්‍ර සයනාසන ලබන්නෙක්ද වෙමි.

3474 "මාගේ භෝගයෝ විනාශ නොවෙත්. මම නැවතුනාවූ සිත් ඇත්තේ වෙමි. හැමකල්හි ධර්මය කැමති වෙමි. කෙලෙස් නැතිවූයේ ආශ්‍රව රහිතද වෙමි.

3475 "දෙව්ලොවෙහිද මිනිස් ලොවෙහිද මෙකී ගුණයෝ මා අනුවම ගියාහුය. ගසේ සෙවන (ගස නොහරින්නාක්) මෙනි. සියළු තන්හිදී මා අතහැර නොදමන්නාහුය.

3476 "මම විසිතුරු බන්ධනයන්ගෙන් බඳනා ලද මැනවින් කළ බොහෝ දැලිපිහිද බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට හා එසේම සංඝයාටද පුදා

3477 "සූරවූයේ කලබල නොවූයේ විශාරද බැව්හි කෙළ පැමිණියේ වෙමි හැමකල්හි (කෙලෙස් වසගව යානොදී) දැඩිකොටගත් සිත් ඇත්තේ නුවණැත්තේ වීර්‍ය්‍යවත්ද වෙමි.

3478 "මම සියුම්වූ අවමානවූ පිරිසිදුවූ කෙලෙස් බිඳීමේ නුවණද එම පුණාකර්ම බලයෙන් සියළු තන්හිදී ලබමි

3479 "පහන් සිත් ඇත්තේ බුදුරජුන් කෙරෙහිද සංඝයා කෙරෙහිද කොරොස් නොවූ රළු නොවූ මැනවින් දෙවූ බොහෝ ආයුධදී එසේම,

3480-3481 "මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් පසක් අනුභව කරමි. (එනම්) කල්‍යාණ චිත්තයද වීර්‍ය්‍යයද ක්ෂාන්තියද,

මෛත්‍රී ශාස්ත්‍රයද, තෘෂ්ණාහුල සිඳින ලද බැවින් වජ්‍රා යුධය සමාන අනුත්තර නුවණැවූ ප්‍රඥා ශස්ත්‍රය (ප්‍රඥා ආයුධය) ද එම කුශලකර්ම බලයෙන් ලබන්නේය.

3482 (මෙහි 3462 (i) හිදි (කටු) දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් පසක් අනුභව කරමි.

3483 "කුදු මහත් භවයෙහි සැරිසරන්නේ හැමකල්හි සැක නැත්තේ කුකුස් සිඳින්නේ මනා රූ ඇත්තේ භොග සම්පත් ඇත්තේ තියුණු පැණවත්වූයේ වෙමි

3484 "ගැඹුරුවූද සියුම්වූද තැන් හා අරුත් නුවණින් දුටුවෙමි. මාගේ මොහඳුරු නසන්නාවූ වීදුරු අගක් මෙන් (සියුම්) නුවණ වේ.

3485 (මෙහි 4362 (i) නිය කපන කුඩා පිහි (ආයුධ) දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් පසක් අනුභව කරමි.

3486 "බොහෝ දාසි දාසයන්ද ගව අශ්වයන්ද බැලමෙහෙ කරන්නන්ද, ආරක්ෂකයන්ද, රවුළු බාන්නන්ද (ඉසකෙස් කපන්නන්) බත් පිළියෙළ කරන්නන්ද (සූපවර්ග පිළියෙළ කරන) අරක්කැමියන්ද මම භවයෙහි සියළු තැන්හිදී ලබමි.

3487 "ශොභනවූ (චිත්‍ර ලෙස කළ) විජිනිපත්ද (තල්කොළයෙන් කළ) වටාපත්ද, බුදුරජුන් කෙරෙහිද (උතුම් සඟගණ කෙරෙහිද) දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් අටක් අනුභව කරමි.

3488 "ශීතොෂ්ණ නොදනිමි. (සිරුරෙහි හෝ සිතෙහි) දාහයක් නැත. මාගේ කය චිත්ත සන්තාපයක් නොදනිමි.

3489 'මාගේ ඒ කුශල කර්මයාගේ විපාකයෙන් රාගාග්නිය ද්වේෂාග්නිය මානාග්නිය දෘෂ්ඨිඅග්නිය යන සියළු අග්නිහු නිවීගියාහුය.

3490 "මොණර පියාපත්ද සෙමර වලිගද බුදුරජුන් කෙරෙහි හා උතුම් සඟගණ කෙරෙහිදී මම කෙලෙස් රහිතව සන්සිඳුනු කෙලෙස් ඇත්තේව වෙසෙමි.

3491 "පෙරහනද ධර්ම කරක නම්වූ පැන් පෙරහනද බුදුරජුන් කෙරෙහි හා උතුම් සඟගණ කෙරෙහිදී මාගේ කර්මයට සුදුසුවූ පඤ්චානි ශංසයක් අනුභව කරමි.

3492 "මම (සෙසු) සියල්ලන්ගේ ආයුෂ ඉක්මවා දිව්‍යමය ආයුෂ ලබමි. හැමකල්හි සොරුන් විසින් හෝ බලයෙන් පැහැරගෙන යුත්තෙක් නොවෙමි.

3493 "අවියකින් හෝ විසයකින් හෝ වෙසෙයකුදු නොකෙරේ එම පුණ්‍ය විපාකයෙන් මාගේ (නියමිත ආයුෂ නොගෙවී) අතරතුර මරණයකුදු නැත.

3494 "(i) බුදුරජුන් කෙරෙහිද උතුම්සඟගණ කෙරෙහිද (ii) තෙල්ගුලාවන්දී මාගේ කර්මයට සුදුසුවූ අනුසස් පසක් අනුභව කරමි.

3495 "මනහර රූ ඇත්තේ (එබඳුවූ) මනොඥ හඬ ඇත්තේ මැනවින් උසස්වූ (සමාධියෙන් යුත්) සිත් ඇත්තේ නොකැළඹුණු සිත් ඇත්තේ සියළු ආරක්ෂකයන් විසින් රක්නා ලද්දෙක් වෙමි.

3496 "(මෙහි 3494 (i) හිද ගුලාවන්දී මාගේ කර්මයට සුදුසු අනුසස් තුනක් අනුභව කරමි.

3497 "චිත්ත සුඛයද කාය සුඛයද ඉරියව් වලින් හටගත් සුවයද යන මේ ත්‍රිවිධ ගුණයන් (සුව) එම ගුණ්‍ය ඵලයෙන් මම ලබමි.

3498-3499 "චෙතොපරිය ගුණය හෙව පෙර ජාතීන් දක්නා නුවණලබමි. දෙවෙනි භවයද සිහිකරමි. මම එම පුණ්‍ය ඵලයෙන් සියළු භවයෙහිදීම මනා සිව් ඇත්තේ වෙමි.

3500 "(මෙහි 3494 (i) කාය බන්ධනයන් හෙවත් පටිදී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් සයක් ලබමි.

3501 "සමාධින්හි කම්පා නොවෙමි. එසේම සමාධීන්හි වර්ග වෙමි. නොබෙදුනු පිරිස් ඇත්තේ වෙමි හැමකල්හි අනුන් විසින් පිළිගත යුතු වචන ඇත්තේ වෙමි.

3502 "එළඹසිටි සිහි ඇත්තේ වෙමි මට තැති ගැන්මක් නැත. මේ ගුණයෝ දෙව්ලොවෙහි වූවද මිනිස් ලොවෙහි වුවද (මා) අනුවම එති.

3503-3504 '(මෙහි 3494 (i) (පත්තාධාරකාදී භාණ්ඩ තබන) ආධාරකයන්දී පස් අයුරකින් (ලබන ලද) දායාද ඇත්තේ හෙවත් අනුසස් පසක් ලබන ලද්දේ වෙමි. (එනම්) කිසිවකින් කම්පා නොවෙමි. මා විසින් අසන ලද යම්කිසි ධර්ම කෙනෙක් වෙත්ද

ඒ ධර්මයෝ සිහිය හා නුවණ පොබයන්නෝ වෙති. සිත්හිලා දරණ ලද්ද (හෙවත් පාඩම් කළ දෙය) නොවැනසේ. එම සිත්හිලා දරණ ලද ධර්මයෝ) මැනවින් තීරණය කරන ලද්දාහුද වෙති.

3505 "(මෙහි 3494 (i) පරිභොග භාජනයක් දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් තුනක් අනුභව කරමි.

3506 "මම රුවන් මුවාවූද මිණිමුවාවූද යලි පිළිමිණි මුවාවූද පියුම් රාමිණි මුවාවූද බඳුන් ලබමි.

3507 "භාර්‍ය්‍යාවෝද දාසිදාසයෝද හස්ති අශ්වරථ පාබල සෙනගද පතිව්‍රතා ස්ත්‍රීහුද හැමකල්හි පරිභොග වස්තුහුවෙත්.

3508 "විද්‍යාවන්ටද මන්ත්‍රපදයනටද විවිධවූ ආගම ධර්මයනටද සියළු ශිල්පයනටද කන්යෙමු කරමි. ඒවා හැමකල්හි ස්වකීය පරිභොගය සඳහා වූවෝ වෙත්.

3509 "(මෙහි 3494 (i) තලි දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් තුනක් අනුභව කරමි.

3510 "රුවන් මුවාවූද මිණිමුවාවූද යළි පිළිමිණිමුවාවූද පියුම් රා මිණිමුවාවූද තලි (මම) ලබමි.

3511 "ඵලවත් ඇසතුද යලි පෙකුරුපත්ද මිහි බොන සක්ද යන තලි (මම) ලබමි.

3512 "වත්සපන්වූ ගුණවත්වූ ප්‍රතිපත්ති ඇති ආචාර ක්‍රියාවන්හිද නිපුණු මෙබඳු ගුණ එම පුණ්‍ය කර්ම බලයෙන් මම ලබන්නෙමි.

3513 "බුදුරජුන් කෙරෙහිද බෙහෙත්දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් දසයක් අනුභව කරමි.

3514 "ආයුෂ ඇත්තේ බලවත්වූයේ වීරගුණ ඇත්තේ වර්ණවත්වූයේ කීර්තිමත්වූයේ සැප ඇත්තේ උවදුරු රහිත වූයේ හැම කල්හි (අනුන් විසින්) පුදන ලදුයේ වෙමි. එම පුණ්‍යකර්මයාගේ ඵලයෙන් මට ප්‍රිය වීප්‍රයොග දුකක් නැත.

3515 '(මෙහි 2994 (i) පාවහන් දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් තුනක් අනුභව කරමි.

3516 "හස්ති අශ්වයානද සිවිකා (දෝලා) සන්දමානික යන යානයෝද, සැටලක්ෂයක් මා හැමකල්හි පිරිවරත්.

3517 "භවයෙහි සැරිසරන්නාවූ මට පියවරක් පාසා මැණික් වලින් කරන ලද්දාවූද, රුවනින් කරණ ලද්දාවූද (පාවහන්) නිපදිත්.

3518 "නියම කළ දෙය කරා දුවත්. ආචාර ගුණ ශොධනය කෙරෙත්. එම පුණ්‍ය ඵලයෙන් මම මෙම ගුණ ලබන්නෙමි.

3519 "(මෙහි 3494 (i) මිරිවැඩි දී කැමතිතාක් කල් ඍද්ධිමය මිරිවැඩි නැගී වෙසෙමි.

3520 (මෙහි 3494 (i) දියපිස්නාකඩ දී මාගේ කර්මයට සුදුසුවූ පස් අනුසස් ලබමි.

3521 "මගේ සිරුර ස්වර්ණවර්ණවූයේ රජස් රහිතවූයේ ප්‍රභාසහිත වූයේ සිනිඳුද වේ. දැළිකුණු නොතැවරේ. එම පුණ්‍ය බලයෙන් මම මෙම ගුණ ලබමි

3522 "(මෙහි 3494 (i) සැරයටි දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් සයක් ලබමි.

3523 "මට බොහෝ පුත්‍රයෝ වෙත්. මාගේ තැතිගැනීමක් නැත. සියළු ආරක්ෂකයන් විසින් රක්නාලදුයේ හැම කල්හි බලාත්කාරයෙන් නොපැහැරගන්නා ලද්දෙක් වෙමි. මාගේ පැකිලීමක් නොදනිමි. මාගේ සිත්හි තැතිගැනීමක්ද නැත.

3524 "(මෙහි 3494 (i) මාගේ කර්මයනට සුදුසුවූ අනුසස් අටක් අනුභව කරමි.

3525 "සුදුවූද, කහවන්වූද, ලෙහෙවන්වූද සියළු රෝගයන්ගෙන් වූද නොකැලන් පහන් ඇස් ඇත්තේ විසල්වූ ඇස් ඇත්තේද වෙමි.

3526 "දිවැසද අනුත්තරවූ පැහැසද ලබමි. මම එම පුණ්‍ය ඵලයෙන් මෙම ගුණ ලබමි.

3527 "(මෙහි 3494 (i) යතුරු දී දහම් දොර හරවා නුවණ නමැති යතුරුද ලබමි.

3528 (මෙහි 3494 (i) යතුරුදී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් දෙකක් අනුභව කරමි. මම ක්‍රෝධ රහිතවූයේ භවයෙහි සැරිසරන්නේ ස්වල්පවූ ක්‍රොධ ඇත්තේ ආයාස වෙමි.

3529 "(මෙහි 3494 (i) අංසයෙහි ලන පසුම්බි දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් පසක් අනුභව කරමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3530 සමාධින්හි කම්පා නොවෙමි. සමාධින්හි වසඟව වෙසෙමි. නොබිඳෙන පිරිස් ඇත්තේ වෙමි. හැමකල්හි පිළිගතයුතු වචන ඇත්තේද වේ. භවයෙහි සැරිසරන්නාවූ මට භොග සම්පත් හටගනී.

3531 "(මෙහි 3494 (i) දුම් පයිප්ප දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් තුනක් අනුභව කරමි.

3532 "මාගේ සිහිය ඍජුවේ. මැනවින් සම්බන්ධවූ නහර ඇත්තේද වේ. එම පුණ්‍ය ඵලයෙන් මම දිවැස් ලබමි.

3533 "(මෙහි 3494 (i) පහන් මිලදී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් තුනක් අනුභව කරමි.

3534 "ජාතිමත්වූයේ සම්පූර්ණවූ ශරීරාවයව ඇත්තේ ප්‍රඥාවත්වූයේ බුද්ධිමත්යයි සම්මතවූයේ එම පුණ්‍ය බලයෙන් මෙම ගුණ ලබමි.

3535 "(මෙහි 3494 (i) (ධාන්‍යමාන) බඳුන්ද කරඬුද දී මාගේ එම කර්මයට සුදුසු අනුසස් දසයක් ලබමි.

3536 "හැමකල්හි ආරක්ෂා සහිතවූයේ, සැපයෙන් යුක්ත වූයේ, මහත්වූ කීර්ති ඇත්තේ මනාගති ඇත්තේ විපත්තීන්ගෙන් වෙන්වූයේ සියුමැලිවූයේ සියළු උවදුරු බැහැර කරන ලදුයේ

3537-3538 "මහත් ගුණ ලාභීවූයේ සමවූ හැසිරීම් ඇත්තේ මාගේ මැනවින් බැහැරකළ උද්වෙගය (චඤ්චලගතිය) ද ඇත්තේ ධාන්‍ය මිණුම්ද කරඬුද හස්ත්‍ය අශ්වාදී සිව්රඟ සෙනගද ලබමි. මාගේ එම සම්පත් විනාශ නොවේ. තුම්බ නම්වූ ධාන්‍ය මාන භාජන දානයෙහි මේ විපාකයයි.

3539 "(මෙහි 3494 (i) අඳුන් (බේත්) ගුළා දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් පසක් අනුභව කරමි.

3530 "සියළු ලක්ෂණයන්ගෙන් යුක්තවූයේ, ආයුෂින් හා ප්‍රඥාවෙන්ද යුතුවූයේ මාගේ හැමකල්හි සියළු ආයාසයන්ගෙන් වෙන්වූ කයද ඇත්තේ වේ.

3541 "මුවහත්වූ කතුරු බුදුරජුන් කෙරෙහිද උතුම් සඟගණ කෙරෙහිද දී කෙලෙස් සිඳින්නාවූ පිරිසිදුවූ අතුල්‍යවූ නුවණ ලබමි.

3542 "(මෙහි 3494 (i) හඬුදී අතුල්‍යවූ පිරිසිදුවූ කෙලෙස් සිඳුනා නුවණ ලබමි.

3543 "(මෙහි 3494 (i) නශ්‍ය ද්‍රව්‍යාදියෙන් මාගේ එම කර්මයට සුදුසුවූ අට අනුසයක් ලබමි.

3544 "ශ්‍රද්ධාවද ශීලයද ලජ්ජාවද භයද ශ්‍රැතයද ත්‍යාගයද ක්ෂාන්තියද ප්‍රඥාවද මාගේ අටවැනි ගුණයයි.

3545 "(මෙහි 3494 (i) පුටු දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් පසක් ලබමි.

3546 'මම උසස් කුලයෙහි උපදිමි. මහත් භොග ඇත්තේ වෙමි. සියල්ලෝ මට ගරුබුහුමන් කෙරෙත්. මාගේ කීර්ති තොමෝ උසස්ව පැන නැංගාහ

3547 "කල්ප සිය දහස්වර සිව්රැස් පයඹිංකයෝ නිතර මාපිරිවරත් මම දාන සංවිභාගයෙහි දන් (බෙදීමෙහි) යෙදුනේද වෙමි.

3548 "(මෙහි 3494 (i) ගුදිරිදී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් සයක් අනුභව කරමි.

3549 "සමවූ සිරුරු ඇත්තේ වෙමි. (බොහෝ දෙනා විසින්) ගරුබුහුමන් කරන ලදුයේ වෙමි. මෘදු සිරුරු ඇත්තේ වෙමි. මනහර දැකුම් ඇත්තේ වෙමි. නැණවත් පිරිවරද ලබමි. ගුදිරි දනෙහි මේ විපාකයයි.

3550 "මම පුළුන් පිරවූ මෙට්ටද, සිංහාදීන්ගේ රූ ඇති පලස්ද, මැණික් ඇල්ලූ පට වස්ත්‍රද, දීමෙන් විසිතුරු එළු ලොම් ඇතිරිද, නියඳින් කළ උතුම් වස්ත්‍රද, නානාවිධ කම්බලද ලබමි.

3551 "මොලොක් උතුරුසළුද, මෘදු ඇඳුම් දිවිසම්ද නොයෙක් ඇතිරිලිද ලබමි. ගුදිරි දනෙහි මේ විපාකයයි

3552 "යම් කලක පටන් තමා පිළිබඳව සිතම්ද යම් කලක පටන් නුවණැති බවට පැමිණියේ වෙම්ද (එතැන් පටන්ම) නොසිස්වූ ධ්‍යාන නමැති මඤ්චය ඇත්තේ හෙවත් ධ්‍යානලාභිවූයේ වෙමි. බිසි දානයාගේ (ගුදිරි දානෙහි) මේ විපාකයයි.

3553 "(මෙහි 3594 (i) බුමුතුරුණු (කොට්ට) දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් හයක් අනුභව කරමි.

3554 "එළුලොම් ආදිය පිරෙව්වාවූද, පඤ්චාකාර මැහුම් ගෙත්තම් ඇත්තාවූද, එලෙසින්ම සඳුන් සුවඳ හමන්නාවූද බිම්බොහනා (කොට්ට) හැමකල්හි මාගේ හිස තබමි.

3555 "උතුම් ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගයෙහිද, චතුර් ශ්‍රාමණ්‍ය ඵලයෙහිද යන එම ධර්මයන් කෙරෙහි නුවණ මෙහෙයා හැමකල්හි වෙසෙමි.

3556 "දීමෙහිද (කායචිත්ත) දමනයෙහිද සංයමයෙ (සන්හුන් බැව්) හිද අප්‍රමාණ්‍ය ධර්ම (සිව් බඹ විහරණ) කෙරෙහිද රූපාවචර ධ්‍යානයන්හිද යන එකී ධර්මයන් කෙරෙහි නුවණ මෙහෙයා හැමකල්හි වෙසෙමි.

3557 "මම වත්සපත් ගුණයෙහිද ප්‍රතිපත්තීන්හි හා ආචාර ක්‍රියාවන්හිද නුවණ උපදවා හැමකල්හි වෙසෙමි.

3558 "සක්මණෙහිද පදහන් වීරියෙහිද බෝපැකි දහම්හිද යන එකී ධර්මයන්හි නුවණ උපදවා කැමැතිසේ වෙසෙමි.

3559 "අනුත්තරවූ ශීලය සමාධිය ප්‍රඥාවය විමුක්තිය යන එකී දහම්හි නුවණ මෙහෙයා මම සුවසේ වෙසෙමි.

3560 "පිදුරු යොදා කළ පුටු බුදුරජුන් කෙරෙහිද උතුම් සඟ ගණ කෙරෙහිද දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් දෙකක් ලබමි.

3561 "රන්මුවාවූද, මිණිමුවාවූද, දළමුවාවූද, හරමුවාවූද බොහෝ උතුම් පර්‍ය්‍යංකයන් ලබමි. පලාලපීඨ දානයාගේ මේ විපාකයයි.

3562 "(මෙහි 3494 (i) පා පුටු දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් දෙකක් ලබමි.

3563 "බොහෝ යානයන් ලබමි. පා පුටු දනෙහි මේද විපාකයකි. දැසිදස්සෝද බිරියෝද අනික් අනු ජීවිහුද මට මැනවින් පරිවරණය කෙරෙත්. මේද පාපුටු දනෙහි විපාකයයි

3564 "(මෙහි 3494 (i) ඇඟ ගල්වන තෙල් දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් පසක් ලබමි.

3565 "මාගේ නිරෝගී බවද රූමත් බවද මහා ධර්මය වැටහෙන බවද ආහාර පාන ලාභී බවද ආයු පඤ්චකයද (ආයු-වර්ණ-සැප-බල-ප්‍රඥා) ද ලබමි.

3566 "(මෙහි 3494 (i) ගිතෙල් ද මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් පසක් ලබමි.

3567 "හැමකල්හි පිනාගිය සිරුරින් හටගත් බලය ඇත්තේ රූමත්වූයේ නිරෝගිවූයේ පැහැදුනු (ප්‍රකට) කෙනෙක් වෙමි. ගිතෙල් දනෙහි මේ විපාකයයි.

3568 "මුවදෝනාව (බඳුන) ක් බුදුරජුන් කෙරෙහිද උතුම් සඟයණ කෙරෙහිද දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් පසක් ලබමි.

3569 "පිරිසිදු කණ්ඨය (උගුර) ඇත්තේ මිහිරි ස්වර ඇත්තේ කාය ස්වාසාදියෙන් තොරවූයේ හැමකල්හි මාගේ මුවින් උපුල් මල් සුවඳ විහිදේ.

3570 "බුදුරජුන් කෙරෙහිද, උතුම් සඟගණ කෙරෙහිද සමෘද්ධවූ දිහි දී උතුම් වූ කායගතා සති සංඛ්‍යාත අමෘත ධනය අනුභව කරමි.

3571 "(මෙහි 3494 (i) වර්ණ ගන්ධ රසයන්ගෙන් යුක්තවීද මම උපමාවක්. කියනොහැකි අතුල්‍යවූ විමුක්තිරසය පානය කරමි.

3572 "(මෙහි 3494 (i) ඇති අයුරුවූ රසවත් දැයදී මාගේ එම කර්මයට සුදුසුවූ (සෝවාන් ආදී සිව්) ඵලයන් අනුභව කරමි.

3573 "(මෙහි 3494 (i) ආහාරපානාදි වාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් දසයක් අනුභව කරමි.

3574 "මම ආයු ඇත්තේ බල ඇත්තේ නුවණැත්තේ වර්ණවත්වූයේ පැණවත්වූයේ හැමකල්හි භවයෙහි සැරිසරන්නේ මෙම ගුණ ලබමි.

3575 '(මෙහි 3494 (i) සුවඳ දුම්දී මාගේ එම කර්මයට සුදුසුවූ අනුසස් දසයක් ලබමි.

3 76-3577 'මම කුදු මහත් වනයෙහි සැරිසරන්නේ සුවඳවත් සිරුරු ඇත්තේ කීර්තිමත් වූයේ යශස් ඇත්තේ සීඝ්‍ර තීක්ෂණ භූරි හාසු ගම්භිර ප්‍රඥා ඇත්තේ විපුලවූ ජවන ප්‍රඥා ඇත්තේද වෙමි එම පුණ්‍ය කර්ම බලයෙන්ම දැන් ශිවවූ ශාන්ති සුඛයටද පැමිණියේ වෙමි.

3578 "ඒකාන්තයෙන් බුදුරජාණන් වහන්සේගේ සමීපයට මාගේ යහපත් පැමිණීමක් විය. පැමිණෙනලද ත්‍රිවිද්‍යාවෝ ඇත්තාහුය. මා විසින් බුදුරජාණන් වහන්සේගේ සසුන කරන ලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3579 "මා විසින් ක්ලේශයන් දවනලදහ. සියළු භවයෝ නසන ලදහ. හස්තිරාජයකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි. 3580

## 392 සෙල ථෙරාපදානය

3581 "මම හංසවතී නගරයෙහි වීථි ස්වාමියෙක් (වීදියක ප්‍රධානියෙක්) වීමි. මාගේ ඥාතීන් කැඳවා මෙම වචනය කීමි.

3582 'බුදුරජතෙම ලොව පහළවීය. (උන්වහන්සේ) නිරුත්තරවූ පුණ්‍යක්ෂෙත්‍රයකි. ලෝවැස්සන්ගේ පූජාවන් පිළිගන්නාවූ (එම සර්වඥතෙම මුළු ලෝකයටම ආශිර්වාදයකි.

3583 "ක්ෂත්‍රියයෝද, නිගම වාසීහුද, බමුණු මහාසාරයෝද පහන් සිත් ඇත්තාහු ඔව්හු (එකමුතුව) සහායවූහ.

3584 "ඇත් සෙනගය, රථ සෙනගය, පාබල සෙනගය, අස්සෙනගය යන සිව්රඟ සෙනගෙහි වූවෝ පහන් සිත් ඇත්තාහු සොම්නස්වූවාහු ඔව්හු (සමගිව) සහායවූහ.

3585 "ක්ෂත්‍රීයනට දාව ක්ෂුද්‍ර ස්ත්‍රීන්ගේ කුසයෙහි උපන්නෝ (ක්ෂුද්‍රයෝ) ද රාජපුත්‍රයෝ (ක්ෂත්‍රියයෝ) ද වෛශ්‍යයෝද, බ්‍රාහ්මණයෝද පහන් සිත් ඇත්තාහු සොම්නස්වූවාහු ඔව්හු සමගිව සහායවූහ.

3586 "අරක්කැමියෝද, සළුවඩන්නෝද, දියවඩන්නෝද, මල්කරුවෝද යන ඔව්හු පහන් සිත් ඇත්තහු සොම්නස් වූවාහු සමගිව සහායවූහ.

3587 "රදව්ද, පෙහෙරුද, සෙම්මරුද, කරණැවැම්යෝද, යන ඔව්හු පහන් සිත් ඇත්තාහු සොම්නස්වූවාහු සමගිව සහායවූහ.

3588 "හී වඩුවෝද, ලියන වඩුවෝද, සම සාදන්නෝද යන ඔව්හු පහන් සිත් ඇත්තාහු සොම්නස්වූවාහු සහායවූහ.

3589 "එසේම කඹුරෝද, රන් කරුවෝද, ඊයම් වැඩ ලෝකුරුවෝද යන ඔව්හු පහන් සිත් ඇත්තාහු සොම්නස් වූවාහු සමගිව සහායවූහ

3590 "බැලයෝද දාසයෝද යන බොහෝ දස් කම්කරුවෝ තම තමන්ගේ බල පමණින් සමගිව සහායවූහ.

3591 දිය ගෙනෙන්නෝද, දර ගෙනෙන්නෝද ගොවියෝද, තණ ගෙනෙන්නෝද තම තමන්ගේ බලපමණින් සමගිව සහායවූහ.

3592 මල් ගෙනඑන්නෝද, මල්ගොතන්නෝද, කොළ එකතුකරන්නෝද ගෙඩිවර්ග ගෙනෙන්නෝද යන ඔව්හු තම තමන්ගේ බලපමණින් සමගිව සහායවූහ

3593 "ගණිකාවෝද, කළදැස්සෝද, පූවෙළෙන්දෝද, මාළු වෙළෙන්දෝද යන ඔව්හු තම තමන්ගේ බලපමණින් සමගිව සහායවූහ.

3594 "එසියල්ලෝ එක්ව එක්රැස්වෙමු. නිරුත්තරවූ පුණ්‍ය ක්ෂෙත්‍රයෙහි පින්කමක් කරන්නෙමු" (යයි මම ඔවුනට කීමි.)

3595 "එකෙණෙහි ඔව්හු මාගේ වචනය අසා රැස්වූහ, මැනවින් කටයුතු නිමකළ. උවටැන් හළක්ද බික්සඟනට කරවූහ.

3596 "ඔදවැඩියේ සතුටු සිත් ඇත්තේ එම ශාලාව නිමවා එකී හැමදෙන සමග බුදුරජුන් වෙත එළඹියෙමි.

3597 "ලොකනාථවූ නරශ්‍රෙෂ්ඨවූ සම්බුදුරජුන් වෙත එළඹ ශාස්තෲන් වහන්සේගේ පාවැඳ මෙම වචනය කීමි.

3598 "වීරයන් වහන්ස, මේ තුන්සියයක් පමණවූ පුරුෂයෝ එක්රැස්ව උවටැන් හළක් කරන ලදි. බුදුරජාණන් වහන්ස, එය (ඔව්හු) ඔබවහන්සේට පිළිගන්වත්.

3599 "පසැස් ඇති සර්වඥතෙම බික්සස්න හමුයෙහි (එය) පිළිගෙන තුන්සියයක් දෙනා ඉදිරියෙහි මෙම ගාථාවන් වදාළේය.

3600 "මෙම තෙසිය දෙනද (එහි) ප්‍රධාන තෙමේද (එක්ව ඔවුනොවුනට) අනුවර්තනයවූහ (එසේම) සියල්ලෝ (එම පුණ්‍ය) සම්පත්තිය කොට (එහි කුශල විපාක) අනුභව කරන්නාහුය.

3601 "අන්තිම භවය පැමිණි කල්හි නිරුත්තර ශීත භාවයවූ අජරවූ අමරවූ ශාන්තිවූ නිවනද සාක්ෂාත් කරන්නාහුය" (කියායි)

3602 "ශ්‍රමණයන් අතුරෙන් උතුම්වූ සර්වඥ බුදුරතෙම මේ දැක්වූ අයුරින් වදාළසේක. මම බුදුරජුන්ගේ වචනය අසා සොම්නස දැක්වීමි.

3603 "මම කල්ප තිස් දහසක් දෙව්ලොව සිත් අලව විසීමි. දෙවෙනුව පන්සියවරක් දිව්‍ය රාජ්‍යය කරවීමි.

**3604** "මම දහස් වරක් සක්විති රජවිමි. දිව්‍යරාජ්‍ය කරන්නාවූ මට මහ දෙව්වරුද වැන්දාහුය.

**3605** "මෙම මිනිස් රජයෙහි පිරිස සබඳකම් ඇත්තෝම වූහ. අන්තිම භවය පැමිණි කල්හි වාසෙට්ඨ නම් බමුණෙක් විය.

**3606** 'මම අසූ කෝටියක් තැන්පත් ධනය ඇති එම වාසෙට්ඨ බමුණාගේ පුත්‍රයෙක් වීමි. 'සෙල' යනු මගේ නමයි. ෂඩංගයෙහි පරතෙරට ගියේද වෙමි.

**3607-3608** "ස්වකීය ශිෂ්‍යයන් විසින් පිරිවරන ලදුව ජංඝා විහාරය කරන්නාවූ (සක්මන් කරන) දළමඬුළු බරින් යුත් පිළියෙල කරන ලද යාග ඇති 'කෙණිය' නම් තවුසා දැක මෙම වචනය කීමි. (කෙසේදයත්?) "ආවාහයක් වේද? විවාහයක් හෝ වේද? තා විසින් රජතෙමේ හෝ නිමන්ත්‍රණය කරන ලදුයේවේද? (කියායි)

**3609** "මම දෙවියන්යයි සම්මත බමුණන් කෙරෙහි පූජාවක් කරනු කැමැත්තේ රජුට නිමන්ත්‍රණය නොකරමි. මාගේ යාගයක්ද නැත.

**3610** "මාගේ ආවාහයක්ද නැත. (එසේම) මාගේ විවාහයක්ද විද්‍යමාන නොවේ. ශාක්‍යයන්ගේ සතුට ඇති කරන්නාවූ දෙවියන් සහිත ලොකයෙහි ශ්‍රෙෂ්ඨවූ

**3611** "සියළු ලෝවැස්සනට හිත පිණිස (හැසිරෙන්නාවූ) හැම සත්නට සුව එලවන්නාවූ ඒ සර්වඥතෙම අද මා විසින් නිමන්ත්‍රණයකරන ලදී. මෙය උන්වහන්සේට පිළියෙළ කිරීම උන්වහන්සේට සඳහාය.

**3612** "තිඹිරි ගෙඩියක වර්ණයට බඳු පැහැඇති පමණ කළ නොහැකි ගුණ ඇති උපමාෂවියාති ක්‍රාන්තවූ රූපයෙන් අසදෘශවූ බුදුරජතෙම සෙට දවසට පවරණලදි.

**3613** "කෝවේහි ලා තැබූ ස්වර්ණයක් මෙන් (පැහැපත්) කිහිරඟුරුමෙන් (දිලිසෙන) විදුලියක් වැනිවූ මහාධිරවූ ඒ බුදුරජතෙම මා විසින් පවරණ ලදි.

**3614** "කඳුමුදුනෙහි පෙනෙන ගිනි සිලක් වැනිවූ පසළොස්වක් දිනයෙහි සඳවැනිවූ බටවලින් හටගත් ගින්නක පැහැය මෙන් බබලන ඒ බුදුරජතෙම මවිසින් පවරණ ලදී.

(මෙහි පහත ගාථා අගට "එම බුදුරජතෙම මා විසින් පවරණ ලදි" යොදන්න)

**3615** "බිය නොවන්නාවූ බියඉක්මවන්නාවූ භවයාගේ කෙළවර කරන්නාවූ මොනෙයා ගුණ යුත්වූ සිහ රජෙකු වැනි මහා වීරවූ-

**3616** "බුදු දහමින් දක්ෂවූ අනුන් විසින් බලයෙන් මැඩලිය නොහෙන හස්තිරාජයෙකු වැනිවූ මහාවීරවූ-

**3617** "සද්ධර්මචයර්‍යාවෙහි දක්ෂවූ බුද්ධ ශ්‍රෙෂ්ඨවූ අසදෘශවූ වෘෂභොපමවූ මහාවීර වූ-

**3618** "අප්‍රමාණ වර්ණ ඇති අපමණ යශස් ඇති විචිත්‍ර වූ සකල ලක්ෂණ ඇති ශක්‍රයා වැනිවූ මහාවීරවූ-

**3619** "ධ්‍යානයන්ගෙන්) වසඟවූ ශ්‍රාවක සමූහයා ඇති ප්‍රතාපවත්වූ තෙජස් ඇති (ගුණයෙන් කිසිවෙකුටත්) ලංවිය නොහැක්කාවූ මහාවීරවූ බ්‍රහ්මොපවවූ-

**3620** "පැමිණියාවූ ධර්මය ඇති බල දසයකින් යුත් බලයන් ඉක්මවාගිය හැමබලයන්ගේ පමා පරතෙරටගිය මහ පොළොව වැනි මහාවීරවූ-

**3621** "ලංවිය නොහැක්කාවූ බලයෙන් මැඩලිය නොහැක්කාවූ නිශ්චලවූ උස්ව නැංගාවූ වැඩෙන්නාවූ මහාමෙර වැනි මහාවීරවූ-

**3622** "අනන්ත ඥාන ඇත්තාවූ අසමසමවූ අතුල්‍යවූ ශ්‍රෙෂ්ඨත්වයට ගියාවූ ආකාශය වැනිවූ මහාවිරවූ-

**3623** "බියෙන් තැති ගත්තවුනට පිහිටවූ සරණගතයනට ආරක්ෂා ස්ථානයවූ (සත්වලොකයට) ඇස් වැසිල්ලක්වූ මහාධීරවූ-

**3624** "බුද්ධිමතුන්ට වාසස්ථානයක්වූ සුව සොයන්නා වුනට පින් කෙතක්වූ (ගුණ රුවන් පිරුනු) රත්නාකරයක්වූ මහාවීරවු-

**3625-3626** "කෙලෙස් තැවුල් නැතිකොට) අස්වැසිලි කරන්නාවූ (දුක් දොම්නස් නසා) සතුට ඇතිකොට ඇතිකරන්නාවූ (සෝවාන් ආදී සතර) ශ්‍රාමණ්‍යය ඵලදායකවූ (අමා වැසි වස්වන) මහා මේඝයක් වැනිවූ-

**3627** "ලොවට ඇසක් වැනිවූ මහා තෙජස් ඇති සියළු අඳුරු දුරු කරන්නාවූ සූය්‍ර්‍යා වැනිවූ-

3628 "ආරම්මණ විමුක්ති විෂයෙහි ස්වභාව කෘත්‍යයන් මේ මේ යයි දක්නාවූ චන්ද්‍රයා වැනිවූ මහාවීරවූ-

3629 ලොකයෙහි වෘද්ධත්වයෙන් යුක්තවූ ලක්ෂණයන් ගෙන් අලංකෘතවූ පමණ කළ නොහැකිවූ මහාවීරවූ-

3630 "යමෙකුගේ ඥානය පමණ කළ නොහැකිද යමෙකුගේ ශීලය උපමා විශයාතික්‍රාන්තද යමෙකුගේ විමුක්තිය අසදෘශද-

3631 "යමෙකුගේ නුවණ අශදෘශද යමෙකුගේ බලය අචින්ත්‍යද යමෙකුගේ පරාක්‍රමය ජ්‍යෙෂ්ඨද-

3632 'රාගයද ද්වෙෂයද මොහයද යන සියළු විෂයෝ නසන ලදහ ඖෂධයක් වැනිවූ මහාවීරවූ-

3633 "කෙලෙස් ලෙඩද බොහෝ දුක්ද සියළු (මොහ) අඳුරුද දුරුකරන්නාවූ වෙදකු වැනිවූ මහාවීරවූ-

3634 "පින්වත බුද්ධ යන යම් වචනයක් කියහිද මෙම ශබ්දය පවා අතිශයින් දුර්ලභය. බුද්ධය යන මේ වචනය අසා මට ප්‍රිතිය හට ගත්තේය.

3635 "සිතින් නොදැරිය හැක්කාවූ මාගේ ප්‍රීතිය පිටත පැතිරෙයි. ප්‍රිති සිත් ඇති ඒ සෙල නම්වූ මම මෙම වචනය කීමි (ඒ කෙසේද යත්)

3636 "ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ ඒ භාග්‍යවතුන් වහන්සේ කොහිද? (සතර) ශ්‍රාමාණ්‍ය ඵලදායකවූ උන්වහන්සේට එහි ගොස් නමස්කාර කරන්නෙමි" (කියායි.)

3637 "(කෙණිය තවුස්තෙමේ) මාගේ දකුණු අතගෙන හටගත් සොම්නස් ඇත්තේ කරන ලද ඇඳිලි ඇත්තේ සෝහුල් පහකරන බුදුරජුන් (අරහයා) මෙසේ කීය.

3638 "නිල් අඳුන් කුලක්වැනිවූද උදාවන්නාවූ වැහිවළාවක් බඳුවූද සයුරමෙන් පෙනෙන්නාවූ මේ මහවනය දක්නෙහිද?

3639 "මෙහි නොදැමුනු අය දමනය කරන්නාවූ ගුණ ඇති විනෙය්‍ය (හික්ම විය යුතු) ජනයන් හික්මවන බෝ පැකි දම් (බොධිපාක්ෂික ධර්ම) පිළිවිදුවන (ප්‍රතිවෙධ කරවන) ඒ බුදුරජතෙම වැඩවෙසේය කියායි.

**3640** "ඉක්බිති සෙල (බමුණුවූ) මම පැන්පවස ඇත්තේ දිය සොයන්නාක් මෙන්ද සාදුකින් පෙළුනේ බොජුන් සොයන්නාක් මෙන්ද වස්සා කෙරෙහි ගිජුවූ දෙනක් (එම වස්සා සොයන්නාක් මෙන්ද මෙසේ බුදුරජුන් සෙවීමි

**3641** "බුදුරජුන් වෙත යන කල්හි ආචාර උපචාරයන් දන්නාවූ ධර්මයට සුදුසු සංවරය ඇති තම සිසුන් (මෙසේ) හික්මවීමි. (කෙසේද යත්)

**3642** "එකලාව හැසිරෙන සිහ රජුන් මෙන් බුදුවරු ලංවිය නොහැක්කෝය. (එබැවින්) මානවක වරුනි (තෙපි පියෙහි පියතබා (පියවරමනිමින්) එන්නාහුය.

**3643** ඝොරවූ ආශික්ත විෂ සර්පයකු මෙන්ද කෙශර සිංහයකු මෙන්ද දළ ඇති මත්වූ ඇත්රජෙකු මෙන්ද මෙසේ බුදුවරු ලංවිය නොහැක්කේය.

**3644** "මානවකවරුනි, (තෙපි) කසින්නාවූද කිඹිසින්නාවූද (ශබ්ද) නවතා පියෙහි පිය තබා බුදුරජුන් වෙත එළඹෙව්.

**3645** (බුදුවරු) සැහැල්ලු පැවැතුම ගරුකරන්නෝය. නිශ්ශබ්දතාව කැමැත්තෝය. (ගුණයෙහි) ඉක්ම විය නොහැක්කෝය. එළඹිය නොහැක්කෝය. දෙවියන් සහිත ලොකයෙහි ගරුවූ උතුමෝද වෙත්.

**3646** "යම් කලෙක්හි මම ප්‍රශ්න විචාරම්ද පිළිසඳර හෝ කථා කෙරෙම්ද එකල්හි නිශ්ශබ්දවූවෝ වව්. වෙනෙයා ගුණ ඇත්තෝව සිටිව්.

**3647** 'ඒ මුනිරජතෙම නිවන් පැමිණීම පිණිස පවත්නාවූ ක්ෂෙම (නිර්භය) වූ යම් ධර්මයක් දෙශනා කෙරේද එම ධර්මාර්ථයම අසව්. සද්ධර්මශ්‍රවණය සැපය.

**3648** "මම බුදුරජුන් වෙත එළඹ එම මුනින්ද්‍රයන් වහන්සේ හා පිළිසඳරෙහි යෙදුනෙමි. එම පිළිසඳර කථාව නිමවා (උන්වහන්සේගේ) මහපුරිස් ලකුණු පරීක්ෂා කෙළෙමි.

**3649** "(එසේ පරික්ෂා කරන්නාවූ මම) මහා පුරුෂ ලක්ෂණ තිසක් දකිමි. මහා පුරුෂ ලක්ෂණ දෙකක් ගැන පමණක් (නොපෙනෙන බැවින්) සැක කරමි (එයින්) කොසොහිත

වත්ථගුය්හතාව (කොපුවක් ඇතුලෙහි මෙන් පවත්නා පුරුෂ ව්‍යඤ්ජනය ඇතිබව) සර්වඥතෙම ඍද්ධි බලයෙන් පෙන්විය

**3650** "(දෙවෙනි නොපෙනෙන ලක්ෂණයවූ) දිවපිටතට ඇද නැහැය පිරිමැද්දේය සර්වඥතෙම හුදුනලල් තලයද (දිවෙන්) වැසීය.

**3651** "මම උන්වහන්සේගේ (අසූවක්) අනුව්‍යඤ්ජන සහිතවූ සම්පූර්ණවූ දෙතිස් මහපුරිස් ලකුණු දැක (හේ) සර්වඥයයි තීරණය කොට සිසුන් සමග පැවිදිවිමි.

**3652** "තුන් සියයක් (සිසුන්) සමග අනගාරය‍්‍ය නම්වූ සසුනෙහි පැවිදි වීමි. අඩමසක් නොපැමිණි කල්හිම (අපි) සියල්ලෝ නිවණට (රහත්බවට) පැමිණියෝ වෙමු.

**3653** "නිරන්තරවූ පුණ්‍ය ක්ෂෙත්‍රයෙහි එක්ව පින්කම් කොට එක්ව සසරෙහි හැසිර එක්වම රහත් වූහ.

**3654** "සහයොගතා ධර්මයෙහි වසඟවූ මම හෙවත් සහාය පිරිස සහිතවූ මම ගොනැසිදී මැනවින් කළ එම කර්මය කරණකොටගෙන හෙතු (අනුසස්) අටක් ලබමි.

**3655** "දිශාවන්හි පුදනු ලබන්නේ වෙමි. මගේ තැති ගැනුමක් නැත

**3656** "මට රෝගයෝ නොවෙති. දීර්ඝායු රකිමි. හෙවත් බොහෝකල් ජීවත්වෙමි. සියුම් සිවි ඇත්තේවෙමි. පතනු ලබන නිවාසයෙහිම වසමි.

**3657** "සහයෝගතා ධර්මයෙහිවූ මම ගොනැසීදි (මෙසේ) අට අනුසසක් ලැබීමි මාගේ මේ අනුසස් අටින් බැහැරවූ අනික් අනුසස් සිව්පිළි සිඹියාවන් සහිත රහත් බවයි.

**3658** "මහාමුනීන් වහන්ස, (කළයුතු) සියල්ල අවසන් කළාවූ කරන ලද කටයුතු ඇත්තාවූ ආශ්‍රව රහිතවූ ඔබ වහන්සේගේ පුත්‍ර (බුද්ධ පුත්‍ර) තෙමේ "අට්ඨගොපානසි' නම්ද වේ.

**3659** "සහයොගතා ධර්මයෙහි වශීවූ මම කණු පසක්දී මැනවින් කරන ලද එම කර්මය කරණකොටගෙන හෙතු (අනුසස්) පසක් ලබමි.

**3660** "මම මෛත්‍රියෙන් නොසැලෙමි. පිරිපුන් අගපසඟ ඇත්තේ වෙමි පිළිගතයුතු වචන ඇත්තේ වෙමි මම (කණුව මෙන්ම නොගිලිහෙමි.

**3661** "මාගේ සිත භ්‍රාන්ත නොවේ. කුමකට වුවද නිශ්චල වෙමි. මැනවින් කරණ ලද එම කර්මය කරණ කොටගෙන සසුනෙහි නිර්මල කෙනෙක් වෙමි.

**3662** "බුදුරජාණන් වහන්ස, ගෞරව සහිතවූ (ස්වාමියෙකු ඇතැයි) යටත් පැවතුම් ඇතිකරන ලද කටයුතු ඇති ආශ්‍රව රහිතවූ ඔබවහන්සේගේ ශ්‍රාවකවූ ඒ භික්ෂුතෙමේ (ඔබ වහන්සේ) වඳියි.

**3663** "මම මනාලෙස වැස නිමවූ පළඟක්කොට මැනවින් කළ එම කර්ම විපාකය කරණකොටගෙන හෙතු (අනුසස්) පසක් ලබමි.

**3664** "මම උසස් කුලයෙහි ඉපිද මහත් භොග සම්පත් ඇත්තේ වෙමි. සියළු සම්පත්තීන්ගෙන් ආඪ්‍ය වෙමි. මාගේ මසුරු කමක් නොමැත.

**3665** "ගමනක් (යෑමට) සිතු කල්හි පළඟක් එළඹ සිටී. එළඹ සිටි එම උතුම් පළඟ සමග මාගේ පැතූ තැනට යමි.

**3666** "එම පයඞ්ංක දානය කරණ කොටගෙන සියළු අඳුර දුරු කෙළෙමි. සියලු අභිඥා බලයනට පත් (ඒ) ස්ථවිර තෙමේ මුනින්ද්‍රයන් වහන්ස, ඔබ වහන්සේ වඳී.

**3667** "අනුන් පිළිබඳ කටයුතුද තමා පිළිබඳ කටයුතුද යන සියළු කටයුතු සිදු කෙළෙමි. මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙන අභය පුරය (නිවණට) පිවිසියෙමි.

**3668** "මම කටයුතු නිමවූ ශාලාව (බුදුරජුන්හට) පරිභොගයට දුනිමි. මැනවින් කරණ ලද එම කර්මය කරණ කොටගෙන ශ්‍රෙෂ්ඨ බවට පැමිණියේ වෙමි.

**3669** "යම් ඇත් අස් ආදි (සතුන්) දමනය කරන කෙනෙක් යම් ඇත් අස් කෙනෙකුන් දමනය කෙරෙත්ද, නොයෙක් හිරිහැරකොට දරුණු ගුණයෙන් ඔවුන් (එසේ) දමනය කෙරෙත්.

**3670** "මහාවීරයාණනි, ඔබ ස්ත්‍රී පුරුෂයන් මෙසේ දමනය නොකෙරෙහිය. දඬු නොගැනීමෙන් අවි නොගැනීමෙන් ඔවුන් උත්තම දමථයෙහි (රහත් බැව්හි) දමනය කෙරෙති.

**3671** "දෙශනා කිරීමෙහි දක්ෂවූ බුදුරජ තෙමේ දානයාගේ අනුසස් පවසන්නේ එක් ප්‍රශ්නයක් දෙසන්නේම තවුසන් තුන්සියයට ධර්මාවබොධය කරවීය.

**3672** "සාරථිවූ බුදුරජුන් විසින් අපි දමනය කරන ලද්දෝ වෙමු කෙලෙසුන්ගෙන් මැනවින් මිදුනෝ වෙමු. ආශ්‍රව රහිතයෝ වෙමු. සියළු අභිඥාබලයනට පැමිණියාහු උපාධිශෙෂයෙහි පිරිනිවියෝ වෙමු.

**3673** "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන් සියලු භිතිහු ඉක්මවන ලද්දාහුය. ශාලාදානයාගේ මේ විපාකයයි.

3674-3675 (මෙහි 3578, 3579 ගාථා යොදන්න) 3676

## 393 සබ්බකිත්තික ථෙරාපදානය

**3677** "පිපුණු කිණිහිරි රුකක්මෙන් බබලන ප්‍රදීප වෘක්ෂයක් මෙන් දිලිසෙන ඔසධිතාරකාව මෙන් බබලන අහසෙහි විදුලියක් බඳුවූ

**3678** "බිය නොමැති තැති ගැනීම් නැති කෙශර සිංහරාජයෙකු වැනිවූ තීර්ථක සමූහයා මඩින්නාවූ ඤාණාලොකය ප්‍රකට කරන්නාවූ

**3679** "මෙම ලොකයා (දුකින්) ගොඩලන සියලු සැක සිඳලන සිංහරාජයෙකු මෙන් ගුගුරන ලොකනායකවූ බුදු රජුන් දුටිමි.

**3680** "(එකල්හි) මම ජටා සහ අඳුන්දිවිසම් දරන්නෙක් වීමි. වැඩෙන්නාවූ ඍජුවූ ප්‍රතාපවත් කෙනෙක් වීමි. වැහැරි සිවුරගෙන එම (බුදුරජුන්ගේ) පාමුල ඇතිරීමි.

**3681** "කළුවැල් (දුම්) ගෙන තථාගතයන් (එම දුමින් පිසහෙළමි. බුදුරජ (එම සුවඳ දුමින්) පිසහැර ලොකනායකවූ උන් වහන්සේට ස්තුති කළෙමි.

**3682** "චතුරොඝ තරණය කළ උතුමාණෙනි, මහ මුනින්ද්‍රයාණෙනි ඔබ මෙම ලොකයා (සසර දුකින්) ගොඩලන්නෙහිය. ඤාණ ලොකයෙන් ආලොක කරන්නෙහිය. (ඔබ විසින්) උත්තම ඥානයද අනාවරණය කරණ ලද්දෙහිය.

**3683** "දම්සක් පවත්වහිය අන්‍ය තීර්ථකයන් මඩනෙහිය. දිනන ලද සංග්‍රාම ඇති ශ්‍රෙෂ්ඨවූ ඔබ පෘථිවිය කම්පා කෙරෙහිය

**3684** "මහ සමුදුරෙහි රළ වේගය වෙරළෙහිදී බිඳෙති. එසේම ඔබගේ නුවණෙහි සියළු දෘෂ්ටීහු බිඳෙති.

**3685** "විලෙක්හි සියුම් ඇස් ඇති දැලක් ඇතිරූ කල්හි එකෙණෙහි දැලතුලට ගිය ප්‍රාණීහු (මත්ස්‍යයන්) පෙළුනාහු වෙත්ද?

**3686** "එසේම ලොකයෙහි අන්‍ය පාෂාණ්ඩ ධර්මයන් ඇසුරුකළ තීර්ථකයෝ, තිඳුකාණන්වහන්ස, ඔබවහන්සේගේ උතුම් නුවණ ඇතුළත පෙරළෙත්.

**3687** "සැඩ පහරෙහි ගසාගෙන යන්නවුනට පිහිටවූ ඔබ වනාහි නොනෑයනටද පිහිට (වෙහිය) භයින් පීඩිත යනටද පිහිට (වෙහිය) ලොකයා විසින්) අතහැර දමන ලද යදියනටද පිහිට (වෙහිය)

**3688** "අසහාය වීරවූ අසදෘශවූ කරුණා මෛත්‍රීන්ගේ රැස්වීම ඇති උතුම් සිල් ඇති අසමවූ ශාන්තවූ (ධ්‍යාන) වශීවූ තාදී ගුණ ඇති දිනන ලද මාර්ගය ඇති,

**3689** "ප්‍රාඥවූ පහකළ මොහය ඇති කම්පා නොවන්නාවූ සැක (විචිකිච්ඡා) දුරුකළ, වැස නිමවූ බඹසර ඇති නිර්මලවූ දොවාහල (සෝදා දැමු එහෙයින්ම) පිරිසිදුවූ (ඔබ) වමාරාහළ දොස් ඇත්තේ වෙහිය.

**3690** "කෙළෙස් ඇලුම් ඉක්මවූ නැසුවාවූද මද ඇති ත්‍රිවිද්‍යා ඇති තුන්ලෝ මුදුන්පත් (ලෞකික) සීමාව ඉක්මගිය ධර්ම ගරුකවූ කළකටයුතු ඇති ඔබ (සත්වලොකයාහට) හිතවත්වූයෙහිය. ආශ්චර්‍ය්‍ය (පුද්ගල) වෙහිය.

**3691** ඔබ නැවකට (ගමන් මග පෙන්වන) තරුවක්මෙන් වෙහිය. නිධානයක් මෙන් අස්වැසිලි කරන්නේ වෙහිය. සිංහයකු මෙන් පිය රහිත වෙහිය. හස්ති රාජයෙකුමෙන් ගර්විත වෙහිය.

**3692** මම එකල්හි (මෙසේ) ගාථා දසයකින් මහා යශස් ඇති පදුමුත්තර බුදුරජාණන් වහන්සේට ස්තුති කොට (එම) ශාස්තෘන් වහන්සේගේ පා වැඳ තුෂ්ණිම්භූතව සිටියෙමි.

**3693** "ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ ශාස්තෘවූ පදුමුත්තර බුදුරජතෙම බික් සඟන මැදහිද මෙම ගාථාවන් වදාළේය.

**3694** "යමෙක් මාගේ ශීලයද ඥානයද ධර්මයද පැසසීද හේ (කවරෙක් දැයි) මම ප්‍රකාශ කරන්නෙමි (එය) විමසන්නාවූ මාගේ (වචනය) අසව්.

3695 "(හෙමෙත) කල්ප සැටදහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේය අතික් දෙවියන් යටපත්කොට ආධිපත්‍යය කරවන්නේය.

3696 "එම කුශල මූලයෙන් මෙහෙයනලද්දේ හෙතෙම පසුව පැවිදිව ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි පැවිදි වන්නේය.

3697 "පැවිදිව කයින් පව්කම් දුරුකොට සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන් දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය."

3698 "යම්සේ වැසි වලාවක් වස්වමින් මෙම පොළොව තෘප්තියට පත් කෙරේද එසේම මහා වීරයාණන් වහන්ස, ඔබ වහන්සේ ධර්මයෙන් මා තුටු කළේය.

3699 '(මම) ශීලයද ප්‍රඥාවද ධර්මයද ලොක නායකයන් වහන්සේද, පසසා අමෘත පදයවූ උතුම්වූ නිර්වාණ නමැති ශාන්තියට පැමිණියේ වෙමි.

3700 "පසැස් ඇති ඒ භාග්‍යවත් තෙමේ බොහෝ කාලයක් වැඩ සිටින්නේ නම් එකාන්තයෙන් ඉතා යෙහෙකි. (එවිට අප සියල්ලෝ) නොදත් දෙය දැන ගන්නාහුය. අමෘත පදය (නිවන) ස්පර්ශ කරන්නාහුය. (ලබන්නාහුය)

3701 "මේ මාගේ පශ්චිම ජාතියයි. සියලු භවයෝ නසන ලදහ. සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

3702 'මින් සියක් දහස්වන කපෙහි බුදුරජාණන් වහන්සේට යම් පැසසීමක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (බුදුරජුන්හට පැසසීමෙහි මේ විපාකයයි.

3703 "මා විසින් ක්ලේශයෝ දවන ලදහ සියළු භවයෝ නසන ලදහ. සියළු ආශ්‍රවයෝ ක්ෂය කරන ලදහ. දැන් නැවත ඉපදීමක් නැත.

3704 (මෙහි 3578 යොදන්න) 3705

## 394 මධුදායක ථෙරාපදානය

3706 "සින්ධු නදී තීරයෙහි මැනවින් කරනලද මාගේ අසපුවක් විය. එහි මම ලක්ෂණ ශාස්ත්‍රය සහිත ඉතිහාසය සිසුනට උගන්වමි.

3707 'ධර්මකාමීවූ විනීතවූ (මාගේ) අනුශාසනය අසන කැමැත්තාවූ ෂඩංග (වෙද) යෙහි පරතෙරට ගියාවූ එම ශිෂ්‍යයෝ සින්ධූ ගංඉවුරෙහි වෙසෙති.

3708 'උත්පාතයන්ගේ ගමන්හිද ලක්ෂණ ශාස්ත්‍රයන් හිද දක්ෂවූ උත්තමාර්ථය සොයන්නාවූ ඔවුහු එකල්හි වනයෙහි වෙසෙත්.

3709 "සුමෙධ නම් සම්බුදුරජතෙම ලොව පහළවිය. අපට අනුකම්පා කරන්නාවූ එම බුදුරජතෙම එකෙණෙහි (අප වෙත) එළඹියේය.

3710 "(එසේ) එළඹියාවූ මහාවීර සුමෙධ ලොකනායකයන් වහන්සේ (දුටිමි) (දැක) මම තණ ඇතිරියක් කොට ලොකජ්‍යෙෂ්ඨවූ බුදුරජුන්හට දුනිමි.

3711 "මම වනයෙන් මී ගෙන (අවුත්) බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි. සම්බුදු රජතෙම (එය) වළඳා මෙම වචනය වදාළේය.

3712 "යමෙක්තෙම පැහැදුනේ සියතින් මට ඒ මධු (මීපැණි) දානයක් දුන්නේද, මම හේ (කවරෙක්දැයි) පවසන්නෙමි. එසේ පවසන්නාවූ මාගේ වචනය අසව්.

3713 "මෙම මධු දානය කරණකොට ගෙනද තණ ඇතිරි දානය කරණකොට ගෙනද කප් තිස් දහසක් මුළුල්লෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය.

3714 '(මින්) කල්ප තිස් දහසකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතමවූ ශාස්තෘතෙමේ ලොව පහළ වන්නේය.

3715 "(මෙතෙම) උන්වහන්සේගේ ධර්මයෙහි දායාදී අයිති කරුවෙක්ව ධර්මයෙන් නිර්මිත කළාක් වැනි ඖරස පුත්‍රයෙක් බුද්ධ පුත්‍රයෙක්ව සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන් පිරිසිඳ) දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය" කියායි.

3716 "දෙව්ලොවින් පෙරළා මෙහි පැමිණ මව් කුසට (පිළිසිඳීම් වශයෙන්) පැමිණි කල්හි මීයෙන් පොළොව වසමින් මී වැස්සක් වැස්සේය.

3717 "මා ඉතා පහසුවෙන් මච්කුසින් බිහිවූ කෙණෙහි එහිදී ද මට නිති කල් පවත්නා මධු වර්ෂා කෙළේය.

3718 'ගිහිගෙන් නික්ම අනගාරයෑ නම්වූ සසුනෙහි පැවිදිවීමි. ආහාරපාන සුලභ කෙනෙක්ද වීමි. මධු දානයාගේ මේ විපාකයයි.

3719 "මම දෙව් මිනිස් දෙගතියෙහි සියළු කාම සම්පත්තීන්ගෙන් සමෘද්ධවූවෙක්ව එම මධු දාන බලයෙන්ම ආශ්‍රව ක්ෂය නම්වූ නිවණටද පැමිණියේ වෙමි.

3720 "වැසිවස්නා කල්හිද සිව් අඟුල් (උසට වැඩුනු) තණ බිම්හිද මනාව මල් පිපීගිය ගස් වලින් වැසුනාවූ තන්හිද, (ජනයාගෙන්) හිස්වූ ගෘහය, මණ්ඩපය, වෘක්ෂමූලය, යන මේ තන්හිද නිතර ආශ්‍රව රහිතව සුඛිතවූයේ වෙසෙමි.

3721 "මහත්වූ හෙවත් ප්‍රණීතවූද, මධ්‍යස්ථවූද, හීනවූද සියළු භවයන් ඉක්මවීමි. අද මාගේ ආශ්‍රවයෝ ක්ෂයවූහ. දැන් නැවත ඉපදීමක් නැත.

3722 "මින් තිස් දහස් කපකින් පෙරවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මධු දානයාගේ මේ විපාකයයි

3723 3724 (මෙහි 3703, 3578 යොදන්න) 3725

## 395 පදුම කූටාගාරිය ථෙරාපදානය

3726 "සියල්ල තෙමේම අවබොධ කළාවූ ලොකනායකවූ සර්වඥවූ මොනෙය්‍ය ගුණ යුත්වූ සමාධියෙහි දක්ෂවූ විපස්සී භාග්‍යවත්තෙමේ විවේක කැමැත්තේ (විය.)

3727 "මහාමුනිවූ පුරුෂොත්තමවූ (එම) පියදස්සී බුදු රජතෙම වනලැහැබට පිවිස පවුල් සිවුර අතුරා වැඩ හුන්නේය.

3728 "මම පෙර මහවෙනෙහි මුව වැද්දෙක් විමි. එම කල්හි පසද මෘගයෙකු සොයන්නේ ඇවිදිමි.

3729 "එහිදී (චතුර්) ඕඝයන් තරණය කළ ආශ්‍රව රහිතවූ පිපියාවූ ශාලවෘක්ෂ රාජයෙකු වැනිවූ උඩට නැගී ආ හිරු වැනිවූ සම්බුදු රජුන් දිටිමි.

3730 "මම දෙවාති දෙවවූ මහත් යශස් ඇති (එම) පියදස්සී බුදුරජුන් දැක එකල්හි ස්වයංජාත විලකට බැස පියුම් ගෙන ආමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3731 "මම සියක් පත් ඇති මනරම්වූ පියුම ගෙනවුත් කුළුගෙයක් කොට (එය) පියුමෙන් වැසීමි. (සෙවිළි කෙළෙමි.)

3732 "පස්මරුන් ජයගත් (සව් සත්නට) අනුකම්පා කරන්නාවූ කාරුණිකවූ මහාමුනිවූ පියදස්සී බුදුරජතෙම රෑ දාවල් දෙකක් (එම) කුළුගෙයි විසීය.

3733 "මම පරණ (පියුම්) අස්කොට අළුත් පියුමින් (එම කුළුගෙය නැවත) වැසීමි. (සෙවිලි කෙළෙමි) එකෙණෙහි මම ඇඳිලි බැඳගන සිටියෙමි.

3734 "ලොක නායකවූ පියදස්සී බුදුරජතෙම සමාධියෙන් නැගිට (දස) දිගුන් බබලමින් වැඩහුන්නේය.

3735 "එකල්හි පියදස්සී බුදුරජුන්ගේ සුදස්සන නම් උපස්ථායක තෙම එම බුදුරජුන්ගේ සිත දැක,

3736 "අසූදහසක් භික්ෂූන් විසින් පිරිවරන ලදුයේ වනයෙහි සුවසේ වැඩහුන් ලොකනායකවූ බුදුරජුන් වෙත එළඹියේය.

3737 "එකල්හි (එම) වනලැහැබෙහි අධිගෘහිතවූ යම්තාක් දෙව්වරු වෙත්නම් (එම) සියළු දෙව්වරු, බුදුරජාණන්වහන්සේගේ සිත දැන (එහි) රැස්වූහ

3738 "කුම්භාණ්ඩයන්ද, රකුසන් සහිතවූ යකුන්ද රැස්වූ කල්හි බික්සඟනද පැමිණි කල්හි බුදුරජතෙම මෙම ගාථාවන් වදාළේය.

3739 "යමෙක් තෙම සතියක් මුළුල්ලෙහි සිට පිදීද, (එසේම) මට ආවාසයක්ද කරවීද, හේ (කවරෙක් දැයි) මම පවසන්නෙමි. (එය) පවසන්නාවූ මාගේ වචනය අසව්.

3740 "ඉතා දුකසේ (කලාතුරකින්) දැකිය හැකිවූ තියුණුවූද ගැඹුරුවූද (ගති) ප්‍රකට කරනලද හේ (කවරෙක් දැයි) නුවණින් (බලා) පවසන්නෙමි. එසේ පවසන්නාවූ මාගේ වචනය අසව්.

3741 "(මෙතෙම) තුදුස් කපක් (මුළුල්ලෙහි) දිව්‍යරාජ්‍යය කරන්නෝය. ඔහුගේ මහත්වූ කුළුගෙය පදුම පුෂ්පයන්ගෙන් (නෙළුම් මල්) වලින් වසන ලද්දකි (එය) අහසෙහි දරන්නේය. පුෂ්පකර්මයාගේ (පියුමින් සෙවිලි කළ කුළුගෙය පිදීමෙහි) මේ විපාකයයි.

3742 "සූවිසි කප් සියයක් (කල් මුළුල්ලෙහි) දෙව් මිනිස් දෙගතියෙහි (මිශ්‍ර ලෙස) සැරිසරන්නේය. ඒ (සියළු) තන්හිදී (මට) මල්මුවා විමනක් අහසෙහි දරන්නේය.

3743 "යම්සේ පියුම් පතෙහි දිය නොතැවරේද, එසේම මොහුගේ නුවණෙහි ක්ලේශයෝ නොතැවරෙත්.

3744 "මෙතෙම පඤ්ච නීවරණයන් සිතින් ලිහා (බැහැරකොට) නෛෂ්ක්‍රම්‍යයෙහි සිත් උපදවා ගිහිගෙන් (නික්ම) පැවිදිවන්නේය

3745 "ප්‍රාඥවූ සිහියෙන් යුක්වූ රුක්මුල්හි වසන්නාවූ (මොහුට) එහිදී මල්මුවා විමනක් මුදුනෙහි දරන්නේය.

3746 "(මෙතෙම) චීවර පිණ්ඩපාත (ගිලාන) ප්‍රත්‍යය සෙනාසන යන සිව්පසය බික්සඟනට දී ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය.

3747 "කුළුගෙයින් (යන) ගමන්ම පැවිද්දට නික්මුණෙමි. රුක්මල්හි වසන කල්හි කුළුගෙය(ද) දරයි"

3748 "චීවරයෙහිද, පිණ්ඩපාතයෙහිද, මාගේ චෙතනාවක් නැත. (කරන ලද) පින්කම හා යෙදුනේ (එම චීවර ආදිය) සම්පූර්ණවම ලබමි.

3749 'මා විසින් ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිනිය නොහැකි (බොහෝ) කෙළගණන් කල්පයෝ ඉක්මවනලදහ. (මා විසින්) හිස්ලෙස එම කල්පයෝ ඉක්මවන ලදහ. බුදුවරු අතහැර දමන ලදහ.

3750 "අටළොස් සිය වැනි කපෙහි හෙවත් (මින්) එක් දහස් අටසිය වන කපෙහි පියදස්සී නම් බුදුරජතෙම ලොව පහළ විය. මම උන්වහන්සේ ඇසුරුකොට මෙම යොනිය (ජන්මය) ට එළඹියේ වෙමි.

3751 "මෙහිදී පසැස් ඇති අනොම නම්වූ සම්බුදුරජුන් දුටිමි. මම උන්වහන්සේ වෙත එළඹ අනාගාර්‍ය නම්වූ සසුනෙහි පැවිදිවිමි.

3752 "පස්මරුන් ජයගත් දුක් කෙළවර කරන්නාවූ බුදුරජතෙම මට (ප්‍රතිපත්ති) මාර්ගය දෙශනා කළේය. උන්වහන්සේගේ ධර්මය අසා නිවනට පැමිණියෙමි.

3753 "ශාක්‍යකුල තිලකවූ ගොයුම් සම්බුදුන් තුටුකොට සියළු ආශ්‍රවයන් (ප්‍රහාණපරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි

3754 "එක්දහස් අටසිය වන කපෙහි බුදුරජුන්හට යම් ප්‍රජාවක් කෙළෙම්ද. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි

3755, 3756 (මෙහි 3703, 3758 යොදන්න.) 3757.

## 396 බක්කුල ථෙරාපදානය

3758-3759 "හිමවතට නුදුරෙහි සොභිත නම් පර්වතයක් විය මාහට මැනවින් කරනලද අසපුවක් විය. එම අසපුවෙහි ස්වකීය ශිෂ්‍යයන් විසින් කරනලද මණ්ඩපයෝද බොහෝ වූහ. පිපුණු සින්දුවාර (නික) වෘක්ෂයෝද, (එසේම) පිපුණු ජීව ජීවක වෘක්ෂයෝද (තවත්) එහි කපිත්ථ (ගිවුල්) වෘක්ෂයෝද බොහෝ වූහ.

3760 'නික ගස්ද ඬෙබර හා නෙල්ලිගස්ද බොරළුදමනු (උගුරැස්ස) ගස්ද, ලබුද, පිපුණු සුදුනෙළුම් ද එහි බොහෝය.

3761 "ආලක නම් ගස්ද, බෙලිගස්ද, කෙසෙල්ගස්ද, නාරන් ගස්ද, උක්ගස්ද, කුඹුක්ගස්ද, පුවගුගස්ද එහි බොහෝය.

3762 "කොසොඹය, සලලය, කොළොම්ය, නුගය, ගිවුළුය යන මේ වෘක්ෂයෝද එහි බොහෝ වෙති. මාගේ අසපුව මෙබඳුය. ශිෂ්‍යයන් සහිතව මම එහි විසීමි.

3763 'සියල්ල තෙමේම අවබොධ කරගත් ලොක නායකවූ අනොමදස්සි භාග්‍යවත්තෙමේ සැහැල්ලු පැවැත්ම (විවේකය) සොයන්නේ මගේ අසපුවට එළඹියේය.

3764 "මහත් යශස් ඇති අනොමදස්සී බුදුරජුන් එළඹි කල්හි ක්ෂණයකින් (එම) ලොක නායක බුදුරජුන්ගේ (සිරුරෙහි) වාතාබාධයක් නැගී ආවේය.

3765-3766 "මම අරණෙහි හැසිරෙන්නේ ලොක නායකයන් වහන්සේ දැක මහත් යශස් ඇත්තාවූද පසැස් ඇත්තාවූද, (එම) සම්බුදුරජුන් වෙත එළඹ උන්වහන්සේගේ කම්පනයද දැක එකල්හි "අහෝ! අපගේ සියල්ල තෙමේම (ස්වයම්භූ ඥානයෙන්) දත් බුදුරජුන්හට ව්‍යාධියක් හටගත්තේය" යි සැළකීමි.

3767 "(ඉක්බිති) වහා අසපුවට පැමිණියෙමි. එකල්හි, මම මගේ සිසුන් සමීපයෙහිදී බේතක් කරනු කැමැත්තේ සිසුන් ඇමතීමි.

3768 "සියළු ශිෂ්‍යයෝ ගෞරව සහිත වූවාහු මාගේ වචනයට පිළිවදන් දී එක්තැනම රැස්වූහ. මාගේ ශාස්තෘ ගෞරවය හේතුකොටගෙන

3769 "මම මහා පර්වතයට නැග සියළු ඖෂධ (සකස්) කළෙමි. මම එම ඔසු බීමට සුදුසුකොට බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

3770 "සර්වඥවූ ලොක නායකවූ මහා වීරයන් වහන්සේ ඒ ඖෂධයන් පානයකළ කල්හි සුගතවූ ඒ මහර්ෂීන් වහන්සේගේ වාත රෝගය වහා සන්සිඳුනේය.

3771 "මහත් යශස් ඇති අනොමදස්සී බුදුරජතෙම සන්සිඳුනාවූ (කාය) දරථය (ක්ලාන්තය) දැක සිය අසුනෙහි හිඳ මෙම ගාථාවන් වදාළසේක.

3772 "යමෙක් මට බෙහෙත් දුන්නේද, මාගේ රෝගය සන්සිඳුවීද, හේ (කවරෙක්දැයි) මම පවසන්නෙමි. (එසේ) පවසන්නාවූ මාගේ වචනය අසව්.

3773 "(මේ හේතුවෙන්) කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දෙව්ලොව සිත්අලවා වසන්නේය එම දෙව්ලොවෙහි තූර්‍ය්‍යයන් වාදනය කරන කල්හි මෙතෙම හැමකල්හි සතුටු වන්නේය.

3774 "කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ මිනිස්ලොවට (උත්පත්ති වශයෙන්) අවුත් දහස්වරක් සක්විතිරජ වන්නේය.

3775-3776 "පස්පණස් වන කපෙහි සිව් මහා දිවයින් හා සිව්සයුරු කෙළවරකොට ඇති පෘථිවියට අධිපතිවූ (සතුරු රජවරුන්) ජයගන්නාසුළුවූ ජම්බුද්වීපයට (විශෙෂයෙන්) අධිපතිවූ සත්රුවනින් යුත් මහත් බල ඇති අනොම නම් සක්විති රජෙක්ව තව්තිසාවද කළඹා ආධිපත්‍යය කරන්නේය.

3777 "දෙව් වූයේද, මිනිස් වූයේද අල්පාබාධවූ (නීරෝගී) කෙනෙක් වන්නේය. (රෝග භයින්) අල්වාගැනුමක් නොමැතිව ලොකයෙහි (ව්‍යාධි) සාගරය තරණය කරන්නේය.

3778 "මින් අපරිමෙය්‍ය කල්පයෙහි (කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ) නමින් ගෞතම නම්වූ ශාස්තෘ තෙමේ ලොව පහළවන්නේය.

3779 "උන්වහන්සේගේ ධර්මයෙහි දයාදීවූ ඖරස (බුද්ධ පුත්‍රවූ) ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ සියළු ආශ්‍රවයන් (පරිඥා ප්‍රහාණ වශයෙන්) දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය.

3780 "කෙලෙස් දවා තෘෂ්ණාව නමැති සැඩපහරද තරණය කරන්නේය. නමින් බක්කුල නම්වූ ශාස්තෘ ශ්‍රාවකයෙක්ද වන්නේය.

3781 "ශාක්‍ය කුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජතෙම මේ සියල්ල දැන භික්ෂු සංඝයා මැද වැඩහිඳ (මොහු) එතදග්‍රස්ථානයෙහි තබන්නේය.

3782 "සියල්ල තෙමේම අවබොධ කළාවූ ලොක නායකවූ අනොමදස්සී භාග්‍යවත් තෙමේ විවේක සුවය බලාපොරොත්තු වන්නේ අසපුවට එළඹියේය.

3783 "එළඹියාවූ මහාවීරවූ ලොක නායකවූ සර්වඥයන් වහන්සේ පහන් සිතැත්තේ සියතින් සියළු ඖෂධයන්ගෙන් සන්තර්පණය කෙළෙමි.

3784 "ඒ මාගේ මැනවින් කළ කර්මය සාරවත් කෙතක (ඇතිවූ) බීජ සම්පත්තිය (අස්වැන්න) මෙන් සරුය. අවසන් කරන්නට නොහැක්කෙමි.

3785 "ඒ මම ලොක නායකයන් වහන්සේ දුටුයෙම්ද, (එය) මට ලාභයකි. මාගේ යහපත් ලැබීමකි. එම කර්මයාගේ අවශෙෂ විපාකයෙන් අචල පදයවූ නිවනට පැමිණියේ වෙමි.

3786 "ශාක්‍ය කුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජතෙම මේ සියල්ල දැන භික්සඟන මැද හිඳ මා එතදග්‍රස්ථානයෙහි තැබීය.

3787 "මින් අපරිමෙය්‍ය කල්පයෙහි හෙවත් කල්ප ලක්ෂයකින් පෙර වූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බෙහෙත් දනෙහි මේ විපාකයයි.

3788-3789 (මෙහි 3703-3578 යොදන්න.) 3790

## 397 ගිරිමානන්ද ථේරාපදානය

3791 "මාගේ භාර්‍ය්‍යාව කළුරිය කළාය. පුත්‍රතෙමේද සොහොනට ගියේය. (මළේය) මවද, පියාද, සොහොයුරාද (යන තිදෙන) එක චිතකයෙහි (දරසෑයෙහි) දැවෙත්.

3792 "මම එම ශොකයෙන් තැවුනේ කෘෂවූයේද පඬුවන් වූයේද වෙමි. එම ශොකයෙන් පෙළුනේ මාගේ චිත්ත කොපයද විය.

3793 "මම එම සෝහුලින් පෙළුනේ වනයට එළඹියෙමි. ස්වයංපතිත ඵල අනුභවකොට මම රුක්මුලෙහි වෙසෙමි.

3794 "පස්මරුන් ජයගත්තාවූ (සසර) දුක් කෙළවර කරන්නාවූ සුමේධ නම් ඒ බුදුරජතෙම මා (සසර සයුරින්) ගොඩලනු කැමැත්තේ මාගේ සමීපයට පැමිණියේය.

3795 "සුමේධ බුදුරජුන්ගේ පියවර හඬ අසා මම හිස ඔසවා (එම) බුදුරජුන් දෙස බැලීමි.

3796 "මහාවීරවූ බුදුරජතෙම සමීපයට පැමිණියේය මාගේ ප්‍රීතිය පහළ විය. එකල්හි මාගේ සිත එකඟ විය. ලොකනායකවූ බුදුරජුන් එය දැක,

3797 "මම සිහිය ලබා (උන් වහන්සේට) පලාමිටක් දුනිමි. පසැස් ඇති භාග්‍යවත් තෙමේ අනුකම්පාවෙන් එහි වැඩහුන්නේය.

3798 "භාග්‍යවත්වූ සුමෙධ බුදුරජතෙම එහි වැඩහිඳ මට (මාගේ) සෝහුල (උදුරා) බැහැර කරන්නාවූ ධර්මය වදාළේය.

3799 "(ඒ භාර්‍ය්‍යා ආදීහු) කැඳවීමක් නොමැතිව එම අතීත ලොකයෙන් (මෙහි) පැමිණියාහුය. (එසේම අප විසින්) අනුදැක්වීමක් නොකරන ලද්දාහු මෙලොවින් පරලොවට ගියාහුය යම්සේ ඇරයුමක් නොමැතිව) මෙලොවට පැමිණියාහුද එසේම (අනුදැනීමක් නොමැතිව) පරලොවට ගියාහුය. එහි කවර නම් විලාප කීමක්ද?

3800 "යම්සේ ඒ මගී ජනයා වැසිවස්නා කල්හි (එම වැස්සෙන් ඇතිවන දුක) ඉවසන්නාහු වැසි නොවැටෙන තැනකට එළඹෙත්.

3801 "ඔවහු වැසි නැවතුනු කල්හි කැමති තැනකට යෙත්. ඔබගේ දෙමාපියෝද එසේ වෙති. එහි කවර නම් වැලපීමක්ද?

3802 "ලෝවැසි හැම සත්හුම මෙලොවට) ආගන්තුගයෝ වෙති අමුත්තෝ වෙති. සැලෙන ඉරියව්වලින් (ඉරියව් මාරුකිරීමෙන්) තෘප්තවූවෝ වෙති. තාගේ දෙමව්පියෝද එබඳු වෙති.

3803 "යම්සේ ජීර්ණවූ සර්පයෙක් තෙම ස්වකීය සැවය හැරදමායේද, එසේම තාගේ දෙමාපියෝද සිය සිරුර මෙලොව්හි හැර දමත්.

3804 මම බුදුරජාණන් වහන්සේගේ වචනය අසා සෝහුල දුරුකෙළෙමි. ප්‍රමොදය උපදවා බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ වැන්දෙමි.

3805 3806 "(එම) බුදුරජුන්හට වැඳ දිව්‍යමය සුවඳින් යුත් ගිරිමල් (කඳුවල හැදෙන මල් වර්ගයක්) කළඹක් පිදීමි. පුදා ලොකනායකවූ සුමේධ බුදුරජුන්හට සිරසෙහි ඇඳිලි බැඳ අග්‍රවූ ගුණ සිහිකරමින් පැසසීමි. කෙසේද යත්?

3807 "මහාවීරයන් වහන්ස, සර්වඥයන් වහන්ස, ලොකනායකයන් වහන්ස, ඔබ පහවූ තෘෂ්ණා ඇත්තෙහිය මහාමුනීන් වහන්ස, ඔබ නුවණින් සව් සතුන් (දුකින්) ගොඩලන්නෙහිය

3808 "මහාමුනීන් වහන්ස, ඔබ දේවල්හක නම්වූ සැකය (විචිකිච්ඡාව) ද සිඳිනෙහිය. පසැස් ඇත්තාණන් වහන්ස, ඔබ මා විසින් (යායුතු ප්‍රතිපත්ති) මාර්ගය පිළියෙළ කෙරෙහිය.

3809 "එකෙණෙහි (ධ්‍යාන) සිද්ධියට පත් ෂඩභිඥා ඇති මහාඍද්ධිමත් ප්‍රාඥවූ ආකාශචාරීවූ රහත්හු පිරිවරවරැස්වෙති

3810 "(ආචාර්‍ය්‍ය මාර්ගයට) පිළිපන්නෝද සප්ත ශාක්‍යයෝද (ශුෂ්ක විදර්ශක වශයෙන්) අර්හත් ඵලයෝද, (එම පිරිසෙහි) වෙත්. ඔබ වහන්සේගේ එම ශ්‍රාවකයෝ හිර උදාවන කල්හි (පිබිදෙන) පියුම් මෙන් ප්‍රබොධ වෙත්.

3811 "පසැස් ඇත්තාණන් වහන්ස; ඔබ (මෙසේ නුවණින් යුතුවූයේ පමණ කළ නොහැකි) අප්‍රමෙයවූ නුවණ ඇත්තේ වෙහිය (කෙසේද යත්?) සමුදුරමෙන් (නොකැළඹිය හැකි)

අතුල්‍යවූ නුවණ ඇත්තෙහිය (සිතා අවසන්කළ නොහැකි නැණ සයුරක් බැවින්) තරණය කළ නොහැකි නුවණ ඇත්තෙහිය

3812 "මම ලෙව්හි (සියළු) කෙලෙස් සතුරන් ජයගත් මහත්වූ යශස් ඇති බුදුරජුන් වෙන වෙන දිගුන්හි (අට දිගෙහිම) හිඳ උක්කුටිකව වැඳ නමස්කාර කරමින් ගියෙමි.

3813 "කුදුමහත් භවයන්හි සැරිසරමින් දෙව්ලොවින් චුතව සම්‍යක් ප්‍රඥාවෙන් යුතුවූයේ එළඹ සිටි සිහි ඇත්තේ මවුකුසින් බිහිවීමි.

3814 "(ඉක්බිති වැඩිවයසට පැමිණ) ගිහිගෙන් නික්ම අනගාර්‍ය්‍ය නම්වූ සසුනෙහි පැවිදි වීමි. කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුතුවූයේ ප්‍රඥාවත්වූයේ ධ්‍යාන කරන සුළුවූයේ විවේකස්ථානයන් ඇසුරු කළේ.

3815 "වීර්‍ය්‍ය කොට බුදුරජුන් තුටුකොට මෙසකූටය (වැසිවලාවකින්) මිදුනු සඳුමෙන් මම හැමකල්හි හැසිරෙමි.

3816 "සන්හුන්වූයේ කෙලෙස් උපධිරහිත වූයේ විවේකයෙහි යෙදුනේ වෙමි. සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ ප්‍රඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

3817 "තිස්වන කපෙහි සම්බුදු කෙනෙකුන් වහන්සේ පිදුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මේ බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

3818, 3819, (මෙහි 3703, 3578 යොදන්න.) 3820

## 398 සලල මණ්ඩපිය ථෙරාපදානය

3821 වැස නිමවන ලද බඹසර ඇති බහාතබන ලද පව් ඇති කකුසඳ බුදුරජුන් පිරිනිවි කල්හි මම සලල මල් ගෙන මණ්ඩපයක් කරවීමි.

3822 "(ඒ පිණින්) තව්තිසා දෙව්ලොවට ගියේ උතුම් විමනක් ලබමි. අනික් දෙවියන් මැඩගෙන බබලමි. පුණ්‍ය කර්මයාගේ මේ විපාකයයි.

3823 "ඉදින් දිවා කල්හි හෝ රාත්‍රි කල්හි හෝ සක්මන් කරන්නාවූද සිටියාවූද මම සලල මල්වලින් වැසුනේ වෙමි.

පුණ්‍ය කර්මයාගේ මේ විපාකයයි.

3824 "මෙම කපෙහිම යම් බුදුවරයෙකු පිදුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

3825, 3826, 3827 (මෙහි 3707, 3578 යොදන්න) 3827

## 399 සබ්බදායක ථෙරාපදානය

3828-3829-3830 "මට මහසමුදුරට බැසගත් මැනවින් නිර්මිත කරන ලද භවනයක් විය. (එය අසළ) සක්වා ලිහිණියන් විසින් නාද පවත්වන ලද මන්දාලක පුෂ්පයන් ගෙන්ද පද්මයන්ගෙන් හා උත්පලයන්ගෙන්ද ගැවසීගත් මැනවින් නිමකළ පොකුණක් විය. එහි මනාවූ කුඩා තොටුපලවල් ඇති මනරම්වූ මස් කැසුබුවන්ගෙන් ගැවසීගත් රැස්වූ නොයෙක් මෘග සමූහයා ඇති ගංගාවක් තොමෝ ගලා බසින්නීය. එම විමනෙහි මොනරුන්ගේ හා කොස්වාලිහිණියන්ගේ හඬින්ද කොවුල් ආදී පක්ෂීන්ගේ හඬින්ද (මනරම් බවක් ඇත)

3831 "පරවියෝය, රවිහංසයෝය, සක්වාලිහිණියෝය. (ගංගාවන්හි හැසිරෙන) නදීචරයෝය, කිරලෝය, සැළලිහිණියෝය. (ජීව-ජීව අනුකරණයෙන් හඬන්නාවූ) ජීව-ජීවකයෝය. උණහපුළුවෝය යන මොවුහු එහි බොහෝ වූහ.

3832-3833 "එහි නාද පවත්වන ලද හංසයෝද කොස්වා ලිහිණියෝද බකමුහුනෝද පිංගලයෝද, යන මේ පක්ෂීහු බොහෝ වූහ. සත්රුවනින් යුත් මිණිමුතු සහිත වැලිද නොයෙක් සුවඳ හමන සියල්ල රන්මුවාවූ ගස්ද හැම කල්හි එම භවනය දිවා රෑ-දෙක්හි බබුළුවත්.

3834 "සැටදහසක් තූර්‍ය්‍යයන් සවසද උදෑසනද වයත්. හැමකල්හි සොළොස් දහසක් ස්ත්‍රීහු මා පිරිවරත්.

3835 "(මම) භවනයෙන් නික්ම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ මහත් යශස් ඇති ලොකනායකවූ ඒ සුමෙධ බුදුරජුන්හට වැන්දෙමි.

3836 "සම්බුදුරජුන් වැඳ සංඝයා සහිත එම බුදුරජුන් නිමන්ත්‍රණය කෙළෙමි. (මාගේ නිමන්ත්‍රණය) ලොකනායකවූ ප්‍රාඥවූ ඒ බුදුරජතෙම ඉවසීය.

3837 "බුදුරජ තෙම මට ධර්ම කතාවක්කොට (මා පින් දහම්හි යෙදෙව්ය. එම සම්බුදු රජුන් වැඳ මාගේ භවනයට එළඹියෙමි

3838 "පෙරවරු කල්හි බුදුරජතෙම (මාගේ) භවනයට වඩින්නේය. තොපි සියල්ලෝ රැස්වව් යයි පිරවර ජනයාට ඇමතීමි

3839 "ඔබ සමීපයෙහි (අපි) යමෙක් වෙසෙමුද, (ඒ) අපට ලාභයකි. යහපත් ලාභයකි. අපිදු ශාස්තෲවූ බුදු රජුන්හට පූජාවක් කරන්නෙමුයි (පිරිවර ජනයා කීහ.)

3840 "මම ආහාර-පාන පිළියෙලකොට තමා කාලය දැන්වීමි. ලොකනායකවූ බුදුරජතෙම රහතුන් සියක් දහසක් සමග වැඩියේය.

3841 "මම පසඟතුරු සහිතව පෙරගමන් කෙළෙමි පුරුෂොත්තමවූ බුදුරජතෙම සියල්ල රුවන්මුවාවූ පුටුවෙහි වැඩහුන්නේය.

3842 "එකල්හි (එහි) සියල්ල රුවන් මුවාවූ උඩුවියනක් විය. බික් සඟන අතුරෙහි විජිනිපත් (මාරුතය) හමයි.

3843 "බොහෝවූ ආහාර පානයෙන් භික්ෂු සංඝයා සන්තර්පණය කෙළෙමි. මම වෙන වෙනම වස්ත්‍ර යුගලය බැගින් බික් සඟනට දුනිමි.

3844 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ සුමෙධ බුදු රජුන්යයි යමෙකුට කියත්ද, (ඒ බුදුරජතෙම) භික්ෂු සංඝයා මැද හිඳ මෙම ගාථාවන් වදාළේය.

3845 "යමෙක් මාද මේ සියල්ලන්ද ආහාරයෙන් හා පානයෙන් තෘප්ත කළේනම් හේ (කවරෙක් දැයි) මම පවසන්නෙමි. එසේ පවසන්නාවූ මාගේ වචනය අසව්

3846 "අටළොස්සියවන (එක්දහස් අටසියවන) කපෙහි දෙව්ලොවෙහි සිත් අලවා වසන්නේය. දහස් වරක් සක්විති රජ වන්නේය.

3847 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් උත්පත්තියකට යේද (ඒ) හැමකල්හි සියල්ල රුවන්මුවාවූ වියනක් දරන්නේය.

3848 "තිස් දහස් කපකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘතෙමේ ලොවපහළ වන්නේය.

3849 "හෙතෙම) උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ ඖරස බුද්ධපුත්‍රයෙක්වේ. සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන් දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේදවේ.

3850 "(හෙතෙම) බික් සඟන මැද හිඳ අභීත නාද කරන්නේය. ඔහුගේ (මළ සිරුර තැන්පත් කළ) චිතකයෙහි පවා ඡත්‍රයක් (කුඩයක්) දරත්. එම ඡත්‍රය යටදීම ආදාහනය වන්නේය (කියායි.)

3851 "මාවිසින් (දැන්) පැමිණෙන ලද (සෝවාන් ආදීවූ සතරමහ නුවණ) ශ්‍රාමාණ්‍ය ඵල ඇත්තේය. (එසේම) මා විසින් ක්ලේශයෝ දවන ලදහ. මණ්ඩපයක හෝ වෘක්ෂ මූලයක හෝ සිටියේ මට සන්තාපයක් ඇති නොවේ.

3852 'තිස්දහස් කපකට පෙරවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සර්වදානයාගේ මේ විපාකයයි.

3853-3854 (මෙහි 3579, 3578 යොදන්න) 3855

## 400 අජිත ථෙරාපදානය

3856 "සියළු ධර්මයාගේ පරතෙරට ගිය ලොකනායකවූ පදුමුත්තර නම් බුදුරජතෙම හිමවතට පිවිස වැඩහන්නේය.

3857 "මම බුදුරජුන්නොදුටිමි. මම (උන්වහන්සේගේ) ශබ්දයද නොඅසමි. එකල්හි (මම) මාගේ ආහාරය සොයමින් වනයෙහි ඇවිදිමි.

3858 "එහිදී දෙතිස් මහ පුරිස් ලකුණින් යුතුවූ බුදු රජාණන් වහන්සේ දුටිමි දැක 'මෙහෙම කිනම් සත්වයෙක් වන්නේදැයි සිතක් පහළවිය.

3859 "(එම මහා පුරුෂ) ලක්ෂණ බලා මාගේ (ලක්ෂණ විද්‍යාව සිහිකළෙමි. මා විසින් මේ වෘද්ධවූ පණ්ඩිතයන්ගේ සුභාෂිත වචනය අසන ලද මැයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3860 "ඔවුන්ගේ ඒ වචනයට අනුව හෙතෙම බුදුවරයෙක් වන්නේය. මම උන්වහන්සේට සත්කාර කරන්නේ නම් ඉතා යෙහෙක. එයින් මාගේ ගතියද පිරිසිදු වන්නේය

3861 "මම වහා අසපුවට ගොස් මී තෙල් ගතිමි. සැලියක්ද ගෙන බුදුරජුන් වෙත එළඹියෙමි.

3862 මම ත්‍රිදණ්ඩය (පිරිවැජිපුටුව) ගෙන එලිමහනෙහි තැබීමි. එසේම මම පහන දල්වා අටවරක් වැන්දෙමි.

3863 'පුරුෂොත්තමවූ බුදුරජතෙම දිව රෑ සතක් සතියක් (එහි) වැඩහුන්නේය. ඉක්බිති රැය අවසන්හි බුදුරජතෙම ඉන් නැගී සිටියේය.

3864 "මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ දිවා රෑ සතක් ප්‍රසන්නවූයේ සියතින්ම බුදුරජුන්හට පහනක් පිදිමි.

3865 "ගන්ධමාදන පර්වතයෙහි සුගන්ධයෙන් කළාක් වැනිවූ සියළු වනයෝ එකල්හි බුද්ධානුභාවයෙන් බුදුරජුන් වෙතටම එළඹියාහුය

3866 "කිසියම් පුෂ්ප සුගන්ධ කෙනෙක් වූවාහුද, පිපුණාවූ වෘක්ෂ කෙනෙක් වූවාහුද එකල්හි බුද්ධානුභාවයෙන් ඒ සියල්ලෝද රැස්වූහ.

3867 "යම්තාක් හිමවතෙහි නාගයෝද, ගුරුළෝද යන මේ දෙවගෙහිවූ ඔවුහු ධර්මයද අසනු කැමැත්තාහු බුදු රජාණන් වහන්සේගේ සමීපයට පැමිණියාහුය.

3868 (එකල්හි) බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවකවූ දෙවළ නම් ශ්‍රමණ තෙමේ රහතුන් සියක් දහසක් සමග බුදුරජාණන් වහන්සේගේ සමීපයට එළඹියේය.

3869 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජතෙම භික්ෂුසංඝයා මැද හිඳ මෙම ගාථාවන් වදාළසේක

3870 "යමෙක් පහන්වූයේ සියතින් (ම) මට පහනක් දැල්වූයේද, හේ (කවරෙක්දැයි) මම පවසන්නෙමි. එය පවසන්නාවූ මාගේ වචනය අසව්

3871 "(හෙතෙම) කල්ප සැටදහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේය. දහස් වරක් සක්විති රජද වන්නේය.

3872 "සතිස් වරක් දෙව්ලොව දිව්‍යරාජ්‍යය කරන්නේය. සත්සිය වරක් මහත්වූ පෘථිවි රාජ්‍යය කරවන්නේය. (එසේම කරවන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍ය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිනිය නොහැකිය.

3873 "මෙම ප්‍රදීප දානය කරණකොට ගෙන දිවැස් ඇත්තේ වන්නේය. (එසේම) මෙතෙම හැමකල්හි හාත්පස දුණු දෙසිය පණසක්වූ අර්ධ කොෂයක් දුර දකින්නේය.

3874 "දෙව්ලොවින් චුතවන්නාවූද (අන්තැනක) උපදින්නාවූද මෙම සත්වයාහට දිවා කල්හි වුවද රාත්‍රියෙහි වුවද ප්‍රදීපයක් දරන්නේය.

3875 ("මෙම ප්‍රදීප දානමය) පුණ්‍ය කර්මය හා යෙදි උපදින්නාවූ සත්වයාගේ (එම උපදින) නගරය යම්තාක්වේද ඒ තාක් (එම නගරය) බබලන්නේය.

3876 "(මෙතෙම) මෙම ප්‍රදීප දානයාගේද අන්‍යවූ ශිෂ්ටාචාරයකින් කළ අභිවාදන කර්මයාගේද ඵලයෙන් දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යොනියක උපදීනම් (එහිදී) කිසිදු සත්වයෙක් මොහු (පරදවා) ජයනොගන්නේය. ප්‍රදීප දානයාගේ මේ විපාකයයි.

3877 "කල්ප සියක් දහසක් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම් ශාස්තෘතෙමේ ලොව පහළ වන්නේය.

3878 "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ ඖරස බුද්ධ පුත්‍රවූ (මෙතෙම) සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය.

3879 "ශාක්‍ය කුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජුන් සතුටු කොට නමින් අජිත නම්වූ ශාස්තෘ ශ්‍රාවකයෙක් වන්නේය.

3880 "මම කල්ප සැටදහසක් දෙව් ලොවෙහි රමනය කෙළෙම් එහිද මට සර්වකාලිකවූ ප්‍රදීප සියයක් බබලයි.

3881 "දෙව් ලොවෙහිද මිනිස් ලොවෙහිද මාගේ ප්‍රභාවෝ පැතිරෙත්. මම බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිකොට වැඩියක්ම සතුට ඉපදවිමි.

3882 "මම තුෂිත දෙව්ලොවින් චුතව මව කුසෙහි ඉපදුනෙමි. (එම මව්කුසින්) බිහිවන්නාවූ මාගේ මහත්වූ ආලොකයෙක් විය.

3883 (මම) ගිහිගෙන් නික්ම අනගාර්‍ය්‍ය නම්වූ සසුනෙහි පැවිදිවීමි. බාවාරි තවුසා වෙත එළඹ ශිෂ්‍ය බවටද පැමිණියෙමි.

3884 "හිමවතෙහි වසන්නාවූ මම ලොකනායකවූ බුදු රජුන් (ගැන) ඇසීමි. උත්තමාර්ථයවූ නිවන සොයන්නේ විනායකවූ එම බුදුරජුන් වෙත එළඹියෙමි

3885 "බුදුරජතෙම දැමුනේය. අනුන් දමනය කරන ගුණ ඇත්තේය. චතුරොඝයන් තරණය කළේය. ස්කන්ධාදී උපධි විරහිතය. එම සර්වඥතෙම සියලු දුකින් මිදෙන්නාවූ නිවනද වදාළේය.

3886 "උන්වහන්සේ වෙත මාගේ පැමිණීම සිදුවිය. මම බුදුරජුන් තුටුකළේ වෙමි. (එසේම) මා විසින් පැමිණෙන ලද ත්‍රිවිද්‍යාවෝ ඇත්තාහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරන ලදී.

3887 "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් පහනක් පිදීම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. විප දානයාගේ මේ විපාකයයි.

3888-3889 (මෙහි 3578, 3579 යොදන්න) 3890

## 41 මෙත්තෙය්‍ය වග්ග.

### 401 මෙත්තෙය්‍යා ථෙරාපදානය

3891 'ශිලාපර්වත කූටයකවූ විවේක ස්ථානනම්වූ පබ්භාකාරයක් ඇසුරුකොට සොභිත නම් තවුසෙක් ස්වයංපතිත ඵල අනුභව කොට කඳු අතරෙහි වෙසෙයි.

3892 "මම එකල්හි ගිනිද දරද ගෙනවුත් උත්තාමාර්ථය සොයමින් බඹලොව ඉපදීම සඳහා (එය) දැල්වීමි.

3893 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජතෙම මා සසර දුකින් ගොඩලනු කැමැත්තේ මාගේ සමීපයට වැඩියේය. (වැඩ මෙසේද වදාළේය.)

**3894** "මහ පිණැත්තාණනි, කුමක් කෙරෙහිද? ගිනි හා දර මටද දෙව. මමද අග්නි පරිවර්ණය කරන්නෙමි. එයින් මාගේ ශුද්ධියද වන්නේය" කියායි.

**3895** "මිනිසුන් අතරෙහි ඔබ ඉතා යහපත් කෙනෙක් වෙහිය දෙවියන් කෙරෙහිවූ තත්වයද ඔබ දන්නෙහිය. ඔබ අග්නි පරිවර්ණය කළමැනව. ඒකාන්තයෙන් මේ ගිනි හා දර ඔබටය" යි (තවුසා කීය)

**3896** "ඉක්බිති බුදුරජතෙම දරගෙන ගිනි දැල්විය. එහි (එම) දර නොදැල්විනි. (එය) බුදුරජුන්ගේ ප්‍රාතිහාර්‍යයකි.

**3897** 'තාගේ ගින්න නොදැල්වේ තාගේ යාගයක්ද නැත (මෙය) තාගේ නිරර්ථක ව්‍රතයකි. මාගේ ගිනි පුදව" (යයි බුදුරජතෙම වදාළේය.)

**3898** "මහා වීරයන් වහන්ස, ඔබ (විසින්) ඒ කෙබඳු ගින්නක් කියනු ලැබේද? මෙය මටද කියනු මැනව. (ඉක්බිති) අප දෙදෙනාම ගිනි පුදමු" (යයි තවුසා කීය.)

**3899** (දුඃඛ) ධර්මයන්ගේ නිරොධය සඳහාවූ, හේතුවත්, කෙලෙස් හන්සිදුවීම් සඳහාවූ හෙතුවත් ඊර්‍ෂ්‍යා මාත්සර්‍යයන් හැර (දැමීම) යන මේ තුණ මාගේ ගින්නය' (යි බුදුරජ තෙම වදාළේය)

**3900** "මහා වීරයන් වහන්ස, ඔබ කෙබඳු කෙනෙක් වෙහිද? නිදුකාණෙනි (ඔබ) කිනම් ගොත්‍රයක් ඇත්තෙහිද ඔබගේ ආචාර ප්‍රතිපත්තීන් දැඩිය. (එය) මට රුචිකෙරේ" (යයි තවුසා කීය.)

**3901** "(මම) ක්ෂත්‍රිය කුලයෙහි උපන්නේ වෙමි. අභිඥාවන්ගේ පරතෙරටද ගියේ වෙමි සියළු ආශ්‍රවයන් ක්ෂය කළේ දැන් නැවත ඉපදීමක්ද නැතැ" යි (බුදුරජ තෙම වදාළේය.)

**3902** "සර්වඥයන් වහන්ස, ආලොකකරයාණන් වහන්ස, (මෝහ නමැති) අඳුර දුරුකරන උතුමාණන්වහන්ස, ඔබ ඉදින් (එසේ නම්) බුදුරජ වෙහිය. විශුද්ධි දෙවයාණන් වහන්ස, ඒ ඔබ වහන්සේට නමස්කාර කරන්නෙමි. ඔබ දුක් නැති කරන්නෙහිය" යි (තවුස්තෙම කීය)

**3903** "(එසේ කියා) මම අඳුන් දිවිසම් අතුරා (බුදුරජුන්හට) හිඳීමට දුනිමි. (දී මෙසේද කීමි) ලොකනාථයන් වහන්ස,

වැඩහිඳිනු මැනව. සර්වඥයන් වහන්ස, මම ඔබ වෙත එළඹී සිටින්නෙමි (යයි තවුසා කීය.)

3904 "භාග්‍යවත්තෙමේ මනාව අතුළ අඳුන් දිවිසමෙහි වැඩහුන්නේය. මම සම්බුදු රජුන් පවරා පර්වතයට ගියෙමි.

3905 "කද පුරවා තිඹිරි ගෙඩි ගෙන ආමි. මම (එම) ගෙඩි මී සමග යොදා බුදුරජුන්හට දුනිමි.

3906 එකල්හි සර්වඥතෙම ධ්‍යානකරන්නාවූ (මාගේ) (එම දානය) වැළඳි බුදුරජුන් දෙස බලමින් එහිදී (මාගේ) සිත පැහැදවීමි.

3907 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජතෙමේ මාගේ ආශ්‍රමයෙහි හිඳ මෙම ගාථාවන් වදාළසේක.

3908 "යමෙක් පැහැදුනේ සියතින් (මේ) ඵලයෙන් (මා) සන්තර්පණය කළේද, හේ (කවරෙක් දැයි) මම කියන්නෙමි. එය කියන්නාවූ මාගේ වචනය අසව්.

3909 "හෙතෙම පස්විසිවරක් දිව්‍ය රාජ්‍යය කරවන්නේය, දහස් වරක් සක්විති රජ වන්නේය.

3910 "පූර්වකර්මය හා යෙදුනාවූ ඔහුගේ අදහස දැන (ඒ අනුව) මාහැඟි ආහාරද පානද, වස්ත්‍රද සෙනසුන්ද,

3911 "(එම) කුශල කර්ම විපාකය හා යෙදුනාවූ එකෙණෙහි උපදින්නාහුය හැමකල්හි මෙතෙම නීරෝගීවූයේ ප්‍රමුදිතවූයේද වන්නේය

3912 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යොනියක උපදින්නේද ඒ සියළු තන්හි සුවඇත්තේම මිනිසත් බවට පැමිණෙන්නේය.

3913 "මෙතෙම වේද හදාරන්නාවූ මන්ත්‍ර දරන්නාවූ වෙදත්‍රයෙහි පරතෙරට ගිය (බමුණෙක්ව) සම්බුදුරජුන් වෙත එළඹ රහත් වන්නේය." (කියායි)

3914 "යම්තැනක පටන්කොට මාගේ අත්බව සිහි කෙරෙම්ද, යම්තැනක පටන්කොට නුවණැති බවට පැමිණියේ වෙම්ද, (ඒ මේ කාලය තුළ) මාගේ භොග සම්පත්තියෙහි අඩුවක් නැත ඵල දානයාගේ මේ විපාකයයි

3915 "උතුම්වූ සසුනට පැමිණියේ රාග ද්වෙෂයන් වැනසීම සියළු ආශ්‍රවයන් ක්ෂය කළේ වෙමි. දැන් නැවත ඉපදීමක් නැත.

**3916 3917** (මෙහි 3578-357?? යොදන්න) 3918

(මෙතැන් සිට 471 අපදානය දක්වා අපදානයන්හි අවසාන කථා ඉහත ගාථා දෙක මෙන් වෙත්) තුන්වෙනි ගාථාවෙහි 2324 ගාථාව මෙනි.

## 402 පුණ්ණක ථෙරාපදානය

**3919** "සියල්ල තෙමේම අවබොධ කළාවූ පස්මරුන් දිනූ ලොකගරුවූ බුදුරජ තෙමේ හටගත් ආබාධ ඇත්තේ ශිලා පර්වත කූටයකවූ විවේකස්ථාන නම්වූ පබ්භාරයක් ඇසුරුකොට කඳු අතරෙහි වැඩවෙසේ.

**3920** "එකෙණෙහි මාගේ අසපුව හාත්පස ආලොකයක් විය. බුදුන් පිරිනිවන් පානා කල්හි (මෙම) ආලොකය පහළවේ.

**3921** "එකෙණෙහි මුළු වනලැහැබෙහි වලස් වෘක කළුහිස් වළස් ව්‍යාඝ්‍ර සිංහ යන සියළු සත්වයෝ (ඔවුන්ගේ වාසස්ථාන වලින්) නික්ම ආවාහුය.

**3922** "මම ඒ අස්වාභාවික සිද්ධිය දැක (බුදුරජුන් වැඩ විසූ) පර්වතයට ගියෙමි එහිදී පිරිනිවන් පානා ලද අපරාජිතවූ සම්බුදුරජුන් දුටිමි.

**3923** "සුපිපි සල් රුකක් මෙන්ද, උදාවූ හිරුමෙන්ද, පහවූ ගිනිදැල් ඇති අඟුරු (ගොඩක් මෙන්ද, පිරිගියාවූ බුදු රජුන් (උදෙසා)

**3924** "මම එහි තණද, දරද පුරවා චිතකයක් (සෑයක්) කෙළෙමි. මම චිතකය මැනවින් කොට බුද්ධ ශරීරය දැවීමි.

**3925** "සිරුර දවා සුවඳ දිය ඉස්සෙමි. එකෙණෙහි අහසෙහි සිටි යක්ෂයෙක් තෙම (මට) නමක් තැබීය. (කෙසේදයත්)

**3926** "සියල්ල තෙමේම අවබොධ කරගත් බුදුරජුන්ගේ යම් (ආදාහන) කෘත්‍යයක් තා විසින් සම්පූර්ණ කරන ලදද මුනිවරය, ඔබ හැමකල්හි නමින් 'පුණ්ණක' නම්වෙහිය.

**3927** "(ඉක්බිති) මම යක් සෙනෙවි අත්බැවින් ච්‍යුතව දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි. එහි අහසෙහි දිව්‍යමය සුවඳ හමයි.

**3928** "එකල්හි එහිදීද මාගේ නම "පුණ්ණක" විය. දෙව්වූයේද, මිනිස් වූයේද (මාගේ) අදහස් (ඒවූ පරිදි) සම්පූර්ණ කරමි.

3929 "මේ මාගේ (සසරෙහි) අවසානයයි. අන්තිම භවය (දැන් මේ) පවතී. මෙහිදීද පූර්ණක නාමය ප්‍රකාශවේ.

3930 'ශාක්‍ය කුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජුන් සතුටු කොට සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

3931 මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ශරීරාදාහන කෘත්‍යයාගේ මේ විපාකයයි. (3932-3934)

## 403 මෙත්තගු ථෙරාපදානය

3935 "හිමවතට නුදුරෙහි 'අසොක' නම් පර්වතයක් විය. එහි මට විශ්වකර්මයා විසින් මවන ලද ආශ්‍රමයක්විය.

3936 "අග්‍රකාරුණිකවූ සුමෙධ නම් සර්වඥ මුනි තෙමේ පෙරවරුයෙහි හැඳපොරවා මා වෙත පිඬු පිණිස එළඹියේය.

3937 "(එසේ) එළඹියාවූ මහාවීරවූ ලොකනායකවූ සුමෙධ බුදුරජුන් (දැක) පාත්‍රය ගෙන ගිතෙලින් පිරවීමි.

3938 "මම ලොකනායකවූ සුමෙධ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ කෙරෙහි (එය) පිළිගන්වා ඇඳිලි බැඳගන වැඩියක්ම සතුට ඉපදවීමි. (මෙසේද පැතිමි.)

3939 "මේ ගිතෙල් දන කරණකොටගෙනද චිත්ත ප්‍රණිධීන් කරණකොටගෙනද දෙවිවූයේ හෝ මනුෂ්‍යවූයේ හෝ මහත්වූ සැප ලබමි.

3940 "දුගතිය හැර කුදුමහත් භවයෙහි සැරිසරමි. (නිවණෙහි) සිත පිහිටුවා අමෘත පදයද ලබම්යි (කියායි.)

3941 "යම් (ඒ සර්වඥත්වයට පත්) මා (මේ) බමුණුතෙම දුටුයේද (බමුණ) එය ඔබට ලාභයකි. ඔබ විසින් එය මැනවින් ලබන ලද්දකි. ඔබ මාගේ දර්ශනය හෙතුකොට ගෙන රහත් වන්නෙහිය.

3942 "(ඔබ) විශ්වාසය ඇත්තෙක් වන්න, බිය නොවන්න. මට ගිතෙල් (දන්) දී මහත් යශස් ලබා සසරින්ද මිදෙන්නෙහිය.

3943 "මේ ගිතෙල් දන කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධීන් කරණකොටගෙනද (ඔබ) දෙවිවූයේද මිනිස්වූයේද, මහත් සැප ලබනෙහිය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3944 "මෙත් සිතින් යුතුව කළ මෙම ගිතෙල් දන කරණකොටගෙන අටළොස්සියවන හෙවත් එක්දහස්අටසිය වන කපෙහි දෙව්ලොවෙහි සිත් අලවා වසන්නෙහිය.

3945 "අටතිස් වරක් දෙව් රජ වන්නේය. (කරවන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නොහැකිය.

3946 "එක් පනස්වරක් සිව් මහ දිවයින් හා සිව් සයුරු කෙළවරකොට ඇති පෘථිවියට අධිපතිවූ (සතුරු රජුන්) ජය ගන්නා සුළුවූ ජම්බුද්වීපයට විශෙෂයෙන් අධිපතිවූ සක්විති රජ වන්නෙහිය.

3947 "යම්සේ මහසමුදුර නොකැළඹිය හැකිද, මහ පොළොව නොසෙල්විය හැකිද, ඔබගේ භොග සම්පත්ද එසේම පමණ කළ නොහැක්කාහු වෙති.

3948 "මම සැටකෝටියක වැඩටනොයෙදු රන් හැරදමා කුසල් (නම් කුමක් දැයි සොයමින් බාවාරි වෙත එළඹියෙමි.

3949 "එහි මම මන්ත්‍රද ෂඩංග ලක්ෂණ ශාස්ත්‍රයද හදාරමි. මහාමුනීන් වහන්ස, ඔබ වහන්සේ ඝනාන්ධකාරය විධ්වංසනය කරමින් ලොව පහළවූ සේක.

3950 "මහාමුනින් වහන්ස, ඔබ වහන්සේගේ දර්ශනය කැමැත්තෙන් මම පැමිණියෙ ඔබවහන්සේගේ ධර්මය අසා අමෘත පද නම් වූ නිවනට පැමිණියේ වෙමි.

3951 "මම තිස්දහස් කපකට පෙර බුදුරජුන්හට ගිතෙල් දුනිමි. (එදා සිට මෙදා දක්වාවූ) මේ අතරතුර මා විසින් වචනයෙන් කියා ඉල්වාගන්නා ලද ගිතෙලක් ගැන නොදනිමි. (සුලභ බැවිනි)

3952 "මාගේ අදහසට අනුව ඉදින් කැමති දැය පහළ වේද, සිත දැනගන මෙන් පහළවූ එය (ගෙන) මම (සෙසු) සියල්ලන් සන්තර්පණය කරමි.

3953 'බුදුරජතෙම ආශ්චර්‍ය්‍යයකි. ධර්මය ආශ්චර්‍ය්‍යයකි අපගේ ශාස්තෘ සම්පත්තියද ආශ්චර්‍ය්‍යයකි. (බුදුරජුන්හට ගිතෙල් ටිකක්දී (එය) අපමණව ලබමි.

**3954** "මේරු පර්වත පාර්ශවයෙක්හි ඇති මහසමුදුරෙහි දිය යම් පමණ වේද (එමදිය) මාගේ (මේ) ගිතෙල් හා සසඳන කල්හි දෙතිසෙන් කොටසක්වූ (කලාභාගයකට) ද නොපැමිණෙන්නේය.

**3955** මට පහළ වන්නාවූ වස්ත්‍ර මුළු සක්වලෙහිම රැස් කරන කල්හිද එම අවකාශය නොපොහොනේ වේ.

**3956** "ඉතා උස්වූ හිමවත් පර්වත රාජයා පවා මා අලෙවි දුන් සුවඳ විලවුන් හා උපමාවකට (පමණ) නොවන්නේය.

**3957** "වස්ත්‍රද සුවඳ ද ගිතෙල්ද මෙම අත් බැව්හිදීම ලබන ලද අසංස්කෘත නිර්වාණයද (ඇත්තේ වෙමි.) ගිතෙල් දනෙහි මේ විපාකයයි.

**3958** "අද (මම) සතිපට්ඨාන ධර්මයන්ගෙන් යුත් සයනය කිරීම් (ආදී ඉරියව්) ඇත්තේ සමාධිධ්‍යාන අරමුණු කොට ඇත්තේ (සප්ත බොධ්‍යංග ධර්ම ආහාරකොට ඇත්තේ වෙමි. ගිතෙල් දනෙහි මේ විපාකයයි. (3959-3961)

## 404 ධොතක ථෙරාපදානය

**3962** "හිමවතින් හටගන්නාවූ භාගීරථී ගංගාතොමෝ එකල්හි හංසවතී නගරයෙහි ද්වාරයකින් ගලා බස්නීය.

**3963** "ගංඉවුරෙහි මැනවින් කරන ලද සොභිත නම් ආරාමයක් විය. එහි ලොකනායකවූ පදුමුත්තර බුදුරජ තෙමේ වැඩ වෙසෙයි.

**3964** "තව්තිසාවෙහි දෙවියන් සහිත ශක්‍රයා මෙන් මනුෂ්‍යයන් විසින් පිරිවරන ලද භාග්‍යවත් තෙමේ එහි අභීත කෙශරසිංහරාජයකු මෙන් වැඩහුන්නේය.

**3965** "මම හංසවතී නගරයෙහි බමුණෙක්ව වෙසෙමි. මම නමින් "ජළංග" නම් මුනිවරයෙක් වෙමි.

**3966** "එකල්හි අටළොස් සියයක් (එක්දහස් අට සියයක්) ශිෂ්‍යයන් මා පිරිවරනු ලබයි. මම ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයේ ගංගාතීරයට එළඹියෙමි.

**3967** "එහිදී කුහක ප්‍රතිපදා නැති දොවාහළ පව් ඇති ශ්‍රමණයන් වහන්සේ දුටිමි. (උන්වහන්සේ භාගීරථ ගඟ තරණය කරන කල්හි මම එකෙණෙහි මෙසේ සිතීමි.

3968 "මහත් කීර්ති ඇති මේ බුද්ධ පුත්‍රයෝ සවස සහ උදයෙහි (මෙ ගඟ) තරණය කරන්නාහු තමන් වෙහෙසවත්. ඔවුන් තෙමේම වෙහෙසේ.

3969 "දෙවියන් සහිත ලොකයා අතුරෙන් බුදුරජතෙම අග්‍රයයි කියනු ලැබේ. (සසර) ගමන් මග පිරිසිඳු වන්නාවූ දක්ෂිණාර්හයන් කෙරෙහි මාගේ පින්කමකුදු නැත.

3970 "ගඟෙහි බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට හෙයක් (ඒ දණ්ඩක්) කරන්නේ නම් ඉතා මැනවි. මෙම පින්කම කරවා මෙම භවය තරණය කරමි" යි (කියායි.)

3971 "මා විසින් කරන ලද පින්කම මහත් ඵල වන්නේයයි අදහමින් මම ලක්ෂයක් (වැයනොට) දී හෙයක් කරවීමි.

3972 "මම හෙය කරවා ලොකනායක බුදුරජුන්වෙත එළඹියෙමි. සිරසෙහි ඇඳිලිබැඳ මෙම වචනයද කීමි. (කෙසේද යත්?)

3973 "මහාමුනීන් වහන්ස, මා විසින් ලක්ෂයක් වැය කොට ඔබ වහන්සේ උදෙසා මහත්වූ හෙයක් කරවන ලදී. (එය) පිළිගනු මැනව" (කියායි)

3974 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූද පදුමුත්තර බුදුරජ තෙමේ භික්ෂු සංඝයා මැදහිද මෙම ගාථාවන් වදාළේය

3975 "යමෙක් පහන්වූයේ සියතින් මට හෙයක් කරවූයේද මම හේ (කවරෙක්දැයි) පවසන්නෙමි. එසේම පවසන්නාවූ මාගේ (වචනය) අසව්.

3976 "මෙතෙම කඳුරකින් (පර්වත විවරයකින්) හෝ පර්වතයකින් හෝ ගසකින් හෝ වැටුනේ නමුදු (ඉන්) ගිලිහුනු කෙණෙහි (ප්‍රතිෂ්ඨා) ස්ථානයක් ලබන්නේය. සේතු (හේදඬු) දානයාගේ මේ විපාකයයි.

3977 "වාතය තෙමේ වැඩීගිය මුල් සමූහය ඇති මහ ගසක් (බලයෙන් උදුරා නොදමන්නාක්) මෙන් පසමිතුරෝ මොහු නොමඩිත්.

3978 "මොහුගේ (දෙය) සොරුබලයෙන් පැහැර නොගනිත්. රජවරු (මොහුට) අවමන් නොකරත්. සියළු පස මිතුරන් ජයගන්නේය. සෙතු දානයාගේ මේ විපාකයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3979 "එලිමහනෙහි ගියේ නමුදු දැඩිඅව්වෙන් තැව්නේ නමුදු (එම සෙතු දානමය පුණ්‍ය කර්මය හා යෙදුනු මොහුට (දුක්) වේදනාවෝ නොවන්නාහුය.

3980 "දෙව්ලොවෙහි හෝ මිනිස් ලොවෙහි හෝ මැනවින් නිර්මිත හස්ති යානයක් එකණෙහි ඔහුගේ අදහස් පරිදි පහළවන්නේය.

3981 "වාතවේගයෙන් දුවන ශීඝ්‍ර වාහනවූ දහසක් සෛන්ධව අශ්වයෝ සවස හා උදෑසන (තමාවෙත එළඹෙන්නාහුය.

3982 "මෙතෙම මිනිසත් බවට පැමිණ සැපවත් කෙනෙක් වන්නේය. මෙහි මිනිස්වූ කල්හිදු (ඔහුට) හස්ති යානයක් වන්නේය.

3983 "කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක වංශයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේය.

3984 "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදිවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ ඖරස (බුද්ධ පුත්‍රවූ මේ තෙම සියළු ආශ්‍රවයන් ප්‍රහාණ පරිඥා වශයෙන් දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය" (කියායි)

3985 "පදුමුත්තර බුදුරජුන් කෙරෙහි මා විසින් කරන ලද කර්මය ආශ්චර්‍යයකි. උන්වහන්සේ කෙරෙහි බුහුමන් කොට මම ආශ්‍රවක්ෂය නම්වූ නිවණට පැමිණියේ වෙමි.

3986 '(කාය-ජීවිත නිරපෙක්ෂව) වීර්‍ය කරන ලදුයේ වෙමි. සන්හුන්වූයේ උපධි රහිත වූයේ ඇතකුමෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි. (3987-3989)

## 405 උපසීව ථේරාපදානය

3990 "හිමවතට නුදුරෙහි අනොම නම් පර්වතයක් විය. මට එහි මැනවින් කළ අසපුවක් විය. මනාකොට කටයුතු නිමවූ පන්සැලක්ද විය.

3991 "එහි මනාවූ කුඩා තොටුපලවල් ඇති මනොඥවූ නදියක් ගලා බසී. එම කුඩා තොටුපලවලට නුදුරෙහි බොහෝ පද්මොත්පලයෝ හටගනිත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3992 "පෘථීන නම් මත්ස්‍යයෝ (පෙටියෝ) ද පාවුස නම් මත්ස්‍යයෝ (ලූල්ලු) ද, වලජ නම් මත්ස්‍යයෝ (වලයෝ) ද, මුඤ්ජ නම් මත්ස්‍යයෝ (මොද්දු) ද, රොහිත නම් මත්ස්‍යයෝ (රෙහෙරු) යන මස් කැසුබුවන්ගෙන් ගැවසීගත්තාවූ නදිය හැම කල්හි ගලා බසී.

3993 "එහි තිමිරය, අසොකය, බුද්දවාලක (කුඩා මල් ඇති ගස්) ය, පුන්නාග (දොඹ) ය, ගිරිපුන්නාහය (කඳුවල හැදෙන දොඹ) ය, යන මේ වෘක්ෂයෝ පිපී ගියාහු මාගේ අසපුවෙහි සුවඳ පතුරුවත්.

3994 "එහි පිපීගියාවූ කෙලිඳ වෘක්ෂයෝද, බෝලිද්ද වනයෝද, සාල වෘක්ෂයෝද පිපීගියාවූ සලල වෘක්ෂයෝද, චම්පක (සපු) වෘක්ෂයෝ ද එහි බොහෝ වෙති.

3995 "පිපීගියාවූ කුඹුක්ද, යොහොඹුද, උක්ගස්ද, (එසේම) පිපීගියාවූ පියාගස්ද, මධුගන්ධි වෘක්ෂයෝද යන මොව්හු මාගේ අසපුවෙහි බොහෝ වෙති.

3996 "මාගේ අසපුව හාත්පස අඩයොදුනක් තන්හි, ඇසළය, පළොල්ය, සීනිද්දය, පුවඟුය, රත් කරච්ය යන මෙකී වෘක්ෂයන්ගෙන් ගැවසීගත්තාහුය.

3997 "පිපුණාවූ මාතංගව නම් වෘක්ෂයෝද, සත්පෙති දෑසමන්ද, පළොල්ද, නිකද, රුකඟුනද, තාලකුට නම් වෘක්ෂයෝද එහි බොහෝ වූහ.

3998 "මාගේ ඒ අසපුවෙහි පිපුනාවූ හල්මල්ද බොහෝය. මේවා පිපෙන කල්හි වෘක්ෂයෝ බොහෝ ශොභන වෙත්. එම සුවඳින් මාගේ අසපුව හාත්පස සුවඳ හමයි.

3999 "අරළුය, නෙල්ලිය, අඹය, ජම්බුය, බුළුය, ඩෙබරය බදුලුය, බෙලිය, බොරළුදැමුණුය යන මේ වෘක්ෂයන්ගේ ඵලද,

4000 "තිඹිරිය, පියල්ය, වැල්මීය, කාසුමාරිය, දෙල්ය, කොස්ය, කෙසෙල්ය, ඩෙබරය යන මොවුන්ගේ ඵලයෝද එහි බොහෝ වෙති

4001 "ඇඹරැල්ලය, මල්ලිකාරය යන මොවුන්ගේ ඵලයෝද එහි බොහෝ වෙති. ලප්නාරන්ය, සපාරිය යන මේ වෘක්ෂයෝද මාගේ අසපුවෙහි හටගත් ඵල ඇත්තාහුවෙති.

4002 "ආලකය, ඉසිමුග්ග (වනමුං) ය, යලි මොදඵලය යන මොව්හු එහි බොහෝ වෙති. පුල්ලිය, දිඹුල්ය යන මේ වෘක්ෂයෝ හාත්පස පැසුනු ගෙඩිවලින් බරවූවාය.

4003 "පුලිලය, මිරිස්ය, නුගය, දිවුල්ය, දිඹුල් (අට්ටික්කා) කණ්ටපක්කය, පාරියය යන මෙකී වෘක්ෂයෝ එහි බොහෝ වෙති.

4004 "මෙම වෘක්ෂයෝද, මෙයින් පිටත් තවත් බොහෝ වෘක්ෂයෝද, මාගේ අසපුවෙහි ඵල හටගත්තාහු වෙති. මාගේ අසපුවෙහි බොහෝ මල් හටගන්නාවූ වෘක්ෂයෝද පිපීගියාහු වෙත්.

4005 "ආළුවය, කලම්බය, බිලාලිය, තක්කලය, ආලකය, තාලකය යන අලවර්ගයෝද මාගේ අසපුවෙහි විද්‍යමාන වෙත්.

4006 "මාගේ අසපුවට නුදුරෙහි පැහැදි දිය ඇති සිසිල් දිය ඇති, මනාවූ (කුඩා) තොටුපලවල් ඇති මනොඥවූ ජාතස්සරයක් හෙවත් ස්වයංජාත (තෙමේම හටගත්) විලක් විය.

4007 "සුදුනෙළුම් සහිත රතුනෙළුම් හා උපුල් එහි බොහෝය. මදාරා ගස්වලින් වැසීගිය (එම තඩාගය) නොයෙක් සුවඳ වහනය කරයි.

4008 "පද්මයෝ (කැකුළුවීමෙන්) ගැබ්ගනිති. ඇතැම් පද්මයෝ පිපෙත්. (ඇතැම් පියුම්හි) පිපුනාවූ පත්‍රයෝ සිටිත්. පද්මකර්ණිකාවෝද බොහෝ වෙති.

4009 "නෙළුඹලවලින් මීද නෙළුඹුදැලිවලින් කිරි හා ගිතෙල්ද වැගිරේ. නොයෙක් සුගන්ධ වහනය වූවාහු හාත්පස එම සුවඳින් යුක්තය.

4010 'කුමුදු සුවඳද, අඹමල් සුවඳද පමුණුවන (වාතයෝ) විද්‍යමාන වෙති. ස්වයංජාත විල ලඟ ඉවුරෙහි ඒ අතට නැමුණු පිපුණු වැටකෙයියා ගස් බොහෝය.

4011 "මැනවින් පිපුණු සුවඳවත් බඳුවදද, සෙතවාරී පුෂ්පයෝද එහි වෙති. කිඹුලෝද (සූසූහඬ නඟමින් දිය මතුපිට කටින් දියබුබුළු නංවන්නාවූ) සුංසුමාරයෝද, ජලජ චණ්ඩ සත්වයෝ එහි හටගනිති.

4012-4013 "උඩට මතුවී ගොදුරු ඩැහැගන්නෝද, පිඹුරෝද එම ජාතස්සරයෙහි බොහෝ වෙති. (එය) පාඨීන (පෙටි) යෝද

පාවුස නම්වූ ලේල්ලුද වලජ නම් වලයෝද, මුඤ්ජ නම්වූ මොද්දුද, රොහිත නම් වූ රෙහෙරුද යන මෙකී මස්කැසුබුවන්ගෙන් ගැවසී ගත්තේය. යලි හුණුපුපුළන් ගෙන්ද (එම විල) ගහණය, පරෙවියෝය, රවිහංසයෝය, කුකුත්ථක නම් පක්ෂීහුය, නදීවර නම් පක්ෂීහුය,

4014 "දින්දිභ නම් කිරළ පක්ෂීහුය, චක්කවාක නම්වූ සක්වා ලිහිණියෝය, චම්පක පක්ෂීහුය, (ජීව-ජීව) යන අනුකරණයෙන් හඬන ජීව ජීවක පක්ෂීහුය, ලෙහෙන්නුය, උක්කුස නම් වූ කබරුස්සෝය, සෙනක නම්වූ උකුස්සෝය, උඩර නම් වූ පක්ෂීහුය යන මොව්හු එහි බොහෝ වෙති.

4015 "කොඨක නම් පක්ෂීහුය, සුව (ගිරා) පොතකයෝය. කකුළුවෝය, යෙමරුය යන මෙකී සත්වයෝද, එහි බොහෝ වෙති. කාරෙණිය, තිලකය යන මොව්හුද එම විල ඇසුරුකොට ජීවත් වෙත්.

4016 "සිංහයෝද, ව්‍යාඝ්‍රයෝද, දිවියෝද, වලස්සුද, කොක්නහවෝද, කරබාන වලස්සුද, වඳුරෝද, කිඳුරෝද මාගේ අසපුවෙහි දෘශ්‍යමාන වෙත්.

4017 "මම එම සුවඳ ආඝ්‍රාණය කරමින් ඵලවර්ග බුදිමින් සුවඳ දිය පානය කරමින් මාගේ අසපුවෙහි වෙසෙමි.

4018 "එහි මෘගයෝද, හූරෝද, පසද මෘගයෝද, (ඔවුනට වඩා කුඩා ස්වරූප ඇති) බුද්දරූපකයෝද, අග්ගිකජෝතික නම් සත්වයෝද මාගේ අසපුවෙහි වෙසෙත්.

4019 "හංසයෝද, කොස්වාලිහිණියෝද, මොණරුද, සැළලිහිණියෝද, කොවුලෝද, මඤ්ජරික නම් සත්වයෝද, බකමුහුණෝද, පොඨසීස නම් පක්ෂීහුද එහි බොහෝ වෙති.

4020 "පිසාචයෝද, අසුරයෝද, කුම්භාණ්ඩයෝද, රකුසෝද බොහෝ වෙති. (එසේම) ගුරුළෝද සර්පයෝද මාගේ අසපුවෙහි වෙසෙති.

4021 "මහත් ආනුභාව ඇති සන්හුන් සිත් ඇති එකඟවූ පැන් කෙණ්ඩි දරන්නාවූ අඳුන් දිවිසම් උතුරුසළුකොට හඳින්නාවූ ඒ සියළු ඍෂීහු දළමඬුලු බරින් යුතුවූවාහු මාගේ අසපුවෙහි වෙසෙත්.

4022 "වියදඬු පමණ දුර බලන්නාවූ ප්‍රාඥවූ ශාන්ත පැවතුම් ඇති ලාභ අලාභ දෙකින්ම සමසේ සතුටු වන්නාවූ (ඍෂීහු) මාගේ අසපුවෙහි වෙසෙත්.

4023 "වැහැරි සිවුරු කම්පා කරවමින් අඳුන් දිවිසම් පොළාහරිමින් ධ්‍යාන බලයන්ගෙන් ස්ථිරබවට පත් ඔව්හු හැමකල්හි අහසෙහි යෙත්.

4024 "ඔව්හු දිය හෝ කාෂ්ට හෝ අග්නිදාරුන් හෝ ගෙන නොඑති. එම දිය ආදීහු තෙමේම ඔවුන් ලඟට පැමිණියාහු වෙති. ප්‍රාතිහාර්‍ය්‍යයාගේ මේ විපාකයයි.

4025 "ඔව්හු ලොහෝ භාජනයක් ගෙන කුඤ්ජර නම්වූ මහාහස්ති රාජයන් මෙන්ද, නිර්භීත කෙශර සිංහයන් මෙන්ද වන මැදෙහි වසත්

4026 "(මේ ඍෂීන්ගෙන්) ස්වකීය ධ්‍යාන බලයෙන් වසඟවූ ඇතමෙක් උතුරුකුරු දිවයිනට යෙත්. (ගොස්) ඒ ඒ තැනින් පිණ්ඩපාතය ගෙනවුත් (සියළු දෙනම) එකතුව හිඳ වළඳත්.

4027 "උග්‍රවූ තෙද ඇති තාදිගුණ ඇති එසේ අහසින් යන්නාවූ සියළු ඍෂීන්ගේ අඳුන්දිවි සම් හඬින් එකල්හි වනය (එකපැහැර) හඬනැගුනාක් මෙන් වෙයි.

4028 "මහාවීරයන් වහන්ස, උග්‍ර තපස් ඇති මෙබඳු ශිෂ්‍යයෝ මාගේ (අසපුවෙහි වෙත්.) ඔවුන් විසින් පිරිවරන ලද මම මාගේ අසපුවෙහි වෙසෙමි.

4029 "ස්වකීය (ධ්‍යානාදි) කටයුතුවල යෙදෙනු කැමති ස්වීය (ධ්‍යානාදී) කර්ම කරණකොටගෙනම (අනුන්ට තුටු කරවනලද) සිල්වත්වූ ප්‍රාඥවූ (මෛත්තා-කරුණා-මුදිතා-උපෙක්ෂා යන) අප්‍රමාන්‍ය ධර්මයන් විෂයෙහි දක්ෂවූ රැස්වූ මෙම ශිෂ්‍යයෝ මා සතුටු කළාහුය.

4030 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ විනායකවූ පදුමුත්තර බුදුරජතෙම (එය) සුදුසු කාලයයි දැන එතැනට එළඹියේය.

4031 "එළඹ කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුතුවූ ප්‍රාඥවූ මෞන ගුණ ඇති (එම) සර්වඥ තෙමේ පාත්‍රය ගෙන පිඩු පිණිස මා වෙත එළඹියේය.

4032 "එසේ වැඩියාවූ පදුමුත්තර බුදුරජුන් (ට) වැඩහිඳීම සඳහා තණ ඇතිරියක් පණවා (එහි) සල්මල් විසිරවීමි.

4033 "සම්බුදු රජුන් එම (අසුනෙහි) වඩාහිඳුවා ප්‍රීතියෙන් පිනාගියේ (එසේ) ප්‍රිතියෙන්ම සැලෙන සිත් ඇත්තේ මහා පර්වතයට නැඟීමට අගිල් (රැස්කොට) ගතිමි.

4034 "කළගෙඩියක් පමණවූ දිව්‍යමය සුවඳ ඇති ඉදුනු කොස්ගෙඩියක්ද කරෙහි තබාගන බුදුරජුන් වෙත එළඹියෙමි.

4035 "මම බුදුරජුන්හට එම (කොස්) ගෙඩිය පිළිගන්වා අගිල්ද ආලේප කළෙමි (එසේම)

4036 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජතෙම සඞඝයින් මැද හිඳ මෙම ගාථාවන් වදාළසේක.

4037 "යමෙක් මට මේ කොස්ගෙඩිද, අගිල්ද ආසනයද දුන්නේ නම් හේ (කවරෙක්දැයි) මම තොපට කියමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

4038 'ගමෙහි හෝ යලි අරණෙහි හෝ ශෛල පර්වතයන්හි විවේකයට සුදුසු ස්ථාන නම්වූ පබ්භාරයන්හි (කඳුබෑවුම්වල) හෝ ගුහාවන්හි හෝ (වසන) මොහුගේ කැමැත්තට අනුව බොජුන් පහළවන්නේය.

4039 "මේ මිනිස්තෙම දෙව්ලොව හෝ මිනිස්ලොව උපන්නේ භොජනයන් කරණකොටගෙනද වස්ත්‍රයන් කරණ කොටගෙනද පිරිස තෘප්තිමත් කරන්නේය

4040 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යොනියක උපදී නම්; නොකැළඹුනු භොග සම්පත් ඇත්තේව මෙම මිනිස් තෙම සසර සැරිසරන්නේය.

4041 "(මෙතෙම) කප් තිස්දහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේය. දහස් වරක් සක්විතිරජ වන්නේය.

4042 "එක්සැත්තෑ වරක් දිව්‍ය රාජ්‍යය කරවන්නේය. (කරවනු ලබන) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යයන් (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය.

4043 "මින් කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම් ශාස්තෘතෙමේ ලොව පහළවන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4044 "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ ඖරස බුද්ධපුත්‍රවූ (මේතෙම) සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වසන්නේය." (කියායි.)

4045 "(එසේ කියන ලද්දේ) යමෙක් පිළිබඳව නම් ඒ මම ලොක නායකයන්වහන්සේ දුටිමි. මා විසින් මැනවින් ලබනලදී. පැමිණෙනලද ත්‍රිවිද්‍යාවෝ ඇතියහ. බුදුරජාණන් වහන්සේගේ සසුනද කරනලදී.

4046 "ගමෙහි හෝ යලි අරණෙහි හෝ ශෛල පර්වතයන්හී විවේකයට සුදුසු ස්ථාන නම්වූ පබ්භාරයන්හි හෝ ගුහාවන්හි හෝ (වසන) මාගේ කැමත්තට අනුව හැමකල්හි මට බොජුන් පහළවේ. 4047-4049.

## 406 නන්දක ථෙරාපදානය

4050 "පෙර මම මහ වෙනෙහි වැද්දෙක් වීමි. පසද මෘගයෙකු සොයන්නේ (එහිදී) සියල්ල තෙමේම දත් බුදු රජුන් දිටිමි.

4051 "පස්මරුන් දිනූ සියල්ල තෙමේම දත් ප්‍රාඥවූ අනුරුද්ධ නම් එම සර්වඥතෙම විවෙක සැප කැමැත්තේ වනයට පිවිසියේ වේ.

4052 "මම (දඬු සතරක් එක්කොට කෙළවරකින් බැඳ සදාගත්) චතු දණ්ඩය ගෙන දඬු සතර තැනක පිහිටනසේ (දිගහැර) තැබීමි. (එසේ තබා) මැනවින් මඬුවක් කොට නෙළුම් මල් වලින් වැසීමි.

4053 "(එසේ) මඬුව (නෙළුමින්) වසා බුදුරජුන්හට වැන්දෙමි. දුන්න එහෙම තබා අනගාරයී නම්වූ ශාසනයෙහි පැවිදිවීමි

4054 "පැවිදිවී නොබෝ කලකින් මට රෝගයක් ඇති විය. පූර්ව කර්මය ගැන සිහිපත් කොට මම එහි කළුරිය කෙළෙමි.

4055 "(ඒ පසේ බුදුරජුන්හට කුටිය පිදීමේ) පූර්ව කර්මය හා යෙදුනේ මම තුෂිත දිව්‍ය ලොකයෙහි උපනිමි. එහි කැමති දෑ ලැබෙන රුවන් මුවා විමනක් පහළවේ.

4056 "අධිෂ්ඨාන කරණ ලද්දාවූ මම දහසක් හසුන් යෙදූ ඒ දිව්‍යමය යානයට නැගී කැමති තැනකට යෙමි.

**4057** "එම යානයෙන් ගෙනයනුලබන්නාවූ දෙව්වූ මාගේ හාත්පස යොදුන් සියයක් තන්හි මට මණ්ඩපයක් දරයි.

**4058** "මම අතිශයින් මල් අතුරන ලද යහනෙහි නිදමි. නිරතුරුවම අහසිනුදු නෙළුම මල් වැසිවසී.

**4059** 'මිරිගු දිය සැලෙන අව් පහරන කල්හිදු (එම) අව්ව මා නොතවයි. මණ්ඩප දානයාගේ මේ විපාකයයි.

**4060** "දුගතිය ඉක්මවූයේ වෙමි මට අපායයෝ වසන ලද්දාහු වෙති. මණ්ඩපයෙහි හෝ වෘක්ෂමූලයෙහි හෝ හුන්නාවූ මට සන්තාපයක් නොවේ.

**4061** "පෘථිවි සංඥාවෙන් ඉටා (පොළොව සේ විමට අදිටන් කොට) මම සයුර තරණය කරමි. ඒ මා විසින් මැනවින් කරන ලද කර්ම ඵලයයි බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**4062** "නොමගද මගකොට අහසෙහි යෙමි. මා විසින් මනාකොට කරන ලද කර්මය ආශ්චර්‍යයයි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**4063** "පෙර විසූ කඳපිළිවෙල දනිමි. දිවැස පිරිසිදු කරන ලදී. මාගේ ආශ්‍රවයෝ ක්ෂය කරන ලදහ. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

**4064** "පෙර ජාතීහු අතහැර දමන ලදහ. බුදුරජුන්ගේ ඖරස පුත්‍රයෙක් වීමි. සද්ධර්මයෙහි දායාදී (උරුමය ඇත්තෙක්) වෙමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**4065** "ශාක්‍ය කුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජුන් ආරාධනය (සතුටු) කෙළෙමි ධර්මයට ධජයක්වූයේ ධර්මයට දායාදීද වෙමි බුද්ධ බුද්ධ පූජාවෙහි මේ විපාකයයි

**4066** "ශාක්‍ය කුල තිලකවූ ගෞතම බුදුරජුන් වෙත එළඹ සිට (එම) බුදුරජුන්ගෙන් නිවන් මග විචාළෙමි.

**4067** "(මා විසින්) ආරාධනය කරන ලද බුදුරජතෙම ගැඹුරුවූ සියුම්වූ ඒ නිර්වාන පදය වදාළේය මම උන්වහන්සේගේ (ඒ) ධර්මය අසා ආශ්‍රවක්ෂය නම්වූ නිවනට පැමිණියෙමි.

**4068** "මා විසින් මැනවින් කරන ලද කර්මය ආශ්චර්‍යයකි. (නැවත සසරෙහි) ඉපදීමෙන් මිදුනේ වෙමි. ක්ෂය කළ සියළු

ආශ්‍රවයන් ඇත්තේ වෙමි. දැන් නැවත ඉපදීමක් නැත (4069-4071)

## 407 හේමක ථේරාපදානය

4072 "එකල්හි අනෝම නම් තවුසෙක් ශෛල පර්වතයෙක්හි විවේකයට සුදුසු ස්ථානයක්වූ පබ්භාරයක් ඇසුරු කොට මනා අසපුවක් කොට එම පන්සැලෙහි විසීය.

4073 "ඔහුගේ තපොකර්මය සිද්ධිප්‍රාප්තය. (එසේම හෙතෙම) ස්වකීය ධ්‍යාන බලයෙහිද සිද්ධිප්‍රාප්තිය ස්වීය ශ්‍රාමාණ්‍ය ගුණයෙන් මැඩපවත්වන ලද කෙලෙස් ඇත්තෙක. කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තෙක. ප්‍රාඥයෙක. සෘෂිවරයෙක.

4074 "විශාරදයෙක, ස්වසමය පරසමයයන්හි දක්ෂයෙක, පොළොවෙහි හා අහසෙහි ප්‍රකට කෙනෙක, උත්පාත ශාස්ත්‍රයෙහි දක්ෂයෙක.

4075 "එකල්හි පහවූ ශොක ඇති නිරාරම්භකවූ ස්වල්පාහාරයකින් යැපෙන ලොල් බැව් නැති ලාභාලාභ දෙක්හි (සමව) සතුටුවන ධ්‍යාන ඇති ධ්‍යානයෙහි ඇළුනාවූ මෞන ගුණයුතු.

4076 "සර්වඥවූ අග්‍ර කාරුණිකවූ පියදස්සි නම් ඒ බුදු රජතෙම සත්වයන් (සසර සයුරින්) එතර කරනු කැමැත්තේ මහා කරුණාව පැතිර විය.

4077 "පියදස්සී බුදු රජතෙමේ ධර්මාවබොධයෙහි සමත් කෙනෙකු දැක සක්වලවල් දහසකට වුවද ගොස් (විනෙය්‍ය ජනයනට) අවවාද කරයි.

4078 "ඒ බුදුරජතෙම මා සසර සයුරින් ගොඩලනු කැමැත්තේ මාගේ අසපුවට වැඩියේය. මා විසින් ඊට පෙර බුදුරජතෙම නොදක්නා ලදී. කිසිවෙකුගෙන් (උන්වහන්සේ ගැන) නොඅසන ලද්දේ වෙමි.

4079 "මම උන්වහන්සේ ගැන උත්පාතය සුපිනය ලක්ෂණය යන මේ ශාස්ත්‍රයෝ මැනවින් පවසන ලදහ. මම පොළොවෙහි හා අහසෙහි පතළාවූ කෙනෙක් වෙමි.

4080 "නක්ෂත්‍ර පදයන්හිද දක්ෂ වෙමි. මම ඒ ශාස්ත්‍රයන්ගෙන්) බුදුරජුන්ගේ (තොරතුරු) අසා එහි සිත පැහැද වීමි. අනුභව කරමින්ද හිඳිමින්ද නිතරම (ඒ පිළිබඳව) සිහිකරමි.

4081 "මෙසේ මා සිතන කල්හි බුදුරජාණන් වහන්සේ ගැන සිහිපත් කරන්නාවූ මට එකෙනෙහි ප්‍රීතිය ඇතිවිය.

4082 "නැවත සුදුසු කාලයද එළඹි බුදුරජතෙම මා සමීපයට වැඩියේය. (එසේ) පැමිණි කල්හිදු මේ මහාමුනිවූ බුදුරජතෙමේ යයි මම නොදනිමි.

4083 "(සත්ව ලොකයට) අනුකම්පා කරන්නාවූ කාරුණිකවූ පියදස්සී බුදුරජතෙම මම දෙවියන් සහිත ලොකයෙහි සර්වඥ වෙමැයි තෙමේම දැන්විය.

4084 'මහාමුනිවූ පියදස්සී බුදුරජුන්යයි හැඳින සිය සිත පහදවා මෙම වචනය කීමි.

4085 "අන්‍යයෝ පුටුවෙහිද, පළගෙහිද දික්සඟලා පුටුවෙහිද හිඳිත්. සියල්ල දක්නාවූ බුදුරජාණන් වහන්ස, (ඔබද) රුවන් හසුනෙහි හිඳිනු මැනව.

4086 "(මෙසේ කියා) එකෙනෙහි සර්වරත්නමය පුටුවක් මවා ඍද්ධියෙන් නිර්මිතවූ එම පුටුව පියදස්සී බුදුරජුන්හට දුනිමි.

4087 "ඍද්ධියෙන් නිර්මිත කරන ලද රුවන් පුටුවෙහි වැඩහුන් (බුදුරජුන්හට) එකෙනෙහි මම කළයක් පමණවූ ජම්බුඵලයක් දුනිමි.

4088 "බුදුරජතෙම මාගේ සතුට උපදවමින් (එය) වැළඳූ කල්හි සිත පහදවා ශාස්තෘන් වහන්සේ වැන්දෙමි.

4089 'ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ රුවන් හසුනෙහි වැඩහුන් පියදස්සී භාග්‍යවත් තෙමේ මෙම ගාථාවන් වදාළේය.

4090 "යමෙක් මට රුවන්මුවා පුටුවක්ද අමාවැනි (දඹ) ඵලයක්ද දුන්නේ නම් හේ (කවරෙක්දැයි) කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

4091 "(මෙතෙම) සත්සත්තෑ කපක් දෙව්ලොව සිත් අලවා වසන්නේය. පන් සැත්තෑ වරක් සක්විති රජ වන්නේය.

4092 "දෙවෙන්ද්‍රව දෙතිස්වරක් දිව්‍ය රාජ්‍ය කරන්නේය. (කරවනු ලබන්නාවූ) මහත්වූ ප්‍රදෙශ රාජ්‍ය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය.

4093 "රන්මුවාවූද රිදීමුවාවූද පියුම රා මිණිමුවාවූද රුවන්මුවාවූද මැනවින් කළ බොහෝ පර්‍ය්‍යංක ලබන්නේය.

**4094** "පුණ්‍ය කර්මය සහ යෙදුනාවූ සක්මන් කරන්නාවූ මේ මනුෂ්‍යයා එකල්හි බොහෝ පයඹිංකයෝ පිරිවරත්.

**4095** "කූටාගාරයෝද, ප්‍රාසාදයෝද මාහැඟි සයනාසනද මොහුගේ සිත දැනගෙනමෙන් එකෙණෙහි පහළ වෙත්.

**4096-4097** "ඇතුන්ගේ පා විදිනා තොමර හා අකුසු (හෙන්ඩු) ගත් අත් ඇති ග්‍රාමණීන් (ගම්ප්‍රධානීන්) විසින් නගින ලද සියළු අලංකාරයන්ගෙන් සරසන ලද සැට දහසක් ඇත්තුද, හෙම් වැනි වත් ඇඳවූ රන්පොරොදු බැඳි ඇත්තුද මොහු පිරිවරත්. රත්නපීඨ දානයාගේ මේ විපාකයයි

(4104 දක්වා ඡේද අගට "රත්නපීඨ දානයාගේ මේ විපාකයයි" යොදන්න)

**4098-4099** 'අවිගත් අත් ඇති සන්නාහ සන්නද්ධවූ ග්‍රාමණීන් (ගම්ප්‍රධානීන්) විසින් නගන ලද ජන්මයෙන්ම ආජානීයවූ ශීඝ්‍රවාහි සෛන්ධවවූ සැටදහසක් අශ්වයෝද මොහු නිතර පිරිවරත්-

**4100-4101** "දුනුගත් අත් ඇති සන්නාහසන්නද්ධවූ ග්‍රාමණීන් විසින් නගින ලද ඔසවන ලද ධජ ඇති සන්නද්ධවූ දිවිසමින් වළඳන ලද රථද, ව්‍යාඝ්‍ර සමින් වළඳන ලද රථදැයි මෙසේ සැට දහසක් රථයෝ මා නිතර පිරිවරත්-

**4102** "දෙවීමට සුදුසුවූ සැටදහසක් ධෙනූහු අතිශ්‍රෙෂ්ඨවූ වස්සන් උපදවත්-

**4103-4104** "මැනවින් අලංකාර කරන ලද සොළොස් දහසක් (ii) ස්ත්‍රීහු විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාහු පළඳින ලද මිණිකොඬොල් ඇත්තාහු දිග ඇසිපිහාටු ඇත්තාහු සිනාසහිතවූවාහු විසින් කටිප්‍රදෙශ ඇත්තාහු (iii) නිරතුරුවම මොහු පිරිවරන්නාහුය-

**4105** "මින් අටසොළොස් සියවන කපෙහි පසැස් ඇත්තාවූ ගෞතම නම් බුදුරජතෙමේ ඝනාන්ධකාරය නසා ලොව පහළ වන්නේය.

**4106** "උන්වහන්සේගේ දර්ශනය නිසා ආකිඤ්චනව හෙවත් ධන රැස්කිරීම් නොමැතිව පැවිදි වන්නේය. ශාස්තෲන් වහන්සේ තුටුකොට සසුනෙහි සිත් අලවා වසන්නේය.

4107 "උන්වහන්සේගේ ධර්මය අසා කෙලෙස් නසන්නේය. සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය" කියායි

4108 "යොගක්ෂෙම නම්වූ නිවන දක්වාම මා උසුලා යන මාගේ ධුරවාහක ගවයා වීයෂීයයි. මම උත්තමාර්ථයවූ නිවන පතන්නේ සසුනෙහි වෙසෙමි.

4109 "මේ මාගේ අවසානයයි. අන්තිම භවය මේ පවතී. සියළු ආශ්‍රව ක්ෂය කරන ලදී. දැන් නැවත ඉපදීමක් නැත. (4110-4112)

(සතළොස්වන බණවරයි)

## 408 තොදෙය්‍ය ථේරාපදානය

4113 "කෙතුමතී නම් උතුම් නගරයෙහි විජය නම් රජෙක් විය. (හෙතෙම) ශූරය. වික්‍රමසම්පන්නය. එකල්හි හේ (එම කේතුමති) පුරයෙහි අධිපතිව විසීය.

4114 'ප්‍රමාදවූ එම රජුගේ (දුර්වල අවස්ථාව දැන) වනචාරීහු නැගී සිටියහ. සිදුරු සොයන්නෝද මුඛරයෝද එකල්හි රට නැසූහ.

4115 "රජතෙම ප්‍රත්‍යන්තය කුපිතවූ කල්හී භටයන්ද බලසෙනගද එකල්හී වහා රැස්කරවිය. සතුරාට නිග්‍රහද කළේය.

4116 "හස්ත්‍යා රෝහකයෝද, ආරක්ෂයෝද, චර්මීයෝධීහුද, උග්‍රවූ ධනුර්ද්ධරයෝද යන සියල්ලෝද එකල්හි රැස්වූහ.

4117 "අරක්කැමියෝද, කරනවෑමියෝද, දියවඩන්නෝද මල් කරුවෝද ශූරවූ ජයගන්නා ලද සංග්‍රාම ඇති සියල්ලෝ එකල්හි රැස්වූහ.

4118 "එකල්හි කඩුගත් අත් ඇති පුරුෂයෝද දුනු ගත් අත් ඇත්තෝද සන්නාහ සන්නද්ධයෝද රෞද්‍රවූ වැද්දෝද යන සංග්‍රාම දිනූ වීරයෝ සියළුදෙනම රැස්වූහ.

4119 "බඳින ලද රන් පොරොදු වලින් අලංකාර කරන ලද්දාවූ ත්‍රිමද ගලන ඇත්තුද සැට වයස් ඉක්මගිය පිරිහෙන බල ඇති ඇත්තුද යන මේ සියල්ලෝ එක්ල්හි රැස්වූහ.

4120 'ශීතෝෂ්ණයෙන් ඉවසන යුද බිමට ආලොකය දෙන්නාක් වැනිවූ යුද කිරීමම ආජීවය කොට ඇති කරන ලද කටයුතු ඇති සියල්ලෝ එකල්හි රැස්වූහ.

4121 "සක්හඬද බෙරහඬද තවත් (නොයෙක්) කම්පා කරන්නාවූ ශබ්දදයන මොවුන්ගෙන් සියල්ලන් සතුටු කරවමින් ඔවුහු එකල්හි රැස්වූහ.

4122 "ත්‍රිශූලය කොන්තය මන්ත්‍රය යන මොවුන්ගෙන්ද කවචයන්ගෙන්ද හා තොමරයන්ගෙන්ද කොටනු ලබන්නන් හෙළමින් සියල්ලෝ එකල්හි රැස්වූහ.

4123 "ජයගත නොහැකි යුද්ධයක් දිනූ එම රජතෙම කෙසේ හෝ එය නිමවා එකල්හි සැටදහසක් ප්‍රාණීන් හුළෙහි තැති ගැන්විය (තැබවිය.)

4124 "අහෝ රජතෙම, අධාර්මිකය. නිරයෙහි පැසෙන්නාවූ ඔහුගේ (එම දුකෙහි) අවසානය කවදාවන්නේ දැයි මනුෂ්‍යයෝ ශබ්ද කළාහුය.

4125 "එකල්හි මම සයනයෙහි පෙරළෙමින් නිරයෙහි (මෙන්) සයනය කරමි. දිවාරෑ දෙක්හි නොනිදමි. මා හුලින් (හුල තබන අයුරින්) තැතිගන්වත්.

4126 "ප්‍රමාදවූ රාජ්‍යයෙන්ද වාහනයෙන්ද බලයෙන්ද කවර ප්‍රයෝජනද ඒ සියල්ලෝ මා (නිරයෙන් වලක්වා) දරන්නට නොපොහොසත් වෙත්. හැම කල්හි මා තැතිගන්වත්.

4127 "පුත්‍රයන්ගෙන් හෝ අඹුවන්ගෙන් හෝ සකල රාජ්‍යයෙන් හෝ මට ඇති ප්‍රයෝජන කිම? මම සුගති මාර්ගය පිරිසිදුකිරීම සඳහා පැවිදිවන්නෙම් නම් ඉතා මැනවයි සිතීය.

4128-4129 "ඇතුන්ගේ පා විදිනා තොමර හා අකුසු (හෙන්ඩු) ගත් අත් ඇති ග්‍රාමණීන් (ගම්ප්‍රධානින්) විසින් නගින ලද සියළු අලංකාරයන්ගෙන් සරසනලද සැටදහසක් ඇත්තුද හෙම්වත් ඇඳ රන්පොරොදු බැඳි සංග්‍රාමාවචර ඇතුන්ද එතැන්හිම අපෙක්ෂා රහිතව මම අතහැර දැමීමි. ස්වකීය (මිනිසුන් හුල තැබීමේ) පාප කර්මයෙන් තැති ගත්තේ අනගාර්‍ය්‍ය නම්වූ සසුනෙහි (පැවිදිවීමට) නික්ම ගියෙමි.

4130-4131 "ආයුධ ගත් අත්ඇති සන්නාහ සන්නද්ධවූ ග්‍රාමණීන් (ගම්ප්‍රධානීන්) විසින් නගිනලද ජන්මයෙන්ම ආ ආජානීයවූ ශීඝ්‍රවාහී සෛන්ධවවූ සැටදහසක් අශ්වයෝ වෙත් නම් ඒ සියල්ල හැරදමා අනගාර්‍ය්‍ය නම්වූ සසුනෙහි (පැවිදිවීමට) නික්ම ගියෙමි.

4132 "ඔසවන ලද ධජ ඇති සන්නද්ධවූ දිවිසමින් වළඳන ලද රථද ව්‍යාඝ්‍ර සමින් වළඳන ලද රථ දැයි මෙසේ සැට දහසක් රථයෝ වූවාහුද ඒ සියල්ල හැරදමා අනගාරයෑ නම්වූ සසුනෙහි පැවිදි වීමි.

4133 "කිරි වැගිරෙන බැවින් නිතරම (බුරුළු වල) ලොහෝ බඳුන් දරන සියළු සැටදහසක් දෙන්නු වෙත්ද එම දෙන්නු හැරදමා අනගාරයෑ නම්වූ සසුනෙහි පැවිදි වීමි.

4134-4135 "මැනවින් අලංකාර කරනලද සැටදහසක් (මෙහි 4104 (ii) යොදන්න.) (වෙත්ද?) ඒ සියළු ස්ත්‍රීන් හඬවමින් අනගාරයෑ නම්වූ සසුනෙහි පැවිදි වීමි.

4136 "සියල්ලෙන් සම්පූර්ණවූ සැටදහසක් ගම්ද එම රාජ්‍යයද හැරදමා අනගාරයෑ නම්වූ සසුනෙහි පැවිදි වීමි.

4137 "මම නගරයෙන් නික්ම හිමවතට එළඹියෙමි. භාගීරථී ගංඉවුරෙහි අසපුවක් කෙළෙමි.

4138 "මම පන්සැලක්ද කොට ගිනිගල් ගෙයක්ද කෙළෙමි. පටන්ගන්නා ලද වීයයෑ ඇත්තේ (කාය ජීවිත නිරපෙක්ෂකව) අතහැර දැමූ ආත්ම ඇත්තේ මම (එම) අසපුවෙහි වෙසෙමි.

4139 "මඩුවෙක්හි හෝ රුක්මුලක හෝ හිස්ගෙයක හෝ ධ්‍යාන කරන්නාවූ මට තැති ගැනිමක් නැත. භය ජනක අරමුනක් නොදකිමි.

4141 "අග්‍රකාරුණිකවූ මොනෙය්‍ය ගුණ යුත් සුමෙධ නම් සර්වඥ තෙමේ ඥාණලොකය බබුළුවමින් එකෙනෙහි ලොවපහළ විය.

4142 "සුමෙධ නම්වූ පසැස් ඇති බුදුරජතෙම ලොව පහළ විය. හෙතෙම සියළු ජන සමූහයා සසර සයුරින් එතර කරයි. ඔබද එතර කරන්නේය." (කියායි.)

4143 "යක්ෂයාගේ වචනය අසා එකෙනෙහි (ප්‍රිතියෙන්) සැළුනේ වීමි. 'බුදුරජය' 'බුදුරජය' යි සිතමින් අසපුව පිළියෙළ කෙළෙමි.

4144 "ගින්දර බැහැරකොට ඇතිරිලි පිළියෙලකොට තබා අසපුවට වැඳ මම මහවනයෙන් නික්මීමි.

4145 "එම වනයෙන් සඳුන්ගෙන ගමින් ගමටද නගරයෙන් නගරයටද විනායකවූ බුදුරජුන් සොයමින් (උන්වහන්සේ වෙත) ගියෙමි.

4146 "එසමයෙහි ලොකනායකවූ සුමෙධ භාග්‍යවත් තෙමේ චතුස්සත්‍යය දෙශනාකරමින් බොහෝ ජනසමූහයාට ධර්මාවබොධ්‍ය කරවයි

4147 "මම ඇදිලිබැඳ හිසෙහි සඳුන් තබාගෙන සම්බුදු රජුන් වැඳ මෙම ගාථාවන් කීමි.

4148 "දෑසමන් පිපෙන කල්හි සමීපයෙහි (අවට) සුවඳ හමයි. එසේම වීරයන් වහන්ස, ඔබගේ ගුණ සුවඳින් සියළු දිගුන් හමායයි.

4149 "සපු, නා, කෝබු, වැටකේ, සල් යන මෙකී මල්පිපෙන කල්හි සුලඟට අනුව (සුලංහමන අතට) හමායයි.

4150 "එසේම) ඔබවහන්සේගේ (ගුණ) සුවඳ අසා හිමවතෙහි සිට (මෙහි) ආමි. ලොකජ්‍යෙෂ්ඨයාණන් වහන්ස, මහත් යසස් ඇත්තාණන් වහන්ස, මහාවීරයාණන් වහන්ස, ඔබවහන්සේ පුදමි."

4151 "සුමෙධ ලොකනායකයාණන් උතුම් සඳුනෙන් ආලෙප කෙළෙමි එකෙණෙහි සිය සිත පහදවා නිශ්ශබ්දව සිටියේය.

4152 "ලෝකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ සුමෙධ නම් භාග්‍යවත් තෙමේ භික්ෂු සංඝයා මැද හිඳ මෙම ගාථාවන් වදාළේය.

4153 "යමෙක් මාගේ ගුණ කීර්තනය කළේද, සඳුනෙන් පිදීද, හේ කවරෙක් දැයි මම ප්‍රකාශ කරන්නෙමි. (එසේ) පවසන්නාවූ මාගේ වචනය අසව්.

4154 "(මෙතෙම) සියල්ලන් විසින් පිළිගතයුතු වචන ඇත්තේ ශ්‍රෙෂ්ඨවූයේ ඍජු ප්‍රතාපවත් වූයේ වේ. පස්විසි කපක් මුළුල්ලෙහි ප්‍රභා සහිත කෙනෙක් වන්නේය.

4155 "කප්සවිසි සියයක් හෙවත් දෙදහස්හසිය කපක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය. දහස්වරක් සක්විති රජ වන්නේය.

4156 "ශක්‍රදෙවෙන්ද්‍රව දෙතිස් වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය. (කරවනු ලබන්නාවූ) මහත්වූ ප්‍රදෙශ රාජ්‍ය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය.

4157 "ඉන් චුතවූයේ මේ මිනිස් තෙමේ මිනිසත් බවට යන්නේ නම් (මෙම) පුණ්‍ය කර්මය හා යෙදුනේ බ්‍රාහ්මණයෙක් වන්නේය. (කෙබඳු බ්‍රාහ්මණයෙක්ද යත්?)

4158 "වෙද හදාරන්නාවූ මන්ත්‍ර දරන්නාවූ වෙදත්‍රයෙහි පරතෙරට ගියාවූ ලක්ෂණත්‍රයකින් යුක්තවූ බාවාරි නම් බමුණෙකි.

4159 "එම බාවාරි බමුණාගේ ශිෂ්‍යයෙක්ව මන්ත්‍ර ශාස්ත්‍රයෙහි පරතෙරට ගියේ ශාක්‍ය කුලශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජුන් වෙත එළඹ.

4160 "තියුණු ප්‍රශ්න විචාරා මාර්ගය වඩා සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රවරහිතව පිරිනිවන් පාන්නේය." (කියායි.)

4161 'මාගේ ත්‍රිවිධාග්නීහු නිවීගියහ. සියළු භවයෝ නසන ලදහ. සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි. (4162-4163)

## 409 ජතු කණ්ණික ථෙරාපදානය

4165 "මම හංසවතී නගරයෙහි සිටු පුත්‍රයෙක් වීමි. එකල්හි මම (සියළු) කාම ගුණයන්හි යෙදුනේ පිරිවර සහිතව වසමි.

4166 "ගෙවල් ලකුණු දන්නෝ (ප්‍රාසාද තුණක්) ගොඩනැගූහ. (එම) තුන් පහයට නැගී එහි මම නෘත්‍යයන්ගෙන්ද ගීතයන් ගෙන්ද යුතුව එකල්හි පිරිස් සහිතව වෙසෙමි.

4167 "මට කුළුතාලම් ආදියෙන් යුත් තූර්‍ය්‍යයෝ අසන ලදහ. සියළු ස්ත්‍රීහු නටන්නාවූ මාගේ සිත පැහැරගනිත්මය.

4168 "පිලිහිස සිසාරන්නියෝද මිටි අය මෙන් නටන්නියෝද කුදු අය මෙන් නටන්නියෝද සිහදෙනෙකු මෙන් මැද පෙදෙස පෙන්නමින් නටන්නියෝද, උඩට මතුවෙමින් නටන්නියෝද, ශොකීව සිතන්නවුන් මෙන් නටන්නියෝද හැම කල්හි මා පිරිවරත්.

4169 "චන්දිභට්ටයෝද කුම්භථූන නම් එක් මුහුණින් යුත් තූර්‍ය්‍ය විශෙෂය වයන්නෝද යන මෙකී නළු නිලියෝ බොහෝ වෙති. මෙම නළු නිලියෝ හැම කල්හි මා පිරිවරත්.

4170 "කරණුවැමියෝද දියවඩන්නෝද අරක්කැමියෝද මල්කරුවෝද මැනවින් පසැට කෙළින්නෝද ජල්ල ක්‍රීඩකයෝද මල්ලක්‍රීඩකයෝද යන මෙකී සියල්ලෝම හැම කල්හිම මා පිරිවරත්

4171 "(ශිල්පයන්හි) හික්මුනාවූ පලපුරුදුකම් ඇති මොවුන් ක්‍රීඩා කරන කල්හි තව්තිසාවෙහි ශක්‍රයා මෙන් රෑ දාවල් නොදනිමි.

4172 "දීර්ඝ මාර්ගයට පිළිපන්නෝද මගියෝද යාචකයෝද (තැනක් නියමයක් නොමැතිව) ඇවිදින්නෝද යන බොහෝවූ මොවුහු නිතර ඉල්වමින් මාගේ ගෙට පැමිණෙත්.

4173 "නිරුත්තර පුණ්‍යක්ෂේත්‍රවූ ශ්‍රමණයෝද බ්‍රාහ්මණයෝද මාගේ පිණ වැඩිකරන්නාහු මාගේ ගෘහයට පැමිණෙත්

4174 "පටකය, ලටකය, පුප්ඵසාටකය, තෙදණ්ඩිකය, එකසිඛය යන සියළු නිගණ්ඨයෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4175 "විලුත්තාවිය, ගොධම්මය, දෙවධම්මකය, රජො ජල්ලධරය යන මේ ආජීවකයෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4176 "පරිවත්තකය, සිද්ධිපත්තය යන තවුසෝද කොණ්ඩය, පූග්ගණිකාය යන වනචාරීහුද මාගේ ගෘහයට බොහෝ පැමිණෙත්.

4177 "ඔඩ්ඩකය, දමිළය. සාකුළය, මලයාලකය, සබරය යොනකය යන මොවුහු මාගේ ගෘහයට පැමිණෙත්.

4178 "අන්ධකයෝද, මුණ්ඩකයෝද, කොලකයෝද, සානුවින්දකයෝද, ආරාවචීන රාෂ්ට්‍රිකයෝද යන මේ සියල්ලෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4179 "අලසන්දකයෝද, පල්ලවකයෝද, බබ්බරයෝද, භග්ගකාරුසයෝද, රොහිතයෝද, චෙතපුත්තකයෝද මාගේ ගෘහයට පැමිණෙත්.

4180 "මාධුරකයෝද, කොසලකයෝද, කාසිකයෝද, හස්ථිපොරිකයෝද, ඉසිණ්ඩයෝද, මක්කලයෝද මාගේ ගෘහයට පැමිණෙත්.

4181 "වෙලාවකයෝද, අරම්මයෝද, මක්කලයෝද, මෙසලයෝද, සුද්දකයෝද යන බොහෝදෙන මාගේ ගෘහයට පැමිණෙත්

4182 "රෝහණයෝද, සින්ධවකයෝද, චිතකයෝද, එකකණ්ණිකයෝද, සුරට්ඨයෝද, අපරන්තයෝද මාගේ ගෘහයට පැමිණෙත්.

4183 'සුප්පාරකයෝද, කිකුමාරයෝද, මලයයෝද සොණ්ණභූමිකයෝද, වජ්ජිතාරාවෝද යන මේ සියල්ලෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4184 "(බටවලින් වැඩ කරන) නළකාරයෝද (රෙදි වියන) පෙෂකාරයෝද (සම් වැඩ කරන) චම්මකාරයෝද (වඩු වැඩ කරන) තච්ඡකයෝද (කුඹුරු වැඩ කරන) කම්මාරයෝද, (හැලිවලන් සාදන) කුම්භකාරයෝද මාගේ ගෘහයට පැමිණෙත්.

4185 "(මැණික් වැඩ කරන) මැණික්කාරයෝද (ලොහෝ වැඩ කරන) ලෝහකාරයෝද (රන් වැඩ කරන) සොණ්ණකාරයෝද (රෙදි වැඩ කරන) දුස්සිකයෝද (ඊයම් වැඩ කරන) තිපුකරයෝද යන මේ සියල්ලෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4186 "(ඊ වැඩ කරන) උසුකාරයෝද (ලියන වඩුවැඩ කරන) හමකාරයෝද (රෙදි වියන) පෙෂකාරයෝද (සුවඳ සාදන හෝ විකුණන) ගන්ධිකයෝද (රෙදි සෝදන පොවන) රජකයෝද (රෙදි මහන) තුණ්ණවායෝද මාගේ ගෘහයට පැමිණෙත්

4187 "(තෙල් සාදන හෝ විකුණන) තෙලිකයෝද (දර අදින) කට්ඨහාරයෝද (ජලය අදින) උදකහාරයෝද (පණිවුඩ ගෙනයන) පෙස්සිකයෝද (සූප සාදන) සූපිකයෝද (සූප රකින) සූපරක්ඛයෝද මාගේ ගෘහයට පැමිණෙත්.

4188 "(දොරටුපාල කම් කරන) දොවාරිකයෝද (බල ඇණියෙහිවූ) අණිකට්ඨයෝද (තුති පැසසුම්කම් කරන) වන්දිකයෝද (ගැබ් මල හෝ පරමල් බැහැර ලන) පුප්ඵඡඩ්ඩකයෝද (ඇතුන්පිට නගින) හත්ථාරුහයෝද (ඇතුන් බලන) හත්ථපාලයෝද මාගේ ගෘහයට පැමිණෙත්.

4189 "ප්‍රමාදීවූ ආනන්ද මහරජුට මම සත්රුවන් දුනිමි. මම (ඔහුගේ පවා) අඩු බැව් (අඩු-පාඩු) පිරවමි.

4190 "මා විසින් මැනවැයි පසසනලද යමෙක් වෙත්නම් ඒ සියල්ලෝ නානා ජාතිවලට අයත් බොහෝදෙන වෙති. මම ඔවුන්ගේ සිත් දැන රුවනින් තෘප්ත කෙළෙමි.

4191 "මිහිරි වදන් කියන කල්හි බෙර වයන කල්හි, සක් පිඹින කල්හි මම ස්වකීය ගෘහයෙහි සිත් අලවා වෙසෙමි.

4192-4193 'එසමයෙහි භාග්‍යවත්වූ ඒ පදුමුත්තර බුදුරජ තෙමේ ක්ෂය කළ ආශ්‍රවයන් ඇති රහත් භික්ෂූන් ලක්ෂයක් සමග වීථියට පිළිපන්නේය. පසැස් ඇති සර්වඥ තෙම සියළු දිගුන් ආලොකවත් කරමින් ප්‍රදීප වෘක්ෂයක් මෙන් බබලයි.

4194 "බුදුරජුන් වඩින කල්හි සියළු භෙරීහු වාදනය කෙරෙත්. උදාවූ හිරු මෙන් උන්වහන්සේගේ රැස් විහිදෙයි.

4195 "කවුළු අතරින් පිවිසි රැසින් ඇතුළු ගෙහිද එකෙනෙහි මහත්වූ ආලොකයෙක් විය.

4196 "මම බුදුරජුන්ගේ රැස් දැක පිරිසට මෙසේ කීමි. (කෙසේද යත්.) "නිසැකව බුද්ධ ශ්‍රෙෂ්ඨතෙම මෙම වීථියට එළඹියේය" (කියායි.)

4197 "වහා පහයෙන් බැස ඇතුළු වීථියට ආයෙමි සම්බුදුරජුන්ට මෙම වචනයද කීමි. (කෙබඳු වචනයක්ද යත්?)

4198 "පදුමුත්තර නම් වූ බුදුරජාණන් වහන්සේ මට අනුකම්පා කරනසේක්වා" යනුයි එම බුදුරජතෙම ලක්ෂයක් රහතුන් සමග එම ආරාධනය පිළිගත්තේය.

4199 "සම්බුදු රජුන් පවරා ස්වකීය ගෘහයට වැඩමවීමි. එහි ආහාරපානයෙන් බුදුරජුන් වැළඳවීමි

4200 "වළඳා අවසන්වූ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ (දැක) සුදුසු කලැයි දැන තාදීගුණ ඇති එම බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට ශතංගික තූර්‍ය්‍යයන්ගෙන් උවටැන් කෙළෙමි.

4201 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජතෙම ඇතුළුගෙයි හිඳ මෙම ගාථාවන් වදාළේය.

4202 "යමෙක් තූර්‍ය්‍යයන්ගෙන් මට උවටැන් කෙළේද මට ආහාරපානයන් දුන්නේද (හේ කවරෙක්දැයි) මම කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

4203 "රැස් කළ (සම්පත්) අනුභව කරන්නෙක්ව අමුරන් සහිතව බොජුන් සහිතව මේ මිනිස්තෙම සිව් මහ දිවයිනෙහි එකච්ඡත්‍රකොට රාජ්‍ය කරවන්නේය.

4204 'පන්සිල් සමාදන්ව ඉක්බිති දශ කර්මපථයන්ද සමාදන්ව පවත්වමින් පිරිස හික්මවන්නේය.

4205 "මැනවින් අලංකාර කරනලද ස්ත්‍රීහු මොහුට නිතර තූර්‍ය්‍යයන් ලක්ෂයක් වාදනය කරන්නාහුය.

4206 "කල්ප තිස්දහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේය. සූසැට වරක් ශක්‍රදෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරන්නේය.

4207 "සූසැට වරක් සක්විති රජ වන්නේය. (කරවනු ලබන) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නොහැකිය

4208 "(මින්) කල්ප ලක්ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාහු නමින් ගෞතම නම් ශාස්තෲ තෙමේ ලොව පහළ වන්නේය.

4209 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යොනියක උපදින්නේ නම් අනූනවූ භොග සම්පත් ඇත්තේය, (යලි) මිනිසත් බවට පැමිණෙන්නේය.

4210 "වෙද හදාරන්නේව වෙදත්‍රයෙහි පරතෙරට ගියේ උත්තමාර්ථයවූ (නිවන) සොයමින් මෙම පෘථිවියෙහි හැසිරෙන්නේය.

4211 'කුශල මූලයෙන් මෙහෙයවනලද හෙතෙම පසුව පැවිදිව ගෞතම බුදුරජුන්ගේ සසුනෙහි සිත් අලවා වසන්නේය.

4212 "මෙතෙම ශාක්‍ය කුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදු රජුන් සතුටුකොට කෙළෙස් දමා රහත් වන්නේය.

4213 "මහ වනයෙහි ව්‍යාඝ්‍ර රාජයෙකු මෙන්ද කෙශර සිංහරාජයෙකු මෙන්ද අද ශාක්‍යපුත්‍රවූ බුදුරජාණන්වහන්සේගේ සසුනෙහි නිර්භීතව වෙසෙමි.

4214 "දෙව්ලොව වුවද මිනිස්ලොව වුවද දිළිඳු බැව්හි හෝ දුගතියක හෝ මාගේ ඉපදීමක් නොදකිමි. (බුදුරජුන්ට) උවටැන් කිරීමේ මේ විපාකයයි.

4215 "සන්හුන් වූයේ උපධි රහිතවූයේ විවෙකයෙහි යෙදුනේ වෙමි. ඇත් රජෙකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වසමි 4216-4218.

## 410 උදෙන ථේරාපදානය

4219 "හිම වතට නුදුරෙහි පදුමනම් පර්වතයක් විය. මට (එම) අසපුවක් මැනවින් කරන ලදී. පන්සලක්ද කොට නිමවන ලදී.

4220 "මනාවූ කුඩා තොටුපළවල් ඇති මනොඥවූ නදීහු එහි ගලා බසිත්. එමනදීහු හැම කල්හි පිරිසිදු දිය ඇත්තාහුය. (එසේම) සිසිල් දිය ඇත්තාහුය, සුන්දරවෙති.

4221 "පෘඨීන නම් මත්ස්‍යයෝ (පෙටියෝ) ද, හාවුස නම් මත්ස්‍යයෝ (ලුල්ලු) ද, වලජ නම් මත්ස්‍යයෝ (වලයෝ) ද මුඤ්ජ නම් මත්ස්‍යයෝ (මොද්දු) ද, රොහිත නම් මත්ස්‍යයෝ (රෙහෙරු) ද, යන මොවුහු නදිය හොබ වන්නාවූ හැම කල්හි (එම) නදියෙහිම වසත්.

4222 "අඹ දඹ රුක්වලින් බැසිගිය නදියද එසේම කරෙරිය තිලකය (මදට) ය උද්දාලක (ඇසළ) ය පාටලී (පළොල් ය යන මෙකී වෘක්ෂයෝ මාගේ අසපුව හොබවත්,

4223 "පිපිගිය අංකොලක (රුකගුන) ය බිම්බිජාලය මායාකාරිය යන මෙකී වෘක්ෂයන්ගේ සුවඳින් (යුතු වාතය හමන්නාවූ) මාගේ අසපුව හොබවත්.

4224 "මැනවින් පිපීගිය අතිමුත්ත (යොහොඹු) ය සත්තලික (සත්පෙති දෑසමන්) ය නාග (නා) ය සාල (සල්) ය යන මොවුහු දිවසුවඳ හමවමින් මාගේ අසපුව හොබවත්.

4225 "කොසම්බ (කොසඹ) ය සල්ලය නිප (කොළොම්) ය අට්ඨංගය යන වෘක්ෂයෝ පිපීගියාහු දිවසුවඳ හමමින් මාගේ අසපුව හොබවත්.

4226 "අරළුය, නෙල්ලිය අඹය දඹය බුළුය ඩෙබරය බඳුළුය බෙලිය යන මෙකී ඵලයෝ අසපුවෙහි බොහෝ වෙති.

4227 "කළම්බ (කොළොම්) කන්දලී (බිම්කෙහෙල්) එහි මාගේ අසපුවෙහි පිපෙත්. දිව සුවඳ හමමින් මාගේ අසපුව හොබවත්.

4228 "අසොක පිණ්ඩිය චවරීය කොසඹය යන මෙකී වෘක්ෂයෝ පිපීගියාහු දිවසුවඳ හමමින් මාගේ අසපුව හොබවත්.

4229 "පුන්නාහ (දොඹ) ය ගිරිපුන්නාගය තිමිරය යන මේ වෘක්ෂයෝ එහි පිපීගියාහු දිව සුවඳ හමමින් මාගේ අසපුව හොබවත්.

4230 "කිග්ගුණ්ඩි (නික) ය සිරිනිග්ගුණ්ඩි (සිරිනික) ය සපූය යන මේ වෘක්ෂයෝ පිපී ගියාහු දිවසුවඳ හමමින් මාගේ අසපුව හොබවත්.

4231 "අසපුවට නුදුරෙහි පොකුණකි. එම පුෂ්කරණී තොමෝ සක්වා ලිහිණියන් විසින් හඬනගන ලද්දීය. මන්දාලක පුෂ්පයන්ගෙන්ද පියුම් උපුල් මල් වලින්ද ගැවසී ගත්තීය.

4232 "පැහැදි දිය ඇත්තීය. සිසිල් ජලයද ඇත්තීය. මනාවූ කුඩා තොටු පොළවල් ඇත්තීය. මනරම් වූවාය. පළිගුමෙන් පැහැදිලිය. (එබඳුවූ පුෂ්කරණී තොමෝ) මාගේ අසපුව හොබපියි

4233 "එහි රන් පියුම්ද හෙළ පියුම්ද උපුල්ද (යන මේ පුෂ්පයෝ) පිපෙත්. මන්දාලක පුෂ්පයන්ගෙන්ද ගැවසී ගත්තීය. (එම පුෂ්කරණී තොමෝ) මාගේ අසපුවට හොබවයි.

4234 "පාඨීන නම් මත්ස්‍යයෝ (පෙටියෝ) ද පාවුස නම් මත්ස්‍යයෝ (ලූල්ලු) ද වලජ නම් මත්ස්‍යයෝ (වලජයෝ) ද මුඤ්ජනම් මත්ස්‍යයෝ (මුද්දු) ද රොහිත නම් මත්ස්‍යයෝ (රෙහෙරු) ද යන මොවුහු එහි (පොකුණෙහි) හැසිරෙමින් මාගේ අසපුව හොබවත්.

4235 "කුම්භිලයෝද සුංසුමාරයෝද යන චණ්ඩ ජලජ සත්වයෝද කැසුබුවෝද ඔගුහ නම් සත්වයෝද අජගරයෝද (පිඹුරෝ) ද බොහෝ වෙති. ඔවුහු මාගේ අසපුව හොබවත්.

4236 "පරවියෝය. පරවී හංසයෝය චක්‍රවෘකයෝ (සක්වා ලිහිණියෝ) ය. නදීචරයෝය දින්දිභයෝ (කිරළු) ය සැළිකයෝය (සැ??ලිහිණියෝ) ය යන මොවුහු මෙහි මාගේ අසපුව හොබවත්.

4237 "නයිතාය අම්බගන්ධීය කෙතකි (වැටකේ) ය යන මෙකී වෘක්ෂයෝ පිපිගියාහු එහි දිවසුවඳ මාගේ අසපුව හොබවත්.

4238 "සිංහයෝය. ව්‍යඝ්‍රයෝය. දිවියෝය. වලස්සුය. කොක්නහවෝය. කරබානා වලස්සුය යන මොවුහු මහ වෙනෙහි හැසිරෙන්නාහු මාගේ අසපුව හොබවත්.

4239 "අඳුන් දිවසම් හැඳි ජටාභාරයෙන් බර වූ (තවුසෝ) මහවෙනෙහි හැසිරෙන්නාහු මාගේ අසපුව හොබවත්.

4240 "මේ තවුසෝ අඳුන් දිවිසම් දරන්නෝය. ප්‍රාඥයෝය. සන්හුන් පැවතුම් ඇත්තෝය. අල්පාහාර ඇත්තෝය. ඒ සියල්ලෝ මාගේ අසපුව හොබවත්.

4241 'එකල්හි ඔවුහු පිරිකර බර (කද) ගෙන වනයට පිවිස මුල් හා ගෙඩි අනුභව කරන්නාහු හැමකල්හි අසපුවෙහි වසත්

4242 "ඔවුහු දර හෝ පා දෝනා දිය හෝ ගෙන නොයෙත්. සියල්ලන්ගේ ආනුභාවයෙන් (ඒවා) තෙමේම ගෙන එයි. (පැමිණියි.)

4243 "අසූහාරදහසක් ඍෂීහු මෙහි රැස්වූහ. මේ සියල්ලෝම ධ්‍යාන කරන්නෝය. උත්තමාර්ථයවූ විමුක්තිය සොයන්නෝය.

4244 "සියල්ලෝ තපස්වීහුය. බ්‍රහ්මචාරීහුය අර්පණා ව්‍රතයෙහි (සිත) මෙහෙයවූවෝය. අහසෙහි හැසිරෙන්නෝය. එකල් (මොවුහු මාගේ) අසපුවෙහි වෙසෙත්.

4245 "පස් දිනකට වරක් එකගවූ සන්හුන් පැවතුම් ඇති මොවුහු රැස්වෙති. (රැස්ව) ඔවුනොවුනට වැඳ ඒ ඒ දිශාභිමුඛ වූවාහු යෙත්.

4246 'සියළු ධර්මයන්ගේ පරතෙරට ගිය පදුමුත්තර නම් බුදුරජතෙම එකෙනෙහි මොහඳුර දුරුකරමින් ලොව පහළ විය.

4247 "මාගේ අසපුව හාත්පස (සමීපයෙහි) මහා ඍද්ධි ඇති යක්ෂයෙක් විය. හෙතෙම පදුමුත්තර නම් බුදුරජුන් හට ප්‍රශංසා කළේය. (කෙසේද යත්?)

4248 "නිදුකාණෙනි, මේ මහාමුනිවූ පදුමුත්තර නම් බුදුරජතෙම ලොවපහළ විය වහා ගොස් එම සම්බුදු රජුන් භජනය කරනු මැනව," (කියායි.)

4249 "එකල්හි යක්ෂයාගේ වචනය අසා පැහැදි සිතින් අසපුව පිළියෙළ කොට තබා මහවනයෙන් නික්මුනෙමි.

4250 'වස්ත්‍රය ගිනි ඇවිලගත් කල්හි මෙන් අසපුවෙන් නික්ම එක්රැයක් (මග) වැස බුදුරජුන් වෙත එළඹියෙමි.

4251 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජතෙම සිව් සස් පවසමින් අමෘත පදය දෙශනා කළේය

4252 "මනාව පිපුණු පියුමක් ගෙන (බුදුරජුන් වෙත) එළඹ පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ මහර්ෂීවූ සර්වඥයන් වහන්සේට පිදීමි.

4253 "(මෙසේ) පදුමුත්තර නම්වූ බුදුරජාණන් වහන්සේට පුදා ලොකනායකවූ තථාගතයන්හට ස්තුති කෙළෙමි. (කෙසේද යත්?)

4254 "යම් සර්වඥතා ඥානයක් කරණකොට ගෙන සම්බුදු රජතෙම ආශ්‍රව රහිතව මෙලෙව්හි වැඩ වෙසේද එම ඤාණය කීර්තනය කරන්නෙමි. (එය) පවසන්නාවූ මාගේ වචනය අසව්.

4255 "(ඔබ) සසර සැඩ කපා සියළු ප්‍රාණීන් (සසර සයුරින්) එතෙර කෙරෙහිය. ඒ සත්වයෝ ඔබ වහන්සේගේ ධර්මය අසා තෘෂ්ණාව නැමැති සැඩපහර තරණය කෙරෙත්.

4256 "ද්විපදොත්තමවූ බුදුරජාණන් වහන්ස, ඔබ සත්වයනට ශාස්තෘ වෙහිය. කොඩියක්ද ධජයක්ද යාග ස්ථම්භයක්ද වෙහිය. ආරක්ෂාවද පිහිටද වෙහිය.

4257 "ලෙව්හි යම්තාක් ගණ ප්‍රධානීහු සාර්ථවාහයෝ යයි කියනු ලබත්ද, සර්වඥයන් වහන්ස, (ඔවුනට) ඔබ අග්‍රවෙහිය. ඔවුහු ඔබ වහන්සේටම ඇතුළත් වෙත්.

4258 "සර්වඥයන් වහන්ස, ඔබ වහන්සේගේ නුවණ කරණකොටගෙන බොහෝ දෙන (සසර සයුරින්) එතර කෙරෙහිය. ඔවුහු ඔබ වහන්සේගේ දර්ශනය නිසා දුක් කෙළවර කෙරෙත්.

4259 'පසැස් ඇතියාණන් වහන්ස, ලෙව්හි යම් කිසි සුගන්ධ සමූහයක් හමත් නම් මහා මුනීන් වහන්ස, පින් කෙත්හිවූ ඔබගේ ගුණ සුවඳ වැනිඅනික් සුවඳක් නැත.

4260 "පසැස් ඇතියාණන් වහන්ස, තිරිසන් ගතියද නිරයද ඔබ දුරු කෙළෙහිය. මහාමුනින් වහන්ස, ඔබ අසංස්කෘතවූ ශාන්තපදය හෙවත් නිවන දෙශනා කෙළෙහිය" (කියායි)

4261 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජතෙම භික්ෂු සංඝයා මැදහිඳ මෙම ගාථාවන් වදාළ සේක

**4262** "යමෙක් තෙම පහන් වූයේ සියතින් මාගේ සර්වඥතා ඥානය පිදීද, හේ (කවරෙක් දැයි) මම පවසන්නෙමි. (එසේ) පවසන්නාවූ මාගේ වචනය අසව්.

**4263** "(මෙතෙම) කල්ප තිස්දහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේය. දහස්වරක් සක්විති රජ වන්නේය." (කියායි.)

**4264** "(මම) මනාවූත ඇති බුදුරජුන් තුටුකොට උතුම් ලාබයක් ලැබුයේ වෙමි. සියලු ආශ්‍රවය (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන් ආශ්‍රව රහිතව වෙසෙමි. (4265-4267)

## 42 භද්දාලි වග්ග.

### 411 භද්දාලි ථෙරාපදානය

**4268** "මොනෙයය ගුණ යුත් අග්‍ර කාරුණිකවූ ලොකාග්‍රවූ සුමෙධ නම් සර්වඥතෙමේ විවේක සුව කැමැත්තේ හිම වතට එළඹ ගියේය.

**4269** "පුරුෂොත්තමවූ සුමෙධ ලොකනායක තෙම හිමවතට පිවිස පළගක් බැඳ වැඩහුන්නේය.

**4270** "ලොකනායකවූ ඒ සුමෙධ බුදු රජතෙම සමාධියට සමවැදුනේය. පුරුෂොත්තමවූ සර්වඥතෙම රෑ දාවල් සතක් (සතියක්) (එසේම) වැඩ හුන්නේය.

**4271** "පිරිකර කද ගෙන මම වනයට පිවිසියෙමි. එහිදී වතුරොඝයන් තරණය කළාවූ ආශ්‍රවරහිතවූ සම්බුදුරජුන් දුටිමි.

**4272** "මුස්න ගෙන අසපුව හැමද චතු දණ්ඩය (එක් කෙළවරකින් එකට බැඳ සාදාගත් දඬු සතරක්) සිටුවා එකල්හි මණ්ඩපයක් කෙළෙමි.

**4273** "මෙ සල්මල් ගෙනවුත් මඩුව සෙවෙනි කෙළෙමි පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ බුදුරජුන් වැන්දෙමි.

**4274** "මහත්වූ ප්‍රඥාව ඇති උතුම් නුවණැති යමෙකුට සුමෙධයයි කියත්ද, එම සුමෙධ බුදුරජතෙම භික්ෂු සංඝයා වැද හිඳ මෙම ගාථාවන් වදාළේය.

**4275** "එම බුදුරජුන්ගේ (සුමධුර) හඬයයි දැන නිසැකවම පසැස් ඇති බුද්ධශ්‍රෙෂ්ඨතෙම දහම් දෙසායයි දෙවියෝ රැස්වූහ.

4276 "ලෝකයේ පූජාවන් පිළිගන්නාවූ සුමෙධ නම් සර්වඥ තෙමේ දිව්‍යසමූහයා මැද වැඩහිඳ මෙම ගාථාවන් වදාළේය.

4277 "යමෙක් තෙම මට සල් මලින් සෙවෙනි කළ මඩුවක් සතියක් මුළුල්ලෙහි දැරීද, හේ (කවරෙක්දැයි) කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

4278 "මෙතෙම දෙව්වූයේද ස්වර්ණවර්ණ වන්නේය සපිරුණු භොගසම්පත් ඇත්තේව කම්සුව අනුභව කරන්නෙක් වන්නේය.

4279-4280 "ඇතුන්ගේ පා විදින තෝමර හා අකුසු (හෙන්ඩු) ගත් අත් ඇති ග්‍රාමණීන් (ගම් ප්‍රධානීන්) විසින් නගින ලද සියළු ආභරණයනගෙන් සරසන ලද සැටදහසක් ඇත්තුද හෙම්වැනි වත් හැඳවූ රන් පොරොදු බැඳි ඇත්තුද මේ මනුෂ්‍යයාට උදේ හවස උවැටනට පැමිණෙන්නාහුය.

4281-4282 "කයිසරඹු හා දුනු දරන්නාවූ ග්‍රාමණීන් (ගම්ප්‍රධානීන්) විසින් තබන ලද ජන්මයෙන් ආජානීයවූ ශීඝ්‍රවාහී සෛන්ධවවූ සියළු අබරණින් සරසන ලද සැට දහසක් අශ්වයෝ මොහු නිතර පිරිවරත්. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

4283-4284 "දුනු ගත් අත් ඇති සන්නාහසන්නද්ධවූ ග්‍රාමණීන් (ගම්ප්‍රධානීන්) විසින් නගින ලද ඔසවන ලද ධජ ඇති සන්නද්ධවූ දිවිසමින් වළඳන ලද රථද ව්‍යාඝ්‍ර සමින් වළඳන ලද රථදැයි මෙසේ සර්වාලංකාරයන්ගෙන් සරසනලද සැට දහසක් රථයෝ මොහු නිතර පිරිවරන්නාහුය. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

4285 "සර්වාකාරයෙන් සම්පූර්ණවූ සමෘද්ධවූ ධන ධාන්‍ය ඇති හැම අයුරින්ම මැනවින් සමෘද්ධවූ සැටදහසක් ග්‍රාමයෝ හැමකල්හි පහළවන්නාහුයි බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

4286 'ඇත් අස් රිය පාබල යන සිව්රඟ සෙනග මොහු නිතර පිරිවරත්. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

4287 "(මෙතෙම) අටලොස් සියවන කපෙහි දෙව් ලොවෙහි සිත් අලවා වසන්නේය. දහස් වරක් සක්විති රජ වන්නේය.

4288 "තුන්සිය වරක් දිව්‍යරාජ්‍යය කරන්නේය.

**4289** "(මින්) තිස්දහස්වන කපෙහි ඔක්කාක කුලයෙහි උපන්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘතෙමේ ලොව පහළ වන්නේය.

**4290** "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ ඖරස බුද්ධ පුත්‍රයෙක්ව ආශ්‍රව රහිතව සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන වාසය කරන්නේය.

**4291** "(මින්) කල්ප තිස්දහසකට පෙර ලොකනායකවූ බුදුරජුන් දිටිමි. (එදින පටන් අද දක්වා) මේ අතුරෙහි අමෘත පදය (නිවන) සෙවීමි.

**4292** "යම් (බුදු) සසුනක් මම දැනගතිම්ද එය මට ලාභයකි. මා විසින් (එය) මනාකොට ලබන ලදී. (මා විසින්) පැමිණෙන ලද ත්‍රිවිද්‍යාවෝ ඇතියහ. බුදුරජාණන් වහන්සේ ගේ සසුන කරන ලදී

**4293** "පුරුෂ ශ්‍රෙෂ්ඨයන්වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා, පුරුෂොත්තමයාණන් වහන්ස ඔබවහන්සේට නමස්කාරවේවා, ඔබවහන්සේගේ සර්වඥතාඥානයට පසසා අමෘත පදයට හෙවත් නිවනට පැමිණියේ වෙමි.

**4294** "දෙවිවූ හෝ මිනිස්වූ හෝ යම් යම් භවයක උපදිම් නම් සැමතන්හි සුවඇත්තේ වෙමි මාගේ සර්වඥතාඥානයට පැසසීමෙහි මේ විපාකයයි.

**4295** "මේ මාගේ පශ්චිම භවයයි. අවසන් භවය මේ පවතී. ඇතෙකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි. (4296-4298)

## 412 එකඡත්තිය ථෙරාපදානය

**4299** "චන්ද්‍රභාග නදී තීරයෙහි මට ආශ්‍රමයක් කරන ලදී. (එහි) සුදෝසුදු වැල්ලෙන් ගැවසීගත් පන්සැලක්ද නිර්මිත කරන ලදි.

**4300** "එහි නොගැඹුරු ඉවුරු ඇති මනාවූ කුඩා තොටුපල ඇති මනොඥවූ මස්කැසුබුවන්ගෙන් යුත් සූ සූ හඬ නගමින් දියබුබුළු උඩට නංවන සුසුංමාරයන් විසින් සෙව්නා ලද කුඩා නදියක් විය.

4301 "වලස්සුය, මොනරුය, දිවියෝය, කොවුලෝය, සැළලිහිණියෝය යන මොව්හු හැමකල්හි මාගේ අසපුව හොබවමින් ශබ්ද කෙරෙත්.

4302 "මිහිරි හඬ ඇති කොවුලෝද මධුර ස්වර ඇති හංසයෝද යන මොවුහු එහි මාගේ අසපුව හොබවමින් නාද කෙරෙත්.

4303 "සිංහයෝද ව්‍යාඝ්‍රයෝද හූරෝද වෘකයෝද කොක්නහවෝද කරබානා වලස්සුද මාගේ අසපුව හොබවමින් ගිරිදුර්ගයන්හි නාද කෙරෙත්

4304 "එහි මෘගයෝද, සරභමෘගයෝද, කැනහිල්ලුද, හූරෝද යන මොවුහු බොහෝදෙන මාගේ අසපුව හොබවමින් ගිරි දුර්ගයන්හි නාද කෙරෙත්.

4305 "ඇසළය, සපුය, පළොල්ය, නිකය, යොහොඹුය, අසොකය යන මේ වෘක්ෂයෝ මාගේ අසපුවෙහි පිපෙත්.

4306 රුකඟුණය, සීනිද්දය, සත්පෙති දෑසමන්ය. බිඹුදැල්ය, කණිණිකය, කිණිහිරිය යන මොවුහු මාගේ අසපුවෙහි පිපෙත්.

4307 "නාය, සල්ය, සලලය, හෙළපියුම්ය යන මොවුහු මෙහි පිපියාහු දිවසුවඳ හමමින් මාගේ අසපුව හොබවත්.

4308 "කුඹුක්ය, පියාය, උක්ය, සල්ය, පුවඟුය යන මේ වෘක්ෂයෝ එහි පිපිගියාහු මාගේ අසපුව හොබවත්.

4309 "අඹය, දඹය, මදටය, කොසඹය සල්කලණය යන මේ වෘක්ෂයෝ දිව සුවඳ හමමින් මාගේ අසපුව හොබවත්.

4310 "හෝපළුද ගිවුළුද හගිනිමාලය යන මොවුහු පිපිගියාහු දිව සුවඳ හමමින් මාගේ අසපුව හොබවත්.

4311 "රොපනය කරන ලද කොළොම්ය, කෙසෙල්ය එසේම සෘෂිමුද්ග නම් ධාන්‍ය විශෙෂය යන මොවුහු මාගේ අසපුව හොබවමින් නිතර එල දරත්.

4312 "අරළුය, නෙල්ලිය, අඹය, ජම්බුය, බුළුය, ඩෙබරය, බදුළුය බෙලිය යන මෙකී වෘක්ෂයෝ මාගේ අසපුවෙහි එල දරත්

4313 "(අසපුවට) නුදුරෙහි මනාවූ කුඩා තොටුපලවල් ඇති මනොඥවූ මන්දාලක පුෂ්පයන්ගෙන්ද පියුම් හා උපුල් වලින්ද ගැවසීගත් පොකුණකි.

**4314** "මාගේ අසපුවෙහි ඇතැම් පද්මයෝ කැකුළු හටගනිත්. ඇතැම් කෙසුරු සහිත පියුම් පිපෙත්. ඇතැම් දිග හැරුනු පත් ඇති පියුම් කර්ණිකාවෝද ප්‍රබොධ වෙත්.

**4315** "පාඨීන නම් මත්ස්‍යයෝ පෙටියෝද පාවුසනම් මත්ස්‍යයෝ (ලුල්ලුද) වලජනම් මත්ස්‍යයෝ (වලයෝද) මුඤ්ජනම් මත්ස්‍යයෝ (මොද්දු) ද රොහිත නම් මත්ස්‍යයෝ (රෙහෙරු) ද යන මොව්හු පැහැදි දියෙහි හැසිරෙමින් මාගේ අසපුව හොබවත්.

**4316** "නයිතාය, අම්බගන්ධිය, කෙතකිය යන මෙකී වෘක්ෂයෝ වාතය හමන දෙසට අනුව දිවසුවඳ හමමින් මාගේ අසපුව හොබවත්.

**4317** "නෙලුඹලවලින් නෙලුඹුදැලිවලින් කිරි හා ගිතෙල්ද වැගිරේ. දිවසුවඳ මීද හමවමින් මාගේ අසපුව හොබවත්.

**4318** "එහි ජලයෙන් සෙව්නාලද ආකීර්ණවූ වැලිතලාවෝ ශොභනයහ. උඩට නැඟුනු පුෂ්පයෝ පිපීයාහු මාගේ අසපුව හොබවමින් තිබෙත්.

**4319** "අඳුන් දිවිසම් හැඳි ජටාභාරයෙන් බරවූ වැහැරි සිවුරු දරණ සියළු (තවුසෝ) මාගේ අසපුව හොබවත්.

**4320** "වියදඬු පමණ දුර බලන්නාවූ ප්‍රාඥවූ සන්හුන් පැවතුම් ඇති කම්සුව අනුභවයෙහි බලාපොරොත්තු නැති (මෙම තවුසෝ) මාගේ අසපුවෙහි වසත්.

**4321** "වැසීගිය කිසිලි නිය ලොම් ඇති මැලියම් සහිත දත් ඇති ධූවීලි සහිත හිස් ඇති රජස් දැලි වැකුණු (සිරුරු ඇති) මේ සියලු තවුසෝ මාගේ අසපුවෙහි වෙසෙත්.

**4322** "අභිඥාවන්ගේ පරතෙරට පැමිණි අහසෙහි හැසිරෙන්නාවූ ඒ මේ තවුසෝ අහසට නගිමින් මාගේ අසපුව හොබවත්.

**4323** "එකල්හි (මම) එම ශිෂ්‍යයන් විසින් පිරිවරන ලදුයේ මහවෙනෙහි වසමි. හැමකල්හි ධ්‍යානයට සමවැදුනේ රෑ දාවල් නොදනිමි.

**4324** "එසමයෙහි ලොකනායකවූ භාග්‍යවත්වූ අත්ථදස්සී බුදුරජතෙම ඝනාන්ධකාරය දුරුකරමින් (ලොව) පහළවිය.

4325 "ඉක්බිති එක්තරා ශිෂ්‍යයෙක් මාගේ සමීපයට පැමිණියේය. හෙතෙම මන්ත්‍රයන්ද ෂඩංග හා ලක්ෂණයන්ද හදාරනු කැමැත්තේය.

4326 "මහාමුනිවූ අත්ථදස්සී බුදුරජතෙම ලොව පහළ විය. (උන්වහන්සේ) චතුස්සත්‍යය පවසමින් අමෘත පදයවූ නිවන දෙශනා කරන සේක.

4327 "(මම) තුටු පහටුවූයේ ප්‍රමුදිතවූයේ ධර්මය තුළ පිවිසි සිත් ඇත්තේ අසපුවෙන් නික්ම මෙම වචනය කීමි.

4328 "දෙතිස් මහපුරිස් ලකුණින් යුත් බුදුරජතෙම ලොව පහළවිය. සියල්ලෝ එව්. සම්බුදු රජුන් වෙත යන්නෙමුය කියායි.

4329 "සදහම්හි පරතෙරට ගිය අවවාදයට අනුව කටයුතු කරන උත්තමාර්ථයවූ නිවන සොයන ඔවුහු මැනවැයි (එම වචනය) පිළිගන්නාහුය.

4330 "ජටාබරින් බරවූ අඳුන් දිවිසම් හඳින ඔවුහු උත්තමාර්ථයවූ නිවන සොයමින් එකල්හි වනයෙන් නික්මුනාහුය.

4331 "එකල්හි මහත් යශස් ඇති අත්ථදස්සී භාග්‍යවතුන් වහන්සේ සිව් සස් පවසමින් අමෘතපදයවූ නිවන දෙශනා කරන සේක.

4332 "මම ස්වෙතච්ඡත්‍රය ගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට දැරීමි එසේ සතියක් මුළුල්ලෙහි දරා සිට බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වැන්දෙමි.

4333 "ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ අත්ථදස්සී භාග්‍යවත්තෙමේ භික්ෂු සංඝයා මැද හිඳ මෙම ගාථාවන් වදාළේය.

4334 "යමෙක්තෙම පැහැදුනේ සියතින් ඡත්‍රයක් දැරීද හේ (කවරෙක්දැයි) මම කියන්නෙමි. එසේ කියන්නාවූ මාගේ වචනය අසව්.

4335 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ (භවයක) උපන්නාවූ මොහුට හැමකල්හි ඡත්‍රයක් දරන්නේය. ඡත්‍ර දානයාගේ මේ විපාකයයි.

4336 "(මෙතෙම) සත් සැත්තෑ කපක් දෙව්ලොව සිත් අලවා වසන්නේය. දහස් වරක් සක්විති රජ වන්නේය.

4337 "සත් සැත්තෑවරක් දිව්‍යරාජ්‍ය කරන්නේය. (කරවනු ලබන) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නොහැකිය.

4338 "අටළොස් සියවන (එක්දහස් අටසියවන) කපෙහි පසැස් ඇත්තාවූ ශාක්‍ය කුල ශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජ තෙමේ ගනඳුරු නසමින් (ලොව) පහළ වන්නේය.

4339 "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීම ධර්මයෙන් නිර්මිත කළාක් වැනි ඖරස බුද්ධ පුත්‍රයෙක්ව සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වසන්නේය." (කියායි)

4340 "යම් තැනක පටන් කොට මම බුදු රජුන් හට ඡත්‍රයක් (කුඩයක්) දරමින් කුශලකර්මයක් කෙළෙම්ද (එතැන් පටන් අද දක්වාවූ) මේ අතරෙහි ස්වෙතච්ඡත්‍ර නොදරණ ලද භවයක් නොදනිමි

4341 "මේ මාගේ පශ්චිම භවයයි. අන්තිම භවය (මේ) පවතී. අද පවා (මග) හැමකල්හි පවත්නාවූ ඡත්‍ර ධාරණය (කුඩ දැරීම) පවතී.

4342 "තාදි ගුණ ඇති අත්ථදස්සී බුදුරජුන්හට මා විසින් මැනවින් කරන ලද (ඒ ඡත්‍ර ධාරණ) කර්මය ආශ්චර්‍ය්‍යයකි. (මාගේ) සියළු ආශ්‍රවයන් ක්ෂය විය. දැන් නැවත ඉපදීමක් නැත. 4343-4345

## 423 තිණසූලක ඡදනීය ථෙරාපදානය

4346 "මම එකල්හි ජාති ජරාමරණයන් පිළිබඳව සිහි කෙළෙමි. එක්ව ගිහිගෙන් නික්ම අනගාර්‍ය්‍ය නම්වූ සසුනෙහි පැවිදි වීමි.

4347 "පිළිවෙලින් හැසිරෙන්නේ ගංතෙරට එළඹියෙමි. එහි ගංතෙරෙහි උඩට නැගී ගිය පොළොව දුටිමි.

4348 "මම එහි අසපුවක් සදාගන එම අසපුවෙහි වසමි. මැනවින් කරන ලද මාගේ අසපුව නොයෙක් පක්ෂි සමුහයාගෙන් යුක්තය.

4349 "(එම පක්ෂීහු) විශ්වාස ඇත්තාහු මා වෙත එළඹෙත්. මනහර ලෙස නාද ද කරත්. මම ඔවුන් සමග සිත් ඇලවූයේ අසපුවෙහි වෙසෙමි.

4350 "මාගේ අසපුව හාත්පස සිව්දිග නාද කොට ඒ මෘගරාජ (සිංහ) තෙම ඔහු වසන ගුහාවෙන් නික්ම හෙන පුපුරන්නාක් මෙන් ගර්ජනා කෙළේය.

4351 '(එම) මෘගරාජයා (සිංහයා) ගර්ජනය කළ කල්හි මට ප්‍රීතිය ඇතිවිය. මම එම මෘගරාජයා සොයන්නේ ලෝක නායකවූ බුදුරජුන් දුටිමි.

4352 "මම දෙවාති දෙවවූ තිස්ස බුදුරජුන් දැක සතුටු වූයේ සතුටු සිතින්ම නාග කෙශර (නාමල් රේණු) පිදීමි.

4353 "උදාවන හිරු වැනිවූ පිපුනු උතුම් සල් රුකක් වැනිවූ බබලන ඔසධි තාරකාවක් වැනිවූ ලොකනායකවූ බුදු රජහට ස්තුති කෙළෙමි.

4354 "සර්වඥයන් වහන්ස, ඔබ වහන්සේගේ ඥාණයෙන් මෙම දෙවියන් සහිත ලෝකයා (සසරින්) මිදුනේය. ඔබ වහන්සේ සතුටු කොටම (ඔවුහු) (මෙම) ජාති සංසාරයෙන් මිදෙත්.

4355 "සර්වදර්ශීවූ සර්වඥ බුදු රජුන්ගේ නොදැකීමෙන් රාග ද්වෙෂයන්ගෙන් පැතිරීගිය (සත්වයෝ) අවීචි නිරයෙහි වැටෙති.

4356 "සර්වඥයන් වහන්ස, ලෝකනායකයන් වහන්ස, ඔබවහන්සේගේ දර්ශනය නිසා සියල්ලෝ භවයෙන් මිදෙත්. අමෘතපදයවූ නිවන සපර්ශ කෙරෙත්.

4357 "යම් කාලයක් පසැස් ඇති ආලොකවත්වූ බුදුවරයෝ ලොව උපදිත්ද ඔවුහු කෙළෙස් දවා ආලොකය දක්වත්.

4358 "මෙසේ ලොකනායකවූ තිස්ස බුදුරජුන්හට ස්තුතිකොට ස්තුතිවූයේ සතුටු සිතින්ම බොලිද්ද (මල්) පිදීමි.

4359 "ලොකාග්‍රනායකවූ තිස්ස බුදුරජතෙමේ මාගේ අදහස දැන සිය අසුනෙහි වැඩහිඳ මෙම ගාථාවන් වදාළේය.

4360 "යමෙක් තෙම පහන් සිතැත්තේ සියතින්ම මා මල්වලින් වැසීද, මම ඒ කවරෙක් දැයි කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්.

4361 "හෙතෙම පස්විසිවරක් දිව්‍යරාජ්‍ය කරන්නේය. පන්සැත්තෑවරක් සක්විති රජ වන්නේය.

4362 "(කරවනු ලබන) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය. (මෙය) පුෂ්ප පූජාවෙහි (ජනිතවූ) එම කර්මයාගේ ඵලයයි.

4363 "පුණ්‍ය කර්මය හා සහයෝගිවූ මේ පුරුෂ තෙමේ හිස පටන් ජලස්නානය කළේ ඉදින් මල් කැමතිවේ නම් (අදහස් පිරිදී මල්) ඉදිරියෙහි පහළ වන්නේය.

4364 "කාම වස්තූන්ගෙන් යමක් යමක් කැමතිවේද, ඒ ඒ දැය පහළ වන්නේය. අදහස (නිවන් ලැබීම) සම්පූර්ණ කොට ආශ්‍රව රහිත පිරිනිවන් පාන්නේද වන්නේය.

(අටලොස්වෙනි බණවරයි)

4365 "කෙළෙස් දවා සම්‍යක් ප්‍රඥාවෙන් හා සිහියෙන් යුක්තවූයේ එම හසුනෙහි හිඳ රහත් බවට පැමිණියෙමි.

4366 "මම හැමකල්හි සක්මන් කරමින්ද නිදමින්ද හිඳිමින්ද, යලි සිටිමින්ද බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ ගැනම සිතා වසමි.

4367 "චීවර පිණ්ඩපාත (ගිලාන) ප්‍රත්‍යය සයනාසන යන මේ සිව් පසෙහි අඩු බවක් නැත බුද්ධ පූජාවෙහි මේ විපාකයයි

4368 "ඒ (මම) දැන් අමෘතවූ ශාන්තවූ නිරුත්තර පදයවූ නිවනට පැමිණියේ (වෙමි) සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

4869 "මින් දෙයනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියකින් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. (4470-4472)

## 414 මධුමංසදායක ථෙරාපදානය

4373 "මම බන්ධුමතී නගරයෙහි හුරු වැද්දෙක් වීමද (එකල්හි) කැවුතු පපුමස් ඉතිරිකොට ගෙන එම මස් මී පැණියෙහි දැමීමි.

4374 "මම භික්ෂූන් රැස්වන (ශාලාවට) ගොස් එක් පාත්‍රයක් ගතිමි. මම ඒ පාත්‍රය (යටකී) මසින් පුරා භික්ෂු සංඝයාට දුනිමි.

4375 "යමෙක් මේ භික්ෂු පිරිසෙහි වෘද්ධතර භික්ෂුව වීද හේ (එකල්හි) මට පින්දුන්නේය. (කෙසේද යත්?) පාත්‍ර පුරවා දුන් (දනින්) මහත් සුව ලබාවා,

4376 "(මෙම) කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ (දිව්‍ය මනුෂ්‍ය) ද්විවිධ සම්පත් අනුභවකොට අන්තිම භවය පවත්නා කල්හි ක්ලේශයන් දමන්නේය. (කියායි)

4377 "මම එහි සිත පහදවා තව්තිසාවට උත්පත්ති වශයෙන් ගියෙමි. එහි (දිව බොජුන්) අනුභවකොට (දිව පැන්) පානයකොට මහත්වූ සැප ලබමි.

4378 "මඩුවෙක්හි හෝ රුක්මුලක හෝ (හිඳ) පූර්වකර්මය සිහි කෙළෙම්ද එකෙණෙහි මට ආහාර පාන වැසී වසී.

4379 "මේ මාගේ පශ්චිම භවයයි. අන්තිම භවය (මේ) පවතී. මෙහිදු මට හැමකල්හි ආහාරපාන (වැසි) වසී.

4380 "මම එම මාංශ දානය කරනකොටගෙන භවයෙහි හැසිර සියළු ආශ්‍රවයන් ප්‍රහාණ (පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

4381 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මධු දානයාගේ මේ විපාකයයි. (4382-4384)

## 415 නාග පල්ලවක ථෙරාපදානය

4385 "මම බන්ධුමතී නගරයෙහි රජ උයනෙහි වසමි. මාගේ අසපුව හාත්පස (තැනක) ලොකනායකවූ බුදුරජතෙම වැඩහුන්නේය.

4386 "මම නාදළු රැගෙන බුදුරජුන් පිදීමි. පහන් සිත් ඇත්තේ සොම්නසවූයේ තථාගතයන් වහන්සේට වැන්දෙමි.

4387 මින් එක් අනූවන කපෙහි යම් (නා) දළු පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි බුද්ධ පූජාවෙහි මේ විපාකයයි (4388-4390)

## 416 එකදීපිය ථෙරාපදානය

4391 "ලොකනායකවූ සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි සියළු දිව්‍ය මනුෂ්‍යයෝ (එම) බුදුරජුන්හට පූජා කෙරෙත්.

4392 "සිද්ධාර්ථ බුදුරජුන් (ගේ ශ්‍රී දෙහය චිතකයට නැගූ කල්හි (සියල්ලෝ) තම තමනට හැකි පමණින් ශාස්තෘන් වහන්සේගේ චිතකයට පුදත්.

4393 "මම (එම) චිතකයට නුදුරෙහි පහනක් දැල්වීමි. මාගේ පහන හිරු උදාවනතුරුම දැල්වුනේය.

4394 "මම මැනවින් කරනලද එම කර්‍මය කරණකොටගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොටගෙනද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට උප්පත්ති වශයෙන් ගියෙමි.

4395 "එහි මට කරනලද (මැවුනු) විමානය එකදීපියයි කියනු ලැබේ. මාගේ විමනෙහි දසදහසක් ප්‍රදීපයෝ දැල්වෙත්.

4396 "හැම කල්හි මාගේ සිරුර උදාවන හිරු මෙන් බබලයි. මාගේ ශරීර ප්‍රභාවන් කරණකොටගෙන හැම කල්හි ආලොකය වේ

4397 "මම පවුරෙන් පිටද ශෛල පර්වතයෙන් පිටද පර්වතයද විනිවිද සියැසින් හාත්පස යොදුන් සියයක් දකිමි.

4398 "මම සත්සැත්තෑ වරක් දෙව්ලොවෙහි සිත්අල්වා විසීමි එක්තිස් වරක් දිව්‍ය රාජ්‍යය කෙළෙමි.

4399 "මම අටසිය වරක් සක්විති රජ වීමි (කරවනලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණින් වශයෙන් ගිණිය නොහැකිය.

4400 "දෙව්ලොවින් ච්‍යුතව මව්කුසෙහි ඉපදුනිමි. මව් කුසෙහි උපන්නාවූද මාගේ ඇස නොපියවේ. (ඇසිපිය නොවැටේ.)

4401 "උප්පත්තියෙන් සිව් වස් වූ මම අනගාර්‍ය්‍ය නම් වූ සසුනෙහි පැවිදිවීමි. (පැවිදිව) අඩමසක්පිරෙන්නට පෙර රහත් බවට පැමිණියෙමි.

4402 "දිවැස පිරිසිදු කෙළෙමි. සියළු භවයෝ නසන ලදහ. සියළු ක්ලෙශයෝ සිඳින ලදහ. එක පහනක් පිදීමෙහි මේ විපාකයයි.

4403 "පව්රෙන් පිටද ගල් පර්වතයෙන් පිටද හුදු පර්වතයද විනිවිද දකිමි. එක පහනක් පිදීමෙහි මේ විපාකයයි

4404 "මට විෂමස්ථානයෝ සමවෙති. අඳුරක් නොමැත. මම ඝනාන්ධකාරයක් නොදකිමි. එක පහනක් පිදීමෙහි මේ විපාකයයි.

4405 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් පහනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ප්‍රදීප දානයාගේ මේ විපාකයයි. 4406-4408

## 417 උච්ඡංග පුප්ඵිය ථෙරාපදානය

4409 "මම එකල්හි බන්ධුමතී නගරයෙහි මල්කරුවෙක් විමි. මල් උකුළක් (ඔඩොක්කුවක්) පුරවාගෙන ඇතුළු වීථියට ගියෙමි.

4410 "එසමයෙහි ලොක නායකවූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසංඝයා විසින් පිරිවරන ලදුයේ මහත්වූ ආනුභාවයෙන් (මාර්ගයෙහි) වඩියි.

4411 "ලොව බබුළුවන්නාවූ ලෝවැස්සන් සසරින් එතර කරන්නාවූ විපස්සී බුදුරජුන් දැක ඔඩොක්කුවෙන් මලක් ගෙන පිදීමි.

4412 "මින් එක්අනූවන කපෙහි යම් පුෂ්පදානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි. 4413-4415

## 418 යාගුදායක ථෙරාපදානය

4416 "එකල්හි (මම) මාගේ මාර්ගොපකරණද ගෙන ගමකට ගියෙමි. පිරීගිය නදිය දැක සංඝාරාමයකට එළඹියෙමි.

4417 "ආරණ්‍යකවූද ධුතාංගධාරීවූද ධ්‍යානකරන්නාවූද රූක්ෂා චීවර දරන්නාවූද විවේකයෙහි ඇළුනු ඒ ප්‍රාඥයෝ සංඝාරාමයෙහි වසත්.

4418 "මැනවින් කෙලෙසුන්ගෙන් මිදුනාවූ තාදී ගුණ ඇති ඔවුන්ගේ (සසර) ගමන (ඔවුන් විසින්) සිඳිනලදී. (දිය පිරෙමින්) ඇවිරුනු ගඟ ඇති බැවින් ඔවුහු පිඩු පිණිස නොයෙත්.

4419 "මම පහන්සිත් ඇතතේ සොම්නස් වූයේ ප්‍රීතිමත් වූයේ බඳිනලද ඇඳිලි ඇත්තේ මාගේ මාර්ගොපකරණවලින් සහල් ටිකක් ගෙන කැඳ දනක් දුනිමි

4420 "මම පහන් සිතැත්තේ සියතින්ම පස්නමකට කැඳ දන් දී ස්වකීය කර්මය විසින් වළක්වන ලදුයේ හෙවත් (මැරුණේ) මම තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4421 "(මට) තව්තිසා දෙව්ලොවෙහි මිණිමුවා විමණක් පහළවිය. (එම) උතුම් විමනෙහි දිව්‍ය ස්ත්‍රී සමූහයා සහිතව සතුටුවෙමි.

4422 "තෙතිස් වරක් දෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරවීමි. තිස්වරක් චක්‍රවර්ති මහා රාජ්‍යය කරවීමි.

4423 "(කරවනලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය. මම දෙව්ලොවෙ හිද මිනිස් ලොවෙහිද යසස් අනුභවකොට

4424 "පශ්චිම භවය පැමිණි කල්හි අනගාරයී නම්වූ සසුනෙහි පැවිදිවීමි. මම හිසකේ බෑ කෙණෙහි සියල්ල අවබොධ කෙළෙමි.

4425 "සිරුැර බය වශයෙන් මෙනෙහි කරන්නේ සිකපද දීමට පෙරටුවම රහත්බවට පැමිණියෙමි.

4426 "මා විසින් උතුම් දනක් මැනවින් දෙනලදී. වෙළඳාමක් මනාලෙස යොදනලදී. එම කැඳ දන කරණකොට ගෙනම අචල පදයවූ නිවනට පැමිණියේ වෙමි.

4427 "උපන්නාවූ ශොකයක් හෝ පරිදෙවයක් (වැළපීමක්) හෝ ව්‍යාධියක් හෝ ක්ලාන්තයක් හෝ චිත්තසන්තාපයක් නොදනිමි. කැඳ දනෙහි මේ විපාකයයි.

4428 "නිරන්තර පුණ්‍යක්ෂෙත්‍රයෙහි සංඝයාට කැඳ දන් දී අනුසස් පසක් ලබමි. කැඳ දනක් මැනවින් දෙනලදී. ආශ්චයර්‍යයකි.

4429 "මාගේ ලෙඩ නැති බව, රූමත් බව, වහා දහම පිළිපදින බව, ආහාර (සුලභව) ලබන බව හා පස්වෙනි අනුසස දීර්ඝායුෂ්ක බවයි.

4430 "යමෙක් සතුට උපදවමින් සංඝයා කෙරෙහි කැඳ දෙන්නේ නම් ඒ නැණවත් තෙමේ මේ අනුසස් පස ලබන්නේය.

4431 '(මින්) කප් තිස්දහසකට පෙර වූ එකල්හි යම් දනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. කැඳ දනෙහි මේ විපාකයයි. 4432-4434.

## 419 පත්ථොදන දායක ථෙරාපදානය

4435 "මම පෙර නිරතුරුවම වනයෙහි කටයුතු කරන වනයෙහිම හැසිරෙන්නෙක් වීමි. (සහල්) පතක් බත්ද ගෙන කර්මාන්තයට ගියෙමි.

4436 'එහිදී සියල්ල තෙමේම අවබොධ කරගත්තාවූ පස්මරුන් දිනූ සම්බුදුරජුන් දුටිමි. වනයෙහි පිඩු පිණිස නික්මෙන්නාවූ (උන්වහන්සේ) දැක සිත පැහැදවීමි.

4437 "අනුන්ගේ බැලමෙහෙ කිරීමෙහි යෙදුනාවූ මට පිණක්ද නැත. (දැන්) මේ (සහල්) පතක බත්ද ඇත. මම බුදුරජුන් වළඳවන්නෙමි.

4438 "එකල්හි මම (ඒ සහල්) පතක බත ගෙන බුදු රජුන්හට දුනිමි. මා බලා සිටියදීම තථාගතයන් වහන්සේ (එය) වැළඳූසේක.

4439 "මම මැනවින් කරනලද එම කර්මය හා චිත්ත ප්‍රණිධින් කරණකොටගෙන මිනිස් සිරුර හැර තව්තිසා දෙව් ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4440 "මම සතිස් වරක් ශක්‍රදෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරවීමි. තෙතිස් වරක් සක්විති රජවීමි.

4441 "(කරවනලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය. සුව ඇත්තේ යශස් ඇත්තේද වෙමි (සහල්) පතක පමණ බත් දන්දීමෙහි මේ විපාකයයි.

4442 "කුදුමහත් භවයෙහි සැරසරමින් අපමණ ධනය ලබමි. මාගේ භොග සම්පත්තියෙහි අඩු බවක් නැත පතක පමණ බත් දන් දීමෙහි මේ විපාකයයි.

4443 "මට ගඟ සැඩපහරක් මෙන් භොග සම්පත්තිහු නිපදෙත්. පමණ කරනට නොහැක්කෙමි. (සහල්) පතක පමණ දන් දීමෙහි මේ විපාකයයි.

4444 "මෙය කව, මෙය අනුභව කරව, මෙම ශයනයෙහි සයනය කරව" (යි කියන) එයින් මම සුඛිත වෙමි. (සහල්) පතක පමණ බත් දන් දීමෙහි මේ විපාකයයි.

4445 'මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම් (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (සහල්) පතක පමණ බත් දන්දීමෙහි මේ විපාකයයි. 4446-4448.

## 420 මඤ්චදායක ථෙරාපදානය

4449 'කාරුණිකවූ සිද්ධාර්ථ බුදුරජුන් පිරිනිවි කල්හි දෙව් මිනිසුන් සත්කාර කරන ලද (උන්වහන්සේගේ) සසුන පැතිරී යන කල්හි

4450 "මම එහි දික්සඟලා පුටු හා අනිකුත් පුටු කරන්නාවූ සැඩොලෙක් වීමි. එම කර්මාන්තයෙන් ජීවත්වෙමි. එයින්ම අඹු (දරු) වන්ද පොෂණය කරමි.

4451 "මම පහන්වූයේ සියතින්ම දික්සඟලා පුටුවක් මැනවින් කොට (තෙමේම) භික්ෂු සංඝයාට දුනිමි.

4452 "මම මැනවින් කරනලද එම කර්මයද චිත්ත ප්‍රණිධින්ද කරණකොටගෙන මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

4453 "දෙව්ලොව ගියේ තිදස්පුරයෙහි සතුටුවෙමි. කැමති පරිදි මාහැඟි සයනයෝ නිපදිත්.

4454 "මම පණස් වරක් දෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරවීමි අසූවරක් සක්විති රජ වීමි.

4455 "(කරවනලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය. සුඛිතවූයේ යශස් ඇත්තේද වෙමි. මඤ්චදානයාගේ මේ විපාකයයි.

4456 "ඉදින් දෙව්ලොවින් ච්‍යුතව මිනිසත් බවට එම් නම් මම මාහැඟි සයනයෝ තෙමේම පහළවෙත්.

4457 "මේ මාගේ පශ්චිම භවයයි. මේ අන්තිම භවය පවතී. අද පවා සයනය කරන කල්හි සයනයක් (කර්ම බලයත්) එළඹ සිටී.

4458 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මඤ්චදානයාගේ මේ විපාකයයි. 4459-4461.

## 43. සකිංසම්මජ්ජක වග්ග.

### 421. සකිංසම්මජ්ජක ථෙරාපදානය

4462 "විපස්සී බුදුරජුන්ගේ උතුම්වූ පාටලී (පළොල්) බොධි වෘක්ෂරාජයා දැක එහි සිත පැහැදවීමි.

4463 "එකෙණෙහි මම මුස්න ගෙන (බෝ) මළුව හැමැද්දෙමි. හැමද ඒ (පළොල්) පාටලී බොධියට වැන්දෙමි.

4464 "(මම) එහි සිත පහදවා හිසෙහි ඇඳිලිබැඳ ඒ බෝධියට වඳිමින් (ගෞරවයෙන්) නැමුනේ (ඉවත්ව) ගියෙමි

**4465** "(මම) උතුම් බෝධිය ගැන සිතමින් අඩිපාරකින් යමි. (එහිදී) මහත් බල ඇති ඝෝර ස්වරූප ඇති පිඹුරෙක් මං පෙළීය.

**4466** "මරණාසන්නයෙහි මා විසින් කරන ලද (බොධි පූජා) කර්මය (එහි) විපාකයෙන් මා සතුටු කරවීය. (පිඹුරා) මාගේ ශරීරය ගිලී. මම දෙව්ලොව සිත් අලවා වසමි.

**4467** "මාගේ සිත හැම කල්හි නිශ්චලය පිරිසිදුය නිර්මලය. ශොක ශූලයක් හෙවත් ශොකයෙන් ඇතිවන පීඩාවක් ගැන නොදනිමි. (එසේම) මාගේ චිත්ත සන්තාපයක්ද නෙ දනිමි.

**4468** "කුෂ්ටය ගණ්ඩ (ගෙඩි) ය කිලාස (කැසිලි) ය අපස්මාර (මීමැස්මොරය) විතච්ඡරිකා (සමගැලවීයන) කුෂ්ටය දද්දු (දදය) කණ්ඩු (ක සුම්) ය යන මේ රොගයන් මට නැත. මේ හැමදීමේ විපාකයයි.

**4469** "ශොකයද පිරිදෙව (වැළපීම) ය ද මාගේ හෘදයෙහි (සිතෙහි) නැත. භ්‍රාන්ත නොවූ (තැති නොගත්) ඍජුවූ සිත ඇත්තේ වේ. මෙය හැමදීමෙහි විපාකයයි.

**4470** "සමාධීන්හි නොඇලුනෙමි. සිත ප්‍රකට (පැහැදිලිවේ.) යම් යම් සමාධියක් කැමැත්තෙම් නම් ඒ ඒ සමාධිය මට සමෘද්ධ වේ.

**4471** 'ඇලියයුතු දැයෙහි නොඇලෙමි. යලි ද්වෙෂ කටයුතු දැයෙහි මුලා නොවෙමි. මෙය හැමදීමෙහි විපාකයයි.

**7742** "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම්කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. හැමදීමෙහි මේ විපාකයයි. (4473-4475)

## 422 එකදුස්සදායක ථෙරාපදානය

**4476** "(මම) හංසවතී නගරයෙහි තෘණාහරකයෙක් (තණ විකුණා ජීවත් වන්නෙක්) වීමි. තෘණ ගෙනවුත් විකිණීමෙන් ජීවත් වෙමි. එයින් අඹු (දරු)වන් පොෂණය කරමි.

**4477** "සර්වධර්මයන්ගේ පරතෙරට ගිය ලොකනායකවූ පදුමුත්තර නම් බුදුරජතෙම මොහාන්ධකාරය නසා (ලොව) පහළ විය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

4478 "එකෙණෙහි (මම) ස්වකීය ගෘහයෙහි හිඳ මෙසේ සිතීමි. බුදුරජතෙම ලොවපහළ විය. දෙය්‍ය ධර්මයක් (දිය යුතු දෙයක්) නැත.

4479 "මේ මාගේ එකම සාටක (වස්ත) යයි. මට (අනික්) දෙන කෙනෙක්ද නැත. නිරය ස්පර්ශය (නිරයෙහි දැමීම) දුකය. දක්ෂිණාවක් (දානමය පුණ්‍ය බීජයක්) රොපණය කරන්නෙමියි" (කියායි.)

4480 "මම මෙසේ සිතා සිය සිත පැහැදවීමි. මම (ඒ) එකම වස්ත්‍රය ගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

4481 "එකම වස්ත්‍රය දී අත්පොළසන් පැවැත්වීමි. ඉදින් මහාමුනීන් වහන්ස, වීරයන් වහන්ස, ඔබ බුදුවෙහි නම් මා (සසර සයුරින්) එතර කරනු මැනව.

4482 ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදු රජතෙමේ මාගේ දානය පසසන්නේ මට අනුමොදනා කළේය.

4483 "මෙම එකම වස්ත්‍ර දානය කරණකොට ගෙන ද චිත්ත ප්‍රණිධීන් කරණකොටගෙනද කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි (ඔබ) දුගතියකට නොයෙහිය.

4484 "සතිස්වරක් දෙවෙන්ද්‍රව දිව්‍ය රාජ්‍යය කරන්නෙහිය. තෙතිස් වරක් සක්විති රජ වන්නෙහිය.

4485 "(කරවනු ලබන) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය. ඔබ දෙව්ලොව හෝ මිනිස්ලොව හෝ භවයෙහි සැරිසරන්නේ,

4486 "රූමත්වූයේ ගුණවත්වූයේ අනුන් විසින් යටත් කළ නොහැකි දෙහයක් ඇත්තේ කැමති පරිදි නොකැළඹිය හැකි අපමණවූ වස්ත්‍ර ලබන්නෙහිය.

4487 "ප්‍රාඥවූ පදුමුත්තර නම්වූ බුදුරජතෙම මෙය වදාරා අහසෙහි (යන) හස්රජෙකු මෙන් අහසට නැංගේය.

4488 "දිව්‍යවූ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදීම්ද මාගේ භොග සම්පත්තියෙහි අඩු බවක් නැත. එකම වස්ත්‍ර දානයාගේ මේ විපාකයයි.

4489 "පියවරක් පියවරක් පාසා මට වස්ත්‍ර උපදී. වස්ත්‍ර යට සිටිමි. මාගේ (හිස) මතුයෙහි උඩුවියනකි.

4490 "මම අද කැමති වන්නේනම් සක්වල ගල පටන් කොට වනයන් සහිතව පර්වතයන් සහිතව ඒ හැමතැන වස්ත්‍රයන්ගෙන් වසන්නෙමි.

4491 "එම එකම වස්ත්‍ර දානය කරණකොට ගෙන කුදුමහත් භවයෙහි සැරිසරන්නේ ස්වර්ණ වර්ණව සැරිසරමි.

4492 "එකම වස්ත්‍ර දානයාගේ විපාකය කිසිතන්හි ක්ෂයට නොපැමිණියේය. මේ මාගේ අන්තිම ජාතියයි. මෙහිදීද මට (එය) විපාක දෙයි.

4493 "මින් ලක්ෂයක් වන කපෙහිවූ එකල්හි යම් වස්ත්‍රයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. එකම වස්ත්‍ර දානයාගේ මේ විපාකයයි. (4494-4496)

## 423 එකාසනදායක ථෙරාපදානය

4497 "හිමවතට නුදුරෙහි ගොසිත නම් පර්වතයක් විය. මට (එහි) අසපුවක් කරන ලදී. පන්සැලක්ද සාදන ලදී.

4498 එකල්හි (මම) නමින් 'නාරද' නම් වෙමි (ලෝවැස්සෝ) මා කස්සපයයිද දනිති. නිර්වාණ මාර්ගය සොයමින් ගොසිත පර්වතයෙහි වසමි.

4499 "සියළු ධර්මයන්ගේ පරතෙරට ගිය පදුමුත්තර බුදුරජතෙමේ විවේක සුව කැමැත්තේ අහසින් (එතැනට) වැඩියේය.

4500 "වන කෙළවරෙහි වඩින්නාවූ මහර්ෂිවූ බුදු රජාණන් වහන්සේගේ රශ්මිය දැක ලී ඇඳක් පණවා අඳුන් දිවිසමද ඇතිරීමි.

4501 "අසුන පණවා හිසෙහි ඇඳිලි බැද සොම්නස දන්වා මෙම වචනය කීමි.

4502 "මහාවීරයන් වහන්ස, (ඔබ) රෝගීනට ප්‍රතිකාර කරන ශල්‍යවෛද්‍යවරයෙක් වූයෙහිය. (ලොක) නායකයන් වහන්ස, රොගයෙන් ආතුරවූ මට බෙහෙත් දෙනු මැනව.

4503 "බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, මුනීන් වහන්ස, නිවන් කැමැත්තාවූ යමෙක් තුමූ ඔබවහන්සේද දකිත්ද, ඒ කාන්තයෙන් (ඔවුහු) අර්ථ සිද්ධියට පැමිණෙත්. මොවුන්ගේ භවය දැදුරු වේ. (අවසන් වේ.)

4504 "මම ස්වයං පතිත (ඉබේ ගසින් වැටුනු) ඵල අනුභව කරන්නෙක්ම ඔබවහන්සේට පිදිය යුතු දෙයක් මට නැත මාගේ මේ අසුන ඇත. ලී ඇඳෙහි (මැස්සෙහි) වැඩ හිඳිනු මැනව.

4505 'භාග්‍යවතුන් වහන්සේ නිර්භීතවූ සිංහරාජයෙකු මෙන් එහි වැඩහුන්සේක. මෙතෙක් කල්ගෙවා මෙම වචනය වදාළ සේක.

4506 "විශ්වාසය ඇත්තේවව, බිය නොවෙව, තා විසින් ජ්‍යොතිරස මැණික ලබන ලදී. තා විසින් යමක් පතන ලද නම් ඒ සියල්ල අනාගතයෙහි සම්පූර්ණ වන්නේය.

4507 "නිරුත්තරවූ පුණ්‍ය ක්ෂෙත්‍රයෙහි තා විසින් ඒ කරන ලද පුණ්‍ය කර්මය හිස් නොවේ. යම් අදහසක සිත පිහිටුවන ලද නම් ඒ අදහස තමා (සසර සයුරින්) ගොඩ ලන්නට සමත් වන්නේය

4508 "මෙම ආසන දානය කරනකොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොටගෙනද (ඔබ) කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි දුගතියකට නොයෙහිය.

4509 "පණස් වරක් දෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරන්නෙහිය. අසූවරක් සක්විති රජ වන්නෙහිය.

4510 "(කරවනු ලබන්නාවූ) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නොහැකිය. හැම තන්හි සුව ඇත්තේව සසරෙහි හැසිරෙන්නෙහිය." (කියායි.)

4511 "පදුමුත්තර නම්වූ බුදුරජතෙම මෙම වචනය කියා ආකාශයෙහි යන හස්රජෙකුමෙන් අහසට නැංගේය

4512 හස්තියානය අශ්වයානය රථ සහිතවූ සන්ද මානිකය යන මේ සියල්ල ලබමි. එකාසන දානයාගේ මේ විපාකයයි.

4513 "යම් කලෙක්හි වනයට පිවිසීද අසුනක් කැමති නම් මාගේ ඒ අදහස් දැන පයඞ්කයක් එළඹ සිටී

4514 "යම් කලෙක්හි ජලමධ්‍යයට ගියේද අසුනක් කැමති වෙම් නම් මාගේ අදහස දැන පළඟක් එළඹ සිටි.

4515 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදිම්ද, ඒ සියළු කල්හි සියක් දහසක් පයඞ්කයෝ මා පිරිවරත්.

4516 "දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි සැරිසරමි. ක්ෂත්‍රිය බ්‍රාහ්මණ යන දෙකුලෙහිම උපදිමි.

4517 "නිරුත්තරවූ පුණ්‍ය ක්ෂෙත්‍රයෙහි එක් අසුනක් පුදා දහම පළඟගෙන ආශ්‍රව රහිතව වෙසෙමි.

4518 "මින් සියක් දහස් වන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඒකාසන දානයාගේ මේ විපාකයයි. (4519-4521)

## 424 සත්තකදම්බ පුප්ඵිය ථෙරාපදානය

4522 "හිම වතට නුදුරෙහි කදම්බ නම් පර්වතයෙක් විය. එම පර්වත පාර්ශවයෙක්හි ඒ සත්බුදුවරයෝම වැඩවිසූහ.

4523 "පිපුණු කොළොම් ගසක් දැක ඇඳිලි බැඳගෙන මල් සතක් ගෙන පුණ්‍ය චිත්තයෙන් උඩට දැමීමි.

4524 "මැනවින් කරන ලද එම කර්මය කරණ කොට ගෙනද මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4525 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. 4526-4528

## 425 කොරණ්ඩ පුප්ඵිය ථෙරාපදානය

4529 "පෙර මම වන කාර්මිකයෙක් (වනයෙහි කටයුතු කරන්නෙක්) වීම. පිය මුතුන් පර පුරෙහි සිටම සිව්පාවුන් මැරීමෙන් ජීවත් වෙමි. මට පිනක් නැත.

4530 "මාගේ අසපුව හාත්පස (තැනකදී) පසැස් ඇති ලොකාග්‍රනායකවූ තිස්ස බුදුරජ තෙමේ පදත්‍රය (අනිත්‍ය-දුඃඛ-අනාත්ම)ලොකානු කම්පාවෙන් දැක්විය.

4531 "තිස්ස නම්වූ බුදුරජුන්ගේ තුබූ පියවර දැක සතුටු වූයේ සතුටු සිතින් පියවර සටහනෙහි සිත පැහැදවීමි.

4532 "මම පිපීගිය කරඬු ගසක්දැක (එම මල්) කිණිති සහිතව ගෙන ශ්‍රෙෂ්ඨ ශ්‍රීපාදයට පිදීමි.

4533 "මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොට ගෙනද මම මිනිස් සිරුර හැර තව්තිසාවට උත්පත්ති වශයෙන් ගියෙමි

4534 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යෝනියක උපදිම්ද මම කරඬුමල් පැහැයෙන් පැහැ ඇත්තේම ප්‍රභා සහිත වෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

4535 "මින් දෙයානුවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පදපූජාවෙහි මේ විපාකයයි. 4536-4538

## 426 සතමණ්ඩදායක ථෙරාපදානය

4539 "(සිව් සස් දහම් පිළිබඳව) මැනවින් සිතන ලද ලොකජෙ‍්‍යෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ මහ වනයට පිවිසියාවූ වාතා බාධයකින් පෙළුනාවූ බුදුරජුන් දැක සිත පහදවා ඉතා පිරිසිදු ගිතෙල් (ටිකක්) පිළිගැන්වීමි.

4540 "(මෙම පුණ්‍ය කර්මය) කරන ලද බැවින් රැස් කරන ලද බැවින් මේ භාගීරථී ගඟද, සිව් මහ සමුදුරද මට ගිතෙල් සපයති.

4541 "මේ ඝොරවූ අප්‍රමාණ්‍යවූ අසංඛෙය්‍යවූ පෘථිවිය මාගේ අදහස දැන විසිතුරු බවට පත්වේ

4542 "සිව්මහ දිවයිනෙහිවූ මේ සියළු වෘක්ෂ සමූහයෝ (වෙත්ද) ඒ සියල්ල මාගේ අදහස් දැන කල්පවෘක්ෂයෝවෙත්.

4543 "මම දෙවෙන්ද්‍රව පණස් වරක් දිව්‍ය රාජ්‍යය කර වීමි. එක් පණස් වරක් සක්විති රජවීමි. (කරවන ලද) මහත්වූ ප්‍රදෙශරාජ්‍යය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය.

4544 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් (ගිතෙල්) දනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පිරිසිදු ගිතෙල් දනෙහි මේ විපාකයයි 4345, 4547

## 427 සතධම්ම සවණිය ථෙරාපදානය

4548 "සියළු ධර්මයන්හි පරතෙරට ගිය පදුමුත්තර නම් බුදුරජ තෙමේ සිව්සස් පවසමින් බොහෝදෙනා (සසර සයුරින්) එතර කරවීය.

4549 "එසමයෙහි මම උග්‍ර තපස් ඇති ජටාධරයෙක් (තවුසෙක්) වීමි. එකල්හි වැහැරි සිවුරු කම්පනය කරවමින් අහසෙහි යමි.

4550 "මම බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ (හිසට) ඉහලින් යන්නට සමත් නොවෙමි. මම ශෛල පර්වතයක හැපුනු පක්ෂියෙකු මෙන් ගමන් කිරීම නොලබමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4551 "(පෙර) දියෙහි මෙන් කිම්දී මෙසේ අහසෙහි යමි. මාගේ මේ ඉරියාපථ විකොපනය (ඉරියව් වැරදීම) පෙර නොවූ විරූය.

4552 "ඒකාන්තයෙන් මෙය පරීක්ෂාකර බලන්නෙමි. මම අර්ථයක් (වැඩක්) ලබන්නෙම් නම් (සිදුකරගන්නෙම් නම්) ඉතා යෙහෙකැයි (සිතා) අහසින් බසින්නේ බුදුරජුන්ගේ ශබ්දය ඇසීමි.

4553 "එකල්හි සිත් ඇල විය යුතු ඇසියයුතු (කණට මිහිරි) වූ මනොඥවූ ස්වරයෙන් (හඬින්) අනිත්‍යතාව දෙසන්නාවූ උන්වහන්සේගේ ඒ වචනයම ඉගෙන ගතිමි.

4554 "මම අනිත්‍ය සංඥාව ඉගෙන මාගේ අසපුවට ගියෙමි. එහි දිවි ඇතිතාක් වසා කළුරිය කළේ වෙමි.

45 5 "අන්තිම අවස්ථාව පවත්නා කල්හි (මරණාසන්නයෙහි) (එම) ධර්මශ්‍රවණමය පිණ සිහිකෙළෙමි. මැනවින් කරන ලද එම කර්මය කොටගෙනද චිත්තප්‍රණිධීන් කරණ කොට ගෙනද මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි

4556 "මම කල්ප තිස් දහසක් දෙව්ලොව සිත් අලවා විසිමි. එක්පණස් වරක් දිව්‍ය රාජ්‍යයද කරවීමි.

4557 "මම එක්සිය වරක් සක්විති රජවීමි. (කරවනලද) ප්‍රදෙශ රාජ්‍යය මෙතෙකැයි ගණන් වශයෙන් ගිණිය නොහැකිය

4558 "මම කුදු මහත් භවයෙහි සුඛිතවූයේ ස්වකීය පුණ්‍ය (ඵල) ය අනුභව කෙළෙමි. (එසේම) කුදුමහත් භවයෙහි සැරිසරමින් එම සර්වඥ ස්වර) සංඥාව සිහිකරමි. අච්‍යුත පද නම්වූ නිර්වාණය කෙළවර ප්‍රතිවෙධ නොකෙළෙමි.

4559 "පිතෘගෘහයෙහි වැඩහිඳ (වඩන ලද ශ්‍රද්ධා වීර්‍ය්‍ය ආදි) ඉන්ද්‍රියයන් ඇති බැවින් භාවිතේන්ද්‍රියවූ ශ්‍රමණතෙම (බුදුරජ තෙම) (සිව්සස්) දක්වමින් දහම් දෙසන්නේ සංස්කාරයන් ගේ අනිත්‍ය බව වදාළේය. (කෙසේදයත්)

4560 "ඒකාන්තයෙන් සියළු සංස්කාරයෝ අනිත්‍යයහ. උත්පත්තිය හා විනාශය ස්වභාවකොට ඇත්තාහ. ඇතිව නැතිවෙත්. එම සංස්කාරයන් හෝ සන්සිඳීම සුවයකියි (කියායි)

4561 "ගාථාව ඇසීම හා සමගම පූර්ව (ධර්මශ්‍රවණ) සංඥාව සිහිකෙළෙමි. එම අසුනෙහිම හිඳ රහත් බවට පැමිණියෙමි.

4562 "උත්පත්තියෙන් සත් ඇවිරිදි කල්හි රහත්බවට පැමිණියෙමි. බුදුරජතෙම (මා) උපසම්පදා කරවිය. ධර්මශ්‍රවණයෙහි මේ විපාකයයි.

4563 "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් ධර්මයක් ඇසුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ධර්මශ්‍රවණයාගේ මේ විපාකයයි. 4564-4566

## 428 සුචින්තික ථෙරාපදානය

4567 "එකල්හි (මම) හංසවතී නගරයෙහි ගොවියෙක් වීමි. කෘෂිකර්මයෙන් ජීවත්වෙමි. එයින් (අඹු) දරුවන් පොෂණය කරමි.

4568 'එකල්හි කෙත මැනවින් සමෘද්ධය මාගේ ධාන්‍යද එල දරණ ලදී. සශ්‍ය පැසෙන කල පැමිණි කල්හි මම මෙසේ සිතිමි

4569 "යම්බඳුවූ මම ඉදින් අග්‍ර සශ්‍යය සංඝයාට නොදී වළඳන්නෙම් නම් එකල්හි ගුණ අගුණ (හොඳ නරක) දන්නාවූ මා වැනියනට එය නුසුදුසුය. නොහොබනේය,

4570 "මේ දෙතිස් මහාපුරිස් ලකුණින් හෙබි අසමසම බුදුරජ තෙමේය. නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රවූ සංඝතෙම ඉන් (එම බුදුරජුන් කෙරෙන්) ප්‍රභාවිතය

4571 "මම පළමුව එම සංඝයා කෙරෙහි නව ශශ්‍ය දානය දෙමි. මම මෙසේ සිතා සතුටුවූයේ පිනාගිය සිත් ඇත්තේද (වීමි)

4572 කෙතින් ධාන්‍ය ගෙනවුත් බුදුරජුන් වෙත එළඹියෙමි. නරශ්‍රෙෂ්ඨවූ ලොකජ්‍යෙෂ්ඨවූ සම්බුදු රජුන් වෙත එළඹ ශාස්තෘන් වහන්සේගේ සිරිපා වැඳ මෙම වචනය කියමි.

4573 "නව සශ්‍යයද ඇතිවිය. මුනීන්වහන්ස, දක්ෂිණාර්හයන් වහන්සේද ඔබ වෙහිය. පසැස් ඇත්තාණන් වහන්ස, අනුකම්පාව උපදවා (මෙය) ඉවසා වදාළ මැනව."

4574 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජතෙමේ මාගේ අදහස් දැන මෙම වචනය කීය.

4575 "(සුප්‍රතිපන්නාදී) ප්‍රතිපන්නයෝ සිව් දෙනෙකි. (සෝවාන් ආදී සිව්) ඵලයෙහි සිටියෝ සිව්දෙනෙකි. මේ ප්‍රඥාශීලයන්ගෙන් යුත් ඍජුභූත සංඝයායි.

4576 "පින් කැමැත්තාවූ භවසම්පත් දෙන පින්කම් හෙවත් ඖපදික පුණ්‍ය කර්ම කරන්නාවූ දන්දෙන මිනිසුන් හට සංඝයා කෙරෙහි දෙන ලද්ද මහත්ඵලවේ.

4577 "එම සංඝයා කෙරෙහි පිදියයුතුවූ නව ශස්‍යද එසේම එයින් අධික තවත් දැයද සඟුන් උදෙසා භික්ෂූන් සිය ගෙදරට වැඩමවා (තමා විසින්) ගෘහයෙහි යමක් පිළියෙල කරන ලද නම් එය ඔබ භික්ෂු සංඝයාට දෙනු මැනව.

4578 "මම සඟුන් උදෙසා භික්ෂූන් (සිය) ගෙදොරට වඩමවා මා විසින් යමක් ගෘහයෙහි පිළියෙල කරන ලදනම් (එය) භික්ෂු සංඝයාට දුනිමි.

4579 "මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධීන් කරණ කොට ගෙනද මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4580 "එහි මට කරන (පහළවූ) විමන ස්වර්ණ වර්ණය, ප්‍රභා සහිතය, සැටයොදුන් උසය. තිස් යොදුන් පුළුලය.

(එකුන් විසිවෙනි බණවරයි)

4581 "මාගේ භවනය (බොහෝ දෙනාගෙන්) ආකීර්ණය දිව්‍ය ස්ත්‍රී සමූහයාගෙන් ගැවසීගත්තේය. මම (එම) තව්තිසාවෙහි අනුභවකොට පානය කොට වසමි.

4582 "මම තුන්සිය වරක් දිව්‍ය රාජ්‍ය කරවිමි. පන්සිය වරක් සක්විති රජවීමි. (කරවන ලද) ප්‍රදෙශ රාජ්‍යය මෙතෙකැයි ගණන් වශයෙන් ගිණිය නොහැකිය.

4583 "කුදු මහත් භවයෙහි සැරිසරන්නේ අපමණ ධනය ලබමි. මාගේ භොගයෙහි අඩු බවක් නැත. නවශස්‍ය දානයාගේ මේ විපාකයයි.

4584 "හස්තියානය, අශ්වයානය, සිවිකාය, සන්දමානික නම් යාන විශෙෂය යන මේ සියල්ල ලබමි. නව ශස්‍ය දානයාගේ මේ විපාකයයි.

**4585** "අභිනව වස්ත්‍රද, අභිනව ඵලද, අභිනවවූ අග්‍ර රස භොජනද යන මේ සියල්ල ලබමි. නව ශස්‍ය දානයාගේ මේ විපාකයයි.

**4586** "කොසෙය්‍යය, කම්බලය, ඛෙමෙ (කොමු) ය, කප්පාසික (කපු) ය යන මේ සියළු වස්ත්‍ර විශෙෂ ලබමි. නව ශස්‍යදානයාගේ මේ විපාකයයි.

**4587** "දාසි සමූහයාද දාස සමූහයාද අබරණින් සරසන ලද ස්ත්‍රීහුද යන මේ සියල්ල ලබමි. නව ශස්‍යදානයාගේ මේ විපාකයයි.

**4588** "මට සීතය හෝ උෂ්ණය හෝ දැනීමක් හෝ නැත යලි මාගේ හෘදයෙහි චෛතසික එකෙකුදු නැත

**4589** "මෙය කව, අනුභව කරව මෙම ශයනයෙහි සයනය කරව යන මේ (මිහිරි වචන) සියල්ලම ලබමි. නව ශස්‍ය දානයාගේ මේ විපාකයයි.

**4590** "මේ මාගේ (භවනෙහි) අවසානයයි. දැන් අන්තිම භවය පවතී. අද පවා මාගේ (ඵලදුන්) දෙය්‍ය ධර්මයෙහි ඵලවිපාකය හැමකල්හි මා සතුටු කරයි.

**4591** "අති උතුම් සංඝ සමූහයා කෙරෙහි නව ශස්‍ය (දානය) දී මාගේ ඒ කර්මයට සුදුසුවූ අටඅනූසයක් අනුභවකරමි.

**4592** "මහත් භොග සම්පත් ඇත්තේ යශස් ඇත්තේ වර්ණවත් වූයේ වෙමි. හැමකල්හි මහත්වූ පක්ෂ (පිරිවර) ඇත්තේද නොබෙදුනු පිරිස ඇත්තේද වෙමි.

**4593** "පෘථිවිය ඇසුරු කළාවූ යමෙක් වෙත් නම් ඒ සියල්ලෝ මට ගරුබුහුමන කෙරෙත් යම්කිසි දෙය්‍ය ධර්මයෙක් වෙත් නම් එයද මම පළමු පළමුව ලබමි.

**4594** "බීක් සඟන මැද හෝ බුදුරජුන් හමුයෙහි හෝ දායකයෝ සියල්ලන් ඉක්මවා මටම දෙති.

**4595** "උතුම්වූ සංඝ සමූහයා කෙරෙහි පළමුකොට නවශස්‍ය දානය දී මම අනුසස් ලබමි. නවශස්‍ය දානයාගේ මේ විපාකයයි.

**4596** 'මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. නව ශස්‍ය දානයාගේ මේ විපාකයයි. 4597-4599

# 429 සොවණ්ණ කිංකිණිය ථෙරාපදානය

4600 "සැදැහැයෙන් ගිහිගෙන් නික්ම අනගාරයෑ නම්වූ සසුනෙහි පැවිදිවිමි. තපො කර්මයෙහි අපෙක්ෂිත වූයේ වැහැරි සිවුරු දරන්නෙක් වීමි

4601 "එසමයෙහි ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ අත්ථදස්සී භාග්‍යවත් තෙමේ මහාජනයා (සසර සයුරින්) තරණය කරමින් (ලොව) පහළ විය.

4602 "දැඩි ව්‍යාධියකින් ඒකාන්තයෙන් මාගේ බලයද ක්ෂය විය. බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිකොට වැලිතෙලෙහි උතුම් සෑයක්,

4603 "කොට මම සතුටු සිත් ඇත්තේ ඔදවැඩිසිතැත්තේ සියතින් රන් කිකිණිමල් විසිරවීමි. (පිදීමි)

4604 "මම බුදුරජුන් හමුවෙහි මෙන් සෑයට වතාවත් කෙළෙමි. තාදී ගුණ ඇති අත්ථදස්සී බුදුරජුන්හට කරන ලද එම චිත්ත ප්‍රසාදය කරණකොට ගෙන,

4605 "දෙව්ලොවට ගියේ මහත්වූ සැප ලබමි. එහි ස්වර්ණවර්ණවූයේ වෙමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

4606 "මට මනා අබරණින් සරසන ලද ස්ත්‍රීහු අසූ කෝටියකි. ඔහු තුමූ හැමකල්හි මට උවටැන් කෙරෙත්. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි

4607 "ගැටබෙර (ආදී) සැට දහසක් බෙරද සංඛයෝද පණාබෙරද යන භෙරීහු මනොඥ ලෙස නාද කෙරෙත්.

4608 "සැටවයස් කල්හි පිරිහෙන බල ඇති ත්‍රිමදගලිත මාතංග හස්ති කුලයෙහි උපන් ඇත්තුද මනාකොට සරසන ලද ඇත්තුද අසූහාර දහසක් දෙනා වෙති.

4609 "රුවන් දැල්වලින් ගැවසීගත්තේ මට උවටැන් කෙරෙත්. බල සෙනගෙහිද ඇත්තුන්ගේද අඩුබවක් මට නැත.

4610 "මම රන්කිකිණි මල් පිදීමෙහි විපාකය අනුභව කරමි අටපණස් වරක් දිව්‍යරාජ්‍යය කරවීමි.

4611 "මම එක් සැත්තෑවරක් සක්විති රජවීමි. මම මේ පෘථිවියෙහි පෘථිවි රාජ්‍යයද සියක් වරක් කරවීමි.

**4612** "ඒ (මම) දැන් අසංස්කෘතවූ සුදුද්දස (දැකීමට අතිශයින් දුෂ්කරවූ) නිවණට පැමිණියේ වෙමි. සියළු සංයෝජනයන් ක්ෂය කරන ලදුයේ වෙමි. දැන් නැවත ඉපදීමක් නැත.

**4613** "මින් අටලොස් සියවන කපකින් පෙර යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි. 4614-4616

## 430 සොණ්ණ කොන්තරික ථෙරාපදානය

**4617** "සිත්හි භාවනාවක් ලෙස වැඩිය යුතුවූ ආත්මය (සිත) දමනය කළාවූ සන්හුන්වූ ශ්‍රෙෂ්ඨ ප්‍රතිපදා මාර්ගයෙහි ගමන් කරන්නාවූ චිත්ත ව්‍යපසමයෙහි ඇලුනාවූ සියල්ල අවබොධ කළවූ,

**4618** "තරණය කරනලද චතුරොඝ ඇති ධ්‍යාන කරන්නාවූ ධ්‍යානයෙහි ඇලුනාවූ මොනෙය්‍ය ගුණයන්ගෙන් යුතුවූ වැඩහුන්නාවූ සමාධියට සමවැදුනාවූ උපුල් පෙති පැහැ ඇති සම්බුදුරජුන් (දුටිමි)

**4619** "(දැක) ලබු කැටයකින් දියගෙන බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹියෙමි. බුදුරජුන්ගේ සිරිපාදොවා මම ලබුකැටය දුනිමි.

**4620** "පදුමුත්තර බුදුරජතෙමේ මෙම ලබු කබලින් දිය ඉවත් කොට මාගේ පාමුල තබවයි අණකෙළේය.

**4621** "මම බුද්ධ ගෞරවයෙන් යහපතැයි පිළිවදන්දී ලබු කබලින් දිය ඉවත්කොට බුද්ධශ්‍රෙෂ්ඨයන් වෙත එළඹීමි.

**4622** "මහාවීරවූ බුදුරජතෙමේ මට ලබුකබල් දනින් තාගේ අදහස් සමෘද්ධවේවා" යි මාගේ සිත නිවමින් අනුමෝදනා කෙළේය.

**4623** "මම පසළොස් කපෙක්හි දෙව්ලොව සිත් අලවා විසීමි. එසේම (මම) තිස්වරක් සක්විතිරජ වීමි.

**4624** "දවල්හි හෝ රැයෙහි හෝ සක්මන් කරන්නාවූද සිටින්නාවූද මාගේ ඉදිරියෙහි රන් කෙණ්ඩියක් ගෙන (කිසිවෙක්) සිටිත්.

**4625** "බුදුරජුන්හට ලබුකබලක් පුදා රන් කෙණ්ඩියක් ලබමි. තාදී ගුණ ඇති උතුමන් කෙරෙහි ස්වල්ප වශයෙන් කරන ලද පිණද මහත් බලවේ.

**4626** "මින් සියක්-දහස්වන කපෙහිවූ එකල්හි යම් ලබුකබල් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ලබුකබල් දනෙහි මේ විපාකයයි. 4627-4629

## 431 එක විහාරික ථෙරාපදානය

**4630** "මේ මහා භද්‍ර කල්පයෙහි බ්‍රාහ්මණ කුලයෙහි ජාතවූ මහත් යසස් ඇති කථා කරනවුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨවූ ගොත්‍රයෙන් කාශ්‍යප නම්වූ (බුදුරජ තෙම) ලොව පහළවිය

**4631** "(මම සර්වඥතෙම) ප්‍රපඤ්ච (කෙලෙස්) විරහිතය. අරමුණු නිත්‍ය ශුභ ආදී වශයෙන් නොගන්නෙක. (මෛත්‍රියෙන්) ආකාශය හා සම සිත් ඇතියෙක. ශූන්‍යතාලක්ෂණවූ නිවණ අරමුණු කිරීම්. බහුලකොට ඇත්තෙක, තාදී ගුණ ඇතියෙක. අනිමිත්ත ලක්ෂණවූ නිවණෙහි ඇළුනෙක. චිත්ත වශිතාවෙන් යුතු කෙනෙක.

**4632** "(අරමුණුවල) නොඇලෙන සිත් ඇත්තෙක, කෙලෙස් නැත්තෙක කුලයා කෙරෙහිද ගණයා කෙරෙහිද නොගැටුනු කෙනෙක. මහා කරුණාවෙන් යුතු කෙනෙක, වීර ගුණ ඇති කෙනෙක. හික්මවීමෙහිවූ උපායෙහි දක්ෂයෙක.

**4633-4634-4635-4636** "අනුන්ගේ කටයුතුවල යෙදුනෙක, කුරවි කොවුලනට බඳු හඬ ඇති කෙනෙක, ලොකයෙහි අනාථයනට නාථවූවෙක බඹ ගොස ඇතියෙක, (සසර කතරෙහි) මංමුළාවූ (යහමගට පමුණුවන) නායකයෙකු නැති (දුඃඛිතයන්) සංසාර මහා දුර්ගයෙන් ගොඩලමින් දුර්ගති නමැති මඩ වියලන්නාවූ නිර්වාණගාමී මාර්ගයවූ ජරා මරණ වලක්වන්නාවූ උතුම් අස්වැසිල්ලවූ අමෘතවූ නිර්මල ධර්මය දෙශනා කරන්නාවූ ඒ මහා පිරිස් මැද වැඩහුන්නාවූ ලොකයා සසර සයුරින් එතර කරන්නාවූ තථාගතවූ ලොකනායක තෙම මා විසින් දක්නා ලදී. උන්වහන්සේගේ ධර්මය අසා අනගාරයෑ නම්වූ සසුනෙහි පැවිදි විමි.

**4637** "එකල්හි මම පැවිදිව බුදුසසුන ගැන සිතමින් (පැවිද්ද පළමු තුබූ) සංසර්ගය (සිහිව ඉන්) පෙළෙමින් රම්‍යවූ වනයෙහි හුදකළාවම විසීමි.

**4638** "(කුලයා කෙරෙන්ද ගණයා කෙරෙන්ද) වෙන්වූ සිත් ඇති සංසර්ගයෙහි භය දක්නාවූ මාගේ ස්වකීය කයද (ජනයා කෙරෙන්) වෙන්වීය. නිර්වාණය හේතුවූ මාර්ගයද මට ඇතිවිය. 4639-4641

## 432 එක සංඛිය ථෙරාපදානය

**4642** "විපස්සී බුදුරජුන්ගේ මහා බොධි පූජාවක් විය. මහජනයා රැස්ව උතුම් බොධියට පූජා කෙරෙත්.

**4643** "යම් ශාස්තෘවරයෙකුගේ බොධියද මෙබඳු පූජනීය වස්තුවක් නම් ඒ උතුමා ලාමක කෙනෙකැයි නොහඟිමි. බුද්ධ ශ්‍රෙෂ්ඨයෙක් වන්නේය.

**4644** "ඉක්බිති සකක් ගෙන බෝරුක ගෙන එළඹියෙමි. මුළු දවසෙහිම එය පිඹිමින් උතුම් බොධිය වැන්දෙමි.

**4645** "කරන ලද (එම) පුණ්‍ය කර්මය මරණාසන්න කල්හි (මා) දෙව්ලොවට පැමිණ වීය. මාගේ සිරුර (අප්‍රාණිකව) වැටිනි. මම දෙව්ලොව සිත් අලවා වසමි

**4646** "තුටුපහටුවූ ප්‍රමුදිතවූ සැටදහසක් තූර්‍ය්‍ය (වාදක) යෝ හැමකල්හි මට උවටැන් කෙරෙත්. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**4647** "එක්සැත්තෑවන කපෙහි සිව් මහ දිවයින් හා සිව් සයුරු කෙළවර කොට ඇති පෘථිවියට අධිපතිවූ සතුරු රජුන් ජයගන්නා සුළුවූ (විශෙෂයෙන්) ජම්බුද්වීපයට අධිපතිවූ සුදස්සන නම් (සක්විති) රජෙක් වීමි.

**4648** "යලි (එහි) සප්තාංගික තූර්‍ය්‍යයෝ හැමකල්හි මා පිරිවරත්. ස්වකීය කර්මය අනුභව කරමි. (බොධි) උපස්ථානයාගේ මේ විපාකයයි.

**4649** "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදිම් නම් මව් කුස පිළිසිඳ ගත්තාවූද (මට) හැමකල්හී භෙරීහු වාදනය කෙරෙත්.

**4650** "සම්බුදු රජුන් වෙත එළඹ සම්පත් අනුභව කොට අතිශයින් ක්ෂෙමවූ ශිවවූ අමෘතවූ අචල පදය වන නිවනට පැමිණියේ වෙමි.

**4651** "මින් එක් අනුභව කපෙහි එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. (4652-4654)

## 433 පාටිහීර සඤ්ඤක ථෙරාපදානය

**4655** "එකල්හි ලෝකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර නම් බුදුරජතෙම රහත් ලක්ෂයක් සමග නුවරට පිවිසියේය.

**4656** "තාදී ගුණ ඇති උපශාන්තවූ (උන්වහන්සේ) නගරයට පිවිසෙන කල්හි (තුමූම) බැබලුනාහ. එකෙණෙහි මහත් ඝොෂාවක්ද විය.

**4657** "නගරයට පිවිසෙන්නාවූ බුදුරජුන් ඉදිරියෙහි (එම බුදුරජාණන් වහන්සේගේ ආනුභාවයෙන් භෙරිවාදයෝ (තුමූම) වීණාවෝ ශබ්ද වූවාහුය. (තුමූම) වැයෙත්.

**4658** "මහා මුනිවූ පදුමුත්තර නම් බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ නොදකිමි. එහෙත් ප්‍රාතිහාර්‍ය්‍යය දැක එහි සිත පැහැද වීමි.

**4659** "බුදුරජතෙම ආශ්චර්‍ය්‍යයකි. ධර්මය ආශ්චර්‍ය්‍යයකි. අපගේ ශාස්තෘ සම්පත්තියද ආශ්චර්‍ය්‍යයකි. අචෙතනවූ තූර්‍ය්‍යයෝ පවා තුමූම වැයෙත්.

**4660** "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් බුද්ධ සංඥාවක් ලදු වේද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ සංඥාවෙහි මේ විපාකයයි. (4661-4663)

## 434 ඤාණථවික ථෙරාපදානය

**4664** "කිණිහිරි රුකක් මෙන් දිලිසෙන ප්‍රදීපවෘක්ෂයක් මෙන් බබලන ස්වර්ණයක් මෙන් දීප්තිමත් බුදුරජුන් දිටිමි.

**4665** "මම ධර්ම කරකයද වැහැරී සිවුරද කෙණ්ඩියද තබා අඳුන් දිවිසම එකක්කොට බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට ස්තුති කෙළෙමි.

**4666** "මහාමුනීන් වහන්ස, (ඔබ) මොහ දැලින් අවුල්වූ ගණදුරු නසා නුවණ නැමැති එළියද දක්වා (සසර සයුර) තරණය කෙළේ වෙහිය.

**4667** "මෙම ලොකයා (සසරින්) ගොඩ දමහිය. ලොකය යම්තාක්ද ඒතාක්ද පැතිරීගිය සියල්ල සහිතවූ අනුත්තර නිර්වාණයද (විෂය කොට ඇති) ඔබවහන්සේගේ නුවණෙහි උපමාවක් නම් නැත.

**4668** "සර්වඥයන් වහන්ස, (ඔබට) එම ඥානය කරණ කොටගෙන බුද්ධයයි කියනු ලැබේ. මහාවීරයන් වහන්ස සියල්ල පිළිබඳ දැනීම ඇති ඒ සර්වඥතා ඥානයද අනාවරණ ඥානයද වඳිමි.

**4669** "මම මින් සියක් දහස් වන කපෙහි බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට ස්තුති කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සර්වඥතා ඥානයට පැසසීමෙහි මේ විපාකයයි. (4670-4672)

## 435 උච්ඡුඛණ්ඩික ථෙරාපදානය

**4673** "මම බන්ධුමතී නගරයෙහි ද්වාරපාලකයෙක් වීමි. (එකල්හි) නිර්මලවූ සියළු ධර්මයන්ගේ පරතෙරට ගියාවූ බුදුරජුන් දුටිමි.

**4674** "මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ මහර්ෂිවූ විපස්සී නම් බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේහට උක් කැබැල්ලක් ගෙන දුනිමි.

**4675** "මින් එක් අනූවන කපෙහි එකල්හි යම් උක් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. උක් කැබලි දනෙහි මේ විපාකයයි. (4676-4678)

## 436 කලම්බදායක ථෙරාපදානය

**4679** "රොමස නම් සර්වඥ තෙමේ කඳු අතරෙහි වැඩ වෙසේ. පහන් වූයේ (මම) උන්වහන්සේට සියතින් විලපලා ටිකක් දුනිමි.

**4680** "මින් සිවු අනූවන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. විලපලා දානයෙහි මේ විපාකයයි (4681-4683)

## 437 අම්බාටක දායක ථෙරාපදානය

**4684** "මහවනයෙහිදී සියල්ල තෙමේම දත් පස්මරුන් දිනූ බුදුරජුන් දැක මම ඇඹරැල්ල (ගෙඩියක්) ගෙන (එම) බුදුරජුන්හට දුනිමි.

**4685** "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි (4686-4688)

## 438 හරීතකදායක ථෙරාපදානය

**4689** "අරළු, නෙල්ලි, අඹද ජම්බුද, බුළුද, ඩෙබරද, බදුළුද බෙලිද තෙමේම හැරගෙන එමි.

**4690** "පබ්භාර (කන්දකවූ විවේකස්ථානයක වැඩහුන් ධ්‍යාන කරන්නාවූ ධ්‍යානයෙහි ඇළුනාවූ ආබාධයකින් පෙළෙන්නාවූ (සමාන කළ හැකි) දෙවැන්නෙකු නැත්තාවූ බුදුරජුන් දැක

**4691** "මම අරළු ගෙඩියක් ගෙන බුදුරජුන්හට දුනිමි. බෙහෙත කළ කෙනෙහි රෝගය සන්සිඳුනේය.

**4692** "සන්සිඳුනාවූ (කාය) දරථය (ක්ලාන්තය) ඇති බුදුරජතෙම අනුමොදනාවක් කෙළේය. මෙම බෙහෙත් දන කරණකොටගෙන ද රොග ව්‍යපසමනය කරණකොට ගෙනද

**4693** "දෙව්වූයේ හෝ මිනිස්වූයේ හෝ අන් ජාතියක උපන්නේ හෝ ඒ සියළු තන්හි සැප ඇත්තෙක් වෙහිවා තොපට ව්‍යාධියක් නොපැමිණේවා,

**4694** "සියල්ල තෙමේම අවබොධ කළාවූ පස්මරුන් අනූ ප්‍රාඥවූ සර්වඥ තෙම මෙම වචන කියා අහසෙහි හස් රජෙකු මෙන් අහසට නැංගේය

**4695** "යම් තැනක පටන් සියල්ල තෙමේම දත් බුදු රජුන්හට අරළු දුනිම්ද, (එතැන්පටන්) මෙම ජාතිය දක්වා මට ව්‍යාධියක් හට නොගත්තේය.

**4696** "මේ මාගේ (සසරෙහි) අවසානයයි (දැන්) අන්තිම භවස පවතී. ත්‍රි විද්‍යාවෝ ප්‍රත්‍යක්ෂකරන ලදහ. බුදු රජාණන් වහන්සේගේ සසුන කරන ලදී.

4697 "මින් සිව්අනූවන කපෙහිවූ එකල්හි (යම්) බෙහෙත් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බෙහෙත් දනෙහි මේ විපාකයයි. (4698-4700)

## 439 පිණ්ඩිය ථෙරාපදානය

4701 "එකල්හි (මම) රාජවාහන යෝග්‍යවූ උඩට දික්ව වැඩුනු දළඇති ඇත්රජෙක් වීමි. මහවෙනෙහි ඇවිදින්නේ ලොකනායකවූ බුදුරජුන් දුටිමි.

4702 "මම අඹ පිඩක් ගෙන ශාස්තෘන් වහන්සේට දුනිමි. මහාවීරවූ සිද්ධාර්ථ බුදුරජතෙම (එය) පිළිගත්තේය.

4703 "එකල්හි සර්වඥතෙම මා බලා සිටියදී එය වැළඳීය. මම එහි සිත පහදවා තුෂිත දිව්‍යලොකයෙහි උපනිමි.

4704 "මම ඉන් චුතව සක්විතිරජ වීමි. මේ ක්‍රමයෙන්ම සම්පත් අනුභවකොට

4705 "වීර්‍ය්‍ය වඩන ලද මම උපශාන්තවූයේ උපධි රහිතවූයේ සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

4706 "මින් සිව්අනූවන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. (4707-4709)

## 440 ජම්බුඵලිය ථෙරාපදානය

4710 "ලොක ජ්‍යෙෂ්ඨවූ තාදී ගුණ ඇති පිඩු පිණිස හැසිරෙන්නාවූ උතුම් යසස් ධරවූ පදුමුත්තර බුදුරජුන්හට

4711 "මම අග්‍රවූ (පළමුවෙන්ම හැදුනු) ජම්බු (දඹ) ඵලයක් ගෙන පැහැද සිතින් දක්ෂිණාර්හවූ වීරවූ ශාස්තෘන් වහන්සේට දුනිමි.

4712 "ද්වීපදොත්තමයන් වහන්ස, ලොක ජ්‍යෙෂ්ඨයන් වහන්ස, (මම) එම කර්මය කරණකොටගෙන ජය පරාජය හැර අචල ස්ථානයවූ නිවනට පැමිණියේ වෙමි.

4713 "මින් සියක්දහස් වන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අග්‍ර ඵල දානයාගේ මේ විපාකයයි. 4714-4715.

# 45 විහිටක වග්ග.

## 441 විහිටක මිඤ්ජිය ථෙරාපදානය

4716 "සියළු ධර්මයන්ගේ පරතෙරට ගිය ඒ කකුසඳ බුදුරජතෙමේ සමූහයා කෙරෙහි වෙන්ව වනයට වැඩියේය.

4717 "මම (බුළු) ඇට මද ගෙන වැලක ඇව්නීමි. භාග්‍යවත් තෙම එසමයෙහි කඳු අතරෙහි ධ්‍යාන කෙරෙයි.

4718 "මම (එම) බුදුරජුන් දැක පැහැදි සිතින් වීරවූ දක්ෂිණාර්හවූ බුදුරජුන්හට (බුළු) ඇට මද දුනිමි.

4719 "මෙම කපෙහිවූ එකල්හි යම් ඵල දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුළු ඇට මද දීමෙහි මේ විපාකයයි

4720 "මාගේ ක්ලෙශයෝ දවනලදහ. සියළු භවයෝ නසන ලදහ. ඇතෙකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

4721 "ඒකාන්තයෙන් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සමීපයට මාගේ පැමිණීමක් විය. පමුණුවනලද ත්‍රිවිද්‍යා ඇත්තෝය. බුදුරජාණන් වහන්සේගේ සසුන කරනලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් විහිටක මිඤ්ජිය තෙරුන් වහන්සේ මෙම ගාථාවන් වදාළසේක.

(මෙතැන සිට ථෙර අපදාන අවසානය දක්වා (536 අපදානය හැර) 4720, 4721 ගාථා අපදාන අගට යොදාගත යුතුයි. අවසාන වාක්‍යවලට ඒ ඒ තෙරුන් වහන්සේලාගේ නාම යොදාගත යුතුයි)

## 442 කොලදායක ථෙරාපදානය

4722 "එකල්හි අඳුන්දිව් සම හැඳි මම වැහැරි බර උසුලන්නේ (එහි මාලා) අසපුවට ඩෙබර ගෙනාවෙමි.

4723 "එසමයෙහි ශ්‍රෙෂ්ඨ පුද්ගලවූ අසහාය පුද්ගලවූ සිඛී බුදුරජතෙම ලොව පහළවිය. හැම කාලයක් දන්නාවූ එම (සර්වඥ තෙම) මාගේ අසපුවට එළඹියේය.

4724 "මම බුදුරජුන්හට වැඳ සිය සිත පහදවා දොහොතින් ඩෙබර (ඵලයක්) ගෙන දුනිමි.

4725 "මින් එක්තිස් වන කපෙහිවූ එකල්හි යම් ඩෙබර ඵල දානයක් දුනිම්ද ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. ඵලදානයාගේ මේ විපාකයයි 4726, 4727

## 443 බිල්ලඵලිය ථෙරාපදානය

4728 "මා විසින් චන්ද්‍රභාග නදීතීරයෙහි බෙලිගස්වලින් ගැවසීගත් නොයෙක් වෘක්ෂයන්ගෙන් සෙවුනාලද අසපුවක් මනාකොට කරනලදී.

4729 "සුවඳවත් බෙලි (ගෙඩියක්) දැක බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත් කෙළෙමි. සතුටු වූයේ ඉපිලීගිය සිත් ඇත්තේ කදක් පුරවාගෙන,

4730 "කකුසඳ බුදුරජුන් වෙත එළඹ මම පුණ්‍යක්ෂෙත්‍රවූ වීරවූ උන්වහන්සේට පැහැදී සිතින් (එම) බෙලිගෙඩිය දුනිමි.

4731 "මෙම කල්පයෙහිවූ එකල්හි යම් ඵලයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 4732-4733.

## 444 හල්ලාතකදායක ථෙරාපදානය

4734 "උතුම් දෙතිස් මහාපුරුෂ ලක්ෂණ ඇති ස්වර්ණ වර්ණවූ වනය ඉහළින් ගමන්කරන්නාවූ පිපුණු සල්රුකක් වැනිවූ (බුදු රජුන් දුටිමි.)

4735 "මම තණ ඇතිරියක් පණවා බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට ආයාචනය කෙළෙමි. (කෙසේද යත්?) බුදුරජ තෙම අනුකම්පා කෙරෙත්වා, භික්ෂාව දෙන්නට කැමැත්තෙමියි කියායි.

4736 "ලොවට අනුකම්පා කරන්නාවූ කාරුණිකවූ මහත් යසස් ඇති අත්ථදස්සී බුදුරජතෙම මාගේ අදහස දැන මාගේ අසපුවෙහි බැස්සේය.

4737 "බුදුරජතෙම අහසින් බැස පන් ඇතිරිලියෙහි වැඩහුන්නේය. මම බඳුළු ඵල ගෙන ගොස් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

4738 'එකල්හි සර්වඥතෙම මා බලා සිටියදී එය වැළඳීය. එහි සිත පහදවා එකල්හි (ම) බුදුරජුන් වැන්දෙමි.

4739 "අටළොස්සිය වන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 4740-4741

## 445 උත්තලි පුප්ඵිය ථෙරාපදානය

4742 "මැනවින් බැසගත් මුල් (හා) ඇටුවම් ඇති කොළවන් රැස් ඇති නාගවෘක්ෂ (නුගරුක) බොධියෙහි උත්තලි මල් ගෙන පිදීමි.

4743 "මෙම කල්පයෙහිම යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බොධි පූජාවෙහි මේ විපාකයයි. 4744.

## 446 අම්බාටකිය ථෙරාපදානය

4745 "වෙස්සභූ බුදුරජතෙම මැනවින් පිපීගිය සල් වනයකට පිවිස ගිරිදුර්ගයන්හි විශිෂ්ට ජන්ම ඇති සිංහ රාජයකු මෙන් වැඩහුන්නේය.

4746 "පුණ්‍ය ක්ෂෙත්‍රවූ මහාවීරවූ (උන්වහන්සේ දැක) පහන්සිත් ඇත්තේ සොම්නස් වූයේ සියතින් (එම බුදුරජුන් හට) ඇඹරැල්ල ගෙඩියක් පිදීමි.

4747 "මින් එක්තිස් වන කපෙහි යම් ඵල පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි. 4748-4749.

## 447 සීහාසනික ථෙරාපදානය

4750 "මම සව්සත්නට හිත කැමැත්තාවූ පදුමුත්තර බුදු රජුන්හට පහන්සිත් ඇත්තේ සොම්නස්වූයේ සිහසුනක් දුනිමි.

4751 "මම දෙව්ලොව හෝ මිනිස්ලොව හෝ ඒ යම් යම් තැනක වෙසෙම් නම් මහත්වූ විමානයක් ලැබීමි. සිහසුන් දනෙහි මේ විපාකයයි.

4752 "ස්වර්ණමයවූද, රජතමයවූද, පද්මරාග මාණික්‍යවූද මණිමය (මිණියෙන් කරනලද) වූද බොහෝ පය්‍යීංකයෝ මට හැම කල්හි පහළවෙත්.

4753 "පමුදුත්තර බුදුරජුගේ බෝධියට අසුනක්කොට උසස් කුලයෙහි උපදිමි. ධර්මයාගේ යහපත් ස්වභාව ඇති බව ආශ්චය්‍යීයකි.

4754 "මම මින් සියක්දහස් වන කපෙහි සිහසුනක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සිහසුන් දනෙහි මේ විපාකයයි. 4755-4756.

## 448 පාදපිඨිය ථෙරාපදානය

4757 "අග්‍රවූ කාරුණිකවූ මොනෙය්‍ය ගුණ ඇති මහත් යසස් ඇති ඒ සුමේධ නම් සර්වඥතෙමේ බොහෝ සත්වයන් (සසර සයුරින්) තරණය කරවා පිරිනිවන් පෑය.

4758 "සුමෙධ බුදුරජුන්ගේ සිහසුන හාත්පස (සමීපයෙහි) පහන්සිත් ඇත්තේ සොම්නස් වූයේ (මම) පාපුටුවක් කෙළෙමි.

4759 "සැප විපාක ඇති සුවගෙන දෙන්නාවූ කුශල කර්මයකොට මම එම කුශල කර්මය හා යෙදුනේ තව්තිසා දෙව්ලොවට ගියෙමි.

4760 පුණ්‍ය කර්මය සහ යෙදුනාවූ එහි (දෙව්ලොව) වසන්නාවූ මාගේ පියවර ඔසවන කල්හි ස්වර්ණමය (පාද පීඨයෝ පහළ වෙත්.

4761 "යමෙක් බුදුරජුන්ගේ සමීපයෙහි සිට දහම් ඇසීමට ලබතොත් ඔවුන්හට එය ලාභයකි. අතිශය උසස් ලාභයකි. පිරිනිවි කල්හිද (උන්වහන්සේ කෙරෙහි) පින්කම් කොට මහත්වූ සැප ලබත්.

4762 "මා විසිනිදු උන්වහන්සේ කෙරෙහි පූර්ණකර්මයක් මනාකොට කරන ලදි. (එය) මැනවින් යොදන ලද වෙළදාමක් මෙනි. මම පා පුටුවක් කොට රන් පුටුවක් ලබමි.

4763 "මම කිසියම් හේතුවකින් යම් යම් දිසාවකට යම්නම් රන් පුටුවලට පය තබමි. පූර්ණ කර්මයාගේ මේ විපාකයයි.

4764 "තිස්දහස් කපකින් පෙරවූ එකල්හි යම්කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පාදපීඨ දානයාගේ මේ විපාකයයි. (4765-4766)

## 449 වෙදිකාරක ථෙරාපදානය

4767 "පදුමුත්තර බුදුරජුන්ගේ ශ්‍රෙෂ්ඨ වෘක්ෂරාජයාවූ බොධියෙහි වේදිකාවක් මැනවින් කොට සිය සිත පැහැදවීමි.

4768 "ඉක්බිති කළාවූද නොකළාවුද භාණ්ඩයෝ අහසින් වඩිත්. වේදිකා දානයෙහි මේ විපාකයයි.

4769 "දෙපසෙහි පවත්නා භයානක දැඩි යුදෙහිදී වුවද (ඔවුනොවුන් ඉදිරියට) පනින්නාහු (මම) භයානක අරමුනක් නොදකිමි. වේදිකා දනෙහි මේ විපාකයයි.

4770 මාගේ අදහස දැන ශුභවූ විමනක් පහළවේ (එහි) මාහැඟි සයනයෝද වෙත් වේදිකා දනෙහි මේ විපාකයයි.

4771 මින් සියක් දහස්වන කපෙහි (මම) යම් වේදිකාවක් කරවූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වේදිකා දනෙහි මේ විපාකයයි. 4772-4773

## 450 බොධිඝරිය ථෙරාපදානය

4774 "ද්විපදොත්තමවූ තාදී ගුණඇති සිද්ධාර්ථ බුදුරජුන් හට පහන් සිත් ඇත්තේ, සොම්නස් වූයේ බොධියක් කරවීමි.

4775 "(ඒ හේතුවෙන්) තුසිතයෙහි උපන්නේ වෙමි. රතන ගෘහයෙහි වසමි. මාගේ සිරුරෙහි ශීතය හෝ උෂ්ණය හෝ වාතය හෝ නොගෑවේ.

4776 "මම මින් පන්සැටවන කපෙහි සක්විතිරජ වීමි. (මට) විශ්වකර්මයා විසින් මවන ලද කාසික නම් නුවරක් විය.

4777 "(එම නගරය) දස යොදුනක් දිගය. අටයොදුනක් පුළුල්ය. එම නගරයෙහි දර හෝ වැල් හෝ මැටි නැත.

7478 '(එහි) විශ්වකර්මයා විසින් මවන ලද මංගල නම් ප්‍රාසාදයෙක් විය. (එය) යොදුනක් දිගු විය. අටයොදුනක් පුළුලු විය.

4779 "(එහි) අසූසාරදහසක් ස්වර්ණමය ස්තම්භයෝ වූහ, ද්වාරයෝ මණිමයහ. සෙවෙනිය (පියස්ස) රජතමයවිය.

4780 "සියල්ල රණින් කළාවූ ගෙයක් විශ්වකර්මයා විසින් මවනලදී. මා විසින් එහි වසනලදී. ගෘහදානයාගේ එම විපාකයයි.

4781 "දෙව්මිනිස් භවයෙහි ඒ සියලු සම්පත් අනුභව කොට අද නිරුත්තර ශාන්තිපදයවූ නිවනට පැමිණියේවෙමි.

4782 'මින් සිව් අනුවන කපෙහි (යම්) බොධි ගෘහයක් කරවූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ගෘහ දානයාගේ මේ විපාකයයි. 4783-4784

# 46 ජගතිදායක වග්ග.

## 451 ජගතිදායක ථෙරාපදානය

4785 "මම දම්ම දස්සී බුදුරජුන්ගේ උතුම් බොධි වෘක්ෂය (පිහිටි තන්හි) පෘථිවිය පහන් සිත්ඇත්තේ, සොම්නස් වූයේ කරවීමි.

4786 "මම පර්වත විවරයකින් හෝ පර්වතයකින් හෝ වැටුනේ (එකල්හි පවා) පිහිටක් ලබමි. පෘථිවිය සකස්කොට දීමෙහි මේ විපාකයයි.

4787 "සොරු මාගේ (වස්තුව) පැහැර නොගනිත්. රජ තෙම (මට) අවමන් නොකෙරේ. සියළු පස මිතුරන් ඉක්මවමි. පොළොව සකස්කොට දීමෙහි මේ විපාකයයි

4788 "දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදිම්ද, ඒ සියළු තන්හි පුදන ලදුයේ වෙමි. පොළොව සකස් කොට දීමෙහි මේ විපාකයයි

4789 "මම අටළොස් සියවෙනි කපෙහි පොළොව (සකස්) කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පොළොව සකස්කොට දීමෙහි මේ විපාකයයි. (4790-4791)

## 452 මොරහත්ථිය ථෙරාපදානය

4792 "මම මොණර පියාපතක් ගෙන පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ ලොකනායකවූ බුදුරජුන් වෙත එළඹියෙමි. (එළඹ) මොණර පියාපත පිදීමි.

4793 'මෙම මොණර පියාපත් දන කරණකොටගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොටගෙනද ත්‍රිවිධාග්නීහු නිවී ගියහ. මහත්වූ සැපද ලබමි.

4794 'බුදුවරයෝ ආශ්චර්‍ය්‍යයහ. (නෛර්‍ය්‍යාණික) ධර්මයෝද, ආශ්චර්‍ය්‍යයහ. අපගේ ශාස්තෘ සම්පත්තියද ආශ්චර්‍ය්‍යයකි. මම මොණර පියාපතක්දී මහත් සුව ලබමි.

4795 "මාගේ ත්‍රිවිධාග්නීහු නිවී ගියහ. සියළු භවයෝ නසන ලදහ. සියළු ආශ්‍රවයෝ ක්ෂය කරන ලදී. දැන් නැවත ඉපදීමක් නැත.

**4796** "මින් එක්තිස්වන කපෙහිවූ යම් දනක් දුනිම්ද ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. මොණර පියාපත් දනෙහි මේ විපාකයයි. 4797-4798

## 453 සීහාසන වීජක ථෙරාපදානය

**4799** "මම තිස්ස බුදුරජුන්ගේ බොධිවෘක්ෂයට වැන්දෙමි. විජිනිපතක් ගෙන එහි සිහසුනට පවන් සැලීමි.

**4800** "මම මින් දෙයානූවක කපෙහි සිහසුනට පවන් සැලූයෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පවන් සැලීමෙහි මේ විපාකයයි 4801-4802

## 454 තිඋක්කාධාරක ථෙරාපදානය

**4803** "පදුමුත්තර බුදුරජුන්ගේ උතුම් බොධි වෘක්ෂයෙහි (ආලොකය පිණිස) පහන් සිත් ඇති සොම්නස්වූ (මම) පන්දම් තුණක් දැරීමි.

**4804** "ඒ මම මින් සියක් දහස්වන කපෙහි (යම්) පන්දම් (තුණක්) දැරුයෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදකිමි. පන්දම් දනෙහි මේ විපාකයයි. 4805-4806

## 455 අක්කමන දායක ථෙරාපදානය

**4807** "වැස නිමවන ලද බඹසර ඇති බ්‍රාහ්මණ වංශයෙහිවූ දිවා විහරණයෙහි හැසිරෙන්නාවූ කකුසඳ බුදු රජුන්හට මම පාතබන පුවරුවක් දුනිමි

**4808** "මෙම කල්පයෙහිමවූ එකල්හි යම්දනක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පා තබන පුවරු දනෙහි මේ විපාකයයි 4809-4810

## 456 වන කොරණ්ඩිය ථෙරාපදානය

**4811** "ලොකජ්‍යෙෂ්ඨවූ තාදි ගුණ ඇති සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේට වන කරඬු මලක් ගෙන පිදීමි.

**4812** "මින් සිව් අනූවන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 4813-4814

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 457 එක ඡත්තිය ථෙරාපදානය

4815 "පෘථිවි තොමෝ හටගත් අඟුරු ඇත්තීය. එසේම මහී තොමෝ උණු අළු සහිත වූවාය. පදුමුත්තර බුදු රජතෙමේද එලිමහනෙහි සක්මන් කළේය.

4816 "මම සුදු කුඩයක් ගෙන මගට පිළිපන්නෙමි. එහි සම්බුදුරජුන් දැක ප්‍රීතිය ඇතිවිය.

4817 "භූමිතොමෝ රැස්වූ මිරිඟුදිය ඇත්තීය. (එසේම) මේ පෘථිවිය (දිලිසෙන අඟුරු මෙනි. සිරුරෙහි ආයුෂ පිරිහෙළන්නාවූ මහා වාතයෝද හමති.

4818 "ශීතය හා උෂ්ණය නසන්නාවූ වාතය හා අව්ව වළකන්නාවූ මේ කුඩය පිළිගනු මැනව. මම (ඒ හේතුවෙන්) නිවන් ලබන්නෙමි" යි කුඩය පිළිගැන්විය.

4819 "එකල්හි (ලොකයා කෙරෙහි) අනුකම්පා ඇති කාරුණිකවූ මහර්ධි වූ පදුමුත්තර බුදුරජතෙමේ මාගේ අදහස් දැන (එය) පිළිගත්තේය.

4820 'තිස්කපක් මුලුල්ලෙහි දෙවනුව දිව්‍ය රාජ්‍යය කරවීමි. (එසේම) මම පන්සිය වරක් සක්විති රජවීමි.

4891 "(කරවන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නොහැකිය. පෙර තමා විසින් මැනවින් කළ පුණ්‍යකර්ම (විපාකය) අනුභව කරමි.

4822 "මාගේ මේ පශ්චිම ආත්මයයි මේ අන්තිම භවය පවතී. අද පවාමට හැමකල්හි සේසතක් දරයි.

4823 "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් ඡත්‍ර දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඡත්‍ර දානයාගේ මේ විපාකයයි. 4824-4825

## 458 ජාති පුප්ඵිය ථෙරාපදානය

4826 "මහත් යසස් ඇති පදුමුත්තර බුදුරජුන් පිරිනිවි කල්හි (මම) හිසෙහි පළඳින දෑසමන් මල් මාලාවක් කොට ශ්‍රී දෙහයට පිදීමි.

4827 "මම එහි සිත පහදවා නිර්මාණරතී දෙව්ලොවට ගියෙමි. මම දෙව්ලොවට ගියේ (එම) පින්කම සිහිකරමි.

4828 "හැමකල්හි මට අහසින් මල් වැසි වසී. ඉදින් මිනිස් ලොවෙහි සැරිසරම් නම් මහත් යසස් ඇති රජ කෙනෙක් වීමි.

4839 "සර්වදර්ශිවූ බුදුරජුන්හට කරනලද එම පුෂ්ප පූජාවෙහිම බලයෙන් එහි (මිනිස් ලොවෙහි) ද මට මල්වැසි වසී.

4830 "මේ මාගේ පශ්චිම භාවයයි මේ අන්තිම භවය පවතී අදද හැමකල්හි මට මල් වැසි වසී.

4831 "(මම) මින් සියක් දහස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (සර්වඥ) දෙන පූජාවෙහි මේ විපාකයයි. 4832-4833

## 459 පටි පුප්ඵිය ථෙරාපදානය

4834 "ශරීරය (ආදාහනය සඳහා) ගෙන යන කල්හි බෙර වයන කල්හි (මම) පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ රත්ලොත් මල් පිදීමි

4835 "(මම) මින් සියක් දහස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චිතක (ආදාහන) පූජාවෙහි මේ විපාකයයි. 4836-4837

## 460 ගන්ධපූජක ථෙරාපදානය

4838 "(ආදාහනය සඳහා) චිතකය කරන කල්හි නානා සුගන්ධයන් රැස්කරන කල්හි මම පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ සුවඳ මිටක් පිදීමි.

4839 "මින් සියක් දහස්වන කපෙහි යම් චිතක පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චිතක පූජාවෙහි මේ විපාකයයි. 4840-4841

# 47 සාලකුසුම්ය වග්ග.

## 461 සාලකුසුම්ය ථෙරාපදානය

4842 පදුමුත්තර බුදුරජතෙම පිරිනිවි කල්හි (උන් වහන්සේගේ ශ්‍රී දේහය චිතකට නැංවූ කල්හි සල්මල් පිදීමි.

4843 "මින් සියක් දහස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. චිතක පූජාවෙහි මේ විපාකයයි. 4844-4845

## 462 චිතක පූජක ථෙරාපදානය

4846 "ධ්‍යාන වඩන්නාවූ ලොකබන්ධුවූ සිඛී බුදුරජාණන් වහන්සේගේ චිතකයට සපුමල් අටක් පිදීමි

4847 "මින් එක් තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි චිතක පූජාවෙහි මේ විපාකයයි. 4848-4849

## 463 චිතක නිබ්බාපක ථෙරාපදානය

4850 "වෙස්සභූ බුදුරජුන්ගේ සිරුර දැවෙන කල්හි මම සුවඳ පැන් ගෙන චිතකය නිවීමි.

4851 "මම මින් එක්තිස්වන කපෙහි (බුදුරජුන්ගේ) චිතකය නිවූයෙම්ද ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. සුවඳ දිය දීමෙහි මේ විපාකයයි. 4852-4853

## 464 සෙතුදායක ථෙරාපදානය

4854 "සක්මන් කරන්නාවූ විපස්සී බුදුරජුන් හමුවෙහි මම පහන් සිත් ඇත්තේ සොමනස් වූයේ ඒදණ්ඩක් කරවීමි

4855 "මින් එක් අනූවන කපෙහි මම යම් හෙයක් කර වූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සෙතු (ඒ දඬු) දානයෙහි මේ විපාකයයි 4856-4857

## 465 සුමනකාල චණ්ඩිය ථෙරාපදානය

4858 "මම සිද්ධාර්ථ බුදුරජාණන් වහන්සේට සමන් මල් වලින් වසන ලද විජිනිපතක් දුනිමි. (එයින් මම) මහත් යශස් දරමි.

4859 "මම මින් සිව් අනූවන කපෙහි යම් විජනි දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. තල්වැට (වටා පත්) දීමෙහි මේ විපාකයයි. 4860-4861

## 466 අවණ්ට එලිය ථෙරාපදානය

4862 "පස්මරුන් දිනූ සියල්ල තෙමේම අවබොධ කළාවූ සතරංසී නම් භාග්‍යවත් බුදුරජතෙම විවේක සුව කැමැත්තේ පිඬු පිණිස නික්මුණේය.

4863 "අතින් ගත් ගෙඩි (වර්ගයක්) ඇති මම බුදුරජුන් දැක (එහි) එළඹියෙමි. පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ එම (වටවූ) ගෙඩි (වර්ගය) උන්වහන්සේට දුනිමි.

4864 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 4865-4866

## 467 ලබුජ දායක ථෙරාපදානය

4867 "එකල්හි (මම) බන්ධුමතී නගරයෙහි ආරාමකයෙක් (අරමක වතාවත්) කරන්නෙක්) වීමි. අහසෙහි වඩින්නාවූ කෙලෙස් රජස් විරහිත බුදුරජුන් දුටිමි.

4868-4869 "මම දෙල් ගෙඩියක් ගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි. මහත් යශස් ඇති මාගේ ප්‍රීතිය ඇති කරන්නාවූ මෙලෙව්හිදීම සුව ගෙන දෙන්නාවූ බුදුරජතෙම අහසෙහි සිටියේ එය පිළිගත්තේය. පැහැදී සිතින් (එම) ඵලය බුදුරජුන්හටදී

4870 "එකල්හි (මම) මහත්වූ ප්‍රීතියද උතුම්වූ සැපයද ලැබීමි. ඒ ඒ තන්හි උපන්නාවූ මට රුවන්ද උපදී.

4871 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 4872-4873

## 468 පිලක්ඛඵල දායක ථෙරාපදානය

4874 "වනයෙහිදී මහත් යසස් ඇති අත්ථදස්සී බුදු රජුන් දැක පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ පුලිල ගෙඩියක් උන්වහන්සේට දුනිමි.

4875 "අටලොස් සියවන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 4876-4877

## 469 සයම්පටි භාණිය ථෙරාපදානය

4878 "බබලන්නාවූ (පිපුනු) කුඹුක්ගසක් වැනිවූ දෙවාතිදෙවවූ නරශ්‍රෙෂ්ඨවූ වීථියට පිළිපන්නාවූ බුදුරජුන් දැක කවරෙක් නම් නොපහදීද?

4879 "(මොහ නමැති) සනාන්ධකාරය නසා බොහෝ දෙන (සසරින්) එතරකොට ඥාන ලොකයෙන් බබලන්නාවූ බුදුරජුන් දැක කවරෙක් නම් නොපහදීද?

4880 "රහතුන් ලක්ෂයක් සමග වඩින්නාවූ ලොක නායකවූ බොහෝ සත්වයන් (දුකින්) ගොඩලන්නාවූ බුදු රජුන් දැක කවරෙක් නම් නොපහදීද?

4881 "දහම් බෙරය ගසන්නාවූ තිර්ථක සමූහයා මඩින්නාවූ සිගනද (ශ්‍රෙෂ්ඨනද) කරන්නාවූ බුදුරජුන් දැක කවරෙක් නම් නොපහදීද?

4882 "බඹලොවින් යම්තාක් බඹුන් සහිත (දෙවියෝ) අවුත් සියුම් පැණ විචාරත්ද, (ඒ බුදුරජුන්) දැක කවරෙක් නම් නොපහදිත්ද?

4883 "දෙවියන් සහිත ලොකයා යම් උතුමෙකුට ඇඳිලි බැඳ අයදිත්ද, එයින් (ඔව්හු) පින් (ඵල) අනුභව කෙරෙත්ද, ඒ බුදුරජුන් දැක කවරෙක් නම් නොපහදීද?

4884 "සියළුදෙන රැස්ව බුදුරජුන් පවරත්. එසේ ආරාධනය කරන ලදුයේ කම්පා නොවේ. (එම බුදුරජුන්) දැක කවරෙක් නම් නොපහදීද?

4885 "නුවරට පිවිසෙන්නාවූ යමෙකුට බොහෝ භෙරීහු (බෙර) නාද කෙරෙත්ද, මත්ත හස්තීහු විශෙෂයෙන් නාද කරත්ද, (එම බුදුරජුන්) දැක කවරෙක් නම් නොපහදීද?

4886 "හැමකල්හි වීථියෙහි ගමන් කරන්නාවූ යමෙකුගේ (සිරුරින්) සියළු පැහැ බබලමින් විහිදේද, (භූමියෙහි) උස් ස්ථානයෙහි (පා තබනවිට) කවරෙක් නම් නොපහදීද?

4887 "බුදුරජුන් දහම් දෙසන කල්හි (මුළු) සක්වළෙහිම ඇසේද, ඒ බුදුරජතෙම සියළු සත්වයන් (එම) ධර්මයෙන් අවබොධ කරවයි. (එම) බුදුරජුන් දැක කවරෙක් නම් නොපහදීද?

4888 "මින් සියක්දහස් වන කපෙහි බුදුරජුන්හට (මෙසේ) යම් ස්තුතියක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුදුරජුන්හට පැසසීමෙහි විපාකයයි 4889-4890

## 470 නිමිත්ත ව්‍යාකරණීය ථෙරාපදානය

4891 "මම එකල්හි හිමවතට පිවිස මන්ත්‍ර කියවමි. සූපණසද්දහසක් ශිෂ්‍යයෝ මට උවටැන් කළාහුය.

4892 "වෙද හදාරණ ලද්දාවූ සියළු වෙදය දත් ෂඩංගයෙහි (වෙදාංග පරතෙරට ගියාවු ස්වකීය විද්‍යාවන්ගෙන් ස්ථිර බවට පැමිණියාවූ ඔවුහු හිමවතෙහි වසත්.

4893 "මහත් යසස් ඇති (බොධිසත්ව) දිව්‍යපුත්‍රතෙම තුසිත දෙව්ලොවින් ච්‍යුතව මනා නුවණැත්තේ සිහියෙන් යුතුවූයේ මව්කුසෙහි උපන්නේය.

4894 "සම්බුදු රජුන් උපදනා කල්හි දශසහශ්‍රී ලොකධාතුව කම්පා වීය. එම ලොක නායකයන් වහන්සේ උපදනා කල්හි අන්ධයෝ ඇස් ලැබූහ.

4895 "මේ සම්පූර්ණ පෘථිවිය හැම අයුරින්ම කම්පා වීය. (ඒ) මහ හඬට මහාජනයෝ කලබල වූහ.

4896 "සියළුදෙන එකතුව මාගේ සමීපයට පැමිණියාහුය "මේ පොළොව කම්පා විය. කවර විපාකයක් වන්නේදැ" යි (විචාළේය.)

4897 "එකල්හි ඔවුන්හට (මම) මෙසේ කීයෙමි. "බිය නොවව්, තොපට (මින්) බියෙක් නැත. සියල්ලෝ විශ්වාස ඇත්තෝ වව්. මෙය සැප ඇති උපතෙකි. (එබඳු උපතක ලකුණකි.)

4898 "හේතු අටකින් ගැටුණු මේ පොළොව කම්පා කළේය. එබඳු නිමිතිහු පැණෙති (මේ) අතිමහත් ආලොකයකි.

4899 "පසැස් ඇති බුදුරජතෙම නිසැකවම (ලොව) උපදින්නේයැයි ජනසමූහයාට දන්වා මම ඔවුනට පන්සිල් කීමි.

4900 "පඤ්චසීලයද, දුර්ලභවූ, බුද්ධොත්පාදයද (ගැන) අසා ඔව්හු සොම්නස් වූවාහු. තුටු පහටු වූවාහු හටගත් කළකිරීම් ඇත්තෝද වූහ.

4901 "මින් දෙයානූවන කපෙහි (බුදුරජුන් උපදින්නේ යයි) යම් නිමිත්තක් පැවසූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. නිමිති පැවසීමෙහි මේ විපාකයයි. 4902-4903

# 48 නළමාලිය වග්ග.

## 471 නළමාලිය ථෙරාපදානය

"ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ වනය මතුයෙහි (අහසින්) ගමන්කරන්නාවූ ලොක නායකවූ ස්වර්ණවර්ණවූ සම්බුදු රජුන් දුටිමි.

**4904** "එකෙණෙහි (මම) බට මලක් ගෙන නික්මෙන්නේම එහිදී චතුරොඝයන් තරණය කළාවූ ආශ්‍රව රහිතවූ සම්බුදු රජුන් දුටිමි.

**4905** "පහන් සිත් ඇති සොම්නස්වූ මම දක්ෂිණාර්හවූ මහාවීරවූ සියළු ලොවට අනුකම්පා කරන්නාවූ බුදුරජුන්හට (එම) බට මල පිදීමි

**4906** "මින් එක්තිස් වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 4907, 4908.

## 472 මණිපූජක ථෙරාපදානය

**4909** "සියළු ධර්මයන්හි පරතෙරට ගිය පදුමුත්තර නම්වූ පස්මරුන් ජයගත් විවෙක සැප කැමැති බුදුරජතෙම අහස් මගෙහි වඩියි.

**4910** "හිමවතට නුදුරෙහි මහත්වූ ස්වයංජාත විලක් විය. එහි පුණ්‍යකර්මය සහ යෙදුනු හෙවත් එම පිණින් පහළවූ මාගේ භවනය විය.

**4911** "භවනයෙන් නික්ම (පිටතට ආ කල්හි) නිළුපුල් මල් මෙන් දිලිසෙන ඇවිලගත් ගින්නක් වැනි ලොකනායකවූ බුදුරජුන් දිටිමි

**4912** "බුදුරජුන්හට පුදන්නෙමැයි සොයන්නේ (සුදුසු) මලක් නොදුටිමි. මම සිය සිත පහදවා ශාස්තෘන් වහන්සේට වැන්දෙමි.

**4913** "(මම) මාගේ හිසෙහිවූ මැණික ගෙන "මෙම මැණික් දනෙහි යහපත් විපාකයක් වේවා" යි ලොක නායකවූ බුදුරජුන්හට පිදීමි.

**4914** "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ ශාස්තෘවූ අහසෙහි (සිටියාවූ) පදුමුත්තර බුදුරජතෙම මෙම ගාථාව වදාළේය.

**4915** "තාගේ ඒ අදහස සමෘද්ධ වේවා, මහත්වූ සැප ලබහිවා, මෙම මැණික් පූජාවෙන් මහත් යසස් අනුභව කරව" (කියායි.)

**4916** "භාග්‍යවත්වූ පදුමුත්තර නම්වූ බුද්ධශ්‍රෙෂ්ඨ තෙමේ මෙම වචනය වදාරා වැඩියේය. (මා) යම් (ප්‍රාර්ථනාවක) සිත පිහිටුවන ලදද,

**4917** "(ඒ හේතුවෙන්) කල්ප සැටක් දෙවනුව දිව්‍ය රාජ්‍යය කරවීමි. (එසේම) මම සියක්වර සක්විතිරජ වීමි.

**4918** "පූර්වකර්මය සිහි කරන්නාවූ දෙවිවූ මට ආලොකවත් කරන්නාවූ මාගේම මැණික් පහළ වේ.

**4919-4920** "මාගේ පිරිවර සූවාසූ දහසක් ස්ත්‍රීහු විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාහුය. පළඳිනලද මිණිකොඩොල් ඇත්තාහුය. දිග ඇස්පිහාටු ඇත්තාහුය. සිනා සහිත වූවෝය. මැනවැයි හැඳින්විය යුතු ශරීරාවයව ඇත්තේය (එම ස්ත්‍රීහු) නිතර මා පිරිවරත්. මණි පූජාවෙහි මේ විපාකයයි.

**4921** "රුවන්මුවාවූද, මිණිමුවාවූද, පියුම්රාමිණිමුවාවූද, මාගේ භාණ්ඩයෝ එසේම මැනවින් කරනලද්දාහු වෙත්. (එසේම) කැමති පරිදි පළඳනාවෝද වෙත්.

**4922** "රම්‍යවූ කුළුගෙවල් ගුහාවෝද මාහැඟි සයනාසනද මාගේ අදහස දැන කැමතිතාක් පහළ වෙති.

**4923** "යමෙක් මිනිසුනට පින්කෙත්වූ, සව් සත්නට ඔසුවක්වූ, ධර්මශ්‍රවණය ලබත් නම් (එය) ඔවුනට ලාභයකි, මනාවූ ලාභයකි.

**4924** "යම් බඳුවූ මම බුදුරජුන් දුටිම්ද, (එහිදී) මා විසිනුදු මනාවූ කර්මයක් කරනලදී. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අචලපදයවූ නිවණටද පැමිණියේ වෙමි.

**4925** "දෙවිවූ හෝ මිනිස්වූ හෝ යම් යම් යොනියක උපදිම්ද, (ඒ) හැම කල්හිම හාත්පස සත්රියනක් මාගේ ආලෝකය පැතිරෙන්නේ වේ.

**4926** "එම මැණික් පූජාවෙන් සම්පත් අනුභවකොට මා විසින් ඥානාලොකයද දක්නාලදී. අචලවූ ශාන්ති පදයද අවබොධ කර ගතිමි.

**4927** 'මින් සියක්දහස් වන කපෙහි යම් මැණික් පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මිණිපූජාවෙහි මේ විපාකයයි 4928.

## 47 උක්කාසතික ථෙරාපදානය

**4929** 'එකල්හි මෞන ගුණ ඇති ධ්‍යාන කරන්නාවූ ධ්‍යානයෙහි ඇළුනාවූ භාග්‍යවත්වූ කොසික නම් බුදුරජතෙමේ චිත්‍රකූට පර්වතයෙහි වැඩ විසීය.

**4930** "(මම) ස්ත්‍රී සමූහයා විසින් පිරිවරන ලදුව හිමවතට පිවිස පසළොස්වක් දිනයෙහි සඳු වැනිවූ කොසික බුදුරජුන් දිටීය.

**4931** "එකල්හි මම උල්කා (පන්දම්) සියයක් ගෙන (උන්වහන්සේ) පිරිවැරීමි. මම රෑ දාවල් සතක් (එහි) සිට අටවෙනි දිනයෙහි ගියෙමි.

**4932** "සමාධියෙන් නැගීසිටියාවූ පස්මරුන් දිනූ සියල්ල තෙමේම අවබොධ කරගත් කොසික බුදුරජුන් වැඳ පහන් සිත් ඇත්තේ මම එක් භික්ෂාවක් දුනිමි.

**4933** "ද්වීපදොත්තමයාණන් වහන්ස, ලොක ජ්‍යෙෂ්ඨයාණන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයාණන් වහන්ස, එම කර්මය කරණ කොටගෙන තුෂිත දෙව්ලොවෙහි උපනිමි. එක භික්ෂා දානයෙහි මේ විපාකයයි.

**4934** "දිවා කල්හිද රාත්‍රියෙහිද යන හැම කල්හි මාගේ ආලොකය වෙයි. මම හාත්පස යොදුන් සියයක් ආලොකය පතුරුවමි.

**4935** "මම පස්පණස් වන කපෙහි සිව් මහ සයුරු හා සිව් මහදිවයින් කෙළවර ඇති පෘථිවියට අධිපතිවූ සතුරු රජුන් ජයගන්නා සුළුවූ දඹදිව රාජධානියකොට ඇති බැවින් හෝ වෙසෙසින් එයට අධිපතිවූ සක්විති රජෙක් වීමි.

**4936** "එකල්හි මට සමෘද්ධවූ සම්පත්තියෙන් පිරුණාවූ මැනවින් කොට නිමවනලද නගරයක් විය. (එය) තිස් යොදුනක් දිගය. විසි යොදුනක් පුළුලය.

**4937** "විශ්වකර්මයා විසින් මවනලදී. (එව-කව-බොව යනාදී) දශවිධ ශබ්දයෙන් තොර නොවීය. කයිතාලම (ආදී තූර්‍ය්‍ය) නාදයෙන් ද යුක්තවූ ශොභන නම්වූ නගරයකි.

4938 "ඒ නගරයෙහි වැල්ද, දරද, මැටිද ඇත. (ඒ) සියල්ල ස්වර්ණමයහ. හැම කල්හිම බබලයි.

4939 "ප්‍රාකාර සතරකින් වට කරනලදී. සිව් පව්රුහුම මිණිමුවා වූහ. මැද පෙදෙසෙහි තාල පංක්තීහුද විශ්වකර්මයා විසින් මවනලදී.

4940 "පියුම් උපුල්වලින් වැසුණු (හෙළ) පියුමින් ගැවසීගත් නොයෙක් සුවඳ වහනය වන්නාවූ පොකුණු දසදහසක් වෙති.

4941 "මම මින් සිව්අනූ වන කපෙහි යම් උල්කා (පන්දම්) දැරූයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. උල්කාධාරණයෙහි මේ විපාකයයි. 4942-4943

## 474 සුමනවිජනිය ථෙරාපදානය

4944 "විපස්සී බුදුරජුන්ගේ උතුම් බොධි වෘක්ෂය සමීපයෙහිදී සමන් මල් විජිනියක් ගෙන (මම) ඒ උතුම් බොධියට පවන් සැලීමි

4945 "මින් එක් අනූවන කපෙහි උතුම් බොධියට පවන් සැලූයෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පවන් සැලීමෙහි මේ විපාකයයි. 4946-4947.

## 475 කුම්භදායක ථෙරාපදානය

4948 "පිඬුපිණිස හැසිරෙන්නාවූ විපස්සී බුදුරජුන් හිස් පාත්‍රය දැක කොමු පිට්ටු (ගෙන) පිරවීමි.

4949 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් පිට්ටුවක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. කුම්මාස දානයෙහි මේ විපාකයයි 4950-4951

## 476 කුසට්ඨදායක ථෙරාපදානය

4952 "වැස නිමවන ලද බඹසර ඇති බ්‍රාහ්මණ වංශයෙහිවූ කාශ්‍යප බුදුරජුන්හට පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ ලහබත් අටක් දුනිමි.

4953 "මෙම කල්පයෙහිම සලාක බත් අටක් දුනිමි. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සලාක බත් අටක් දීමෙහි මේ විපාකයයි. 4954-4955

## 477 ගිරිපුන්නාගිය ථෙරාපදානය

**4956** 'එකල්හි සොභිත නම් සම්බුදුරජතෙම චිත්‍රකූට පර්වතයෙහි වැඩ විසීය. මම ගිරි පුන්නාග (කඳුවල හැදෙන දොඹ) පුෂ්පයන්ගෙන් (එම) බුදුරජුන් පිදීමි.

**4957** "මින් සිව් අනූවන කපෙහි බුදුරජුන්හට යම් පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 4958-4959

## 478 වල්ලිකාරඵලදායක ථෙරාපදානය

**4960** "එකල්හි සුමන නම් සම්බුදු රජතෙම තක්කරා රාජධානියෙහි වැඩ වීසිය. මම සියල්ල දත් බුදුරජාණන් වහන්සේට වල්ලිකාර ඵලයක් ගෙන දුනිමි.

**4961** "මින් එක්තිස් වන කපෙහි යම් ඵලදානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 4962-4963

## 479 පානාධිදායක ථෙරාපදානය

**4964** "ලොකජ්‍යෙෂ්ඨවූ පසැස් ඇති අනොමදස්සී බුදු රජතෙමේ දිවාවිහරණයෙන් නික්ම මාර්ගයට පිළිපන්නේය.

**4965** මම මැනවින් කරන ලද පාවහන් (දෙකක්) ගෙන මාර්ගයට පිළිපන්නෙමි. එහිදී මනොඥවූ දර්ශන ඇති මාර්ගයෙහි වඩින්නාවූ සම්බුදු රජුන් දුටුවෙමි.

**4986** "සිය සිත පහදවා පා වහන් (දෙක) බැහැරට ගෙන (බුදුරජුන්ගේ) පාමුල තබා මෙම වචනය කීමි.

**4967** විනායකයන් වහන්ස, සුගතෙන්ද්‍රයාණන්වහන්ස මහාවීරයාණන් වහන්ස, (මේ පා වහන් යුවල) දමාගනු මැනව. මෙයින් යම් විපාකයක් ලබන්නෙම්ද, (ඉන්) මාගේ යම් අභිමතාර්ථයක් වේනම් එය සමෘද්ධ වේවා,

**4968** "ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ අනොමදස්සී බුදුරජතෙම වහන් සඟලෙහි නැගසිට මෙම වචනය වදාළේය.

**4969** "යමෙක් තෙම පහන් සිත් ඇත්තේ මට සියතින්ම වහන් සඟලක් දුන්නේද, (හේ කවරෙක් දැයි) මම කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ වචනය අසව්."

4970 "බුදුරජාණන් වහන්සේගේ හඬ අසා ඔද වැඩි සිත් ඇති සොම්නස්වූ ප්‍රීතිමත්වූ බඳැදිලි ඇති සියළු දෙවිවරු රැස්වූහ.

4971 "මෙතෙම (මෙම) වහන්සඟල පිදීම කරණකොට ගෙන සුව ඇත්තේ පස් පණස් වරක් දිව්‍ය රාජ්‍යය කරන්නේය.

4972 "දහස් වරක් සක්විති රජ වන්නේය. කරවන ලද මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිනිය නොහැකිය.

4973 "මින් අපරිමෙය්‍ය කල්පයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘතෙමේ ලොව පහළ වන්නේය.

4974 "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදිවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ ඖරස බුද්ධ පුත්‍රවූ (මෙතෙම) සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය.

4975 'පින්වත්වූ (මෙතෙම) දෙව්ලොවෙහි හෝ මිනිස් ලොවෙහි උපදින්නේ නම් දිව්‍යයානයක් වැනි යානයක් ලබන්නේය."

4976 "මාගේ ප්‍රාසාදයෝද සිවිකාවෝද මැනවින් සැරසූ ඇත්තුද, ආජානීය අශ්වයන් යෙදූ රථද හැමකල්හි මට පහළ වෙත්.

4977 'මම ගිහිගෙන් නික්මෙන්නේද, රථයෙන් නික්මුනෙමි, කෙස් සිඳින (හිසකේබාන) කල්හි රහත්බවට පැමිණියෙමි.

4978 "මට ලාභයකි මට මහා ලාභයකි. මැනවින් යෙදූ වෙළඳාමක් වැනිය. එක වහන් සඟලක්දී අචල පදයවූ නිවනට පැමිණියේ වෙමි.

4979 "මා මින් අපරිමෙය්‍ය කල්පයෙහි යම් වහන් සඟලක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පානධී දානයාගේ මේ විපාකයයි. (4980-4981)

## 480 පූලින චංකමිය ථෙරාපදානය

4982 "මම පෙර මහා වෙනෙහි මුව වැද්දෙක් වීමි. මම වාත මෘගයෙකු සොයන්නේ සක්මණක් දුටුවෙමි.

4983 "මම ඔඩොක්කුවෙන් වැලිගෙන පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ ශ්‍රීමත්වූ බුදුරජුන්හට සක්මණෙහි ඉස්සෙමි.

4984 'මින් තිස්වන කපෙහි මම (යම්) වැලි ඉසීමක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පුලින දානයාගේ මේ විපාකයයි. 4985-4986

## 49 පාංසුකූල වග්ග.

### 481 පාංසුකූල සඤ්ඤක ථෙරාපදානය

4987 "සියල්ල තෙමේම දත් අග්‍ර පුද්ගලවූ තිස්ස නම් බුදුවරයෙක් තෙම විය. (එම) සර්වඥතෙම පවුල් (පාංශුකූල) සිවුරු තබා විහාරයට පිවිසියේය.

4988 "මම නවන ලද දුන්න ගෙන අහර පිණිස (වනයෙහි) හැසිරෙන්නෙමි. කඩුව ගෙන මම වනයට පිවිසියෙමි.

4989 "එකල්හි එහිදී ගසක් මුදුනෙහි එල්වන ලද පවුල් සිවුරදැකීමි (දැක) දුන්න එහිම තබා සිරසෙහි ඇඳිලිබැඳ

4990 "මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ මහත්වූ ප්‍රීතියෙන් බුද්ධ ශ්‍රෙෂ්ඨයන් සිහිකොට පාංශුකූල චීවරයට වැන්දෙමි.

4991 "මම මින් දෙයානූවන කපෙහි පසුල් සිවුරට වැන්දෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වන්දනාවෙහි මේ විපාකයයි. (4992-4993)

### 482 බුද්ධ සඤ්ඤක ථෙරාපදානය

4994 '(මම) ලක්ෂණ ශාස්ත්‍ර ඉතිහාසයෙහිද, නිඝණ්ඩු සහිතවූ කවීන්ට හිත ක්‍රියා කල්ප විකල්ප නම්වූ කෙටුභ ශාස්ත්‍රයෙහිද ත්‍රිවෙදයෙහිද පරතෙරට ගිය මන්ත්‍ර හදාරන්නාවූ මන්ත්‍ර ධරයෙක්වීමි.

4995 "එකල්හි ගඟ සැඩපහරක්මෙන් මාගේ සමීපයට ශිෂ්‍යයෝ එති. දිවාරෑ දෙක්හි අනලස්වූයේ ඔවුනට මම මන්ත්‍ර හදාරවමි.

4996 "එකෙණෙහි සිද්ධාර්ථ නම් සම්බුදුරජතෙමේ ලොවපහළ විය. (මොහ නමැති) ගනඳුර නසා ඥානාලොකය පැවැත් විය.

**4997** "මාගේ එක්තරා ශිෂ්‍යයෙක් වීය. හෙතෙම මාගේ සෙසු සිසුනට මෙය කීය. එකල්හි ඔව්හු මෙය අසා මට සැළකළාහුය. (කෙසේද යත්?)

**4999** "සර්වඥවූ ලොකනායකවූ බුදුරජතෙම ලොවපහළ විය. ජනතෙමේ උන්වහන්සේට අනුවර්තනය වේ. අපට ලාභයක් නොවන්නේය (කියායි)

**4999** "මහත් යශස් ඇති පසැස් ඇත්තාවූ බුදුවරයෝ (දිව්‍ය බ්‍රාහ්මාදී කිසිවෙකුන්ගේ උපදෙශ හෙතු විරහිතව) ලොව පහළවන්නෝ වෙති. ලොකනායකවූ (එම) බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ දකින්නෙම් නම් ඉතා යෙහෙකැයි (මම සිතීමි)

**5000** "(සිතා) මාගේ අඳුන්දිවි සමද වැහැරි සිවුරුද, පැන්කෙණ්ඩියද ගෙන අසපුවෙන් නික්ම මම සිසුනට ඇමතීමි.

**5001** "දිඹුල්ගස්වල මල් මෙන්ද සඳෙහි සාවා මෙන්ද, කපුටාගේ කිරි මෙන්ද බුදුවරයෝ දුර්ලභයහ.

**5002** "(දැන් එම) බුදුරජතෙම ලොව උපන්නේය. මිනිසත් බවද දුලබය. මෙම (බුද්ධොත්පාදය-මිනිසත් බව යන)දෙකම ඇති කල්හි සද්ධර්මශ්‍රවණය අතිශයින් දුර්ලභය.

**5003** "බුදුරජතෙම ලොවඋපන්නේය පින්වතුනි, (අපි) අපගේ ඇස ලබමු. එව්, (අපි) සියල්ලෝම සම්බුදු රජුන්ගේ සමීපයට යන්නෙමු.

**5004** "එකල්හි සියල්ලෝ කමඬලා (පැන්කෙණ්ඩි) දරන්නාහු කුර සහිත අඳුන් දිවිසම් හඳින්නාහු දළු මඩුළු බරින් බර වූවාහු වනයෙන් නික්මුනාහුය.

**5005** "වියදඬු පමණ දුර බලන්නාහු උත්තමාර්ථයවූ නිවන සොයන්නාහු ඇලුම් දොස් නැත්තාහු නිර්භය කෙශර සිංහයන් වැනි වූවාහු ය.

**5006** "ස්වල්පකෘත්‍ය ඇත්තාහු, ලොල් නොවුවාහු ප්‍රඥ ඇත්තාහු සන්හුන් පැවතුම් ඇත්තාහු පිණ්ඩචරියාවෙහි හැසිරෙන්නාවූ ඔව්හු බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සමීපයට එළඹියාහුය.

**5007** "(එසේ එළඹෙන කල්හි) යොදුන් එකහමාරක් ශෙෂව (ඉතිරිව ඇති කල්හි මාගේ (ශරීරයෙහි) ව්‍යාධියක් හටගත්තේය.

බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත්කොට එහිදී මට කළුරිය කෙළේ වෙමි.

5008 "මින් සිව්අනූවන කපෙහිවූ එකල්හි (යම්) බුද්ධ සංඥාවක් ලැබුයෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ සංඥාවෙහි මේ විපාකයයි. 5009-5010

## 483 භිසදායක ථෙරාපදානය

5011 "මම එකල්හි නොයෙක් හස්තීන් විසින් සෙවිනා ලද පොකුණකට බැස සාදුක හෙතුකොට ගෙන එහි නෙළුම්ල උදුරමි.

5012 "එසමයෙහි රතුවන් සිවුරු දරන්නාවූ භාග්‍යවත්වූ පදුමුත්තර නම්වූ බුදුරජතෙම අහස්මගෙහි වඩියි.

5013 "එකල්හි පසුව සිවුරු කම්පා කරන්නේ මම (එම) ශබ්දය ඇසීමි. උඩ බලන්නාවූ මම ලොකනායකවූ බුදු රජුන් දුටුවෙමි.

5014-5015 "(මම) එහිම සිටියේ බුදුරජුන්ගෙන් (මෙසේ) ඉල්ලීමි මාගේ නෙළුම්ල සහිතවූ මී ද කිරිද, ගිතෙල්ද නෙළුම් දැලිද පසැස් ඇත්තාවූ බුදුරජතෙමේ පිළිගණීවා" ඉක්බිති මහත් යසස් ඇති කාරුණිකවූ ශාස්තෘතෙමේ අහසින් බැස,

5016 "පසැස් ඇති සර්වඥතෙමේ මාගේ භික්ෂාව අනුකම්පාවෙන් පිළිගත්තේය. බුදුරජතෙම (එය) පිළිගෙන මට අනුමෝදනාවක් කළේය. (කෙසේදයත්?)

5017 "මහ පින් ඇතියාණන් වහන්ස, සුව ඇත්තේ වන්න. ඔබගේ ගතිය සමෘද්ධවේවා. මෙම නෙළුම්ල දන කරණ කොට ගෙන මහත් සැප ලබහිවා"

5018 "පදුමුත්තර නම් බුදුරජතෙමේ මෙය වදාරා භික්ෂාව ගෙන පස්මරුන් දිනූ සර්වඥතෙමේ අහසින් වැඩියේය.

5019 'ඉක්බිති නෙළුම්ල ගෙන මාගේ අසපුවට පැමිණියෙමි. නෙළුම්ල ගසෙක්හි එල්වා මාගේ දානය සිහිපත් කෙළෙමි.

5020 "එකල්හි මහා වාතයක් නැගී වනය කම්පා කෙළේය. සෙන පුපුරන කල්හි අහස ශබ්ද පැවැත්විය.

**5021** "එකල්හි සෙනක් මාගේ හිස මතුයෙහි පතිත විය. එහි හුන් මම කළුරිය කෙළෙමි.

**5022** "මම පින් කම සහ යෙදුනේ තුෂිත දෙව් ලොවෙහි ඉපදුනෙමි. මාගේ සිරුර පතිතවිය. මම දෙව් ලොවෙහි සිත් අලවා වීසිමි.

**5023** "මැනවින් සරසනලද සයාසූ දහසක් ස්ත්‍රීහු සවසද උදෑසනද (මා) උවටැන් කෙරෙත්.

**5024** "මම හැමකල්හි මිනිසත් බවට පැමිණ සුව ඇත්තේ වෙමි. මාගේ භොගයෙහි අඩු බවක් නැත. නෙළුඹල දනෙහි මේ විපාකයයි.

**5025** "ඉක්බිති තාදී ගුණ ඇති එමදෙවාති දෙවයන් වහන්සේ විසින් අනුකම්පා කරන ලදී. සියළු ආශ්‍රව ක්ෂය විය. දැන් නැවත ඉපදීමක් නැත.

**5026** "එකල්හි මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් භික්ෂාවක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. නෙළුඹල දනෙහි මේ විපාකයයි. 5027-5028

## 484 ඤාණත්ථවික ථෙරාපදානය

**5029** "හිමවතට දකුණෙහි මට මැනවින් කරණ ලද අසපුවක් විය. එකල්හි උත්තමාර්ථය සොයන්නේ වනයෙහි වෙසෙමි.

**5030** "මුල් වලින්ද, එලවලින්ද, ලාභ අලාභදෙකින්ද, (සමව) තුටුවූයේ මම ආචාර්‍ය්‍යයන් සොයමින් හුදකලාවම වෙසෙමි.

**5031** 'එකල්හි සුමෙධ නම් සම්බුදුරජතෙම ලොව පහළ විය (හෙතෙම) මහාජනයා (සසරින්) ගොඩලමින් චතුස් සත්‍යය ප්‍රකාශ කෙරෙයි

**5032** "(මෙතෙක්කල්) මම සම්බුදු රජුන් ගැන නොඅසමි. මට කිසිවෙක් එය නොකියයි. අඩමසක් ඉක්මගිය කල්හි බුදුරජුන් (ගැන) ඇසීමි

**5033** "මම ගිනි හා දර බැහැරකොට අසපුව හැමද පිරිකර කද ගෙන වනයෙන් නික්ම ගියෙමි.

**5034** "එකල්හි ගම්හි හෝ නියම් ගම්හි හෝ එක් රැයක්ම වසන්නාවූ මම පිළිවෙලින් චන්ද්‍රවතී ගඟ වෙත එළඹියෙමි.

5035 "එසමයෙහි භාග්‍යවත්වූ සුමෙධ නම් බුදුරජතෙම බොහෝ සත්වයන් (සසරින්) ගොඩලමින් අමෘත පදය (නිවන) දෙසයි.

5036 "ජන සමූහයා ඉක්මවා (ගොස්) ගුණ සයුරක්වූ ජිනෙන්ද්‍රයන් වැඳ අඳුන් දිවිසම සකස්කොට බුදුරජුන්හට ස්තුති කරමි.

5037 "ඔබ සත්වයනට ශාස්තෘවෙහිය. කෙතුවක්ද, ධජයක්ද, යාගසමානයෙන්ද වෙහිය. (එසේම) ද්විපදොත්තම තෙම පරායණයක්ද, ප්‍රතිෂ්ඨාවක්ද, ප්‍රදීපයක්ද වෙහිය.

(එක්විසිවෙනි බණවරයි)

5038 "චතුරාර්‍ය්‍ය සත්‍ය නම්වූ දර්ශනයෙහි නිපුණ බව ඇති වීරවූ ඔබ ජනසමූහයා සසරින් තරණය කෙරෙහිය. මුනීන්වහන්ස, ලෙව්හි ඔබවහන්සේට වඩා උසස් අනික් (සත්වයන් දුක් සයුරින්) එතර කරන්නෙක් නැත.

5039 "එකාන්තයෙන් මහසයුර තණ අගින් පමණ කරන්නට හැකිවන්නේ නමුදු ඔබවහන්සේගේ සර්වඥතාඥානය ප්‍රමාණ කරන්නට නොහැක්කේය.

5040 "පසැස් ඇත්තාණන් වහන්ස, තරාදි පියනෙහි තබා පොළොව දැරීමට හැකිවන්නේ නමුදු ඔබවහන්සේගේ ප්‍රඥාවෙහි ප්‍රමාණයක් (කරන්නට) නොහැක්කේමය.

5041 "අහස රැහැණකින් හෝ අඟුලෙන් මැණීමට හැකිවන්නේ නමුදු සර්වඥයන් වහන්ස, ඔබවහන්සේගේ සීලය පමණ කරන්නට නොහැක්කෙමි.

5042 "මහ සයුරෙහි දියද අහසද පොළොවද යන මේවා පමණකළ හැක්කාහු නමුදු පසැස් ඇත්තාණන් වහන්ස, ඔබ පමණ කළ නොහැකි ගුණ ඇත්තේ වෙහිය."

5043 "මහත් යසස් ඇති සර්වඥයන් වහන්සේට ගාථා සයකින් (මෙසේ) ස්තුතිකොට එකල්හි මම ඇඳිලි බැඳගෙන නිශ්ශබ්දව සිටියෙමි.

5044 "මහත්වූ ප්‍රඥාව ඇති මනා නුවණ ඇති යමෙකුට සුමෙධයයි ලෝවැස්සෝ කියත්ද, (එම සුමෙධ බුදුරජතෙම) භික්ෂු සංඝයා මැද හිඳ මෙම ගාථාවන් වදාළසේක.

5045 "යමෙක් පැහැදුනේ සියසිතින් ම මාගේ නුවණට පැසසීද හේ කවරෙක්දැයි මම කියන්නෙමි. (එසේ) කියන්නාවූ මාගේ (වචනය) අසව්.

5046 "(මෙතෙම) සත් සැත්තෑ කපක් දෙව්ලොව සිත් අලවා වසන්නේය. දහස්වරක් දෙවනුව දිව්‍යරාජ්‍යය කරන්නේය.

5047 "සියක් වර සක්විති රජ වන්නේය. (කරවනු ලබන) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණින් වශයෙන ගිණිය නොහැකිය.

5048 "මෙම කුශල කර්මය හා යෙදුනේ දෙව්වූයේ හෝ මිනිස්වූයේ අනූනවූ චිත්ත සංකල්ප ඇත්තේ තියුණු නුවණ ඇත්තේ වන්නේය.

5049 "මින් තිස් දහස්වන කපෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘතෙමේ ලොව පහළ වන්නේය.

5050 "(මෙතෙම) ගිහිගෙන් නික්ම කිසිත් ධනයක් නොමැත්තෙකුසේ පැවිදි වන්නේය. උත්පත්තියෙන් සත් හැවිරිදි කල්හි රහත් බව ලබන්නීය.

5051 "යම් තැනක පටන්කොට තමා ගැන සිතම්ද, යම්තැනක පටන් කොට සසුනනට පැමිණියේ (පැවිදිවූයේ) වෙම්ද මේ අතරතුර මනොඥ නොවූ සිතිවිල්ලක් ගැන නොදනිමි.

5052 "මෙම සියළු භවයෙහි හැසිර සම්පත් අනුභව කෙළෙමි. මාගේ භොගයෙහි අඩු බවක් නැත. සර්වඥතාඥානයට පැසසීමෙහි මේ විපාකයයි.

5053 "මාගේ ත්‍රිවිධාග්නිහු නිවීගියහ. සියළු භවයෝ නසන ලදහ. සියළු ආශ්‍රවයෝ නසන ලදහ. දැන් නැවත ඉපදීමක් නැත.

5054 "(මින්) තිස් දහස්වන කපෙහි යම් (යම් එබඳු) නුවණකට පැසසුයෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි, සර්වඥතාඥානයට පැසසීමෙහි මේ විපාකයයි. 5055-5056

## 485 චන්දන මාලිය ථෙරාපදානය

5057 "ප්‍රිය ස්වරූපවූ මනරම්වූ පස්කම් ගුණ හැර අසූ කෙලක් ධනයද හැර අනගාර්‍ය්‍ය නම්වූ සසුනෙහි පැවිදි වීමි.

**5058** "මම පැවිදිව කයින් පව්කම් දුරුකෙළෙමි. වාක් දුශ්චරිතයද, හැරදමා ගංඉවුරෙහි වසමි.

**5059** "හුදකළාව වසන්නාවූ මාවෙත බුද්ධ ශ්‍රෙෂ්ඨ තෙමේ එළඹියේය. බුදුරජයයි මම නොදනිමි. (එහෙත්) පිළිසඳර කථා කෙළෙමි.

**5060** "මම පිළිසඳර කථාකොට නම් ගොත් විචාළෙමි. (කෙසේද යත්?) (ඔබ) දෙවතාවෙක් වෙහිද, නොඑසේ නම් පුරින්දද නම්වූ ශක්‍රයා වෙහිද,

**5061** "ඔබ කවරෙක් හෝ වෙහිද? කාගේ පුත්‍රයෙක් හෝ වෙහිද? මහා බ්‍රහ්මයා මෙහි පැමිණියේ දෝ? උදාවන හිරුමෙන් සියළු දිගුන් බබුළුවහිය.

**5062** "නිදුකාණෙනි, (ඔබගේ) පාදයෙහි දහසක් දැවි ඇති චක්‍ර (ලක්ෂණයෝ) පෙණෙත්. ඔබ කවරෙක් හෝ වෙහිද? කවරෙකුගේ හෝ පුත්‍රයෙක් වෙහිද? එය අපි කෙසේ දැන ගනිමුද?

**5063** "නම්ගොත් පවසනු මැනව, මාගේ සැක දුරු කරනු මැනව." "මම දෙවියෙක් නොවෙමි. ගාන්ධර්වයෙක්ද නොවෙමි. පුරින්දද නම් වූ ශක්‍රයාද නොවෙමි.

**5064** "මට බ්‍රහ්මත්වයක්ද නැත. ඔවුනතුරෙන්ද මම උතුම් වෙමි. ඔවුන්ගේ විෂයය ඉක්මවූයේ වෙමි. කාමබන්ධනය ප්‍රදාලනය කෙළෙමි.

**5065** සියළු කෙලෙසුන් දවා උතුම්වූ සම්යක් සම්බොධියට පැමිණියේ වෙමි." මම උන්වහන්සේගේ වචනය අසා මෙම වචනය කීමි.

**5066** 'මහාමුනිවූ සර්වඥයන් වහන්ස, ඉදින් ඔබ බුදු වූයේ වෙහි නම් වැඩ හිඳිනු මැනවි. මම ඔබට පුදන්නෙමි. ඔබ දුක් කෙළවර කරන්නේ වෙහිය."

**5067** "මම අඳුන්දිවි සම අතුරා ශාස්තෘන් වහන්සේට දුනිමි. භාග්‍යවත් තෙමේ ගිරි ගුහාවක සිංහයකු මෙන් එහි වැඩහුන්නේය.

**5068** "මහා පර්වතයට නැග අඹ ගෙඩියක් ගතිමි. සල් කලණ මල්ද, මා හැඟි සඳුන්ද,

5069 "ඒ සියල්ල වහාගෙන ලොකනායකයන් වහන්සේ වෙත එළඹ එම බුදුරජුන්හට (අඹ) එලදී සල්මල් පිදීමි.

5070 "මම සඳුන් ආලෙපකොට පහන්සිත් ඇත්තේ සොම්නස් වූයේ මහත්වූ ප්‍රීතියෙන් බුදුරජාණන් වහන්සේට වැන්දෙමි.

5071 "සුමෙධ බුදුරජතෙම අඳුන්දිව් සම්හි වැඩහිඳ එකල්හි මා තුටුකරමින් මාගේ කර්මය පැවසිය (කෙසේදයත්?)

5072 "ගඳ-මල්-දෙවගය සහිත මෙම (අම්බඵල) දානය කරණකොට ගෙන දෙදහස් පන්සියවන කපෙහි දෙව්ලොවෙහි සිත් අලවා වසන්නේය.

5073 "සම්පූර්ණවූ චිත්ත සංකල්පනා ඇති වශවර්ති දෙවියෙක්ද වන්නේය. දෙදහස් හසියවන කපෙහි මිනිසත් බවට යන්නේය.

5074 සිව් සයුරු හා සිව් මහදිවයින් කෙළවරකොට ඇති පෘථිවියට අධිපතිවූ මහත් සෘද්ධි ඇති සක්විති 'රජෙක් වන්නේය. විශ්වකර්මයා විසින් මවන ලද වෙභාර නම් නගරයක්ද විය.

5075 "(එය) නොයෙක් රුවිනින් සරසන ලද සියල්ල ස්වර්ණමයවූයේ විය. හෙතෙම මෙම ක්‍රමයෙන්ම භවයෙහි සැරිසරන්නේය.

5076 "දිව අත්බවවෙහිද යලි මිනිස්බවෙහිද යන සියළු තන්හී පුදන ලදුයේම පශ්චිම භවය පැමිණි කල්හි බ්‍රාහ්මණයෙක් වන්නේය.

5077 "ගිහිගෙන් නික්ම අනගාර්‍යයී වන්නේය අභිඥාවන්හි පරතෙරටගියේම ආශ්‍රව රහිතව පිරිනිවන් පාන්නේය"

5078 "ලොකනායකවූ සුමෙධ බුදුරජතෙම මෙය වදාරා මා බලා සිටියදීම් අහස් මගෙහි (අහසින්) වැඩියේය.

5079 "තුෂිත දිව්‍යලොකයෙන් චුතව මව්කුසෙහි උපනිමි. මම යම් ගැබක වෙසෙම්ද (එකල්හි) මාගේ භොගයෙහි අඩුබවක් නැත.

5080 'මා මව් කුසෙහි පිළිසිඳගත් කල්හි මාගේ අදහසට අනුව මවට කැමතිතාක් ආහාරද පානද යන භොජන පහළ වේ.

**5081** "උත්පත්තියෙන් පස්හැවිරිදි කල්හි අනාගාරයී නම්වූ සසුනෙහි පැවිදි වීමි. කෙස් කැපූ කල්හි රහත් බවට පැමිණියෙමි.

**5082** "පූර්ව කර්මය පිරික් සන්නේ මම (එය) අඩුවෙන් නොදුටිමි. තිස්දහස්වන කපෙහි (සිට) මාගේ කර්මය සිහි කෙළෙමි.

**5083** "පුරුෂ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා, පුරුෂොත්තමයන් වහන්ස, ඔබවහන්සේ ගේ සසුනට පැමිණ අචල පදයවූ නිවණට පැමිණියේ වෙමි."

**5084** "තිස් දහස්වන කපෙහි යම් බුද්ධ පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 5085-5086

## 486 ධාතු පූජක ථෙරාපදානය

**5087** "ලොකනායකවූ සිද්ධාර්ථ බුදුරජුන් පිරිනිවි කල්හි මම මාගේ ඥාතීන් රැස්කොට ධාතු පූජාවක් කෙළෙමි.

**5088** "මින් සිව් අනූවන කපෙහි යම් ධාතු පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි ධාතු පූජාවෙහි මේ විපාකයයි. 5089-5090

## 487 පුලිනුප්පාද ථෙරාපදානය

**5091** "හිමවත් පව්වෙහි දෙවල නම් තවුසෙක් විය. එහි අමනුෂ්‍යයන් විසින් මවන ලද මාගේ සක්මණ විය.

**5092** "එකල්හි දළමඑඩු බරින් බරවූ කමඬලා (පැන් කෙන්ඩි) දරන්නාවූ උත්තමාර්ථයවූ නිවන සොයන (මම) වනයෙන් නික්මුනෙමි.

**5093** "එකල්හි මට අසූහාරදහසක් ශිෂ්‍යයෝ උවටැන් කළාහුය. (ඔව්හු) ස්වකීය කටයුතුවල යෙදුනාහු වනයෙහි වෙසෙත්.

**5094** "අසපුවෙන් නික්ම වැලි සෑයෙක් කෙළෙමි. නොයෙක් මල් රැස්කොට එම සෑය පිදීමි

**5095** "මම එහි සිත පහදවා අසපුවට පිවිසෙමි. සියළු ශිෂ්‍යයෝ රැස්ව මාගෙන් මෙම කරුණ විචාළාහුය. (කෙසේද යත්?)

**5096** "ඔබ වැලියෙන් කළ සෑයක්හි යම් දෙවියෙකුට නමස්කාර කෙරෙහිද, (එම දෙවියා) අපිදු දැන ගැනීමට කැමැත්තෙමු. අප විසින් විචාරණ ලද ඔබ අපට (එය) කියනු මැනව"

**5997** "අප විසින් මන්ත්‍රපදයෙහි දක්වනලද මහත් යසස් ඇති බුදුවරු වෙති. මම මහත් යශස් ඇති එම බුද්ධ ශ්‍රෙෂ්ඨයන් නමදින්නෙමි"

**5098** "ඒ මහාවීරවූ සර්වඥවූ ලොකනායකවරයෝ කෙබඳු වෙත්ද? කෙසේවූ සටහන් ඇත්තෝ වෙත්ද? කෙසේවූ ස්වභාව ඇත්තෝ වෙත්ද? ඒ මහත් යසස් ඇත්තෝ? කෙබඳු වූවෝ වෙත්ද?"

**5099** "බුදුවරයෝ දෙතිස් (මහපුරිස්) ලකුණු ඇත්තෝය. සතළිසක් දත් ඇත්තෝය. උන්වහන්සේලාගේ වස්සෙකුගේ ඇස් පිහාටු ඇති ඔලිඳගෙඩි වැනි නෙත්‍රයෝ වෙති

**5100** "ගමන් කරන්නාවූ බුදුවරයෝ විය. පමණවූම දුර බලත්. උන් වහන්සේලාගේ දණහිස් ශබ්ද නොකරයි. (අත් පා ආදී) සන්ධීන්හි ශබ්දයක් නොඇසේ.

**5101** "ගමන් කරන්නාවූ බුදුවරයෝ පළමුකොට දකුණු පය ඔසවමින් (පෙරට තබමින්) යන්නාහ. මේ බුදුවරයන්ගේ ධර්මතාවකි.

**5102** "ඒ බුදුවරයෝ කෙශර සිංහරාජයන් මෙන් නිර්භීතය තමා උසස්කොට නොදක්වත්. ප්‍රාණීන් හෙලා නොදකිත්.

**5103** "මාන-අවමාන දෙකින් මිදුනාහු සව් සතුන් කෙරෙහි සම (සිත් ඇත්තෝය. බුදුවරයෝ තමා උසස්කොට නොදක්වන්නෝය බුදුවරයන්ගේ මේ ධර්මතාවකි.

**5104** '(ලොව) උපදින්නාවූ එම බුදුවරයෝ (විශෙෂ) ආලොකයක් දක්වත්. හුදෙක් මෙම පෘථිවිය ආකාර සයකින් කම්පා කෙරෙත්.

**5105** "මේ බුදුවරයෝ නිරයද දකිත් (ලොවපහළ වන) එකල්හි නිවීයෙයි. මහවැසි වසියි බුදුවරයන්ගේ මේ ධර්මතායි.

**5106** "අතුල්‍ය (අසම) වූ මහත් යසස් ඇති අතිශ්‍රෙෂ්ඨවූ ඒ බුදුවරයෝ රූපකාය සම්පත්තියෙන් නොඉක්ම විය හැක්කේය. තථාගතවරයෝ අපමණවූ ගුණ ඇත්තෝය.

**5107** සියළු ශිෂ්‍යයෝ මාගේ වචනය ගෞරව සහිතව පිළිගත්තාහුය. (වචනයට අනුව තුටුවූහ) (ඔවුන්ගේ) ශක්ති වූ පමණින් බලයවූ පමණින් එසේම පිළිපැද්දාහුය.

**5108** "ස්වකීය කර්මාභිලාෂිවූ (ඔවුහු) මාගේ වචනය අදහන්නාහු බුදුබවට ගිය සිත් ඇත්තාහු වැලි (සෑය) පුදත්"

**5109** "එකල්හි මහත් යසස් ඇති (බෝසත්) දිව්‍යපුත්‍ර තෙමේ තුෂිත දිව්‍යලොකයෙන් චුතව මව්කුසෙහි උපන්නේය. දසදහසක් ලෝදා කම්පා විය.

**5110** "මම අසපුවට නුදුරෙහි සක්මනෙහි සිටියේ වෙමි. සියළු ශිෂ්‍යයෝ රැස්ව මාගේ සමීපයට පැමිණියාහුය.

**5111** (පැමිණ) "පෘථිවිය ඍෂභයෙකු මෙන් නාද කෙරෙයි සිංහයෙකු මෙන් ශබ්ද පවත්වයි සුංසුමාර නම් ජලචර ව්‍යාල මත්ස්‍යයකුසේ සැළෙයි. (මින්) කවර විපාකයක් වන්නේ දැයි" (ඇසුහ.)

**5112** "වැලි සෑය සමීපයෙහිදී (මම) යම් බුදුවරයෙකු ගැන කීයෙම්ද? ඒ භාග්‍යවත් ශාස්තෘ තෙමේ දැන් මව්කුසට එළඹියේය.

**5113** "ඔවුනට ධර්ම කථාව කියා මහාමුනිවූ බුදුරජුන් හට පසසා සිය සසුන් පිටත්කොට යවා මම පලඟ බැඳගතිමි.

**5114** "ඒකාන්තයෙන්ම මාගේ (ශරීර) බලය ද ක්ෂයවිය. බලවත් ව්‍යාධියෙකින් මම පෙළුනේ වෙමි. මම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත්කොට එහි කළුරිය කෙළේ වෙමි.

**5115** "එකල්හි සියළු ශිෂ්‍යයෝ රැස්ව චිතකයක් කළාහුය. මාගේ මෘත දෙහය ගෙන සෑයට නැංවූහ.

**5116** "සෑය පිරිවරා හිඳ ඇඳිලි බැඳ සෝක හුලින් පෙළුනාහු රැස්වූ (එම) ශිෂ්‍යයෝ හැඬුවාහුය.

**5117-5118** "ඔවුන් විලාප කියමින් හඬද්දී (එම) චිතකය සමීපයට ගියෙමි. (ගොස් මෙසේ කීමි) 'මම තොපගේ ආචාර්‍ය්‍යයා වෙමි. ශොක නොකරව් මනා නුවණින් යුතුව යහපත්වූ කටයුතුවල දිවා රෑ දෙක්හි අනලස්වූයේ උත්සාහ වඩව් තොපවිසින් (අෂ්ට දුෂ්ටදුක්ෂණ විනිර්මුක්ත බුද්ධොත්පාද) ක්ෂණය පිළියෙළ කරගන්නා ලදී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5119 "(මෙසේ) සිය සිසුනට අනුශාසනා කොට යලි දෙව්ලොවට ආයෙමි. මම අටළොස් කපක් දෙව්ලොව සිත් අලවා විසීමි.

5120 "මම පන්සිය වරක් සක්විතිරජ වීමි. පන්සියක් වර දිව්‍යරාජ්‍යය කෙළෙමි.

5121 "මම සෙසු කල්පයන්හි (දෙව්-මිනිස් දෙගතියෙහි) මිශ්‍රවශයෙන් සැරි සැරීමි. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. වැලි සෑ පිදීමෙහි මේ විපාකයයි.

5122 'සඳරැස් සහිත මසෙහි යම්සේ වෘක්ෂයෝ පිපෙත්ද, එසේම මමද සුදුසු කල්හි මහර්ෂිවූ බුදුරජුන් විසින් පුබුදුවන ලදුයේ වෙමි.

5123 "යොග ක්ෂෙම නමවූ නිවණ දක්වාම උසුලා යන යන්නාවූ මාගේ ධූරවාහක (ගව) යා වීයයීයයි. ඈත් රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

5124 '(මින්) සියක් දහස්වන කපෙහි බුදුරජුන්හට යම් පැසසීමක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ගුණ කථනයෙහි මේ විපාකයයි. 5125-5127

## 488 තරණිය ථෙරාපදානය

5128 "සියල්ල තෙමේම අවබොධ කළාවූ ලොකනායකවූ භාග්‍යවත්වූ අර්ථ දස්සී බුදුරජතෙම විනතා නදී තීරයට වැඩියේය.

5129 "(එකල මම) ජලයෙහි හැසිරෙන්නාවූ කැසුබුවෙක් (වීමි) බුදුරජුන් ගඟින් එතර කරනු කැමැති මම එම සර්වඥයන් වහන්සේ වෙත එළඹියෙමි. (එළඹ මෙසේ කීමි)

5130 "මහාමුනිවූ බුදුරජතෙමේ මාගේ පිටට නගීවා, ඒ ඔබ මම තරණය කරන්නෙමි. ඔබ (ලොකයාගේ) දුක් කෙළවර කරන්නේ වෙහිය" (කියායි)

5131 "මහත් යසස් ඇති අර්ථදස්සී බුදුරජතෙම මාගේ අදහස දැන මාගේ පිටට නැගී සිටියේය.

5132 "යම් තැනක පටන් කොට තමා සිහි කෙරෙම්ද, යම් තැනක පටන් කොට නැණවත් බවට පැමිණියේ වෙම්ද, ඔබ වහන්සේගේ පාද තලය ස්පර්ශවූ කල්හි ඇතිවූ ඒ සුවය යම්සේද එබඳු සුවයක් මට (මේ තාක්) නැත."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5133 "මහත් යසස් ඇති අර්ථදස්සී බුදුරජතෙම එතරවී ගංතෙර සිටගෙන මෙම ගාථාවෙන් වදාළේය. (කෙසේද යත්?)

5134 "මේ ගඟ සැඩපහර තරණය කරමැයි (මා තුළ) යම්තාක් සිතක් පවතීද (එවිට) පැණවත් (මේ) කැසුබු රජ තෙම මා එතර කරවීය.

5135 "මේ බුදුරජුන් තරණය කිරීම කරණකොට ගෙනද, (ඇතිවූ) මෙත්සිත ඇති බව කරණකොටගෙනද අටළොස්සියවන කපෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේය.

5136 "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් මෙහි පැමිණ හුනස්නෙහිම හිඳ සැකය නැමැති සැඩපහර තරණය කරනනේය" (කියායි)

5137 "යම්සේ සරුකෙතක රොපණය කරනලද ස්වල්පවූ ද බිජුවට මැනවින් වැසිවසින කල්හි (එහි) සශ්‍යඵලය ගොවියා තුටු කරයි.

5138 "එසේම මේ බුද්ධ ක්ෂෙත්‍රය සම්බුදු රජුන් විසින් දෙසන ලද (දහම් නමැති) වැසි මැනවින් වස්නා කල්හි (එහි) සශ්‍යඵලය තෙම ගොවියා තුටු කරයි.

5139 "වීර්‍ය්‍යයෙහි මෙහෙයවන ලද සිත් ඇත්තේ වෙමි. උපශාන්තවූයේ උපධි රහිතවූයේ සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

5140 "අටළොස්සියවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. (බුදු රජුන් තරණය කිරීමෙහි මේ විපාකයයි. 5141-5143

## 489 ධම්මරුචි ථෙරාපදානය

5144 "යම් කලෙක්හි පස්මරුන් දිනූ දීපංකර බුදුරජ තෙම සුමෙධ තවුසාහට මෙය (විවරණ වශයෙන්) ප්‍රකාශ කළේය. (කෙසේද යත්?) මින් අපරිමෙය්‍ය කල්පයෙහි මෙතෙම බුදුවන්නේය.

514 "(එකල්හි) මොහුගේ ජනක මාතාව මායා නම් වන්නීය පියතෙම සුද්ධොදන නම් වන්නේය. මෙතෙම ගෞතම නම් වන්නේය.

5146 "වීර්‍ය්‍යී වඩා දුෂ්කර ක්‍රියා කොට ඇසතු බෝරුක් මුල්හිදී මහත් යසස් ඇති මෙතෙම සම්‍යක් සම්බුද්ධවන්නේය.

5147 "උපතිස්ස තෙමේද කොලිත තෙමේද අග්‍රශ්‍රාවකයෝ වන්නාහුය. මේ බුදුරජුන්හට ආනන්ද නම් තැනැත්තේ උවටැන් කරන්නේය

5148 "ඛෙමා තෙමෝද, උත්පලවර්ණා තොමෝද අග්‍ර ශ්‍රාවිකාවෝ වන්නාහුය. චිත්ත තෙමේද, ආලවක තෙමේද අග්‍රෝපාසකයෝ වන්නාහුය.

5149 "ඛුජ්ජුත්තරාවෝද, නන්ද මාතා තොමෝද අග්‍රෝපාසිකාවෝ වන්නාහුය. මෙම (සර්වඥ) වීරයන්වහන්සේගේ බොධිය ඇසතුයයි කියනු ලැබේ.

5150 "අසමවූ මහර්ෂීන්වහන්සේගේ මෙම වචනය අසා සතුටුවූ දෙවිමිනිස්සු කරනලද ඇඳිලි ඇත්තාවූ නමස්කාර කෙරෙත්.

5151-5152 "එකල්හි මම සුශික්ෂිතවූ මේඝ නම් මානවකයෙක් වීමි. සුමෙධ බුදුරජුන්ගේ එම ශ්‍රෙෂ්ඨ විවරණය අසා මහාමුනිවූ කුළුණුබර අදහස් ඇති සුමෙධ බුදුරජුන් කෙරෙහි විශ්වාස ඇත්තේව පැවිදිවන්නාවූ එම (සුමෙධ) වීරයන් සමග ඒ අනුව පැවිදිවීමි.

5153 "ප්‍රාතිමොක්ෂ සංවරයෙහිද, පඤ්චවිධ ඉන්ද්‍රිය සංවරයෙහිද සංවෘතවූයේ පිරිසිදු ආජීවය ඇත්තේ සිහියෙන් යුතු වූයේ බුදුසසුන කරන්නාවූ වීරයෙක්ව.

5154 "මෙසේ වාසය කරන්නාවූ මම කිසියම් පාපමිත්‍රයෙකු සමග අනාචාරයෙහි යෙදුනේ (සුමගින් ගිලිහී) විපතට පත්වූයේ.

5155 'විතර්කයට වසඟ වූවෙක්ව සසුනෙන් බැහැරවීමි. පසුව එම පාපමිත්‍රයා විසින් මම මානාඝාතක කර්මයෙහි යොදවනලදී.

5156 "දුෂ්ඨ සිත් ඇත්තේ (මම) මව මැරීමි. ආනන්තර්‍ය්‍යී කර්මයක් කෙළෙමි. එම ආත්ම බවෙන් චුතවූයේ ඉතා දරුණු (දුක් ඇති) මහා අවීචි නරකයෙහි උපන්නේ වෙමි.

5157 "දුගතියට ගියේ බොහෝ කාලයක් දුඃඛිතව හැසුරුනෙමි. නැවත නරශ්‍රෙෂ්ඨවූ සුමෙධ වීරයා නොදුටිමි.

5158 "මෙම කල්පයෙහි සමුද්‍රයෙහි තිමිංගල නම් මත්ස්‍යයෙක් වීමි. මහසයුරෙහි නැවක් දැක ගොදුරු පිණිස (ඒ නැව වෙත) එළඹියෙමි.

5159 "මා දැක බියපත්වූ වෙළෙන්දෝ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහි කළාහුය. ඔවුන් විසින් කියනලද 'ගොතම' යන මහ හඬ අසා-

5160 "පූර්ව (දීපංකර විවරණ) සංඥාව සිහිකොට ඉන් කළුරිය කළ මම සැවැත්නුවර ආඪ්‍යවූ කුලයක බ්‍රාහ්මණ ජාතියෙහි උපනිමි.

5161 "ධර්මරුචි" නම්වූ සියළු පව් පිළිකුල් කරන්නෙක් වීමි. උත්පත්තියෙන් සත් හැවිරිදිවූ මම ලොව බබුළුවන්නාවූ බුදුරජුන් දැක,

5162 "දෙව්රම් වෙහෙරට ගොස් අනගාරයෑ නම්වූ සසුනෙහි පැවිදිවීමි. රාත්‍රියෙහිද දිවාකල්හිද බුදුරජුන් වෙත තෙවිටක් එළඹෙමි.

5163 "එකල්හි සර්වඥතෙමේ ධර්මරුචි නම්වූ මා බොහෝ කලකින් දැක මෙසේ වදාළේය. ඉක්බිති මම පූර්වකර්මයෙන් ප්‍රභාවිතවූ බුදුරජුන්හට (මෙසේ) කීමි.

5164 "පෙර දිවකුරු බුදුන් හමුවෙහි සපිරූ පිරිසිදු පාරමී සමූහ ඇති, සියයක් පින් ලකුණු ඇති, සුන්දර දැකුම් ඇති, උපමා විෂයාතික්‍රාන්ත ශරීර ඇති ඔබ බොහෝ කලකට පසු මම අද ඒකාන්තයෙන් දකිමි.

5165 "මහා මුනීන්වහන්ස, ඔබ විසින් නසනලද මොහඳුරු ඇත්තේය. මැනවින් රැකීම් වශයෙන් (තෘෂ්ණා) නදීතොමෝ වියලන ලද්දීය. බොහෝ කලකට පසු නිර්මලවූ නිවණ සාක්ෂාත් කරනලදී. ඥානමයවූ දිව්‍ය චක්ෂුසය බොහෝ කලකට පසු තබනලදී.

5166 "ගෞතමයන් වහන්ස, බොහෝ කලකට පසු ඔබවහන්සේ සමග එක්වූයේ වෙමි. (පෙර එක්ව සිට) නැවත අතරතුර බොහෝ කලක් (ඔබෙන් වෙන්ව) නටුයේ වෙමි. නැවත (පෙර මෙන්) අද ඔබවහන්සේ සමග එක්වූයේ වෙමි. කරනලද කර්මයෝ විනාශ නොවෙත්. 5167-5169.

## 490 සාලමණ්ඩපිය ථෙරාපදානය

5170 "සල් වනයට පිවිස මට අසපුවක් කරනලදී. එකල්හි සල්මල්වලින් ගැවසීගත්තේ එම වනයෙහි වෙසෙමි.

5171 "සියල්ල තෙමේම අවබොධ කළාවූ භාග්‍යවත් පියදස්සී සම්බුදු රජතෙම විවේක සැප කැමැත්තේ සල් වනයට එළඹියේය.

5172 "මම අසපුවෙන් නික්ම වනයට ගියෙමි. එකල්හි මුල් හා ඵල සොයමින් වනයෙහි ඇවිදිමි.

5173 "එම වනයෙහි බබලන්නාවූ වැඩහුන්නාවූ සමාධියට සමවන් මහත් යසස් ඇති පියදස්සී සම්බුදුරජුන් දුටිමි.

5174 "මම බුදුරජුන් (සිටින තැන වැසෙන සේ එයට) මතුයෙහි (දඬු සතරක් එකට තබා කෙළවරකින් එකට බැඳගත්) චතුර්දණ්ඩය තබා මනා මඩුවක් කොට සල්මල්වලින් ගැවසීමි.

5175 "මම සල්මලින් වසනලද මණ්ඩපය සතියක් දරා එහි සිත පහදවා බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට වැන්දෙමි.

5176 "පුරුෂොත්තමවූ භාග්‍යවත් තෙමේ සමාධියෙන් නැගිට වියදඬු පමණ දුර බලනුයේ වැඩහුන්නේය.

5177 "පියදස්සී බුදුරජුන්ගේ වරුණ නම් ශ්‍රාවකතෙමේ ලක්ෂයක් රහතුන් සමග බුදුරජුන් වෙත එළඹියේය.

5178 "පස්මරුන් දිනූ ලොකජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ පියදස්සී භාග්‍යවත් තෙමේ බික්සඟන මැද හිඳ සිනා පහළ කළේය.

5179 "පියදස්සී බුදුරජුන්ගේ අනුරුද්ධ නම් උපාසක තෙමේ සිවුරු එකස්කොට බුදුරජුන්ගෙන් (මෙසේ) විචාළේය.

5180 "භාග්‍යවතුන් වහන්සේ, ශාස්තෘවූ ඔබවහන්සේ ගේ සිනා පහළකිරීමට හේතුව කිම? ශාස්තෘතෙමේ කරුණක් ඇති කල්හිම සිනා පහළ කරන්නේය." (කියායි)

5181 "යම් මානවකයෙක් තෙම සතියක් මුළුල්ලෙහි මට මල් සෙවෙනියක් දැරීද, ඔහුගේ (ඒ) කර්මය සිහිකොට මම සිනා පහළ කෙළෙමි.

5182 "යම් තැනක (එම) පිණ විපාක දේ නම් (එබඳු) ඉඩ ඇති තැනක් මම නොදකිමි. දෙව්ලොවෙහි හෝ මිනිස් ලොවෙහි හෝ ඇති අවකාශයද නොසෑහේ.

5183 'පුණ්‍යකර්මය සහ යෙදුනාවූ දෙව්ලොව වසන ඔහුගේ පිරිස යම්තාක් නම් (ඒතාක්) එම පිරිස් තොමෝ සල් සෙවනයෙන් වසනලද්දී වන්නීය.

5184 "පූර්වකර්ම විපාකය සහ යෙදුනේ එහි දිව්‍යමයවූ නෘත්‍යයන්ගෙන්ද හැම කල්හි සිත් අලවා වසන්නේය.

5185 "ඔහුගේ පිරිස යම්තාක් නම් (ඒතාක්ම) සුගන්ධයන්ගෙන් සුගන්ධවත් වූයේ වන්නේය. එකෙණෙහි සල් මල් වැසිද වසින්නේය.

5186 "මේ මිනිස්තෙම (එසේ) දෙව්ලොවින් චුතව (නැවත) මිනිසත් බවට පැමිණෙන්නේ නම් මේ මිනිස් ලොවෙහිද හැමකල්හිම සල්මල් සෙවෙනියක් දරන්නේය.

5187 "මෙහි කයිතාලම්වලින් යුත් නැටුම්ද ගැයුම්ද මා නිතර පිරිවරන්නාහුය. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

5188 "හිරු උදාවන කල්හි සල්මල් වැසි වසී. පුණ්‍ය කර්මය හා සංයුක්තවූ ඔහුට (එම වැසි) සර්වකාලිකව වසී.

5189 "අටළොස් සියවන කපෙහි ඔක්කාක කුලයෙහි උපන්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘ තෙමේ ලොව පහළවන්නේය.

5190 "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූ ධර්මයෙහිම නිර්මිතකළාක් වැනිවූ ඖරස බුද්ධපුත්‍රවූයේ සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥාවශයෙන්) දැන ආශ්‍රව රහිතව පිරිනිවෙන්නේය.

5191 "ධර්මය අවබොධ කරන්නාවූ මොහුට සල්මල් සෙවෙනියක් වන්නේය පිරිනිවීමෙන් පසු චිතකය දැවෙන කල්හිද සෙවෙනිය වන්නේය.

5192 "මහාමුනිවූ පියදස්සී බුදුරජතෙමේ (මෙම පුණ්‍ය කර්මයෙහි) විපාකය වදාරා දහම් වැස්සෙන් වැසීමට පත්කරමින් පිරිසට දහම් දෙසීය.

5193 "මම දෙවියන් අතරෙහි තිස්කපක් දිව්‍යරාජ්‍යය කරවීමි. සත්සැට වරක් සක්විති රජවීමි.

5194 "දෙව්ලොවින් මෙහි පැමිණ මහත්වූ සැප ලබමි. මෙහිද සර්වකාලිකවූ සල්මල් සෙවෙනියක් වන්නේය.

**5195** "ශාක්‍ය කුලශ්‍රෙෂ්ඨවූ ගෞතම බුදුරජුන් තුටුකොට ජය පරාජය හැර අචල ස්ථානයවූ නිවණට පැමිණියේ වෙමි.

**5196** "අටළොස් සියවන කපෙහි යම් බුද්ධපූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි යම් විපාකයයි. 5197-5199

## 50 කිංකණි පුප්ඵිය වග්ග.

### 491 තිකිංකණි පුප්ඵිය ථෙරාපදානය

**5200** "කිණිහිරි රුකක් මෙන් බබලන්නාවූ කඳු අතරෙහි වැඩහුන්නාවූ ලොක නායකවූ කෙලෙස් විරහිත විපස්සි බුදුරජුන් දුටිමි

**5201** "කිංකිණි පුෂ්ප තුනක් ගෙන (එම බුදුරජුන්හට) පිදීමි. සම්බුදුරජුන් පුදා දකුණු දිගට මුහුණ ලා යෙමි.

**5202** 'මම මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොට ගෙනද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

**5203** 'මින් එක් අනූවන කපෙහි යම් බුද්ධ පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 5204-5206

### 492 පාංසුකූල පූජක ථෙරාපදානය

**5207** "හිමවතට නුදුරෙහි උදංගණ නම් පර්වතයක් විය. එහි ගස් මුදුනක එල්වන ලද පාංශුකූල චීවරය දුටිමි.

**5208** "එකල්හි මම කිංකණි පුෂ්ප තුණක් නෙලාගන සතුටුවූයෙ සතුටු සිතින්ම (එම) පංශුකූල චීවරයට පිදීමි

**5209** "මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොට ගෙනද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

**5210** 'මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද, එම අර්හත් ධජය පුදා (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. 5211-5213

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 493 කොරණ්ඩ පුප්ඵිය ථෙරාපදානය

**5214** "මම පෙර පිය මුතුන් පරපුරෙහි පටන්ම වනයෙහි කටයුතු කරන්නෙක් වීමි. සිව්පා සතුන් මැරීමෙන් ජීවත් වෙමි. මට කුසලයක් නැත.

**5215** "මාගේ අසපුව අබියෙස පසැස් ඇති ලොකාග්‍ර නායකවූ තිස්ස බුදුරජතෙමේ අනුකම්පාවෙන් පියවර තුනක් දැක්විය.

**5216** "තිස්ස බුදුරදුන්ගේ තබනලද පියවර සටහන් දැක සතුටුවූයේ සතුටු සිතින් පියවර සටහනෙහි සිත පැහැදවීමී.

**5217** "පිපීගිය කරඬු ගසක් දැක කොපුව සහිතවම (එම මල්) ගෙන ශ්‍රෙෂ්ඨ ශ්‍රීපාද ලාංඡනය පිදීමි.

**5218** "මම මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙනද චිත්තප්‍රණිධින් කරණකොට ගෙනද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

**5219** "මම දිව්‍යවූ හෝ මනුෂ්‍යවූ හෝ යම් යම් යොනියක උපදිම්ද ප්‍රභා සහිතවූ කොරණ්ඩක පුෂ්ප වර්ණවූ සිවි ඇත්තේ වෙමි.

**5220** "මින් දෙයානූවන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පියවර සටහන් පිදීමෙහි මේ විපාකයයි. 5221-5223

## 494 කිංසුක පුප්ඵිය ථෙරාපදානය

**5224** "පිපීගිය කැලගසක් දැක ඇඳිලි බැඳගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත් කොට (ගසේ තිබියදීම) අහසෙහි පිදීමි.

**5225** "මම මැනවින් කරන ලද එම කර්මය කරණ කොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොට ගෙනද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

**5226** "මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 5227-5229

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 495 උපඩ්ඪ දුස්ස දායක ථෙරාපදානය

5230 'එකල්හි පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ සුජාත නම් ශ්‍රාවකතෙමේ පංශුකූල (සිවුර සඳහා රෙදි කැබලි සොයමින් කසල (එකතුකොට) ඇතිතන්හි හැසිරෙත්.

5231 "මම හංසවතී නගරයෙහි අනුන්ගේ (මෙහෙකරන) බැලයෙක් වීමි. (ඒ මම උන්වහන්සේට) අඩවතක් (රෙදි කැබෙල්ලක්) දී හිසනමා වැන්දෙමි.

5232 "මම මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොට ගෙනද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

5233 "තෙතිස්වරක් දෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරවීමි මම සත් සැත්තෑ වරක් සක්විති රජ වීමි.

5234 "(කරවන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍ය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය. අඩවත් දනින් (භය විරහිත බැවින්) අකුතොභයවූ නිවන පසක් කළේ සතුටු වෙමි.

5235 "මම අද කැමති වන්නේ නම් වන පර්වත සහිතවූ (සියල්ල) කොමු පිළිවලින් වහන්නෙමි. අඩවත් දනෙහි මේ විපාකයයි.

5236 "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අඩවත් දනෙහි මේ විපාකයයි. 5237-5239

## 496 සත මණ්ඩදායක ථෙරාපදානය

5240-5241 'මනාකොට සිතන ලද්දාවූ ලොකජේ‍යෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ වාතාබාධයකින් පෙළුනාවූ වැඩහුන්නාවූ මහා වීරවූ භාග්‍යවතුන් වහන්සේ දැක සිත පහදවා ඉතා පිරිසිදු ගිතෙල් ටිකක් පිළිගැන්වීමි. (මෙම පුණ්‍ය කර්මය) කරන ලද බැවින් රැස්කරන ලද බැවින් මේ භාගීරසී ගඟද,

5242 "සිව් මහ සමුදුරද මට ගිතෙල් සපයති. අප්‍රමාණවූ අසංඛ්‍යවූ මේ මහත් පෘථිවියද,

5243 "මාගේ අදහස දැන මී සකුරු (බවටපත්) මේ සිව් මහ දිවයිනෙහිවූ ඒ මේ වෘක්ෂ සමූහයද,

**5244** "මාගේ අදහස දැන කල්ප වෘක්ෂයෝ වෙති. පණස් වරක් දෙවෙන්ද්‍රව දිව්‍ය රාජ්‍යය කෙළෙමි.

**5245** "මම එක් පණස්වරක් සක්විති රජවීමි. (කරවන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණින් වශයෙන් (මෙතෙකැයි) හිණිය නොහැකිය.

**5246** "මින් සානූවන කපෙහිවූ එකල්හි යම් (ගිතෙල්) දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පිරිසිදු ගිතෙල් දනෙහි මෙම විපාකයයි. 5247-5249

## 497 උදක දායක ථේරාපදානය

**3250** "පදුමුත්තර බුදුරජුන්ගේ අනුත්තරවූ භික්ෂු සංඝයා කෙරෙහි පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ පැන් කළයක් පිදීමි.

**5251** "පර්වත මුදුනෙහිදී හෝ ගස මුදුනෙහිදී හෝ අහසෙහිදී හෝ පොළොවෙහිදී යම් කලෙක්හි පැන් කැමති වෙම් නම් වහා මට (පැන්) පහළවේ.

**5252** "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් (පැන්) දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පිරිසිදු ගිතෙල් දනෙහි මේ විපාකයයි. 5253-5255

## 498 පුලින ථූපිය ථේරාපදානය

**5256** "හිමවතට නුදුරෙහි යමක නම් පර්වතයක් විය. (එහි) මට මැනවින් කරන ලද අසපුවක් විය. පන්සැලක්ද මොනවට නිම කරන ලදී.

**5257** "(මම) නමින් නාරද නම්වූ උග්‍ර තපස් ඇති ජටිලයෙක් වෙමි. තුදුස් දහසක් ශිෂ්‍යයෝ මා පිරිවරත්.

**5258** "මම එකල්හි විවේකව හුන්නේ මෙසේ සිතීමි. සියළු ජනතෙමේ මා පුදයි. මම (කිසිවෙකුට) කිසිවක් නොපුදමි.

**5259** "මට කිසි ඔවා දෙන්නෙක්ද නැත (කිසිවෙකුට කරන) කිසිවතාවතකුදු නැත. මම ආචාර්‍ය්‍ය උපාධ්‍යාය විරහිතව වනයෙහි වෙසෙමි.

**9260** "මම යමෙකු වෙත එළඹෙන්නේ නම් හේ (මා කෙරෙහි) ගුරුවරයෙක යන සිත උපදවාගන්නේය. මට එබඳු ගුරුවරයෙක් නැත. වනයෙහි විසීම නිරර්ථකය.

**5261** මම එසේ ගරුභාවනීයවූ උතුමෙකු සොයන්නෙමි. (එබඳු උතුමෙකු) ඇසුරුකෙළේ වසමි. එවිට (කිසිවෙක් (මට) නොගරහන්නේය.

**5262** "නොගැඹුරු ඉවුරු ඇති මනාවූ කුඩා තොටුපලවල් ඇති මනොඥවූ සුදෝසුදු වැලිතලාවන්ගෙන් ගැවසීගත් කුඩා ගඟක් මෙන් අසපුවට නුදුරෙහි විය.

**5263** "(එය) අමරිකා නම්වූ නදියකි. එකල්හි මම (එතැනට) එළඹ වැලි එකතුකොට වැලි සෑයක් (පුලින චෛත්‍යයක්) කෙළෙමි.

**5264** "භවය කෙළවර කරන්නාවූ යම් ඒ සර්වඥ මුනිවර කෙනෙක් වෙත්නම් මෙබඳුවූ සෑයක් (තනන්නේ) උන්වහන්සේට නිමිතිකොට මම මේ සෑය කරමි.

**5265** "වැලිගොඩෙහි සෑයක් කොට මම ස්වර්ණ නිර්මාණය කෙළෙමි. රන් කිකිණි මල් තුන් දහසක් පූජාකෙළෙමි.

**5266** "හටගත් ප්‍රීති ඇත්තේ බඳින ලද ඇඳිලි ඇත්තේ සවස හා උදයෙහි නමදිමි. සම්බුදුන් හමුයෙහිදී මෙන් පුලින චෛත්‍යය (වැලිසෑය) වඳිමි.

**5267** "යම් කලෙක්හි ගිහිගෙට අයත් ක්ලේශවිතර්කයෝ හටගනිත්ද, එකෙණෙහි සර්වඥ ස්තූපය සිහිකරමි. ප්‍රත්‍යවෙක්ෂ කරමි.

**5268** "සාර්ථවාහකවූ විනායකවූ බුදුරජුන් ඇසුරු කොට වසන්නේ ක්ලේශයන්හි ගැටී වසන්නෙහි නම් නිදුකාණෙනි, (එය) ඔබට නුසුදුසුය.

**5269** "එකල්හි සෑය සිහිකළ කෙනෙහි මාගේ සිත්හි ගෞරවය ඇතිවේ. අකුස්සෙන් පෙළනලද ඇතෙකු මෙන් මිථ්‍යා විතර්කයන් දුරු කෙරෙමි.

**5270** "මෘත්‍යුරාජයා මෙසේ වසන්නාවූ මා වැසීය. මම එහි කළුරිය කළේ බඹලොවට ගියෙමි.

**5271** 'මම එහි දිවි ඇතිතාක් වසා තාවතිංස දෙව් ලොවෙහි උපනිමි. අසූවරක් දෙවෙන්ද්‍රව දිව්‍ය රාජ්‍යය කරවීමි.

**5272** "මම තුන්සියවරක් සක්විති රජවීමි. (කරවනලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නොහැකිය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5273 "මම එම පිදූ කිංකණි පුෂ්පයන්ගේ විපාකය අනුභව කරමි. භවයෙහිදී සියත් දහසක් කිරි මව් වරු මා පිරිවරත්.

5274 "සෑය පිළිදැගුම් කරන ලද බැවින් දැලි කුණු නොතැවරේ. සිරුරෙහි ඩහ නොවැගිරෙයි. මම ප්‍රභා සහිත (පැහැපත්) වූයේ වෙමි.

5275 "ආශ්චර්‍ය්‍යයකි. මා විසින් මැනවින් කරන ලද සෑයකි. (එසේම) ඇමෙරිකා නදියද මැනවින් දක්නා ලදී. වැලිතලාවෙහි සෑයක් කොට අචලපදයවූ නිවණට පැමිණියේ වෙමි.

5276 "කුසල් යනු කැමැත්තාවූ (නිර්වාණ) සාරය ගන්නාවූ සත්වයා විසින් (එයට) මෙය කෙතය. මෙය නොකෙතයයි (වෙන්කොට ගතයුත්තක්) නැත.

ප්‍රතිපත්ති තොමෝම අර්ථසාධක වන්නීය.

5277-5278 "බලවත් පුරුෂයෙක් තෙම සාගරය තරණය කරන්නට උත්සාහ කරන්නේද, යම්සේ (හේ) කුඩා දඬු කැබැල්ලක් ගෙන මහසයුරට පණින්නේ නම් මම මේ දඬු කැබෙල්ල නිසා මහ සයුර තරණය කරන්නෙමැයි උත්සාහයෙන්ද වීර්‍ය්‍යයෙන්ද (එම) මනුෂ්‍යතෙම සයුර තරණය කරන්නේය.

5279 "එසේම මා විසින් යම් කර්මයක් කරන ලද නම් (එය) කුඩාය. ඉතාම සුළුය. (එහෙත්) එම කර්මය නිසා සසර ඉක්මවීමි.

5280 "එම කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ අන්තිම භවය පැමිණි කල්හි පළමුකොටම සැවැත්නුවර ආඪ්‍යවූ මහා සාර කුලයෙහි උපන්නේ (වෙමි.)

5281 "මාගේ දෙමාපියෝ සැදැහැත්තාහුය. බුදුරජුන් ගේ සරණ ගියෝය මේ දෙදෙනාම දක්නා ලද (නිර්වාණ) පදය ඇත්තෝය. ශාසනයටද අනුව පවතිත්.

5282 "(ඔවුහු) බොධියෙහි පතුරක් ගෙන රන් සෑයක් කරවූහ. බුදුරජුන්ගේ හමුවෙහි උදේ සවස නමස්කාරද කෙරෙත්.

5283 "පොහෝ දිනයෙක්හි ස්වර්ණ ස්තූපය පිටතට ගන්නාහුය. බුදුරජුන්ගේ ගුණ කියමින් ත්‍රියාම රාත්‍රියම ගත කළාහුය.

5284 "මම (ස්වර්ණ) ස්තූපය දැක ඒ සමගම පුලින චෛත්‍යය (අතීතයෙහි පිදූ වැලි සෑය) සිහි කෙළෙමි. එම අසුනෙහිම හිඳ රහත් බවට පැමිණියෙමි.

(දෙවිසිවන බණ වරයි)

5285 "එම වීරවූ (බුදුරජුන්) සොයන්නෝ ධර්ම සෙනාපතීන් වහන්සේ (සැරියුත් තෙරුන්) දුටිමි. ගිහිගෙන් නික්ම උන්වහන්සේගේ සමීපයෙහි පැවිදි වීමි.

5286 "උත්පත්තියෙන් සත් හැවිරිදි කල්හි රහත්බවට පැමිණියෙමි. පසැස් ඇති බුදුරජතෙම (මාගේ) ගුණ දැන (මා) උපසම්පදා කරවීය.

5287 "මා විසින් දහර කල්හිම (මාගේ) (නිවන් සඳහා කළයුතු) කටයුතු නිමකරන ලදී. ශාක්‍යපුත්‍රවූ බුදුරජුන්ගේ සසුනෙහි කටයුතු දෙස අද මා විසින් කරන ලදී.

5288 "මහාවීරවූ ඍෂින්වහන්ස, සියළු වෛර හා භය ඉක්මවන ලදුයේ වෙමි. සියළු කෙලෙසුන්ද ඉක්මවන ලදුයේ වෙමි. (මම) ඔබ වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි. ස්වර්ණ පුෂ්ප පූජාවෙහි මේ විපාකයයි. 5289-5291

## 499 නළකුටි දායක ථේරාපදානය

5292 "හිමවතට නුදුරෙහි හාරිත නම් පර්වතයක් විය. එකල්හි සියල්ල තෙමේම දත් නාරද බුදුරජතෙම රුක්මුලක වැඩ විසීය.

5293 "මම බටවලින් කුටියක් කොට තෘණ වලින් සෙවෙනි කෙළෙමි. (එසේම) මම සක්මනක්ද පිරිසිදු කරවා බුදුරජුන්හට දුනිමි.

5294 "මම මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොට ගෙනද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට ගියෙමි.

5295 "බට වලින් කළ කුටිය පිදීම හේතුකොට ගෙන එහි (දෙව්ලොව) මට මැනවින් කරන ලද නිර්මිතවූ විමානය සැටයොදුනක් උසය, තිස්යොදුනක් පුළුලය.

5296 "මම තුදුස් කපක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා විසීමි. එක් සැත්තෑවරක් දිව්‍ය රාජ්‍ය කරවීමි.

5297 "මම සූතිස්වරක් සක්විති රජ වීමි. (කරවනලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය ගණින් වශයෙන් මෙතෙකැයි ගිණිය නොහැකිය.

5298 "සියළු ආකාරයෙන් උතුම් උපමා ඇති ධර්ම නැමැති ප්‍රාසාදයට නැගී ශාක්‍යපුත්‍රවූ බුදුරජුන්ගේ සසුනෙහි මම කැමතිතාක්ම වසමි.

5299 "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම්කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බටින් කළ කුටියක් පිදීමෙහි මේ විපාකයයි. (5300-5302)

## 500 පියාල ඵලදායක ථෙරාපාදනය

5303 'පෙර (මම) මුව වැද්දෙක් විමි. එකල්හි වනයෙහි හැසිරෙන්නේ සියළු ධර්මයන්ගේ පරතෙරට ගිය කෙළෙස් රජස් විරහිත බුදුරජුන් දුටිමි.

5304 "මම පියල් ගෙඩියක් ගෙන පහන්වූයේ සිය සිතින්ම පින්කෙත්වූ විරවූ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

5305 "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් (පියල්) දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. (5306-5308)

# 51 කණිකාර වග්ග.

## 501 තිකණිකාර පුප්ඵිය ථෙරාපදානය

5309 "දෙතිස් මහ පුරිස් ලකුණින් යුත් සර්වඥවූ සුමෙධ නම් භාග්‍යවත් තෙමේ විවෙක සැප කැමැත්තේ හිමවතට එළඹියේය.

5310 "පුරුෂොත්තමවූ අග්‍රකාරුණික බුදුරජතෙම හිමවතට පිවිස පය්‍යංකයක් බැඳගන (එරමිණිය ගොතාගෙන) වැඩහුන්නේය.

5311 "මම එකල්හි අහසෙහි හැසිරෙන විද්‍යාධරයෙක් වීමි. එකල්හි මැනවින් කරන ලද ත්‍රිශූලායුධයක් ගෙන අහසෙහි යමි.

5312 "කඳු මුදුනෙක්හිවූ ගින්නක්මෙන්ද පසළොස්වක් පොහෝදිනයෙහි සඳුමෙන්ද පිපීගිය සල්රුකක් මෙන්ද බුදු රජතෙම (මෙම) වනයෙහි බබලයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5313 "වන මුදුනෙන් නික්ම බුද්ධ රශ්මිහු පැතිරෙත්. බට වනයෙහි ඇවිලගත් ගින්නක් මෙන් (බබලන එම රශ්මිය) දැක සිත පැහැද වීමි.

5314 '(ඒ මේ අත) සොයන්නේ දිව්‍යමය සුවඳ ඇති කිණිහිරිමල් දුටිමි. එම මල් තුණක් ගෙන බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට පිදීමි.

5315 "එකල්හි මා විසින් (පුදන ලද) එම ත්‍රි පුෂ්පයෝ (මල්තුණ) බුදුරජාණන් වහන්සේගේ ආනුභාවයෙන් නැටි උඩුකුරුව පෙති යටිකුරුව බුදුරජුන්හට සෙවන කෙරෙති.

5316 'මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොටගෙනද මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

5317 "එහි මැනවින් කරණ ලද මාගේ විමානය කණිකාරී යයි හඟිනු ලැබේ. (එය) සැට යොදුන් උසය. තිස් යොදුන් පුළුලුය.

5318 "දහසක් කොටස් (බෙදුම්) ඇත්තේය. සියයක් ගොලාකාර මුදුන් ඇත්තේය. ධජයන්ගෙන් යුක්තය. කොළවන්ය මුදුන් ගෙවල් සියක් දහසක්ද මාගේ විමණෙහි පහළවුහ

5319 "කැමතිවන ලද්දාවූ රිසියෙන තාක් රන්මුවාවූද මිණිමුවාවූද පියුම් රාමිණිමුවාවූද පිළිමිණිමුවාවූද, පයඕංකයෝ (එහි) වෙත්.

5320 "(පුළුන්) මෙට්ට වර්ගයන්ගෙන් යුතුවූද දෙදාය ඇතිරිය එකදාය ඇතිරිය, බිම්බොහන යන මේවායින්ද යුතුවූ මාහැඟි සයනයෝද එහි වෙති.

5321 "යම් කලෙක්හි භවනයෙන් නික්ම දිව්‍ය සමූහයා විසින් පිරිවරන ලදුව දිව්‍යචාරිකාවෙහි හැසිරෙමින් ගමන් කිරීම කැමැත්තෙම්ද,

5322 '(එකල්හි) මල් යට සිටිමි. මාගේ මස්තකයෙහි වියනකි. (එය) හාත් පස යොදුන් සියයක් (තැන්) කිණිහිරි මල්වලින් වසන ලද්දකි.

5323 "සැට දහසක් තුයඹීයෝ උදය-සවස උවැටැන් කළාහුය. (ඔව්හු) රිය දාවල් දෙක්හි අනලස්ව නිරතුරුව මා පිරිවරත්.

5324 "එහි නෘත්‍යයන්ගෙන්ද ගීතයන්ගෙන්ද තාලයන්ගෙන්ද වාදිතයන්ගෙන්ද යන ක්‍රීඩා රතියෙන් සිත් අලවා වසමි. මම කැමති කැමති පරිදි සතුටු වෙමි.

5325 "එකල්හි එම තව්තිසාවෙහි අනුභව කොටද, පානය කොටද, තුටුවෙමි. උතුම්වූ විමනෙහි (දිව්‍ය) ස්ත්‍රී සමූහයා සමග සතුටු වෙමි.

5326 'මම පන්සියවරක් දිව්‍යරාජ්‍යයා කරවීමි. තුන්සිය වරක් සක්විති රජ වීමි.

6327 "(කරවන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතැකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය. මම කුදුමහත් භවයෙහි හැසිරෙන්නේ මහත්වූ භොග සම්පත් ලබමි.

5328 "මාගේ භොග සම්පත්තියෙහි අඩුබවක් නැත. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. කැත්කුලයෙහිද බමුණු කුලයෙහිද යලි මිනිස් අත්බැව්හිද, යන දෙඅත් බැව්හි සැරිසරමි.

5329 "අනික් ගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. කැත්කුලයෙහිද බමුණු කුලයෙහිද යන මේ දෙකුලෙහි උපදිමි.

5330 'පහත් කුලයෙහි නොඋපදිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. හස්තියානද අශ්වයානද සිවිකාද සන්දමානික නම් යාන විශෙෂයද,

5331 "යන මේ සියල්ල ලබමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. දාසී සමූහයාද දාස සමූහයාද සරසන ලද ස්ත්‍රීන්ද

5332 "යන මේ සියල්ල ලබමි. බුද්ධ පූජාවෙහි මේ විපකයයි කොසෙය්‍යද කම්බිලිද කොමු හා කපු පිළිද,

5333 "යන මේ සියල්ල ලබමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. අභිනව වස්ත්‍රද අභිනව ඵලද අභිනව අග්‍රරස භොජනද,

5334 "යන මේ සියල්ල ලබමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. මෙය කව, මෙය අනුභව කරව. මෙම සයනයෙහි සයනය කරව.

5335 "යන මේ සියල්ල ලබමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි හැමතන්හි පුදන ලදුයේ වෙමි. මාගේ කීර්තිය උස්ව පැන නැංගේය.

5336 "හැමකල්හි මහත්වූ පක්ෂපාත පිරිස ඇත්තේ වෙමි. තැනකට උතුම් වෙමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

5337 "ශීතයද උෂ්ණයද (කුමක් දැයි) නොදනිමි. පරිඩාහයක් (දැවිල්ලක්) නැත. යලි මාගේ හෘදයෙහි චෛතසික දුකක්ද නැත

5338 "කුදු මහත් භවයෙහි ස්වර්ණවර්ණවම සැරිසරමි. විවර්ණ බවක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

5339 "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් චුතව සැවැත් පුරයෙහි ඉතා ආඪ්‍යවූ මහාසාර කුලයෙහි උපන්නේ.

5340 "පස්කම් ගුණ හැර අනගාරයී නම්වූ සසුනෙහි පැවිදි වීමි. උපතින් සත් හැවිරිදිවූ මම රහත් බවට පැමිණියෙමි.

5341 "පසැස් ඇති බුදුරජතෙම ගුණ දැන (මා) උපසම්පදා කරවීය. මම තරුණ වූ පිදිය යුත්තෙක් වෙමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

5342 "මාගේ දිවැස පිරිසිදුය. මම සමාධියෙහි දක්ෂ වෙමි. අභිඥාවන්හි කෙළ පැමිණියේ වෙමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි.

5343 "පැමිණි ප්‍රතිසම්භිදා ඇත්තේ වෙමි. ඍද්ධි පාදයන්හි දක්ෂවූයේ වෙමි. ධර්මයන්හි කෙළ පැමිණියේ වෙමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

5344 "මෙයින් කල්ප තිස් දහසකට පෙර යම් ඒ බුදුරජාණන් වහන්සේ නමකට මනාකොට පිදිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 5345-5347

## 502 එකපත්ත දායක ථෙරාපදානය

5348 "මම හංසවතී නගරයෙහි කුම්භකාරයෙක් (කුඹලෙක්) වීමි. චතුරොඝයන් තරණය කළාවූ ආශ්‍රව රහිතවූ කෙළෙස් රජස් විරහිත බුදුරජුන් දුටිමි.

5349 මම මැනවින් කරනලද මැටිපාත්‍රයක් බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි. (කාය වංකාදියෙන් තොර බැවින්) ඍජුවූ තාදී ගුණ ඇති බුදුරජුන්හට පාත්‍රය දී.

5350 ‘භවයෙහි උපදිනු ලබන්නාවූ මම රන්තලි ලබමි. රජතමයවූද, ස්වර්ණමයවූද, මණිමයවූද,

5351 “පාත්‍රද, පරිභොග කරමි. පුණ්‍ය කර්මයාගේ මේ විපාකයයි. මම යසසටද ධනයටද හිමිවූයේ වෙමි.

5352 “යම්සේ සොඳුරු (සාරවත්) කෙතක රොපනය කරන ලද ස්වල්පවූද, බීජය මැනවින් වැසි ලැබෙන කල්හි (එහි) ශස්‍ය ඵලය ගොවියා සතුටු කෙරේද,

5353 “එසේම බුද්ධ ක්ෂෙත්‍රයෙහි රොපනය කරන ලද මෙම පාත්‍ර දානය (බීජය) ප්‍රීතිය නමැති වැසි වස්නා කල්හි (එහි) (විපාක ඵලය මා සතුටු කරන්නේය.

5354 සංඝයාවූද ගණයාවූද යම්තාක් (පුණ්‍ය) ක්ෂෙත්‍රයෝ විද්‍යමාන වෙත්, නමුදු සව්සත්නට සුව දෙන්නාවූ බුද්ධ ක්ෂෙත්‍රය සමාන කෙතක් (නම්) නැත.

5355 “පුරුෂ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා, එක පාත්‍රයක්දී අචල පදයවූ නිවණට පැමිණියේ වෙමි.

5356 “මින් එක් අනූවක කපෙහිවූ එකල්හි යම් පාත්‍රයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. පාත්‍ර දානයාගේ මේ විපාකයයි 5357-5359

## 503 කාසුමාරි ඵලදායක ථෙරාපදානය

5360 “(පිපීගිය) කිණිහිරි රුකක්සේ බබලන කඳු අතරෙහි වැඩහුන්නාවූ (කෙලෙස්) රජස් විරහිත ලොක ජ්‍යෙෂ්ඨවූ නරශ්‍රෙෂ්ඨවූ බුදුරජුන් දුටිමි

5361 “මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ හිසෙහි ඇඳිලි බැඳ ඇත්දෙමට (ගෙඩියක්) ගෙන බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

5362 “මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් (ඇත්දෙමට) ඵලයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 5363-5365

## 504 අවට ඵලිය ථෙරාපදානය

5366 "පස් මරුන් දිනූ සියල්ල තෙමේම අවබොධකර ගත් දහසක් රැස් ඇති භාගයවත් තෙමේ විවෙක (සමාධි) යෙන් නැගිට පිඬු පිණිස නික්මුණේය.

5367 "එසේ නික්මුණු) නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ දැක මම (අවට) ඵලගත් අත් ඇත්තේ උන් වහන්සේ වෙත එළඹියෙමි. පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ (එම) අවට ඵලයක් දුනිමි.

5368 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් (අවට) ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානසාගේ මේ විපාකයයි. 5369-5371

## 505 වාරඵලිය ථෙරාපදානය

5372 'මම ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ වීථියට පිළිපන් ස්වර්ණවර්ණවූ සම්බුදු රජුන්හට වාරඵලයක් දුනිමි.

5373 "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම් වාරඵල දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයය. 5374-5376

## 506 මාතුළුංගඵලදායක ථෙරාපදානය

5377 "පසළොස්වක් පොහෝ දිනයෙහි සඳු මෙන් දිලිසුන, කිණිහිරි රුකක් වැනි ප්‍රදීප වෘක්ෂයක් මෙන් බබලන ලොක නායකවූ බුදුරජුන් දුටිමි.

5378 "මම නාරන්ගෙඩියක් ගෙන දක්ෂිණාර්හ දීමට සුදුසු) වූ ප්‍රාඥාවූ ශාස්තෘන්වහන්සේට පහන්වූයේ සියතින් දුනිමි.

5379 "මින් එක්තිස්වන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 5380-5382.

## 507 අජෙලිඵලදායක ථෙරාපදානය

5383 "එකල්හි චරණ ධර්මයන්ගෙන්ද, යුක්තවූ සමාධියෙහි දක්ෂවූ මොනෙයය ගුණ යුත් අජ්ජුන නම් සම්බුදුරජ තෙමේ හිමවතෙහි වැඩ විසීය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5384 "මම (එම) ශාස්තෘන්වහන්සේහට කළයක් පමණවූ අජෙලිඑලයක්ද, ජීවජීවකද, කොළවලින් තැනූ කුඩයක්ද ගෙන දුනිමි.

5385 "මින් එක්සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි 5386-5388

## 508 අමොදඵලිය ථේරාපදානය

5389 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ ස්වර්ණවර්ණවූ වීථියට පිළිපන්නාවූ සම්බුදුරජුන් (දැක) අමොදඵලයක් දුනිමි.

5390 "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 5391-5393.

## 509 තාලඵලදායක ථේරාපදානය

5394 "සියල්ල තෙමේම අවබොධ කරගත් පස්මරුන් දිනූ සතරංසී නම් භාග්‍යවත් තෙමේ විවේකයෙන් (සමාධියෙන්) නැගිට පිඬුපිණිස වැඩියේය.

5395 "මම (තථාගතයන්) දැක (තල්) ගෙඩියක් ගත් ඇතිව එම බුදුරජුන් වෙත එළඹියෙමි (එසේම) මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ (එම) තල්ගෙඩිය දුනිමි.

5396 "මින් සිව් අනූවන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 5397-5399

## 510 නාලිකෙර දායක ථේරාපදානය

5400 "එකල්හි මම බන්ධුමතී නගරයෙහි ආරාමිකයෙක් (අරමෙහි වතාවත් කරන්නෙක්) වීමි. අහසෙහි වඩින්නාවූ කෙලෙස් රජස් විරහිත බුදුරජුන් දුටිමි

5401 "මම නාළිකෙර ඵලයක් (පොල් ගෙඩියක්) ගෙන බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි. මහත් යසස් ඇති බුදුරජ තෙමේ අහසෙහි සිටියේම එය පිළිගෙන වදාළේය.

5402 "මට ප්‍රීතිය උපදවන්නාවූ මෙලෙව්හිදීම සුව ඵලවන්නාවූ (එම) ඵලය පැහැදී සිතින් බුදුරජුන්හට දී,

**5403** "එකල්හි මහත්වූ ප්‍රීතියටද උතුම් සැපයටද, පැමිණියෙමි. ඒ ඒ තන්හි උපන් මට රුවන් පහළවේ.

**5404** "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම් නාලිකෙර ඵලදානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵලදානයාගේ මේ විපාකයයි.

**5405** "මාගේ දිවැස පිරිසිදුවිය. මම සමාධියෙහි දක්ෂ වෙමි. අභිඥාවන්හි කෙළපැමිණියේද වෙමි. ඵල දානයාගේ මේ විපාකයයි. 5406-5408.

## 52 කුරඤ්ජිය වග්ග.

### 511 කුරඤ්ජියඵලදායක ථෙරාපදානය

**5409** "මම පෙර වනයෙහි හැසිරෙන්නාවූ වැද්දෙක් වීමි. සියළු දහම්හි කෙළපත් කෙලෙස් රජස් විරහිත බුදු රජුන් දුටිමි.

**5410** "මම කුරඤ්ජිය ඵලයක් ගෙන වීරවූ පුණ්‍ය ක්ෂෙත්‍රවූ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේට පහන්වූයේ සියතින් දුනිමි.

**5411** "මින් එක්තිස්වන කපෙහි යම් ඵලදානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) මම දුගතියක් නොදනිමි. ඵලදානයාගේ මේ විපාකයයි. 5412-5414

### 512 කපිත්ථඵල දායක ථෙරාපදානය

**5415** "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ ස්වර්ණවර්ණවූ වීර්‍ය්‍යට පිළිපන්නාවූ බුදුරජුන් දැක ගිවුළුඵලයක් (දිවුල් ගෙඩියක්) දුනිමි.

**5415** "මින් එක්අනූවන කපෙහිවූ එකල්හි යම් (ගිවුළු) ඵලයක් දුනිම්ද, ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 5417-5419.

### 513 කොසුම්භඵල දායක ථෙරාපදානය

**5420** "කුඹුක් රුකක් මෙන් බබලන දෙවාතිදෙවවූ නර ශ්‍රෙෂ්ඨවූ වීර්‍ය්‍යට පිළිපන් බුදුරජුන්හට කොසුම්භ ඵලයක් දුනිමි

**5421** "මින් එක් අනූ වන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි. 5422-5424.

## 514 කෙතක පුප්ඵිය ථේරාපදානය

**5425** "පුරුෂොත්තමවූ බුදුරජතෙම විනතා නදීතීරයෙහි වැඩහුන්නේය. (මම) මැනවින් සන්හුන්වූ එකඟවූ කෙලෙස් රජස් විරහිත බුදුරජුන් දුටිමි.

**5426** 'එකල්හි මම මී සුවඳ වහනය වන වැටකෙයියා මලකින් පහන් සිත් ඇත්තේ සොම්නසස්වූයේ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ පිදීමි.

**5427** "මින් එක්අනූවන කපෙහිවූ යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 5428-5430

## 515 නාගපුප්ඵිය ථේරාපදානය

**5431** "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ ස්වර්ණවර්ණවූ වීර්‍ය්‍යයට පිළිපන් සම්බුදු රජුන්හට නා මලක් පිදීමි

**5432** 'මින් එක් අනූවන කපෙහිවූ යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 5433-5435.

## 516 අජ්ජුන පුප්ඵිය ථේරාපදානය

**5436** "එකල්හි (මම) චන්ද්‍රභාගා නදීතීරයෙහි කිඳුරෙක් වීමි. (එහිදී) කෙලෙස් රජස් විරහිත සියල්ල තෙමේම දත් පස්මරුන් දිනූ බුදුරජුන් දුටිමි.

**5437** "පහන් සිත් ඇත්තේ සොම්නස් වූයේ හටගත් ප්‍රීති ඇත්තේ බඳැඳිලි ඇත්තේ කුඹුක් මලක් ගෙන බුදුරජුන් පිදීමි.

**5438** "මැනවින් කරනලද කර්මය කරණකොටගෙනද චිත්තප්‍රණිධීන් කරණකොටගෙනද මම කිඳුරු සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

**5439** "සතිස් වරක් දෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරවීමි. දස වරක් චක්‍රවර්ති මහාරාජ්‍යය කරවීමි.

**5440** '(කරවනලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය. සර්වඥවූ මහා පින්කෙතෙහි මා විසින් වපුල බිජුවට ආශ්චර්‍ය්‍යයකි.

**5441** "මාගේ කුශලය (තවත්) විද්‍යමානවේ. අනගාර්‍යයී නම්වූ සසුනෙහි පැවිදිවීමි. මම අද ශාක්‍යපුත්‍රවූ බුදුරජුන්ගේ සසුනෙහි පිදිය යුත්තෙක් වෙමි. 5442-5444.

## 517 කුටජ පුප්ඵිය ථෙරාපදානය

**5445** "හිමවතට නුදුරෙහි චාවල නම් පර්වතයක් විය. (එම) අතරෙහි සුදස්සන නම් බුදුරජ තෙමේ වැඩ වෙසෙයි.

**5446** "මම හිමවතෙහි හටගත් මල් ගෙන අහසට (නැගී) ගියෙමි. එහිදී චතුරොඝයන් තරණය කළ ආශ්‍රව රහිතව සම්බුදුරජුන් දුටුවෙමි.

**5447** "කෙළිඳ මල් ගෙන හිසෙහි ඇඳිලි බැඳ සියල්ල තෙමේම දත් මහර්ෂිවූ බුදුරජුන්හට පිදීමි.

**5448** "මින් එක් තිස්වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 5449-5451

## 518 ඝොස සඤ්ඤක ථෙරාපදානය

**5452-5453** "මම පෙර මහවෙනෙහි මුව වැද්දෙක්වීමි (එහිදී) කෙලෙස් රජස් විරහිත දිව්‍ය සමූහයා විසින් පිරිවරණ ලද චතුස්සත්‍යය ප්‍රකාශ කරන්නාවූ අමාපදය දෙසන්නාවූ බුදුරජුන් දුටිමි. ලොකබන්ධුවූ සිඛී බුදුරජුන්ගේ මිහිරි ධර්මය ඇසීමි.

**5454** "අසමවූ අප්‍රති පුද්ගලවූ (බුදුරජුන්) කෙරෙහිද (උන්වහන්සේගේ බ්‍රහ්ම) ස්වරයෙහිද සිත පැහැදවීමි. එහි සිත පහදවා තරණය කිරීමෙහි දුෂ්කරවූ භවය තරණය කෙළෙමි

**5455** 'මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි යම් (ධර්ම දෙශනා ශබ්දයෙක්හි) සංඥාවක් ලැබුයෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බ්‍රහ්ම ස්වර සංඥාවෙහි මේ විපාකයයි, 5456-5458

## 519 සබ්බ ඵලදායක ථෙරාපදානය

**5459** "එකල්හි (මම) මන්ත්‍රයන්හි කෙළපැමිණි නමින් වරුණ නම්වූ බ්‍රාහ්මණයෙක් වීමි. පුත්‍රයන් දසදෙනෙකු හැර දමා වනයට පිවිසියෙමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5460 "මම මනොඥ ලෙස කොටස් කරන ලද අසපුවක් සාදා පන්සැලක්ද කොට වනයෙහි වසමි.

5461 "ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ ඒ පදුමුත්තර බුදුරජතෙමේ මා සසරින් ගොඩලනු කැමැත්තේ මාගේ අසපුවට පැමිණියේය.

5462 "වන ලැහැබෙහි ආලොකය යම්තාක් මහත්වීද, එකල්හි බුදුරජුන්ගේ ආනුභාවයෙන් වනය ඇවිලගත්තාක් මෙන් විය.

5463 "මම තාදී ගුණ ඇති බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ ගේ ඒ පෙළහර දැක කොළගොටුවක් ඵලයෙන් පිරවීමි.

5464 "මම බුදුරදුන් වෙත එළඹ කද සහිතවම දුනිමි. බුදුරජතෙම මට අනුකම්පාවෙන් මේ වචනය වදාළේය.

5465 "ඔබ (පළතුරු) කත් බර රැගෙන මාගේ පසුපසින් එව. සංඝයා එය වැළඳූ කල්හි තොපට පින් (සිදු)වන්නේය" කියායි.

5466 "මම එම (පළතුරු) ගොටුව ගෙන භික්ෂු සංඝයාට දුනිමි. මම එහි සිත පහදවා තුෂිත දෙව්ලොවෙහි උපනිමි.

5467 "එම දිව්‍ය ලොකයෙහි දිව්‍යමයවූ නෘත්‍යයන් කරණකොට ගෙනද ගීතයන් කරණකොට ගෙනද වාදිතයන් කරණකොට ගෙනද (එකී) කුශල කර්ම හා සංයුක්තවූ සුවය හැමකල්හි විඳිමි.

5468 "දිව්‍යවූද, යලි මනුෂ්‍යවූද, යම් ගොනියක උපදිම් නම් මාගේ භෝගයෝ අඩු බවක් නැත ඵලදානයාගේ මේ විපාකයයි.

5449 "මම බුදුරදුන්හට (මේ) ඵල (දානය) දී සමුදුරු සහිතවූ සිව් මහ දිවයින් යම් පමණ නම් (එපමණ) තන්හි මාගේ ආධිපත්‍යය කරමි.

5470 "මේ පක්ෂි සමූහයා අහසෙහි යම් පමණ දුර (උඩ) පියාඹත්ද, (එපමණ තනහි අහසෙහිද) ඔවුහු (මාගේ) වසගයට පැමිණෙත්. ඵල දානයාගේ මේ විපාකයයි.

5471 "වන සණ්ඩයෙහි (කැළෑරොදෙහි) යම්තාක් යක්ෂයෝද, භූතයෝද, රාක්ෂසයෝද කුම්භාණ්ඩයෝද ගුරුළෝද පවත්නම් ඔව්හු මාගේ පරිචරියාවට (මෙහෙවරට) පැමිණෙත්.

5472 "ඉදිබුවෝද, බල්ලෝද, මීමැස්සෝද, ඩැහැලේ බොන මැස්සන් හා මදුරුවෝද යන උභය ප්‍රාණීහුදැයි ඔව්හු මා වශයට පැමිණෙත්. ඵල දානයාගේ මේ විපාකයයි.

5473 "පක්ෂියොනියෙහි උපන් මහත් බල ඇති සුපර්ණ නම්වූ ගුරුළු පක්ෂීහු වෙත්නම් ඔව්හුද මා සරණකොට යෙත්. ඵල දානයාගේ මේ විපාකයයි.

5474 "දීර්ඝායුෂ්කවූ ඍද්ධිමත්වූ මහත් යසස් ඇති යම් නාග කෙනෙක් වෙත් නම් ඔවහුද මාගේ වශයට එත්. ඵල දානයාගේ මේ විපාකයයි.

5475 "සිංහයෝද, ව්‍යාඝ්‍රයෝද, දිවියෝද, වලස්සුද, වෘකයෝද කරබානා වලස්සුද යන මොව්හු මාගේ වසඟයට එත්. ඵලදානයාගේ මේ විපාකයයි.

5476 "ඔසධී-තෘණ (වෘක්ෂාදියෙහි) වාසය කරන්නාවූද අහසෙහි වාසය කරන්නාවූද යම් (දෙවිකෙනෙක්) වෙත්නම් ඒ සියල්ලෝ මා සරණකොට යෙත්. ඵල දානයාගේ මේ විපාකයයි.

5477 "අතිශයින් දැකුමට (අවබොධයට) දුෂ්කරවූ ඉතා සියුම්වූ ගැඹුරුවූ ධර්මයකැයි පවසන ලද (නිවණ) අවබොධ කොට වෙසෙමි. ඵල දානයාගේ මේ විපාකයයි.

5478 "මම අෂ්ට විමොක්ෂයන්ද ලබා ආශ්‍රව රහිතවූයේ ප්‍රඥා ඇත්තේ වෙසෙමි ඵලදානයාගේ මේ විපාකයයි.

5479 "මහත් යශස් ඇති ක්ෂය කරන ලද දොස් ඇති ඵලස්ථවූ යම් බුද්ධ පුත්‍රකෙනෙක් වෙත්නම් ඔවුනතුරෙන් මමද එක්තරා කෙනෙක් වෙමි. ඵල දානයාගේ මේ විපාකයයි.

5480 "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ අභිඥාවන්හි කෙළ පැමිණ සියළු ආශ්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

5481 'ත්‍රිවිද්‍යා ඇත්තාවූද, ඍද්ධි ප්‍රාප්තවූද, මහත් යසස් ඇත්තාවූද දිවකරණ ලද්දාවූද යම් බුද්ධ පුත්‍ර කෙනෙක් වෙත් නම් මමද ඔවුනතුරෙන් එක්තරා කෙනෙක් වෙමි.

5482 "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් ඵල දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. ඵල දානයාගේ මේ විපාකයයි 5483-5485

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

## 520 පදුම ධාරක ථෙරාපදානය

5486 "හිමවතට නුදුරෙහි රොමස නම් පර්වතයක් විය. එකල්හි 'සම්භව' නම් බුදුරජතෙමේද එලිමහනෙහි වැඩ විසීය.

5487 "මම භවනයෙන් නික්ම (අවුත්) උන්වහන්සේට පියුමක් (නෙළුම් මලක්) දරා සිටියෙමි. එක් දිනක් (එසේ) දරා සිට නැවත භවනයට ආමි.

5488 'මින් එක් තිස්වන කපෙහි යම් බුද්ධ පූජාවක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 5489-5491

# 53 තිණදායක වග්ග.

## 521 තිණමුට්ඨි දායක ථෙරාපදානය

5492 "හිමවතට නුදුරෙහි ලම්බක නම් පර්වතයක් වීය එහි එලිමහන්හි උපතිස්ස නම් සම්බුදුරජතෙමේ සක්මන් කෙළේය.

5493 "මම පෙර මහවෙනෙහි මුව වැද්දෙක් වීමි. මම ඒ දෙවාති දෙව වූ (බුදුරජුන්) දැක තණ මිටක් දුනිමි.

5494 "(එය) බුදුරජුන්හට වැඩහිඳීම සඳහා දී සිත පැහැදවීමි. සම්බුදුරජුන් වැඳ උතුරු දිගට මුහුණලා ගියෙමි

5495 "ගිය නොබෝ වේලාවකින්ම සිංහයෙක් තෙම මා පෙළීය. මම (එම) සිංහයා විසින් හෙළන ලදුයේ එහි කළුරිය කළේ වෙමි.

5496 "මරණාසන්න කල්හි මා විසින් ආශ්‍රව රහිතවූ බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ විෂයයෙහි (එම) කර්මය කරන ලදි මම (දුන්නෙන් මිදුනු) හී වේගයක් මෙන් දෙවලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

5497 "පුණ්‍යකර්මය කරණකොට ගෙන (එහි) නිර්මිතවූ විමානය ශුභ එකක් විය. දහසක් බෙදුම් (කොටස්) ඇත්තේය සියයක් ගොලාකාර බෙදුම් ඇත්තේය, ධජයන්ගෙන් යුක්තය, කොළවන්ය.

5498 "උදාවූ හිරුමෙන් එම ප්‍රාසාදයාගේ පැහැය පැතිරේ. මම (එහි) දිව්‍ය කන්‍යාවන් විසින් ගැවසී ගත්තේ කැමති කැමති පරිදි සතුටුවීමි.

**5499** "කුශල මූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් චුතව මිනිසත් බවට පැමිණ ආශ්‍රවක්ෂයට පැමිණියේ වෙමි.

**5500** "මින් සිව් අනූවන කපෙහි මම නිසීදනයක් (අතුරා හිඳුමට තණ මිටක්) දුනිමි. (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. තණ මිටක් දීමෙහි මේ විපාකයයි. 5501-5503

## 522 මඤ්චදායක ථෙරාපදානය

**5504** "ලොක ජෙ‍්‍යෂ්ඨවූ තාදී ගුණ ඇති විපස්සී බුදු රජුන්හට මා විසින් පහන් සිතින් යුතුව සියතින්ම එක ඇඳක් දෙන ලදී

**5505** 'එම මඤ්චක දානය කරණකොට ගෙන හස්ති යානද, අශ්ව යානද යන දිව්‍යමය යානයන් ලබමි. ආශ්‍රව ක්ෂයටද පැමිණියේ වෙමි.

**5506** "මින් එක් අනූවන කපෙහි මම යම් මඤ්චක දානයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මඤ්චක දානයාගේ මේ විපාකයයි. 5507-5509

## 523 සරණ ගමනීය ථෙරාපදානය

**5510** "එකල්හි ආජීවකයෙක්වූ මමද, භික්ෂුවක්ද නැවකට නැගුනෙමු. නැව බිඳෙන කල්හි භික්ෂුව මට සරණ දුන්නේය.

**5511** "මින් එක් තිස්වන කපෙහිවූ එකල්හි ඒ භික්ෂු තෙම මට යම් සරණයක් දුන්නේද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මෙය සරණාගමණයෙහි විපාකයයි 5512-5514

## 524 අබ්භඤ්ජන දායක ථෙරාපදානය

**5515** "මම බන්ධුමති නගරයෙහි රජ උයනෙහි වසමි. එකල්හි මම දහම් කරකය (පැන්කෙණ්ඩිය) දරන්නාවූ සම හඳින්නෙක් විමි.

**5516** '(එහිදී) සියල්ල තෙමේම දත්තාවූ පස් මරුන් ජයගත්තාවූ වීයයීයෙහි මෙහෙයූ සිත් ඇති ධ්‍යාන කරන්නාවූ ධ්‍යානයෙහි ඇළුනාවූ (පඤ්ච) වශීතාවන්ගෙන් යුක්තවූ නිර්මලවූ බුදුරජුන් දුටිමි.

**5517** "සියළු අභිමතාර්ථයන් සමෘද්ධ කළාවූ චතුරොඝයන් තරණය කළාවූ ආශ්‍රව රහිතවූ (බුදුරජුන්) දැක මම පහන් සිත් ඇත්තේ සොම්නස්වූයේ ඇඟ ගල්වන තෙලක් දුනිමි.

5518 "මින් එක් අනූවන කපෙහිවූ එකල්හි යම් (අබ්භඤ්ජන) ඇඟ ගල්වන තෙල් දනක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. අබ්භඤ්ජන දානයාගේ මේ විපාකයයි. 5519-5521

## 525 සුපට දායක ථෙරාපදානය

5522 'විපස්සී බුදුරජතෙම දිවා විහරණයෙන් නික්මුණේය. මම (උන්වහන්සේ දැක) සැහැල්ලුවූ මනා වස්ත්‍රයක් දී කල්පයක් ස්වර්ගයෙහි සතුටුවීමි.

5523 "මම මින් එක් අනූවන කපෙහි මනාවූ වස්ත්‍රයක් දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. මනාවූ වස්ත්‍ර දානයාගේ මේ විපාකයයි. 5524-5526

## 526 දණ්ඩදායක ථෙරාපදානය

5527 "මම එකල්හි මහවනයට පිවිස හුණ (දණ්ඩක්) කපා එල්බෙන ලීයක් (සැරයටියක්) කොට සංඝයාට දුනිමි.

5528 "එම චිත්ත ප්‍රසාදය කරණකොටගෙන මනා ව්‍රත ඇති සංඝයාට වැඳ ආලම්බන දණ්ඩ (සැරයටිය) ද උත්තර දිශාභිමුඛව ගියෙමි.

5529 'මින් සිව්අනූ වන කපෙහිවූ එකල්හි යම් ආලම්බන දණ්ඩක් (සැරයටියක්) දුනිම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. සැරයටි දීමෙහි මේ විපාකයයි. 5530-5532

## 527 ගිරිනෙල පූජක ථෙරාපදානය

5533 "මම පෙර වනයෙහි හැසිරෙන්නාවූ වැද්දෙක් වීමි (එකල්හි) සියළු දහම්හි කෙළපැමිණි (කෙලෙස්) රජස් විරහිත බුදුරජුන් දුටිමි.

5534 "සව්සතුන් කෙරෙහි යහපත කිරීමෙහි ඇළුණු මහා කරුණිකවූ උන්වහන්සේ කෙරෙහි පහන්සිත් ඇත්තේ සොම්නස්වූයේ ගිරිනිල්මල් පිදීමි.

5535 "මින් එක්තිස් වන කපෙහි යම් පුෂ්ප පූජාවක් කෙළෙම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. 5536-5538.

## 528 බොධිසම්මජ්ජක ථෙරාපදානය

5539 "මම පෙර සෑමළුවෙහි හැරදැමූ බෝපත් (දැක) එය ගෙන බැහැරලීමි. (එහි) විසි ගුණයක් අනුසස් ලැබීමි.

5540 "එම කම් බෙලෙන් කුදුමහත් භවයෙහි සැරි සරන්නේ දිව්‍යවූද මනුෂ්‍යවූද දෙඅත්බැව්හි සැරිසරමි.

5541 "දෙව්ලොවින් ච්‍යුතව මනුෂ්‍ය භවයට පැමිණ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ දෙකුලෙහි (පමණක්) උපදිමි.

5542 "සුපුන් අඟපසඟ ඇත්තේ, ආරෝහපරිණාහයෙන් යුතුවූයේ නොඅඩුව සම්පූර්ණ අංග ඇත්තේ පිරිසිදු වූයේ මනා රූ ඇත්තේ වෙමි.

5543 "දෙව් ලොවෙහි හෝ මිනිස් ලොවෙහි හෝ යම් කිසිතැනක උපන්නේ නම් නිවනලද ස්වර්ණයක් මෙන් රන්වන් වන්නේය.

5544 "බෝපත් බැහැර කළ කල්හි (ඒ හේතුවෙන්) මාගේ සිවිය හැමකල්හි මෘදුද, මෙලෙක්ද, සිනිඳුද සියුම්ද, සියුමැලිද වේ.

5545 "යම්කිසි ගතියක සිරුර පහළවූ කල්හි (එහි) දැලි කුණු නොතැවරේ. බෝපත් බැහැරලීමෙහි මේ විපාකයයි.

5546 "උෂ්ණවූ අවු සුළං ඇති කල්හිද, යලි ගිණි රශ්මිය කරණකොටගෙනද, ඒ මාගේ සිරුරෙහි ඩහ නොවැගිරේ (මෙය) සෑ මළුවෙහි බෝපත් බැහැර කරලීමෙහි විපාකයයි.

5547 "කුෂ්ටද, ගෙඩිද, කැසිලිද, තලකැලැල්ද, පොළවල් (බිබිලි) ද එසේම දදද, සිරුරෙහි නොවෙත්. පත් බැහැර කිරීමෙහි (කසළ ඉවත්කිරීමෙහි) මේ විපාකයයි,

5548 "(i) කුදුමහත් භවයෙහි ඒ කර්මයාගේ අනිකුදු ගුණයක් ඇතිවේ. (ii) සිරුරෙහි රෝගාබාධයෝ නොවෙත්. (කසළ) කොළ බැහැර කිරීමෙහි (මේ) විපාකයයි.

5549 '(මෙහි 5548 (i) ) (එනම්) මානසික පීඩාවක් ඇති නොවේ. (කසළ) කොළ බැහැරකිරීමෙහි (මේ) විපාකයයි.

5550 "(මෙහි 5548 (i) ) (එනම්) එම කර්මය කළහුට පසමිතුරෝ (ඇති) නොවෙත් (කසළ) කොළ බැහැරකිරීමෙහි (මේ) විපාකයයි.

**5551** "(මෙහි 5548 (i) ) (එනම්) නොඅඩුවූ භොග සම්පත් ඇත්තේවේ. (කසළ) කොළ බැහැර කිරීමෙහි මේ විපාකයි.

**5552** '(මෙහි 5548 (i) ) ගින්නෙන්, රජුන්ගෙන්, සොරුන්ගෙන් හෝ දියෙහි බියක් ඇති නොවේ

**5553** "(මෙහි 5548 (i) ) දැසි දස්සෝ සිතැගි අනුව පවත්නා අනුචරයෝ වෙත්.

**5554** "යම් පමණ ආයු ඇති කලෙක්හි මිනිසත් බවක උපදීද, ඉන් ආයු නොපිරිහේ. (එකලට නියමිත) ආයු ඇතිතාක් සිටී.

**5555** "ඇතුළත වූවෝද, පිටත්හි හැසිරෙන්නෝද, නිගම් වැස්සෝද, රටවැසියන් සහිත වූවාහු මේ සියල්ලෝ අභිවෘද්ධිය කැමැති වූවාහු සුව කැමැති වූවාහු (තමාට) අනුගත වූවෝ වෙත්.

**5556** "මම භවයෙහි හැම අයුරින්ම භොග ඇත්තේද, යසස් ඇත්තේද, ශ්‍රීමත් වූයේද, ඥාතිපක්ෂ ඇත්තේද වෙමි. (එසේම) පහවූ බිය තැතිගැනීම් ඇත්තේද වන්නේය.

**5557** "භවයෙහි හැසිරෙන්නාවූ මට හැම කල්හි දෙවියෝද, අසුරයෝද, මනුෂ්‍යයෝද, ගාන්ධර්වයෝද, යක් රකුසෝද යන මේ සියල්ලෝ පිරිවර වෙත්.

**5558** "දෙව් ලොවෙහිද, මිනිස් ලොවෙහිද යන මේ දෙලෙව්හිම යසස් අනුභවකොට අවසන්හි අනුත්තරවූ ශිවවූ නිවනට පැමිණියේ වෙමි.

**5559** "යම් පුරුෂයෙක් තෙම සම්බුදු රජුන් උදෙසා හෝ එම ශාස්තෘන්වහන්සේගේ බොධිය උදෙසා හෝ පින් රැස්කරන්නේ නම් ඔහට කුමක් නම් දුර්ලභද?

**5560** "මාර්ගයෙහිද ඵලයෙහිද (දීර්ඝ-මධ්‍යම) ආදී නිකායයෙහිද, ධ්‍යානාභිඥා ගුණයන්හිද අන් අයට වඩා අධික (ඥාන) ලාභියෙක්ව ආශ්‍රව රහිතව පිරිනිවන්පාමි.

**5561** "පෙර මම සතුටුසිත් ඇත්තේ බොධියෙහි කොළ බැහැරකොට හැමකල්හි මෙම අංග විස්සෙන් සමන්විත වෙමි.
5562-5564

## 529 ආමණ්ඩඵලදායක ථෙරාපදානය

5565 "සියළු දහම්හි තෙරපත් පස්මරුන් දිනූ ලොකාග්‍රවූ පදුමුත්තර බුදුරජ තෙමේ සමාධියෙන් නැගිට සක්මන් කෙළේය.

5566 "එකල්හි (මම) කත් බර ගෙන ඵල (නෙලා) ගෙන එන්නේ කෙලෙස් රජස් විරහිතවූ සක්මන් කරන්නාවූ බුදුරජුන් දුටිමි.

5567 "(මම) පහන්සිත් ඇත්තේ සොම්නස් වූයේ හිසෙහි ඇඳිලිබැඳ සම්බුදු රජුන් වැඳ එරඬු ගෙඩියක් දුනිමි.

5568 "මින් සියක්දහස් වන කපෙහිවූ එකල්හි යම් (එරඬු) ඵල දානයක් දුනිම්ද, (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. එරඬුගෙඩි පිදීමෙහි මේ විපාකයයි. 5569-5571

## 530 සුගන්ධ ථෙරාපදානය

5572-5573 "මෙම භද්‍රකල්පයෙහි බ්‍රාහ්මණ වංශයෙහිවූ මහත් යසස් ඇති කථා කරන්නවුන්හට උතුම් වූ අනුව්‍යඤ්ජනයන්ගෙන් යුක්තවූ දෙතිස් මහපුරිස් ලකුණු ඇති ව්‍යාම ප්‍රභා (බඹයක් පමණ ඇතට රශ්මි) යෙන් යුත් රැස් සමූහයෙන් ගැවසීගත් නමින් කාශ්‍යප නම් බුදුරජතෙම ලොව පහළවිය.

5574 "(මෙම බුදුරජතෙම) සඳු මෙන් අස්වැසිලි කරන්නෙක. හිරු මෙන් පැහැ ඇතිකරන්නෙක. වැහිවලාවක් මෙන් (කෙලෙස්) ගිම් නිවන්නෙක. සයුර මෙන් ගුණ (මැණික්) වලට ආකරයෙක.

5575 "සීලයෙන් මහපොළොව මෙනි. සමාධියෙන් හිමවත් පව්ව මෙනි. ප්‍රඥාවෙන් අහස මෙනි. සුළඟ මෙන් නොඇලෙන්නේද වේ.

5576 "පිරිස් හමුවෙහි විශාදරවූ ඒ මහාවීරවූ (බුදුරජ තෙමේ) කිසියම් දිනෙක මහාජනයා (සසර සයුරින්) ගොඩලමින් සිව්සස් දෙසූසේක.

5577 "එකල්හි මම බරණැස් නුවර සමෘද්ධවූ ධන ධාන්‍යයට හිමිකරුවෙකුවූ මහත් යසස් ඇති සිටුපුතෙක් වීමි.

5578-5579 "මම ජංඝාවිහාරයෙහි හැසිරෙමින් මිගදාය නම්වූ මුවන් වසන වනයට එළඹ අමාපදය (නිර්වාණධර්මය)

දෙසන්නාවූ කෙලෙස් රජස් විරහිතවූ විසිරීයන මනොඥ වචන ඇති කුරවි කෙවිල් හඬට බඳු හඬ ඇති හංසධ්වනියට බඳු ශබ්ද ඇති මහාජනයාට දහම් අවබොධ කරවන්නාවූ බුදුරජුන් දුටිමි.

5580 "දෙවාතිදෙවවූ ඒ බුදුරජුන් දැක මිහිරි වචනද අසා අපමණවූ භොග සම්පත් අතහැර දමා අනගාර්‍ය්‍ය නම්වූ සසුනෙහි පැවිදිවීමි.

5581 "මෙසේ පැවිදිවූ මම නොබෝ කලකින්ම බහුශ්‍රැතවූ ධර්මකථිකවූ විසිතුරු වැටහීම ඇති කෙනෙක් වීමි.

5582 "මම මහපිරිස් මැදෙහි සතුටුසිතින් යුතුව ගුණ මැනීමෙහි විශාරද වූයේ නැවත නැවත ස්වර්ණවර්ණවූ බුදු රජුන්ගේ ගුණ වර්ණනය කෙළෙමි. (කෙසේද යත්?)

5583 "මෙම බුදුරජතෙම ක්ෂයකළ ආශ්‍රවයන් ඇත්තෙක උවදුරු රහිතයෙක. දුරු කළ සැක ඇතියෙක. සියළු කර්මයන්ගෙන් ක්ෂයට පත්වූවෙක. උපධි නම්වූ පඤ්චස්කන්ධයෙහිවූ (දුකින්) මිදුනෙක.

5584 "මේ ඒ භාග්‍යවත්වූ බුදුරජ තෙමේය. මේ අනුත්තරවූ පුරුෂසිංහ තෙමේය. (මෙතෙම) දෙවියන් සහිත ලොකයෙහි බ්‍රහ්මචක්‍රය පවත්වන්නේද (වෙයි.)

5585 "මහර්ෂිවූ බුදුරජ (තෙමේ) දමනය වූයේ මහජනයාද දමනය කරන්නෙක. (තෙමේ ශාන්තවූයේ) මහාජනයාද ශාන්ත කරන්නෙක. (තෙමේ කෙලෙස් ගින්නෙන්) නිවුනේද මහාජනයාද නිවන්නෙක. (තෙමේ) අස්වැසිල්ලට පැමිණියේ මහාජනයාද අස්වසන්නෙක.

5586 "ඒ බුදුරජතෙම වීරයෙක, ශූරයෙක, නැණවතෙක, පැණවතෙක, කාරුණිකයෙක, (මඤ්ච වශිතාවෙන්) වසඟවූවෙක, දිනනසුළු කෙනෙක, කලබල නොමැතියෙක, නිරාලය (ආශාව නැති) කෙනෙක.

5587 "ගුරුන් අතුරෙහිදු (මේ) සර්වඥතෙමේ තෘෂ්ණාව නැති කෙනෙන. නිශ්චල කෙනෙක. නුවණැති කෙනෙක. මොහය නැති කෙනක. (සමකොට කීමට අනිකෙකු නොමැති බැවින්) අසමයෙක ධූර උසුලන්නෙක. වෘෂභයෙක. නාගයෙක සිංහයෙක. කටයුතු කිරීමෙහි හැකි කෙනෙක.

පටුන



**5588** "රාගය නැත්තෙක. නිර්මල කෙනෙක. ශ්‍රෙෂ්ඨයෙක. වාදයෙහි ශූරයෙක පව් දුරු කළ කෙනෙක. (සිත්හි රාගාදී කිලුටු නැති බැවින්) අචලවූ කෙනෙක. (පහවූ රාගාදී හුල් ඇති බැවින්) විසල්ලවූ කෙනෙක. (ලෙව්හි සමාන කිරීමට අනිකෙකු නොමැති බැවින්) අසම කෙනෙක. චක්ෂුරාදී ඉන්ද්‍රියයන් (සංවෘත බැවින්) සන්හුන් කෙනෙක. පිරිසිදු කෙනෙක.

**5589** "(බැහැර කරන ලද පව් ඇති බැවින්) බ්‍රාහ්මණයෙක. (ශමනය කරන ලද පව් ඇති බැවින්) ශ්‍රමණයෙක. (අනාථයනට පිහිටවන බැවින්) නාථයෙක. (කෙලෙස් ලොවට වෛද්‍යයෙක. (රාගාදී හුල් උදුරන) ශල්‍ය වෛද්‍යයෙක. (කෙලෙස් සතුරන් ජය ගන්නා) යොධයෙක. (සිව්සස් දත් බැවින් බුදුවරයෙක. ප්‍රකට කෙනෙක (දමනය කළයුතු අය දමනයකරණ බැවින්) සාරථියෙක. නිශ්චල කෙනෙක. මුදිතාවෙන් යුතු කෙනෙක. උසස්ව නැගී ගිය කෙනෙක.

**5590** "තෘප්තියට පත් කෙනෙක. (මහාකරුණා ආදි ගුණ) දරන්නෙක. (කෙලෙස්සතුරන්) නසන්නෙක (ශාන්තිය) කරන්නෙක. (නිවන් මගට) පමුණුවන්නෙක. (අමාදහම්) දෙසන්නෙක. (සව්වන්) සතුටු කරන්නෙක (සසර සක දැව්) බිඳින්නෙක. (සංසාර වෘක්ෂය) සිඳින්නෙක. (විනෙයාජනයන්ගේ කථාවකට භවාග්‍රයෙහි සිට නමුදු) ඇහුම්කන් දෙන්නෙක. (මනා ප්‍රතිපත්ති ඇතියනට) පසසන්නෙක.

**5591** "(රාගාදි කිලිටි නැති බැවින්) අබිලවූ කෙනෙක. (පහවූ රාගාදී හුල් ඇති බැවින් විසල්ලවූ කෙනෙක. උවදුරු රහිත කෙනෙක සැකදුරුකළ කෙනෙක. තෘෂ්ණා විරහිත කෙනෙක. කෙලෙස් රජස් විරහිත කෙනෙක. ඉවසන කෙනෙක. නිවන්මග යන්නෙක. (මග නොමග මේ යයි) කියන්නෙක. හිතාහිත මේ යයි) පවසන්නෙක.

**5592** "(සත්වයන් සසරින්) එතෙර කරන්නෙක, අභිවෘධිකාරයෙක නිවන සිදු) කරන්නෙක. (කෙලෙස් ගල්කුළු) පැලුවෙක. (සත්වයන් නිවනට) පමුණුවන්නෙක. (ලොකොත්තර ගුණ) සහිතවූවෙක. දුටුවන් සිත් ඇදගන්නා කෙනෙක. (කෙලෙස්

සතුරන් නසන්නෙක. (කෙලෙස් තවන) වීර්‍ය්‍යී ඇත්තෙක තපොගුණ යුත් කෙනෙකි.

5593 "සතුරු මිතුරු වැදගත් කවුරුත් කෙරෙහිත්) සමසිත් ඇතියෙක. අසමවූ බුදුවරයනටම පමණක් සමාන වන බැවින්) අසම සම කෙනෙක. (මේ සමානයයි දක්වීමට අනිකෙකු නොමැති බැවින්) අසහාය කෙනෙක. දයාගුණ නැත්තෙක. සර්වඥතා ඥානය සඳහා කටයුතු තාක් දැයකළ කෙනෙක. පෙර සම්බුදුවරයන් වහන්සේ කෙනෙකුට අනතුරුව ලොව පහළවූ බැවින් ඉසිසත්තම නැමැත්තෙක.

5594 "දුරුකළ සැක අතියෙක. මානය නැත්තෙක. පමණ කළ නොහැකි ගුණ ඇතියෙක. උපමා විෂයය ඉක්මවූ කෙනෙක. සකල වර්ණනා විෂයයන් ඉක්මවා ගිය කෙනෙක. සත්‍ය ධර්මයාගේ හා දතයුතු සකල ධර්මයාගේ පරතෙරට ගිය කෙනෙක. පස්මරුන් ජයගත් කෙනෙක.

5595 "මෙම සත්වසාරයවූ බුදුරජුන් කෙරෙහි (ඇතිකර ගන්නා) ප්‍රසාදය අමාසුව එළවන්නේවෙයි. එහෙයින් බුද්ධ රත්නය කෙරෙහිද ධර්මරත්නය කෙරෙහිද සංඝරත්නය කෙරෙහිද (ඇතිවූ) ශ්‍රද්ධ තොමෝ මහත් සෘද්ධි ඇත්තීය" (කියායි)

5596 "මම මේ ආදී ගුණයන්ගෙන් තුන් ලොවට උතුම් පිළිසරණවූ බුදුරජුන් වර්ණනය කරමින් පිරිස් මැද ධර්මකථාවක් කෙළෙමි.

5597 "මම ඉන් චුතවූයේ තුෂිතයෙහි මහත් සැප අනුභවකොට ඉනුදු චුතවූයේ මිනිසත් බැව්හි උපන්නේ සුවඳවත් වූයේ වෙමි.

5598 "මාගේ පිට කරන වාතයද, මුඛගන්ධයද, ශරීර ගන්ධයද, එසේම මාගේ ඩහදිය ගඳද හැමකල්හි සියළු සුවඳ වහනය කරයි.

5599 "හැමකල්හි මාගේ මුව සුවඳ පියුම් උපුල් සපුමල් සුවඳ (මෙයයි) පෙන්වමින් හමයි. මාගේ සිරුරද එසේමය.

5600 "(බුදුරජුන් පිළිබඳ) ගුණකීර්තයාගේ ඒ සියළු විපාකය අතිශය විෂ්මය ජනකය. ඒ වර්ණනය කරන්නෙමි. සියල්ලෝ එකඟ සිත් ඇත්තෝව මාගේ (ඒ වචනය) අසව්.

**5601** "ජනයා එක්වන තන්හිදී ඉතසිතින් මධුර ස්වරධ්වනි යුක්තවූයේ (මිහිරි හඬ ඇත්තේ) බුදු ගුණ කියා හැම තන්හි සුව ඇත්තේ වෙමි.

**5602** "යසස් ඇත්තේ සුව ඇත්තේ මනහරවූයේ ප්‍රභාවත්වූයේ පිය දැකුම් ඇත්තේ එසේම (සොඳුරු වචන) කියන සුළුවූයේ (අනුන්ගේ ධනයෙන්) පොෂණය නොකරන ලද්දේ නිදොස්වූයේ පැණවත්වූයේද වෙමි.

**5603** "ආයුෂ ගෙවීගිය කල්හි බුද්ධ භක්තිකයනට නිවන පහසුවෙන් ලැබෙන්නේ වේ. ඔවුන්ගේ (නිවන් සුලබ බවට) හෙතුව කියමි. යම් ඒ පරිද්දෙකින් (එය වේනම්) ඒ කෙසේ දැයි) අසව්

**5604** "මම භාග්‍යවතුන් වහන්සේගේ ශාන්තවූ යශසට විධිවූ පරිදි අභිවාදනය කරන්නේ ඒ කරණකොටගෙන යම් යම් තැනක උපන්නේ නමුදු යසස් ඇත්තෙක් වෙමි.

**5605** 'දුක් කෙළවර කරන්නාවූ බුදුරජුන්ද, ශාන්තවූ අසංස්කෘත ධර්මයද වර්ණනා කරන්නේ සෙසු සත්නටද සුවදෙන කෙනෙක් වීමි. ඒ හේතුවෙන් සුව ඇත්තෙක් (වීමි.)

**5606** "බුද්ධාලම්බන ප්‍රීතියෙන් යුක්තවූයේ බුදුරජුන් ගුණ කියන්නේ සිය සිත් ගැනුම්ද පරසිත් ගැනුමද ඇති කෙළෙමි. ඒ හේතුවෙන් දුගතියක් නොදනිමි.

**5607** "තීර්ථකයන් විසින් ගැවසී ගත් ජන සමූහයා කෙරෙහි (ඒ) මිථ්‍යා තීර්ථකයන් මැඩපවත්වා ගුණ කියමින් බුදුරජුන් බැබලවීමි. ඒ හේතුවෙන් පැහැපත් කෙනෙක්වීමි.

**5608** 'මම සම්බුදු රජුන්ගේ ගුණ කියන්නේ ඒ හේතුවෙන් සරාසඳ මෙන් ජනයාහට ප්‍රියංකර ගති ඇත්තේ ප්‍රිය දැකුම් ඇත්තේ වීමි.

**5609** "මම ශක්ති පමණින් බුදුරජුන්හට සියළු වචනයන්ගෙන් ස්තුති කෙළෙමි. (ඒ හේතුවෙන්) (කීමෙහි දක්ෂවූ වාගීස්වරවූයේ විසිතුරුවූ වැටහෙන නුවණ ඇත්තේද වීමි.

**5610** විමතියට පත් යම් බාල කෙනෙක් මහා මුනිවූ බුදුරජුන්හට පරිභව කෙරෙත් නම් ඔවුනට කරුණු සහිතව නිග්‍රහ කෙළෙමි. ඒ හේතුවෙන් මම පරිභව නොලද්දේ වීමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5611 "මම බුදුගුණ වැණීමෙන් සත්වයින්ගේ කෙළෙස් දුරු කෙළෙමි. එම කාමයාගේ බලයෙන් නිකෙලෙස් සිත් ඇත්තේ වෙමි.

5612 "බුදුගුණ සිහිකොට දෙසන්නෝ අසන්නවුන්ගේ නුවණ ඉපදවීමි. එහෙයින් මම ප්‍රඥා සහිත වූයේ සියුම්වූ අදහස් දක්නේ වේ.

5613 'සියළු ආශ්‍රවයන් ක්ෂය කරන ලදුයේ තරණය කරන ලද සසර සයුරු ඇත්තේ උපාදාන (දර) රහිත ගින්නක් මෙන් පිරිනිවනට පැමිණියේ වෙමි.

5614 'මම මෙම කල්පයෙහිදීම බුදුරජුන්හට යම් ස්තුතියක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුදුගුණ වැණීමෙහි මේ විපාකයයි. 5615-5616

## 54 කච්චාන වග්ග.

### 531 මහා කච්චාන ථෙරාපදානය

5618 'මින් කල්ප ලක්ෂයකින් මතුයෙහි නොපැරදවිය හැකි මර රුපුනුදු ජය ගත්තාවූ ලොකනායකවූ පදුමුත්තර නම් බුදුරජතෙමේ ලොවපහළ වීය.

5619 'වීරවූ පියුම් පතක් බඳු ඇස් ඇති සඳුමෙන් පිරිසිදු මුහුණක් ඇති කනක පර්වතයක් (රත්රන් කන්දක්) මෙන් බබලන්නාවූ හිරුරැසට බඳු පැහැඇති.

5620 "සත්වයින්ගේ නෙත්සිත් පැහැරෙන්නාවූ උතුම් (දෙතිස් මහාපුරිස් ලකුණින් සරසන ලද්දාවූ සියළු (වර්ණනාත්මක) කථා මාර්ගය ඉක්මවන ලද්දාවූ දෙව්මිනිසුන් විසින් සත්කාර කරන ලද්දාවූ

5621 '(මාර්ග) ස්වරවූ මධුරස්වර ඇත්තාවූ (සිව්) පිරිස්හි විශාරද (නිර්භය) වූ සම්‍යක් සම්බුදු රජ තෙමේ සත්වයනට (දහම්) අවබොධ කරවමින්,

5622 "සිව් සස් සහිතවූ මිහිරි දහම දෙසයි. මොහය (මුලාව) නමැති මඩෙහි ගැලුන සත්වයන් (ඉන්) ගොඩලයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5623** "හිමව් (පව්ව) වාසස්ථානකොට ඇති තව්සෙකුවූ (මම) එකල්හි එකලාව හැසිරෙන්නාව අහසින් මිනිස්ලොවට යන්නේ බුදුරජුන් දුටිමි.

**5624** "(මම) වීරවූ ශ්‍රවකයෙකු පිළිබඳ මහත්වූ ගුණය වර්ණනය කරන්නාවූ ඒ බුදුරජාණන් වහන්සේගේ සමීපයට එළඹ (එම) දහම් දෙසුම ඇසීමි.

**5625** "යම්සේ මා විසින් සංක්ෂිප්ත වශයෙන් (ලුහුඬින් යමක්) කියන ලද නම් (එය) මේ කෘත්‍යායන තෙමේ විස්තර වශයෙන් පවසමින් පිරිසිඳ මාද තුටු කෙරෙයි

**5626** "මහණෙනි, මම මෙබඳුවූ අන්කිසි ශ්‍රාවකයකු නොදනිමි. එහෙයින් මෙතෙම අග්‍රය. එතදග්‍රස්ථානයෙහිලා දරව්."

**5627** "එකල්හි මම ඒ මනොඥ වචනය අසා හිමවතට ගොස් මල් රැසක් ගෙනවුත්.

**5628** "ලොකයට පිහිටවූ බුදුරජුන් හට පුදා එම තනතුර පැතීමි. ඒ බුදුරජතෙමේ එකල්හි මාගේ අදහස දැන (මෙසේ) පැවසීය.

**5629-5630** "රත්කොට පිරිසිදු කළ ස්වර්ණයෙක (පැහැයට) බඳු සිවිය ඇති උඩට නැමීගිය අග් සහිත ලොම් ඇති සම්පූර්ණව (මසින් වැසුනාවූ) උරහිස් ඇති නිශ්චලවූ බඳැදිලිව සිටියාවූ සතුටු කඳුලින් පිරීගිය ඇස් ඇති බුදුරජුන්ගේ ගුණ වැනීමෙහි මෙහෙයන සිත් ඇති අමා වගුරන ලද්දාක් මෙන්වූ (මූර්තිමත්වූ) ධර්මය වැනි උතුම් සිරුරක් ඇති මෙම ඍෂිවරයා (දෙස) බලව්"

**5631** "(මෙතෙම) කච්චායනයන්ගේ ගුණ අසා එම තනතුර පතමින් සිටියේය. (ගෞතම) මහා මුනින්ද්‍රයන් වහන්සේගේ (සසුන පවත්නා) අනාගත කාලයෙහි

**5632** "එම බුදුරජුන්ගේ ධර්මයෙහි දායාදීවූ ධර්මයෙන්ම නිර්මිත කළාක් වැනිවූ ඖරස බුද්ධපුත්‍රවූ නමින් 'කච්චාන නම් බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේය.

**5633** "යම්සේ මා විසින් මෙය පවසන ලද නම් එසේම (අනාගතයෙහි බහුශ්‍රැතයෙක්ව මහ නුවණැතියෙක්ව අදහස් දන්නා කෙනෙක්ව එම තනතුරට පැමිණෙන්නේය" (කියායි)

**5634** "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙලෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයයි

**5635** "දෙව් ආත්ම බවෙහිද මිනිස් ආත්ම බවෙහිද යන දෙආත්ම බවෙහි සැරිසරමි. (ඉන් පිටත්) අනික් ගතියකට නොයමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**5636** "කැත් කුලයෙහිද යලි බමුණු කුලයෙහිද යන දෙකුලයෙහිම උපදිමි. නීච කුලයෙහි නොඋපදිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි.

**5637-5638** "දැන් මේ පශ්චිම භවයෙහි උදෙනි නගරයෙහි උපන්නේ වෙමි. චණ්ඩ ප්‍රද්‍යොත රජුගේ කිරීටවච්ඡ (නම්) පුරොහිත බමුණාගේ පුත්‍රවූයේ සියුම් නුවණැත්තේ (සිව්) වෙදයෙහි පරතෙරට වීමි. මව්තොමෝ චන්දිම නම් වූවාය. උතුම් සිවියක් (සමක්) ඇති මම කච්චාන නම් වෙමි.

**5639** "බුදුරජුන් විමසන පිණිස රජු විසින් එවන ලද යම් ගුණ සමූහය ඇති ලොකනායකවූ බුදුරජුන්ද මොක්පුර දොරටුව (නිර්වාණ ද්වාරය) ද දැක,

**5640** "(සසර) ගමන නමැති මඩ වියලවන්නාවූ නිර්මල (බුද්ධ වචනයද, අසා පන්සියයක් දෙනා සමග ශාන්තවූ අමෘතයට (නිවනට) පැමිණියෙමි.

**5641** "මහාමුනිවූ බුදුරජුන්ගේ අදහස් දන්නෙක් විය. මැනවින් සමෘද්ධවූ මනොරථ (අදහස්) ඇත්තේ එතදග්‍රස්ථානයෙහි තබන ලද්දේ (වීමි.) 5642-5644

## 532 වක්කලි ථෙරාපදානය

**5645** "මින් සියක් දහස්වන කපෙහි ලොකනායකවූ අලාමකවූ නම් ඇති අපමණ ගුණ ඇති නමින් පදුමුත්තර නම්වූ බුදුරජතෙම ලොවපහළ විය.

**5646** "(එම බුදුරජතෙම) පියුමකට බඳු මුහුනු ඇත්තේය. ජලය හා (නොගැටෙන) පියුම මෙන් ලොකය හා නොගැටෙන්නේය.

**5647** "(එසේම) වීරයෙක, (සුදු පියුම් පතට බඳු ඇස් ඇත්තෙක. පියුමක් මෙන් සිත් කළුය. උතුම් පියුමක සුවඳට

බඳු සුවඳ (මුව) ඇත්තෙක. එබැවින් හෙතෙම පදුමුත්තර නමුදු වේ.

**5648** "එසේම එම බුදුරජතෙම) ලොකජේ‍යෂ්ඨයෙක (ගුණ) නිපදවන්නෙක (දැස් නැති) අන්ධයනට ඇසක් වැනියෙක. ශාන්තවූ වෙශ ඇතියෙක. ගුණ නිධානයක කුළුණු නැණ සයුරෙක.

**5649** "බඹ අසුර සුරයන් විසින් පුදන ලද දෙවියන් සහිතවූ මිනිසුන් විසින් ගැවසීගත් (පිරිවරන ලද) අති උත්තමවූ ඒ මහාවීරවූ බුදුරජතෙම කිසියම් දිනෙක්හි.

**5650** "සුවඳවත් මුවින්ද මියුරුවූ හඬින්ද සියළු පිරිස (එහි) රඳවමින් සිය සව්වෙකුට ස්තුති කෙළේය.

**5651** "බැසගත් සැදැහැ ඇති මනා නුවණැති මාගේ දැකුමෙහි ලොල්වූ මේ වක්කලී වැනි මෙබඳුවූ අනික් භික්ෂුවක් නැත" (කියායි)

**5652** "එකල්හි මම හංසවතී නගරයෙහි බ්‍රාහ්මණ පුත්‍රයෙක්ව (බුදුරජුන්ගේ) ඒ වචනය අසා එම තනතුර රුචි කෙළෙමි.

**5653** "එකල්හි ශ්‍රාවක සංඝයා සහිත ඒ නිර්මල බුදුරදුන් පවරා සතියක් (දන්) වළඳවා) (චීවර) වස්ත්‍රවලින්ද හැඳවීමි.

**5654** "උන් වහන්සේගේ අනන්තවූ ගුණ සයුරෙහි සිරසින් (හිසනමා) වැටී (එහි) ගිළුනේ ප්‍රීතියෙන් සම්පූර්ණ වූයේ මෙම වචනය කීමි.

**5655** "මුනීන් වහන්ස, මින් සත් වැනි දිනයෙහි (සතියකට පෙර) යම් ඒ භික්ෂුවක් තෙම සැදැහැතියනට අග්‍රයයි ඔබ වහන්සේ විසින් පසසන ලදද, මමද එබන්දෙක් වෙමියි (කියායි)

**5656** "මෙසේ කී කල්හි මහාවීරවූ නොඇවිරුණු දැකුම් (අනාවරණ ඥාන) ඇති බුදුරජතෙම පිරිස්හිදී මෙම වචනය වදාළේය.

**5657** "යාගකොට රන්හුයින් දැමූ පුනනුල් සහිත සිරුර ඇති හේ නෙත් සිත් ඇදගන්නාවූ කසාවත් හඳින්නාවූ මේ මානවකයා දෙස බලව්.

**5658** "මෙතෙම මතුකාලයෙහි ගෞතම බුදුරජුන් කල බැසගත් සැදැහැ ඇති (සද්ධාධිමුක්තික) යනට අග්‍රවූ ශ්‍රාවකයා වන්නේය.

**5659** "දෙව්වූයේ හෝ මිනිස්වූයේ හෝ සියළු තැවුල්වලින් බැහැරවූයේ හැම භොග සම්පත්තීන්ගෙන් පිරිවරන ලදුයේ සුව ඇත්තෙක් වන්නේය.

**5660** 'මින් සියක් දහස්වන කපෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘ තෙමේ ලොව පතළ වන්නේය

**5661** "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ ඖරස (බුද්ධ පුත්‍ර) වූ නමින් වක්කලී නම් ශාස්තෘ ශ්‍රාවකයෙක් වන්නේය.

**5662** "මම එම කර්මවිශෙෂය කරණකොටගෙනද චිත්ත ප්‍රණිධින් කරණ කොටගෙනද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

**5663** "මම සියළු කල්හි සුව ඇත්තේම කුදු මහත් භවයෙහි සැරිසරන්නේ සැවැත්නුවර එක්තරා කුලයක උපන්නේ වෙමි.

**5664-5665** "පිසාචියගේ බියෙන් තැතිගත්තාවූ බැගෑපත් සිත් ඇති (දෙමාපියෝ) වෙඬරුමෙන් සිව්මැලිවූ අසෝක දළු මෙන් මොළොක්වූ උඩුකුරුව හෝනාවූද හොඳ නොහොඳ නොදන්නාවූ ළදරුවූ මා මහර්ෂීවූ බුදුරජුන්ගේ පා මුල සයනය කරවූහ. 'නාථයන් වහන්ස, පිහිටවනු මැනවැ' යිද (කීහ.)

**5666** "එකල්හි බියවුවනට පිහිටවූ ඒ බුදුරජතෙම සක් ලකුණු ඇති මුදුකොමල හස්තයෙන් (දැල්හුයින් පිළි) ගත්තේය

**5667** "මම එතැන් පටන් එම ආරක්ෂාව කරණ කොට ගෙන රක්නා ලදුයේ සියලු පස මිතුරන්ගෙන් මිදුනේ සුවයෙන් වැඩුනේ.

**5668** "මොහොතකුදු බුදුරජුන්ගෙන් වෙන්වූයේ උකටලීවෙමි. උත්පත්තියෙන් සත් හැවිරිදිවූ මම අනගාර්‍ය්‍ය නම්වූ සසුනෙහි පැවිදි වීමි.

**5669** "සියළු පාරමිතාවන්ගේ බලයෙන් හටගත්තාවූ උතුම්වූ ලක්ෂ්මියට (සම්පත්තියට වාසස්ථානවූ සියළුම ශුභ වර්ණ

සණ්ඨාන) යන්ගෙන් ගැවසීගත් (බුදුරජුන්ගේ) රූපය මම සැහීමකට පත් නොවූයේ කැමති වෙමි.

**5670** "එකල්හි පස්මරුන් දිනූ බුදුරජතෙම (මා) රූපයෙහි ඇළුනු බව දැක 'වක්කලිය' කම් නැත. බාලයන් තුටු කරන්නාවූ රූපයෙහි කිම ඇලෙහිද?"

**5671** "යමෙක් සදහම් දක්නේ වේද, ඒ පණ්ඩිතතෙමේ මා දකී. සදහම් නොදක්නේ මා දක්නේ නමුදු නොදක්නේමය.

**5672** "කය අපමණවූ දොස් ඇත්තකි. විෂ වෘක්ෂයකට බඳු උපමා ඇත්තකි. සියළු රෝගයනට නිවාස ස්ථානයකි. හුදු දුඃඛ පිණ්ඩයකි.

**5673** "එබැවින් රූපයෙහි කලකිරී ස්කන්ධයන්ගේ උදය-ව්‍යය (ඇතිවීම නැතිවීම) බලව. (ඉන්) සියළු කෙලෙසුන්ගේ කෙළවරට සුවසේ පැමිණෙන්නෙහිය.

**5674** "හිතෛෂිවූ එම (ලොක) නායකයන් වහන්සේ විසින් මෙසේ අනුශාසනා කරන ලද එම ගිජුකුළු පව්වට නැගී ගිරිකඳුරෙක්හිදී මැරෙන්නට සිතීමි.

**5675-5676** "ඒ පස්මරුන් දිනූ බුදුරජතෙම (එවිට) කඳු බෑවුමේ සිටියේ, 'වක්කලී' යයි මට ඇමතීය. මම එම වචනය අසා සතුටුවූයේ බොහෝ සිය ගණන් පුරිස් පමණවූ (ශතපුරුෂ ප්‍රමාණ වූ) පර්වත පබ්භාරය (කන්ද යටින් සෑරී සෑදුනු ප්‍රපාතය) ට පැන්නෙමි. එකල්හි (මම) සුවසේම භූමි ගතවූයේ (පොළොවෙහි පිහිටියේ) වෙමි.

**5677** "(බුදුරජතෙම) නැවතද ස්කන්ධයන්ගේ උදයව්‍යය පිළිබඳව දහමක් දෙසීය. මම එම ධර්මය දැක රහත් බවට පැමිණියෙමි.

**5678** "එකල්හි මහනුවණැති මරණයෙහි කෙළවරට ගිය නිවන් ලැබීමෙන් මරණ දුක නැති කළ (බුදුරජතෙම) අති මහත් පිරිස් මැද (හිඳ) මා බැසගත් සැදැහැඇති (ශ්‍රද්ධා විමුක්තික) යනට අග්‍රයයි (අගතන්හි) තැබීය.

**5679** "මින් සියක් දහස්වන කපෙහිවූ එකල්හි යම් කර්මයක් කෙළෙම්ද (ඒ හේතුවෙන්) දුගතියක් නොදනිමි. බුද්ධ පූජාවෙහි මේ විපාකයයි. (5880-5882)

## 533 මහා කප්පින ථේරාපදානය

**5683** "සියළු දහම්හි තෙරපත් පදුමුත්තර නම් බුදුරජ තෙමේ ලෝකය නමැති අහසෙහි උදාවූ ශරදාකාශයෙහි සූර්‍ය්‍යයා මෙන්,

**5684** "වචන නමැති රශ්මියෙන් විනෙය ජන නමැති පියුම් පුබුදුවයි. (එම) ලොකනායකතෙමේ නුවණ නමැති රැසින් කෙලෙස් නමැති මඩ වියලයි.

**5685** "කණමැදිරි එලිය (නොබබුළුවන) හිරුමෙන් තීර්ථකයින්ගේ යශස නසයි සත්‍යාර්ථ ප්‍රභාව ප්‍රකට කෙරෙයි. සූර්‍ය්‍යතෙමේ රත්නයන් ප්‍රකට කොට දක්වන්නාක් මෙනි.

**5686** "රත්නයනට සයුරමෙන් ගුණයට රැස්වන තැනක් (ආකාරයක්) වේ. භූත වස්තූන් (තෙමා සමෘද්ධියට පත් කරන) වැහිවලාවක් මෙන් ලොකයා දහම් වැස්සෙන් තෙමයි.

**5687-5688** "මම එකල්හි හංසවතී නගරයෙහි 'සාර දර්ශීවූ ආචාර්‍ය්‍ය වරයෙක් වීමි. (බුදුරදුන් වෙත) එළඹ භික්ෂූනට අවවාදකරන්නවුන් අතුරෙන් (අගතැන්පත්) කටයුතුදෑ කොට නිමවූ ශ්‍රාවකයෙකුගේ ගුණ පවසන්නාවූ මාගේ සිත සතුටු කරන්නාවූ (එම) පදුමුත්තර බුදුරදුන්ගේ ධර්මය ඇසීමි.

**5689** "(එම ධර්මය) අසා සතුටුවූයේ සොම්නස්වූයේ ශිෂ්‍යයන් සහිතවූ තථාගතයන් පවරා (දන්) වළඳවා එම තනතුර මමද පැතීමි.

**5690-5691** "එකල්හි හංසහඬ ඇති බෙරහඬකට බඳු මහා ස්වර ඇති මහත් භාග්‍ය ඇති බුදුරජතෙමේ මෙසේ පැවසීය. මැනවින් උඩට නැගුණාවූ ඌර්ධවාග්‍රරොම ඇති මාගේ පාමුල වැටුනාවූ මෙසවර්ණවූ පිරිපුන් උරහිස් ඇති පැහැදි ඇස් හා මුහුණ ඇති මේ මහාමාත්‍යයා දෙස බලව්.

**5692** "මහත්වූ පිරිවර සහිතව මහා යශස් රඤ්ජනය කරන්නාවූ ප්‍රමුදිත සිත් ඇති මෙතෙම කටයුතුදෑ කොට නිමවූ භික්ෂූනට ඔවා දෙන්නවුන් අතුරෙන් අගතැන් (පත් එම ශ්‍රාවකයාගේ) තනතුර පතයි.

**5693** "මෙම පිණ්ඩපාතදානය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණකොට ගෙනද කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියක නූපදියි.

**5694** "දෙවියන් අතුරෙහි දිව්‍යමය සෞභාග්‍යයද මිනිසුන් අතුරෙහි මහත්තත්වයද අනුභවකොට (එම) කමාව ශෙෂයෙන් නිවණටද පැමිණෙන්නේය

**5695** "මින් සියක් දහස් වන කපෙහි ඔක්කාක කුලයෙහි උපන්නාවූ නමින් ගෞතම නම්වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේය.

**5696** "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූ ධර්මයෙන් නිර්මිත කළාක් බඳුවූ ඖරස (බුද්ධපුත්‍ර) වූ නමින් කප්පින නම්වූ ශාස්තෘ ශ්‍රාවකයෙක් වන්නේය" (කියායි)

**5697** 'ඉක්බිති මම සර්වඥ ශාසනයෙහි (මෙම) මහා පින්කම කොට මිනිස් සිරුර හැර තුෂිත දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

**5698** "දැහැමින් සෙමින් සියක් වරක් මනුෂ්‍ය රාජ්‍යයන් (අනුශාසනය) කොට බරණැස සමීපයෙහි පෙශකාර කුලයෙහි උපන්නේ (වෙමි.)

**5699** "භාර්‍යාව සහිතවූ මම දහසක් පිරිවරද සමග පන්සියයක් පසේ බුදුවරයනට උවටැන් කෙළෙමි

**5700** "තෙම්සක් (මුළුල්ලෙහි දන්) වළඳවා පසු තුන් සිවුරු දුනිමු අපි සියල්ලෝ ඉන් චුතව තව්තිසා දෙව්ලොවට ගියෙමු.

**5701** "යළි අපි සියල්ලෝ ඉන් චුතවූවාහු මිනිසත්බවට පැමිණියෙමු. හිමවත් පව් පසෙකින් (පැත්තකින්) වූ කුක්කුට පුරයෙහි උපන්නෝ වෙමු.

**5702** "මම මහත් යසස් ඇති කප්පින නම් රාජ පුත්‍රයෙක් වීමි. සෙස්සෝ ඇමති කුලයෙහි උපන්නාහු මාම පිරිවැරූහ.

**5703** "සියළු කාම සුඛයන්ගෙන් සමෘද්ධවූ මම මහරජ සුවයට පැමිණියේ වෙළඳුන් විසින් කියන ලද බුදු උපත (ගැන) ඇසීමි.

**5704** අසමවූ අසහාය පුද්ගලවූ බුදුරජ තෙම ලොව පහළවිය. හෙතෙම උතුම්වූ අමාසුවය (දෙන) සදහම් දෙසයි.

**5705** "උන්වහන්සේගේ ශිෂ්‍යයෝද මැනවින් (එම ධර්මයෙහි) යෙදුනෝය. ආශ්‍රවයන් කෙරෙන් මැනවින් මිදුනෝය" (කියායි) ඔවුන්ගේ මේ මනා වචනය අසා(එම) වෙළඳුන්හට සත්කාර කොට,

**5706** "රාජ්‍යය හැරදමා (ඇමතියන් සහිතව තථාගතයන් දක්නට) නික්මුණේය. මුවවිට දක්වා (සමව) පිරුණාවූ චන්ද්‍ර භාග මහා නදීය දැක.

**5707** "එහි වැටුනු අයට කිසිදු පිහිටක් නොමැති බැවින් ප්‍රතිෂ්ඨා විරහිතවූ එල්බගැනීමට කිසිවක්නැති බැවින් නිරාලම්බවූ තරණය කිරීම දුෂ්කරවූ ශීඝ්‍රව (වේගයෙන්) ගලා බස්නාවූ (චන්ද්‍රභාග නදිය) බුදුරජුන්ගේ ගුණ සිහිකොට සුවසේ ඉක්මවීමි. (කෙසේදයත්?)

**5708** 'ලොකයෙහි කෙළවරට ගියාවූ (දතයුතු තාක් සියල්ල) දන්නා සර්වඥතෙමේ ඉදින් භවය නමැති සැඩපහර තරණය කළේ නම් එම සත්‍ය වචනය කරණකොට ගෙන මාගේ ගමන සමෘද්ධ වේවා.

**5779** "ඉදින් ශාන්ති ගමන මාර්ගයද මොක්ෂයද අත්‍යන්ත සුඛ වේනම් එම සත්‍ය වචනය කරණකොට ගෙන මාගේ ගමන සමෘද්ධ වේවා.

**5710** "ඉදින් (ආයර්‍ය) සංඝතෙමේ තරණය කරන ලද (භව) කාන්තාරය ඇත්තේ වේද, නිරුත්තරවූ පුණ්‍යක්ෂෙත්‍රය වේද එම සත්‍ය වචනය කරණකොට ගෙන මාගේ ගමන සමෘද්ධවේවායි" (සත්‍යක්‍රියා කෙළෙමි)

**5711** "(මෙම) උතුම්වූ සත්‍යක්‍රියාව කළ කෙණෙහි මාර්ගයෙන් ජලය ඉවත්විය. ඉක්බිති සුවසේ ගඟින් එතෙරවූයේ මනරම්වූ ගංගාතීරයෙහි,

**5712-5713** "උදාවන හිරුමෙන්ද දිලිසෙන හිමාලය පර්වතය මෙන්වූද බබලන ප්‍රදීප වෘක්ෂයක් වැනිවූද තාරකා සමූහයා සහිතවූ සඳුමෙන් ශ්‍රාවකයන් විසින් පිරිවරන ලද්දාවූද වර්ෂණය කරන්නාවූ මෙඝයන් මෙන් (දහම්) දෙසුම් නමැති දිය දෙන්නාවූද වැඩහුන්නාවූ බුදුරජුන් දුටිමි.

**5714** "(මම) ඇමතියන් සහිතව (බුදුරජුන්) වැඳ එකත් පසෙක හුනිමි. ඉක්බිති බුදුරජතෙමේ අපගේ අදහස් දැන දහම් දෙසීය.

**5715** "අපි නිර්මලවූ ධර්මය අසා බුදුරජුන්හට (මෙසේ) කීමු. මහා වීරයන්වහන්ස අපි භවයෙහි කලකිරුනෝ වෙමු. පැවිදි කරනු මැනව" යි (කියායි)

**5716** "මහණෙනි, ධර්මය (මැනවින් දෙසන ලද බැවින්) ස්වාක්ඛාතය. තොපගේ දුක් කෙළවර කිරීම පිණිස බඹසර හැසිරෙව් යයි විපස්සී බුදුරජුන් පටන් මෙම බුදුරජුන් දක්වා සත්වැනිවූ (ගෞතම) මුනිතෙම වදාළේය.

**5717** "එම වචනය හා සමගම අපි සියල්ලෝ භික්ෂුවෙශ දරන්නාහු සසුනෙහි උපසපන්වූ සෝවාන්වූ පැවිද්දෝ වීමු.

**5718** "ඉක්බිති බුදුරජතෙම දෙව්රම් වෙහෙරට ගොස් අනුශාසනා කළේය. බුදුරදුන් විසින් අනුශාසනා කරන ලද මම රහත් බවට පැමිණියෙමි.

**5719** "ඉක්බිති (මාගේ පිරිවරවූ) ඒ භික්ෂූන් දහසකටද මම අනුශාසනා කෙළෙමි. එකල්හි මාගේ අනුශාසනය කරන්නාවූ ඔවුහුද ආශ්‍රව රහිතයෝ (රහත්හු) වූහ.

**5720** "එම ගුණයෙහි සතුටු වූ බුදුරජතෙම මහජනයා ඉදිරියෙහි කප්පිනතෙමේ භික්ෂුනට ඔවා දෙන්නවුන් අතුරෙන් අග්‍රයයි මා එතදග්‍රස්ථානයෙහි තැබීය.

**5721** "මන් (යම්) සියක් දහස්වන කපෙහි මා විසින් කරන ලද (ඒ පුණ්‍ය) කර්මය මෙහිදී විපාක දැක්විය. (දුන්නෙන්) මැනවින් මුදාහරින ලද වේගවත් හීනයක් මෙන් (එම කර්ම ඵලය) මාගේ කෙලෙසුන් දැවීය. 5722-5724

## 534 දබ්බ ථෙරාපදානය

**5725** "පසැස් ඇත්තාවූ සව් ලෝ (මැනවින්) දත් පස් මරුන් දිනූ පදුමුත්තර නම් බුදුරජතෙමේ මින් සියක් දහස් වන කපෙහි ලොව පහළවිය.

**5726** "(සව් සත්නට) ඔවා දෙන්නාවූ දහම් අවබොධ කරවන්නාවූ (එසේම ඔවුන් සසර සයුරින්) එතරකරන්නාවූ දෙශනාවෙහි දක්ෂවූ බුදුරජතෙමේ බොහෝ ජන සමූහයා (සසරින්) එතර කරවීය.

5727 "සව් සත්නට අනුකම්පා කරන්නාවූ කාරුණිකවූ හිත කැමති වන්නාවූ (බුදුරජතෙම) පැමිණි සියළු තීර්ථකයන් පන්සිල්හි පිහිටුවිය.

5728 "මෙසේ (එම කාලය) තීර්ථකයන්ගෙන් හිස්වූ නිරවුල්වූ තාදී ගුණ ඇති (පඤ්ච වශිතාවන්ගෙන්) වශීභූතවූ රහතුන්ගෙන් විසිතුරුවූවක් විය.

5729 "එම බුදුරජතෙමේ අටපණස් රියනක් උසය. රන් ඇගෑවක් මෙන් බබලන්නේය. දෙතිස් මහා පුරිස්ලකුණු ඇත්තේය.

5730 "එකල්හි වර්ෂ ලක්ෂයක් ආයුෂ වෙයි. ඒතාක්කල් වැඩහුන්නාවූ (මෙම) සර්වඥතෙම බොහෝ ජන සමූහයා (සසරින්) එතර කෙළේය.

5731 'එකල්හි මම හංසවතී නගරයෙහි මහත් යසස් ඇති සිටුපුත්‍රයෙක්වූයේ බුදුරජුන් වෙත එළඹ දම්දෙසුම ඇසීමි.

5732 "භික්ෂූනට සෙනසුන් පණවන්නාවූ සිය සව්වෙකට පසසන උන්වහන්සේගේ වචන අසා සතුටුවූ මම,

5733 සංඝයා සහිතවූ ඒ බුදුරජුන්හට (දන්දීම් ආදීවූ) පින්කම් කොට (උන්වහන්සේගේ) පාමුල සිරසින් වැටී එම තනතුර පැතීමි.

5734 "එකල්හි ඒ මහාවීරවූ බුදුරජතෙමේ මාගේ පුණ්‍ය කර්මයට පසසමින් මෙසේ කීය. යමෙක්තෙම සංඝයා සහිත බුදුරදුන් සතියක් වැළඳවීද,

5735 "(හෙළ) පියුම් පතකට බඳු ඇස් ඇති ශ්‍රෙෂ්ඨවූ (පිරුණු) උරහිස් ඇති රන්වන්වූ සිවි ඇති ඒ මේ සිටු පුතෙක් තෙම (මෙම) උතුම් තනතුර පතමින් මාගේ පාමුල වැටුනේද,

5736 "මින් සියක් දහස්වන කපින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම්වූ බුදුරජතෙමේ ලොව පහළ වන්නේය.

5737 "එකල්හි මෙතෙම එම බුදුරජුන්ගේ දබ්බ නමින් ප්‍රසිද්ධවූ සෙනසුන් පණවන්නාවූ අගසව්වෙක් වන්නේය" (කියායි)

5738 "මැනවින් කරන ලද එම කර්මය කරණකොට ගෙනද චිත්ත ප්‍රණිධින් කරණ කොට ගෙනද මම මිනිස් සිරුර හැර තව්තිසාවට ගියෙමි.

5739 "මම තෙසියවරක් දිව්‍ය රාජ්‍යය කරවීමි. පන්සිය වරක් සක්විති රජවීමි.

5740 '(කරවන ලද) මහත්වූ ප්‍රදෙශ රාජ්‍යය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නොහැකිය. එම කර්මයාගේ බලයෙන් හැමතන්හි සුවඇත්තේ වීමි.

5741 "මින් (යට) එක් අනූවන කපෙහි මනොඥ ඇස් ඇති සියළු ධර්මයන් විදසුන් නුවණින් දක්නාවූ විපස්සී නම් බුදුරජතෙම ලොව පහළවිය.

5742 "තාදී ගුණ ඇති උන්වහන්සේගේ සියළු ආශ්‍රවයන් ක්ෂය කළ ශ්‍රාවකයෙකු ශුද්ධවූ උතුමෙකැයි දැනම දුෂ්ට සිත් ඇත්තේ නින්දා කෙළෙමි.

5743 "මම සළාකයක් ගෙන එම බුදුරදුන්ගේ මහර්ෂිවූ (රහත්) සව්වනට කිරිබතක් දුනිමි.

5744 "මට භද්‍ර කල්පයෙහි බ්‍රාහ්මණ කුලයෙහිවූ මහත් යසස් ඇති කථාකරන්නවුන් අතුරෙන් ශ්‍රෙෂ්ඨවූ නමින් කාශ්‍යප නම්වූ බුදුරජතෙමේ ලොව පහළවිය.

5745 "ශ්‍රාවකයන් සහිතවූ හෙතෙම මිථ්‍යාතීර්ථකයන් මැඩ සසුන බබුළුවා හික්මවියයුතු ජනයන් හික්මවා පිරිනිවන් පෑය.

5746 "ශිෂ්‍යයන් සහිතවූ බුදුරජුන් පිරිනිවි කල්හි සසුන පිරිහෙන කල්හි කලකිරුණාවූ දෙව්වරු මිදූ (විසිරවූ) කෙස් ඇත්තාහු කඳුලු පිරි මුහුණු ඇත්තාහු හැඬූහ. (කෙසේදයත්?)

5747 'දහම් ඇස නිවී යන්නේය. මනාව්‍රත ඇති (ශ්‍රාවක) යන් නොදකින්නෙමු. සදහම් නොඅසන්නෙමු. අහෝ අපගේ පින්මද බවය (කියායි.)

5748 "එකල්හි මේ නිශ්චලවූ සියළු පෘථිවි තොමෝ වෙව්ළුම් සහිතව කම්පාවූවාය. සයුරද සොක සහිතව මෙන් අනුකම්පා කටයුතුසේ නාද පැවැත්විය.

5749 "සිව්දිගෙහිවූ අමානුෂිකවූ භෙරීහු ශබ්ද පැවැත්වූහ. හාත්පස භයජනකවූ අසනීහු (හෙණ) පතිතවූහ.

5750 "අහසින් උල්කාවෝ පතිතවූහ. ධූමකේතූහුද පෙණුනාහුය. මෘග (ආදී) වූ ගොඩ උපදින සියළු සත්වයෝ අනුකම්පා කටයුතු සේ නාද පැවැත්වූහ.

5751 "ශාසන විනාශය පවසන දරුණු උත්පාත (භූත විකාරයන්) දැක කලකිරුණාවූ භික්ෂූන් සත්නමක්වූ අපි එකල්හි මෙසේ සිතීමු.

5752 "සසුනෙන් තොරවූ අපගේ ජීවිතයෙන් කම්නැත. අපි මහාවනයට පිවිස බුදුසසුනෙහි යෙදෙමුය" (කියායි)

5753 "එකල්හි අරණෙහි උස්වූ උතුම් පර්වතයක් දුටිමු. හිණිමගෙකින් (එම) පර්වතයට නැගී හිණිමග බිම හෙළීමු.

5454 "එකල්හි (එම පිරිස අතුරෙන්) සංඝ ස්ථවිර තෙමේ අපට (මෙසේ) අවවාද කෙළේය. බුද්ධොත්පාදය අතිශයින් දුර්ලභය. ශ්‍රද්ධාතොමෝද අතිශයින් දුර්ලභ වන්නීය. සසුනද ශෙෂව ඇත්තේ ස්වල්පයකි.

5755 "අෂ්ට දුෂ්ට ක්ෂණ විනිර්මුක්ත මෙම උතුම් මොහොත ඉක්මවුවෝ අනන්තවූ දුක් සයුරෙහි වැටෙත්. එහෙයින් සර්වඥ මතය (බුදුසසුන) පවත්නා කල්හිම (එහි) යෙදීම කළයුතුයි.

5756 "ඒ (ඔවා දුන්) ස්ථවිරතෙමේ රහත්විය. උන්වහන්සේ අනුවගිය (දෙවැන්නා) අනාගාමි විය. (ධර්මයෙහි) යෙදුනු සෙසු සිල්වතුන්වූ අපි (ඉන් චුතව) දෙව්ලොව ගියෙමු.

5757-5758 "(අනාගාමිවූ තැනැත්තේ) හුදකලාව ශුද්ධාවාසයෙහිදී තරණය කළ සසර ඇත්තේ (රහත්ව) (එහිදී) පිරිනිවනපෑයේ (විය.) මමද පුක්කුසාතී (රජ) ද (එසේම) සභියද බාහියද කුමාර කස්සපදැයි (මෙසේ) අපි ඒ ඒ තන්හි උත්පත්ති වශයෙන් ගියාහු ගෞතම බුදුරජුන් විසින් අනුකම්පාකරන ලද්දාවූ සසර බැඳුමින් මිදුනෝ වෙමු.

5759 "මම මල්ල රටෙහි උපන්නේ මව් කුසෙහිදීම මාගේ මව මළා. චිතකයට නැංවූවා (එම මවගේ මෘත ශරීරයෙන්) වැටුනේ වෙමි.

5760 "කුස තණ ගොඩෙහි වැටුනේ ඒ හේතුවෙන් 'දබ්බ' යන නමින් ප්‍රකටවූයේ වෙමි. බඹසර බලය කරණ කොටගෙන මම සත්ඇවිරිදි වූයේ (සසරින්) මිදුනේ වෙමි.

**5761** "මම කිරිබත් (දන් දීමේ) විපාකයෙන් ආයු වර්ණ සැප බල ප්‍රඥා යන අංග පසකින් යුක්තවූයේ වෙමි. (රහතන් වහන්සේ කෙනෙකුට නින්දාකිරීමේ) අරියොපවාද පාපය කරණකොටගෙන බෙහෙවින් චොදනා ලබන ලදුයේද වෙමි.

**5762** "දැන් මම කුසල් (රැස්කිරීම) ද අකුසල් රැස් කිරීමද යන මේ දෙකම ඉක්මවූයේ වෙමි. පරම ශාන්තියවූ නිවනට පැමිණ ආශ්‍රව රහිතවූයේ වෙමි.

**5763** "මනා ව්‍රත ඇති භික්ෂූන් තුටුකොට සෙනසුන් පැණවීමි. එම ගුණයෙහි තුටුවූ බුදුරජතෙම මා (සෙනසුන් පණවන භික්ෂූන් අතුරෙන් අග්‍රයයි) එතදග්‍රස්ථානයෙහි තැබීය. 5764-5766.

## 535 කුමාරකස්සප ථෙරාපදානය

**5767** "මින් ලක්ෂයක් වන කපෙහි සියලු ලොවට හිතවූ වීරවූ පදුමුත්තර නම් ලොක නායක (බුදුරජ) තෙමේ ලොව පහළවිය.

**5768-5769** 'එකල්හි මම වෙදයෙහි පරතෙරට ගිය බමුණෙක්ව ප්‍රකටවුයේ දිවාවිහරණයෙහි හැසිරෙන්නේ, සිව්සස් දෙසන්නාවූ දෙවියන් සහිත ලොකයාට දහම් අවබොධ කරන්නාවූ මහජනයා ඉදිරියෙහි විචිත්‍ර කථිකයනට අගතැන් පත් සව්වෙකු වර්ණනය කරන්නාවූ,

**5770-5771** "එකල්හි ප්‍රමුදිත සිත් ඇති මම තථාගතයන් වහන්සේ පවරා නන්රුවනින් බබලන මඬුවක් නොයෙක් රතු වත්වලින් සරසා එහි සංඝයා සහිත බුදුන් වැළඳවීමි. සතියක් මුළුල්ලෙහි නොයෙක් අග රස බොජුනෙන් වළඳවා,

**5772** "මම නන් වන් මලින් ශ්‍රාවක සංඝයා සහිත බුදුරදුන් පුදා පාමුල වැටී එම තනතුර පැතීමි.

**5773-57744-5775** 'එකල්හි එම කරුණා ජලාශයක්වූ බුදු රජතෙම (මෙසේ) වදාළේය. පියුමකට බඳු මුහුණු හා ඇස් ඇත්තාවූ ප්‍රීති ප්‍රමොද්‍ය බහුලකොට ඇති මැනවින් උඩට නැංගාවූ ඌර්ධවාග්‍ර රොම ඇති ප්‍රීතිය අධිකවීමෙන් විශාලවූ ඇස් ඇති මාගේ සසුනෙහි ඇලුම් ඇති, මාගේ පාමුල වැටුනාවූ (චිත්‍ර කථික භික්ෂූන් අතුරෙන් අග්‍රවීමය යන මේ) එකම අතට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හැරුණු මනා අදහස් ඇති මේ බමුණු උතුමා බලව්. මෙතෙම විචිත්‍ර කඨිකත්වයවූ ඒ මේ තනතුරු පතයි.

5776 "මින් සියදහස් වන කපෙහි ඔක්කාක කුලයෙහි උපන්නාවූ ගොත්‍රයෙන් ගෞතම නම්වූ ශාස්තෘතෙමේ ලොව පහළවන්නේය.

5777 "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූ ධර්මීයෙන් නිර්මිත කළාක් වැනිවූ ඖරස බුද්ධපුත්‍රවූ කුමාරකස්සප නම් ශාස්තෘ ශ්‍රාවකයෙක් වන්නේය.

5778 "(පුදන ලද) විසිතුරු පුෂ්ප වස්ත්‍රයන්ගේද රත්නයන්ගේද බලයෙන් හෙතෙම විචිත්‍රකථිකවූ භික්ෂූන් අතුරෙන් අග්‍ර බවට පැමිණෙන්නේය (කියායි)

5579 "මම මැනවින් කරනලද එම කර්මය කරණකොට ගෙනද චිත්තප්‍රණිධීන් කරණකොටගෙනද මිනිස් සිරුර හැර තව්තිසාවට උත්පත්ති වශයෙන් ගියෙමි.

5780 'රඟමඬල මැදට පත් නළුවෙකු මෙන් භවය නමැති අහසෙහි කැරකෙමින් ශාඛ මෘගපොතකයෙක්ව මුවදෙනෙකුගේ කුසයෙහි පිළිසිඳ ගතිමි.

5781 "එකල්හි මා මව්කුස පිළිසිඳ ගත් කලහි (මවගේ) මරණයට නියමිත වාරය එළඹියේය. ශාඛ මෘගරාජයා විසින් අතහැරදමනලද මාගේ මව්තොමෝ න්‍යග්‍රොධ මෘග රාජයා පිහිටකොට ගියාය.

5782 "එකල්හි ඒ න්‍යග්‍රොධ මෘගරාජයා විසින් ස්වකීය ප්‍රාණය පරිත්‍යාගකොට මරණයෙන් මුදාගන්නාලද ඕතොමෝ මට මෙසේ අවවාද කළාහුය.

5783 "න්‍යග්‍රොධ මෘගරාජයාම සෙවනය කරව. ශාඛ මෘගරාජයා සමග නොවසව. ඉදින් ශාඛා මෘගරාජයා සමග වැස යම් ජීවත්වීමක් වේ නම් (එයට වඩා) න්‍යග්‍රොධ මෘග රාජයා කෙරෙහි වැස මරණය යෙහෙකි.

5784 "එම න්‍යග්‍රොධ මෘගරාජයා විසින් අනුශාසනය කරනලද මමද එසේම සෙස්සෝද දුර රටක සිටියෙක් සිය ගෙදරට එන්නාක් මෙන් රම්‍යවූ තුෂිත දෙව්ලොව විසීම සඳහා ගියෝ (වෙමු)

5785 "යලි කාශ්‍යප බුදුරජුන්ගේ සසුන පිරිහී යන කල්හි කඳුමුදුනකට නැගී බුදුසසුනෙහි යෙදී.

5786 "දැන් මම රජගහනුවර සිටු කුලයක උපන්නේ වෙමි. කුස පිළිසිඳගත් දරු ගැබ් ඇති (එහෙත් එය නොදත්) මාගේ මව්තොමෝ අනගාරයී නම්වූ සසුනෙහි පැවිදි වූවාය.

5787 "දරුගැබ් සහිත බව (පසුව දැන සෙසු භික්ෂුණීහු) ඇය දෙව්දත් තෙරුන් වෙත පැමිණවූහ. එම දෙව්දත් තෙමේ මේ පවිටු භික්ෂුණීය (ගේ) (සිවුරු හැරවීමෙන්) ලිංග නාසනය කරව්යයි කීය.

5788 "දැනුදු මුනීන්ද්‍රවූ බුදුරජුන් විසින් අනුකම්පා කරන ලද්දී මාගේ මව්තොමෝ භික්ෂුණී ආශ්‍රමයෙහිදීම සුව ඇත්තී (මා) ප්‍රසූතකළාය.

5789 "එය දැන කොසොල් රජතෙමේ මා කුමර පෙරහැරින් පොෂණය කෙළේය. මම නමින් කාශ්‍යප නම් වූයේ (ද වෙමි.)

5790 "මහා කාශ්‍යප තෙරුන් නිසා මම කුමාර කාශ්‍යප යයි (ප්‍රසිද්ධවිය) කය තුඹසකට සමකොට බුදුරජුන් (විසින් කළ) දෙසුම අසා-

5791 "එහෙයින් මාගේ සිත තෘෂ්ණාදියෙන් දැඩිකොට අල්වාගැනීමක් නොකොට හැම ලෙසින්ම (ආශ්‍රවයන් කෙරෙන්) මිදුනේය. (මම පායාසිරාජන්‍යයා) දමනයකොට (චිත්‍රකථික භික්ෂූන් අතුරෙන්) එතදග්‍රස්ථානයට පැමිණියෙමි. 5792-5794

(සූවිසිවැනි බණ වරයි)

## 536 බාහිය ථෙරාපදානය

5795 'මින් (පෙර) සියක්දහස් වන කපෙහි මහත් ප්‍රභා ඇති තිලොවට අග්‍රවූ නමින් පදුමුත්තර නම්වූ බුදුරජතෙම ලොව පහළවිය.

5796 '(එකෙණෙහි දහම් අවබොධ කරන බැවින්) ක්ෂිප්‍රාභිඥවූ භික්ෂුවකගේ ගුණයට පසසන බුදුරජුන්ගේ (දෙසුම) අසා ඔදවැඩි සිත් ඇති මම මහාර්ෂීවූ (එම) බුදුරජුන්හට පුද සත්කාර කොට-

**5797** "එකල්හි මම සිසුන් (ශ්‍රාවක සංඝයා) සහිත බුදු රජුන්හට සතියක් මුළුල්ලෙහි දන් දී සම්බුදුරදුන් වැඳ එම තනතුර පැතීමි.

**5798-5799-5800** "ඉක්බිති බුදුරජතෙම මට මෙසේ පැවසීය. මාගේ පාමුල වැටුනාවූ පහන්වූ ඇස් හා මුහුණු ඇති රන්හුයින් යාගයෙහිදී දැමූ පුනනූල් සහිත සිරුරු ඇති සුදු පැහැ ඇඟ සිවි ඇති එල්බෙන (ඉදී මෙන්) රතු බිඹුඵල වැනි දෙතොල් ඇති මුවහත් තියුණු අවියකින් (මැද) සමකළාක් වැනි දත් ඇති අති බොහෝවූ ගුණය හා බලය ඇති මැනවින් උඩට නැගුණාවූ ඌර්ධවාග්‍ර රොම ඇති ගුණ නමැති සැඩ පහරට ස්ථානයක්වූ ප්‍රීතියෙන් මැනවින් පුබුදුව ගිය මුහුණු ඇති මෙම බමුණා (දෙස) බලව්.

**5801** "මෙතෙම ක්ෂිප්‍රාභිඥා (එකෙණෙහි දහම් අවබොධ කරන්නාවූ භික්ෂුවගේ (එම) තනතුර පතයි. අනාගතයෙහි ගෞතම නම් බුදුරජතෙම (ලොව පහළ) වන්නේය.

**5802** "උන්වහන්සේගේ ධර්මයෙහි දායාදීවූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනිවූ ඖරස (බුද්ධ) පුත්‍රවූ නමින් බාහිය නම්වූ ශාස්තෘ ශ්‍රාවකයෙක් වන්නේය.

**5803** 'එකල්හි ඉතා තුටු වූයේ නැගිට දිවි ඇතිතාක් බුදුරජුන්හට සත්කාර කොට (ඉන්) චුතවූයේ සිය ගෙදරට යන්නාක් මෙන් ස්වර්ගයට ගියෙමි.

**5804** "මම එම කර්මයාගේ බලයෙන් දෙව්වූයේ හෝ මිනිස්වූයේ සුඛිතවූයේ සැරිසරා සම්පත් අනුභව කෙළෙමි.

**5805** "යලි කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ සසුන පිරිහී යන කල්හි කඳුමුදුනකට නැඟී බුදුසසුනෙහි යෙදී,

**5806** "පිරිසිදු සිල් ඇති ප්‍රඥාවෙන් යුතුවූ බුදුසසුන් කරන්නාවූ (අපි) පස්දෙනෙක් ඉන් චුතවූවාහු දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

**5807** "ඉක්බිති භාරුකච්ඡ නම් උතුම් නගරයෙහි මම උපන්නේ 'බාහික' (නමැත්තේ වීමි.) අනතුරුව නැවකින් අප්‍රකට සයුරට පිවිසියේ.

5808 "ඉක්බිති කිහිප දිනක් ගොස් නැව බිඳුනේය. එකල්හි (දැති) මුවර (ආදී චණ්ඩ මත්ස්‍ය) යනට ආකරවූ ඝොර බිරුම් (සයුරෙහි) වැටුනේ.

5809 "එකල්හි මම වෑයම් කොට මහසයුර තරණය කොට (වෙහෙස කරණකොට ගෙන) මඳවූ නුවණැත්තේ උතුම් සුප්පාරක පටුනට පැමිණියේ,

5810 "සිහින් දර පතුරුවලින් ගොතා කළ වස්ත්‍රයක් හැඳ ගමට පිඩු පිණිස ගියෙමි. එකල්හි (මම ගමෙහි) එම ජනතෙමේ තුටුවූයේ මෙසේ කීය." මේ රහත් කෙනෙක් මෙහි පැමිණියේය.

5811 "අපි මොහුට ආහාරයෙන්ද පානයෙන්ද වස්ත්‍රයෙන්ද සයනයෙන්ද බෙහෙතින්ද සත්කාරකොට සැප ඇත්තෝ වෙමු" (කියායි.)

5812 "එකල්හි ප්‍රත්‍යයලාභීවූයේ එම ගම්වැසියන් විසින් පුද සැළකිළි කරන ලදුයේ මම රහතෙක් වීමි. නුනුවණින් අදහසක් ඉපිද වීමි.

5813 "ඉක්බිති පෙර (එකට මහණදම් පුරමින් සිට බඹලොව උපන් අනාගාමී බ්‍රහ්මදෙවතාවෙක් මාගේ සිත දැන" තෝ (නිර්වාණගාමී) උපාය මාර්ගය දන්නෙක් නොවෙහිය. තෝ කවර හෙයකින් රහතෙක් වෙහි දැයි" චොදනා කෙළේය.

5814 "ඔහු විසින් චොදනා කරන ලද මම කලකිරුනේ එකල්හි ඔහුගෙන් (මෙසේ) විචාළෙමි. "මේ රහත්හු නම් කවරහු වෙත්ද. ඒ නරොත්තමවූ රහත්හු ලොකයෙහි කොයි වෙසෙත්ද?" (කියායි.)

5815 "සැවැත් නුවර කොසොල් (රජ) මැදුරෙහි සම්පූර්ණවූ ප්‍රඥා ඇති උතුම්වූ මහා නුවණැති ආශ්‍රව රහිතවූ (රහත්වූ) ඒ ශාක්‍ය පුත්‍රවූ බුදුරජතෙමේ රහත්බවට පැමිණීම පිණිස දහම් දෙසත්.

5816 "එකල්හි ඔහුගේ වචනය අසා ලබන ලද නිධානයක් ඇති දුගියෙකු මෙන් අතිශයින් පිණාගියේ ඉතා විජ්මයට පත්වූයේ ඔදවැඩි සිත් ඇත්තේ අතිශයෙන් දැකුම් කළුවූ අනන්තවූ (සත්ව-සංස්කාර අවකාශ ලොකයන් විෂයයෙහි) විනිවිද ගිය නුවණ ඇති අර්හත්වූ උතුම්වූ බුදුරජුන් දැකීමට.

මෙහි ඉතිරි කොටස අඩු බව කරුණාවෙන් සලකන්න. එය හැකි ඉක්මනින් එකතු කිරීමට බලාපොරොත්තු වෙමු.

තෙරුවන් සරණයි.